

# කච්චායන භේදං

# KACHCHAYANA BHEDAYA.

BY THE

*VENERABLE ACHARYA "YASA" STHAVIRA.*

Translated into Sinhalese and Edited by

THE **MATARA, DHAMMAVANSA**

AND

THE **LADDUVA, SOMARATANA**

At the Suggestion of their Teacher

VEN. SRI DHARMĀRĀMĀSABHA STHAVIRA

*Principal of Viddyananda Pirivena.*

APPROVED BY

REV. MATALE DHARMASIDDHI

*Asst. of the Viddyananda Pirivena, Veyangoda.*

PUBLISHED BY

L. A. PERERA, SCHOOL MASTER.

1906.

# විඥාපනය.

**කාත්‍යායනභෙද** නම් මේ ප්‍රකරණය වනාහි සුප්‍රසිද්ධ "කාත්‍යායන ප්‍රකරණ" නාමධෙය මූලභාෂාත්මක මහාව්‍යාකරණ ග්‍රන්ථාගත සන්ධි නාමාදීන්ගේ භෙද සංක්ෂෙපනයින් සංගෘහීත පද්‍ය රචනාවකි. භෙද ග්‍රන්ථ ප්‍රමාණයෙන් කුඩාවුව්ද නිරූපිතාර්ථ සාරත්වයෙන් ගරුභාවොවහණය කෙරෙයි. තත් කර්තෘනාමාදිය ග්‍රන්ථාද්‍යන්තයෙහිවත් අනුපනිබද්ධනමුදු "කාත්‍යායනසාරා"දි ග්‍රන්ථකර්තෘකවූ ව්‍යාකරණ ජ්‍යෙලඞ්කාර සවසමය සමයාන්තරාදියෙහි ප්‍රවීණ බුද්ධිමත් ආචාර්ය්‍ය "**මහායසථවිර**" තුමෝයයි ටීකායෙහි පෙණෙතත් කාලදෙශාදිය අනියමිතයි. භෙද අනුමිතිවශයෙන් තට්ටීකාකරණ කාලයෙන්ම කියයුතු හෙයින් මෙයින් දෙසිය පන්තිස් හවුරුද්දකින් පෙර මහටීකාවද, එයින් එකුන්සාළිස් හවුරුද්දකින් පමණ පෙර සංක්ෂෙප ටීකාවද රචනාකරණ ලද්දෙන් මෙය ශ්‍රී බුද්ධ වර්‍ෂ දෙදහස්එක්සිය වන්නෙහි ම්‍රම්මදෙශයෙහිදී කරණ ලද්දකැයිද, කර්තෘ තද්දෙශීය පණ්ඩිතුමෙකැයිද සිතියයුතුයි.

මෙහි සන්ධි, නාම, කාරක, සමාස, තද්ධිත, අක්ඛ්‍යාත, කිතක යන කාණ්ඩ සප්තයකින් හා ග්‍රන්ථ එක්සියඑක්සැත්තෑවකින්ද පරිමිතත්වය පැණෙයි. මෙය පෞරාණිකයන් විසිනුදු උද්ග්‍රහණ ධාරණාදීන් සම්භාවිතබැව් කලින්කල තදර්ථවණ්ණනා වාරයෙන් කෘත ටීකාවිසින්ම සුප්‍රකාශයි. යථොක්ත ග්‍රන්ථය විශෙෂයෙන් කාත්‍යායන ව්‍යාකරණාර්ථාවබොධ ධාරණාදීයෙහි නියැලියන්ට සුඛොපනිඃශ්‍රයවන්නෙන් පරිශීලනාර්ථි ආධුනිකයන්ගේ අනායාසාපි ශිඛිය සඳහා මීට සවභාෂාමය අපිව්‍යාඛ්‍යානයක් කළ හොත් යෙහෙකැයි ධාතුකන්දේ විහාරාධිවාසී කලල්පිටියේ **රතනසිරි ස්ථවිර** ස්වාමින්වහන්සේ විසින් ආරාධනා කරණ ලදින් වේයන්ගොඩ විද්‍යානන්ද පරිවෙණාධිපති පූජ්‍යාචාර්ය්‍ය පණ්වල **ශ්‍රී ධර්මාරාමාභිධ ස්ථවිර** ස්වාමින්වහන්සේගේ ධර්මාන්තෙවාසිවූද මාතර වල්පොල දිසානායක මනහිඳුරාමාධිවාසී උයන්ගොඩ **සුමඞ්ගල** ස්ථවිර ස්වාමීන්වහන්සේගේ ශිෂ්‍යවූද මාතර **ධම්මවංස**, දෙවගොඩ විජයාරාම විහාරාධිවාසී මාතලේ **අග්ගධම්මාලඞ්කාරාභිධාන** මහාස්ථවිර ස්වාමීන්වහන්සේගේ ශිෂ්‍යවූද ලද්දුව **සොමරතන**, යන අප විසින් කාත්‍යායනභෙද ටීකානයාශ්‍රිතවැ වෙනත් ආගමධර්ම ශබ්දශාස්ත්‍ර සම්බන්ධ **ග්‍රන්ථරාශියකින්** කරුණු උපුටා යථාස්ථානයන්හි නිදර්ශනය කරමින් ශබ්දශාස්ත්‍රා

ෂ්‍යින්ගේ උද්ග්‍රහණ සෞකර්‍ය්‍යයට යොග්‍යසේ මේ විස්තර ව්‍යාඛ්‍යානය කරණලදී. අපගේ මේ සත්කෘතියෙහිදී **විද්‍යානන්ද පිරිවෙණ** උපප්‍රධානාචාර්‍ය්‍ය ගෞරවාහී මාතලේ **ධර්මශ්‍රීඛ්‍යාභිධාන** ස්වාමිපාදයන්වහන්සේ විසින් අවසාන ශුද්ධපත්‍ර බලා පිළිගැණි මද, විද්‍යානන්දපිරිවෙණ උපආචාර්‍ය්‍ය ගාල්ලේ ධම්මකුසල ස්වාමින් වහන්සේද-පනාවල විමලසිරි ස්වාමින්වහන්සේද-මුල්ලේගම සීලාලඞ්කාර භවතුන්වහන්සේද යන භවතුන්වහන්සේලාගේ යම් යම් අනුබලද, මුද්‍රනය කිරීමේදී අලුත්ගම සද්ධර්මප්‍රකාශ යන්ත්‍රාලයේ ප්‍රධාන කේ. ඞී. ජේ. ගුණතුංග මහත්මයාගේ උපකාරද ඉවහල්වූ බව සතුටින් මතක්කරමු.

Matara, Dhammavansa
Ladduwa, Somaratana

*Viddyananda Pali College,*
*Veyangoda 1906.*

---

නිශශ්‍රීධර්මසාරාචාර්‍ය්‍යස්‍යාපිංශිඛයෙද්ධ්‍රැවම්,
ශ්‍රීමච්ඡාක්‍යමුනීන්ද්‍රාය නමඃ සර්වාපිශිඛයෙ.

විද්‍යානන්දාභවයං විද්‍යාලයං ප්‍රත්‍යධිපොබුධඃ,
ශ්‍රීධර්මාරාමනාමායඃ නත්වාවිප්‍රාහීණං ගුරුම්.

යස්සාචාර්‍ය්‍යේණ යඃ කාත්‍යායනභෙදෙති විශ්‍රැතඃ,
කෘතො මාගධියා සම්‍යග් ව්‍යාකරණපි සංග්‍රහඃ.

තස්‍යෙයං ක්‍රියතෙ ටීකාභ්‍යාමන්‍ය ග්‍රන්ථකාදපි,
අන්‍යෘෂ්‍ය විස්තරාපීනි ව්‍යාඛ්‍යා සිංහලභාෂයා.

ප්‍රමාද භ්‍රමතො ජාතං ස්ඛලනංචාත්‍ර විද්‍යුතෙ,
ක්‍ෂමතාං කෘපයා විචානනසූයගුණාලයඃ.

---

# කච්චායන භෙදය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

**ජිතමාරාදිකං බුද්ධං, ධම්මං මොහ විධංසකං**
**වන්දිත්වා උත්තමං සඞ්ඝං, කච්චායනස්ස වණ්ණිතං.**

**කච්චායනස්ස භෙදඤ්ඤං, සප්පයොගං සත්ථරහං**
**සොතුජනානමත්ථාය, පවක්ඛාමි සමාසතො.**

---

## සන්නය.

**ජිනෙනුං කරුණාකූණො දධිමග්ගඵලාතනො**
**සිඞ්ඝිමත්ථං ගණාවතාත ජනන්තු ධම්මි තො පරං.**

ශ්‍රී සුගත තථාගත සුපරිශුද්ධ ප්‍රවචනොදධි තරණ තරණ්‍යක දෙශායමාන කාත්‍යායන භෙදග්‍රන්ථ කෘචිප්සිත "**ශස**" සවිරාචාර්‍ය්‍යයෝ

ග්‍රන්ථාදෞ ග්‍රන්ථ මධ්‍යෙ ච, ග්‍රන්ථාන්තෙ වාපි මඞ්ගලම්
ග්‍රන්ථ සමාප්ත්‍යරිපූර්ණ, හාපො හාදිනානි ඛණ්ඩනම්'ධි

ආපත ඊඨින් මඞ්ගලාචරණය කරණුවෝ, "ආශිනාත්ම ක්‍රියා ජංශව, වස්තු පූර්වරථොපිවා,ඝී උක්ත මඞ්ගලෙල්‍යක දෙශවූ පරම සූක්‍ෂ්ම රත්නත්‍රය ඍඥනිරූපකවූ ප්‍රණාමයෙන් ස්වග්‍රන්ථ නිර්මාණාරම්භයෙහි "**ජිතමාරාදිකංබුද්ධං**" යනාදීන් ප්‍රාරිප්සිත කළෝ.

එයද රත්නත්‍රය ප්‍රණාමක්‍රියා ජනක විසින් යථාභිප්‍රෙත ග්‍රන්ථ පරිසමාප්තියෙහි "විඝාඪක, උපච්ඡෙදකාදි අන්තරා නිරාකරණ ශිංසනයි.

තවද විස්තරහෙයින් පූජාභාගීයන් පුදනුවන් විසින් ප්‍රාප්‍යවූ පූජාච පූජනෙය්‍යානං—පෙ—සබ්බත්ථසොත්ථිංගච්ඡන්ති තෙසංම්ඔහලමුත්තමං,සි වදාළ මඞ්ගල්‍යයද බුද්ධාදීන් ස්මරණය කරන්නවුන්විසින් ප්‍රාප්‍යවූ එවංබුද්ධං සරන්තානං—පෙ—භයංවාඡම්භිතත්තංවා ලොමහංසොනහෙස්සති,සි වදාළ විත්ත්‍රාසාදි භය පරිත්‍රානයද

රත්නත්‍රය ප්‍රණාම සඞ්ඛ්‍යාත සෞමනස්‍යසහගත ඥාණසම්ප්‍රයුක්ත මහාකුසල චේතනා සම්භිහිතයන් විසින් ප්‍රාප්‍ය වූ "සත්තිමෙ භික්ඛවෙ අපරිහාණිය සංවත්තන්ති, කතමෙ සත්ත, සත්ථුගාරවතා, ධම්මගාරවතා, සඞ්ඝගාරවතා, සික්ඛාගාරවතා, කල්‍යාණමිත්තතා, සොවචස්සතා," යන මෙහි අභිප්‍රෙතාර්ථ සිද්ධියෙහි ප්‍රඥා අපරිහාණියද යථා ලබ්ධ සම්පත්තියෙහි. ආයුසංස්කාරාදීන් අප්‍රවර්තනයෙන් ආරබ්ධකෘත්‍ය විඝ්න ආ ප්‍රාර්ථිතයන් විසින් ලභ්‍ය වූ "**අභිවාදන—පෙ—ආයුවණ්ණසුඛ බලං.**"සි" වදාළ ආයුරාදීන් අභිසංසනයද අපරිඥාතගුණාභිධෙය ඇති ශාසනිකයන්ට ග්‍රන්ථගෞරවයද ජිනාභිධෙයත්ව රත්නත්‍රයෙහි ගෞරවයද. යන උභය ගෞරවජනනයද. ප්‍රතිපත්ති හා ලෞකික ලොකෝත්තර-අර්ථාගමයද—අභිප්‍රෙතයි—

තව්ද, ප්‍රකරණාරම්භයෙහි. සියලු බාහිරාභ්‍යන්තර භයඋපද්‍රවයන් නිවාරණයද—ග්‍රන්ථ:හි නිෂ්පාදන—සමාප්ති වියඤ්ඤාණ ප්‍රත්‍යූහ්‍යූප නිශ්‍රයද—ලෞකික ලොකොත්තර සකල සම්පත්ති නිෂ්පාදනයද රත්නත්‍රය ප්‍රණාමයද—වන්දිතව්‍ය වන්දනහෙතු වන්දනා සමුත්ථාපිත ප්‍රයෝජන—සංඥා-නිමිත්ත-කර්තෘ-ප්‍රමාණ-ප්‍රයෝජන—ප්‍රතිඥාතව්‍ය—වර්ණනීය—නිශ්‍රය-යන තුදුස් අර්ථයන්ද දක්වන්නෝ, **ජිනමාරාදිකං**, යනාදි ගාථාවය, හදුළෝඩි—

එහි, වන්දිත්වා, යන ක්‍රියා විසින් ප්‍රණාමයද, බුද්ධං, ධම්මං, සඞ්ඝං, කච්චායනං, යන ප්‍රත්‍යකපදවිසින් ප්‍රණාමාභිසින්ද ජිනමාරාදිකං මොහවිධංසකං, උත්තමං, වණ්ණිතං, යන ගුණවචන හෙයින් ප්‍රණාමහෙතුද · වන්දිත්වාති, ක්‍රියායෙහි, ත්වා ප්‍රත්‍ය විසින් ප්‍රණාම ක්‍රියා සමුත්ථාපිකයෝද—වන්දිත්වා, පවක්ඛාමි, යන ක්‍රියා සම්බන්ධ ධාතූන්ගේ සාමර්ථ්‍ය හෙයින් ප්‍රයෝජනයද, භෙදං, යන පදහෙයින්, ප්‍රකරණනාම සංඥායද, පවක්ඛාමි යන්නෙහි ධාත්වර්ථ සාමර්ථ්‍යයෙන් බාහ්‍යාභ්‍යන්තර නිමිත්ත්විසින්, අභ්‍යන්තර කරුණා නිමිත්තහා, සොතුජනානං, යන පදයෙන්භ බදුනීවූ, බාහ්‍යනිමිත්තද, අහං, යන, නාමපදයෙන් කර්තෘද, සුසෝගං, යථාරහං. සමාසතො, යන පදහෙයින්, ග්‍රන්ථප්‍රමාණයද, භෙදං යන, පද සාමර්ථ්‍ය හෙයින් මුඛ්‍යානුෂංගික, ද්විවිධ ප්‍රයෝජනයන්ද, කච්චායනභෙදං පවක්ඛාමි යන්නෙන්, ප්‍රතිඥාවද පවක්ඛාමි යන්නෙහි ධාත්වර්ථ සාමර්ථ්‍යහෙයින් ප්‍රතිඥාතයද.) භෙදං යන්නෙන් සම්ප්‍රතිපාදිත ප්‍රකරණයද, "**කච්චායනස්ස**" යන පද හෙයින් වර්ණනීය, කච්චායන ව්‍යාකරණ ග්‍රන්ථයද—එසින්ම නිශ්‍රයද—කීවෝය. එහි-ප්‍රථම ගාථායෙන්-සංඥා—නිමිති—කර්තෘ-ප්‍රමාණ—මුඛ්‍ය ප්‍රයෝජනයන්ද, දෙවනගයින් ආනුෂංගි ආ ප්‍රයෝජනයද.

දස්සිතයි. තස්සමොධානයෙන්—

සඤ්ඤා නිමිත්තං කත්තාච පරිමාණං පයොජනං
සබ්බාගමස්ස පුබ්බෙවත්තබ්බං චතුබ්බිජතා-යි—කියනලද පූර්ව පංචකය හඳලේනම් වෙයි-

මෙසේ රතනත්‍රය ප්‍රණාම ප්‍රයෝජනය එක දෙශයකින් දතයුතු තදනන්තරව—ප්‍රණාමගාථායෙහි—නයලක්ෂණ-සංවර්ණනාලක්ෂණද්‍ය—සොතෘජන ප්‍රඥාවඩ්ඪනය පිණිස දතයුතුය.

න ය භෙ ද ය.

ශබ්දනය—අලඞ්කාරනය-නෙත්තිනය. යන භෙදයෙන්-ත්‍රිවිධය—එහි—ශබ්දනයභෙදය.

එකදෙසූපචාර, සම්පූර්ණචාරය. ඨාණූපචාරය, ඨාණ්‍යුපචාරය සදිසූපචාරය. ගුණූපචාරය-කාරණූපචාරය. තද්ධම්මූපචාරය—භෙදූපචාරය. ඵලූපචාරය."යි" උපචාරභෙදයෙන්—දශවිධය—උක්තමැයි—

එකදෙස සම්පෙංච ඨාණ ඨාණීච සාදිසෝ
ගුණො කාරණ තබ්බම්මා භෙදෙඵ්පූ පචාරතො
සමුද්දෙච මයාදිට්ඨා ගංගායංඝස්සම්බචපි.

මඤ්චා ඝොසන්ති කුඩ්ඩා පචරන්ති සීහමාණවෝ
නීලොපපවොජං බ්‍රාහ්මණගාමො සස විසාණකං
සිලාපුතතා ක සරීරං සෙමෙහා ගුලොංච ද සබ්බා"ති"

අ න්‍යා වා ශී යෝ

කාරණූපචාරය, හෙතූපචාරයයි කියත්—හේමෙසේයි.

මුත්‍යෙක්ඛාඵකවිබො තත්ථ. අමුත්‍යෙක්ඛාද සබ්බාමතො
හෙතුඵලො සදිසොච. ඨාණෙ ඨාණී ගුණේ පිච
එකදෙසො සම්පෙංච තද්ධම්මා හෙද කො පිච.

ත ද න්‍යා වා ශී යෝ.

සාමීප්‍ය නෙත ඉද්දෙසත සඟිනට්ඨාන පාසිකා
තබ්බම්මභෙද ගුණහෙතුං ඵලතාදත්ථ සාදීසා
සබ්බෙබ නොප මෙයෙහි නො උචාර නොකන්තිතෙදසා-යී"

උපචාරය තෙරසවිධයයි කියත්—තන්මතයෙහි-බාහුල්ලය තදඤ්ඤ-සම්බන්ධ. යන උපචාරත්‍රය පූර්වෝක්තයෙන් අතිරික්තයි. "ජිතමාරාදිකං" යනාදි ගාථායෙහි—උපචාරවිධානය යථාලාභ වශයෙන් දත යුතු.

අභිවන්දිය "යි" ප්‍රණාම චේතනොත්පාදයෙහි. වස්තුත්‍රය ගුණානුස්මරණ සංඛ්‍යාත—විභූතාලම්බනයෙහි—ප්‍රවර්තිත භවාංග චලනානන්තරයෙහි මනොද්වාරාවර්ජන-සත්ජවන් යුක්ත චිත්තවීථි ගත කුශලජවනයන්හි—කුශලචේතනාවෝ මුඛ්‍යවෘත්ති වශයෙන්. පැවැත්තෙන් ප්‍රථම ජවනචේතනාව **"එකදෙසූපචාර"** ප්‍රණාම යැ. මනොද්වාරාවර්ජනය "සමීපූපචාර ප්‍රණාමය" හෘදයවස්තුව ස්ථානූපචාර ප්‍රණාමය-වේදනා-සඤ්ඤා-චිත්ත යන ස්කන්ධත්‍රය-චේතනාවට සහජාත-නිශ්‍රය වශයෙන්-නිශ්‍රිතත්වයෙන් **ධාරණූප චාර** ප්‍රණාමය-චේතනාව හැර- ශෙෂසංස්කාරස්කන්ධය. සංස්කාර ස්කන්ධවශයෙන් සදෘශහෙයින්-**සාදිසූපචාර** ප්‍රණාමය ආචාර්‍ය්‍යයන්ගේ-ප්‍රණාම ගුණ සමංගිතාව-ගුණූපචාර ප්‍රණාමය-කායවිඥප්ති වාක්විඥප්තීහු **කාරණූපචාර** ප්‍රණාමය. යොනිසොමනස්කාර ශ්‍රද්ධාමෛත්‍රී කරුණාදීහු, **ඵලූපචාර** ප්‍රණාමය. ආචාර්‍ය්‍යයන්ගේ ප්‍රඥප්තිය-**ශබ්දූපචාර** ප්‍රණාමය. විඥප්තිමාත්‍ර චිත්ත-චිත්තජරූපයෝද-හෘදයවස්තු චිත්ත කර්මජ-ඍතුආහාරජ රූපයෝද **තද්ධම්මූපචාර**. ප්‍රණාමය.

මේ මෙහි යථාලාභ, යෝජනායි,

මෙම්, ගාථායෙහි එව ශබ්ද භාව නමුදු තදඤ්ඤ ප්‍රසංගයෙන් ප්‍රණාම ක්‍රියාහුගේ, අන්‍යයොග ව්‍යවච්ඡෙද, අයොග ව්‍යවච්ඡෙද. අත්‍යන්තායොග ව්‍යවච්ඡෙදනීහු අපේක්ෂිතව්‍යාප්ති, අනුක්ෂණතාව මඤ්ඤිත ව්‍යාප්තියන් වියයුතුමය—ප්‍රණාමහෙස්වරස්කන්ධ කුමාරාදීහු නිවෘත්තිතව්‍යයන් හෙයින් නොවැදිය යුතුයයි කියත්—අතීතානාගත භගවත්හු ප්‍රණාම ක්‍රියාවට අනුඥාතයහ—එත්මත් බුදුහු ප්‍රණාම ක්‍රියාවෙන් අත්‍යන්තායොග ව්‍යවච්ඡෙද වඤ්චිතව්‍යාප්තිකලෝ මෙම කීහ.

ගුණද්‍රව්‍යක්‍රියානංවා, ව්‍යවච්ඡෙද විසාතිධා
තිසෙසා ධනුධරෙ එව, කාලොඑව ධනුධරෙ
අතෙව කා කො සෙතොපි, ඉදංතෙසං නිදස්සනං.

නොහොත්—වාචකය දස්සනය—පකාසනය—විභාවනය-දීපකය අනුභාවනයයි—ෂඩ්විධශබ්දනය කෙනෙක්ද කීහ—තය් වශයෙනුදු—අභිවන්දිත්වා යනු සංදර්භයෙන් වැද යන අර්ථවාචකයෙන් වාචකනයද—වන්දිත්වාඃඞි: ක්‍රියා විසින් දශිත රත්නත්‍රය ගුණානුස්මරණයෙන් කායවිඤ්ඤත්ති සමුට්ඨාපක කායප්‍රණාම චෙතනාව හා තත්ගුණ ලම්බනයෙන් වාක්විඥප්ති සමුට්ඨාපකවාක් ප්‍රණාම චෙතනාවද—තද්භාග චෙතනාන්තරයෙහි—පූර්වචරණ අනුචරණ අනුස්සරවශයෙන් ප්‍රවෘත්ත-මනොචෙතනාවද—යන—ත්‍රිවිධචෙතනාවෝ කියනු ලබනුයෙත්

දස්සනයද—යථොක්ත චෙතනා සහජාතවූද, ඔවුනට සුදුසුසේ: සහජාතාදි ප්‍රත්‍යවූ සම්ප්‍රයුක්ත ධර්මයන්—අනන්තරාදි ප්‍රත්‍යවූ අනන්තර චිත්තොත්පාදයන්, ඔවුනට සහජාතවූ පුරෙජාතාදි ප්‍රත්‍යවූ හෘද වස්තුවද, ප්‍රකෘතූපනිශ්‍රිතවූ ධර්මයන්—යොනිසොමනස්කාරවූ ගුණානුස්මරණ ශ්‍රද්ධාද, අතීතොපකාරමමණීක කරුණාද—සත්පුරුෂොප නිශ්‍රය, ප්‍රතිරූප දෙශාවාසය—පූර්කෘත පුණ්‍යත්වය—ආත්ම සම්‍යක්ප්‍රනිධිය: යන. චතුශ්චක්‍ර සම්පත්තියද, යන අර්ථවාචකයෙන්—**දීපකනයද**—

මනසින් ව්‍යවස්ථිත ශබ්දාලම්බනයෙන් සමුත්පත්තික වාක්භෙදය සමුට්ඨාපක චෙතනාහා අනන්තරය විශෙෂනප්‍රසාද ජනක සෘජුගත චිත්තාජීවෙදාදීන් ප්‍රකාශකත්වයෙන්—**ප්‍රකාශන**නයනද-රත්නත්‍රය ගුණප්‍රණාමාභිත්වයන් යෝනෘජනාවෙදනය කරණයෙන්—**විභාවන**නයද—නමාස්කාරාගත භාවය අනුභාවනය කරණයෙන්—**අනුභාවන**නයද—(ඇතැමිහු අනුභාවයයි කියත්) යනාදිවශයෙන්—ෂඩ්භෙද ශබ්දනයද ආශ්‍රිතයි.—

# අලංකාරනය.

භාව,'ය'—විභාවය—අනුභාව,ය—යන භෙදත්‍රයෙන් භා—බ්‍යඞ්ගය—යන භෙදයෙන්ද; ත්‍රිවිධවූයේ—අලඞ්කාරනයයි—ප්‍රථම විකල්පයෙහි—භාවනම්—ශරීරයි—විභාව නම් හෙතුයි-අනුභාව නම්-ආනිශංස ඵලයි—ශබ්දනය භෙදයෙහි-දශිනයට මෙහි භාවනය සමයැ—දීපකනයට විභාවනය සමයැ—පකාසනනයට අනුභාවනය සමයැ—තදර්ථදීපකයෝ—දස්සන භූතා—තිස්සො චෙතනා, භාවො සරීරත්ථා.සීද දීපකංවිභාවො කාරණත්තායිද: පකාසනං අනුභාවො ආනිසංසඵලත්තා,සීද—යථා—ඛෙදෙ-භාවො; ගති-විභාවො: සෙද,-අනුභාවො:සීද—සභොප මොදෘගරණකෙරෙත්—**අපරවිකල්පයෙහි.**

ව්‍යඞ්ගනම්-වාචකය, ලක්ෂණිකය, ව්‍යඤ්ජකය, මුඛ්‍යව්‍යාපාරය, ලක්ෂණව්‍යාපාරය, ව්‍යඤ්ජන සභාව ව්‍යාපාරය, වාච්‍යය ලක්ෂ්‍යය, ව්‍යඞ්ග්‍යයයි භේදනවයකින් උක්තය.

මෙහි පූර්‍ණම, චෙතනාවෝ වාච්‍ය තත්වාචකවූ වන්දිතවා, යනු වාචකයි. ඒ වන්දිතවායි වාචකයාගේ විකාරය මුඛ්‍ය ව්‍යාපාරයි පූර්වෝක්ත විභාවිංසි අනුභාවාඤ්ඤයෝ, ලක්ෂ්‍යයි. ලක්ෂ්‍යශී වාචක වන්දිතවා යනු ලක්ෂණිකයි. ලක්ෂණිකයාගේ යථෝක්ත විකාරය හෝ සත්ත්වය ලක්ෂණව්‍යාපාරයි. මෙහාර්‍ථයෙහි ආශිංසාජීය ව්‍යාංගයි, ආශිට්ඨාජී වාචක ශබ්දය ව්‍යඤ්ජකයි. තත්ව්‍යඤ්ජකයාගේ විකාරසත්තින් යථෝක්තත්වය ව්‍යඤ්ජන සභාවව්‍යාපාරයි,

තද්භාගය විකල්පාත්ම අලඞ්කාරණ්‍යයි. කියනුවෝ අලංකාරනයොපත්තුවිධො භාවපිහාව අනුභාවා ව්‍යඞ්ගාචාති'ඩිඃතත් කාලෝ.

අ ල ඞ් කා ර න ය භේ ද.
ස මා ප්ත යි.

—:o:—

# නෙත්තිනය.

හාරෝපදෙශය, න්‍යායොපදෙශය, ප්‍රශස්ථානෝපදෙශයයි, ත්‍රිවිධොප දෙශයකින් නිරූපිතය.

ව්‍යඤ්ජනවිචය ලක්ෂණහෙයින් එකවිධවූද, දෙශනාවිචයාදි ලක්ෂණවශයෙන් ෂොඩශවිධය—මෙම නීන.

සොළස හාරා නෙත්ති—පඤ්චනයා සාසනපරියෙට්ඨි
අට්ඨාරස පදා මහා—කච්චායනෙන නිද්දිට්ඨා"ති"

සො ළ ස හා ර ග ං.

දෙසනා විචයො යුත්ති පදට්ඨානො ච ලක්ඛණො
චතුබ්‍යූහො ආවත්තො විභත්ති පරිවත්තනො.
වෙවචනො ච පඤ්ඤත්ති ඔතරණො ච සොධනො
අධිට්ඨානො පරික්ඛාරො සමාරොපනො සොළසා"ති"

දෙසනාහාරය විචයහාරය යුත්තිහාරය පදට්ඨානහාරය ලක්ඛණහාරය චතුබ්‍යූහහාරය ආවත්තහාරය විභත්තිහාරය පරිවත්තනහාරය වෙවචනහාරය පඤ්ඤත්තිහාරය ඔතරණහා

රය සොධනහාරය අධිට්ඨානහාරය පරික්ඛාරහාරය සමාරොපන හාරය,යි—හාරසොළසය.

## සොළසහාර නිර්වචන නම්

දෙසියන්තෙ අත්ථා එතායාති දෙසනා, හරතීති. හාරො, දෙසනා එවහාරො දෙසනාහාරො, දෙසනාහරීයතෙ සංවණ්ණි යතෙ එතෙනාතිවා දෙසනාහාරොයි—ප්‍රකරණසිනි රුකත්තියි. සෙස්සෙසුද මෙසේයි.

විචිනාතිඅත්ථං එතෙනාති, විචයො—පෙ—විචයහාරො. යො ජීයතෙ අත්ථො එතායාති-යුත්ති-යුත්ති එව—පෙ—යුත්තිහාරො, පදං(ඵලං) තිට්ඨති එත්ථාති පදට්ඨානො සොච හාරො පදට්ඨා නහාරො ලක්ඛියතෙ ධම්මා එත්ථාති ලක්ඛණො සොච—පෙ— ලක්ඛණහාරො ව්‍යූහෙති නිස්සිතං එතෙනාති. ව්‍යූහො චතුන්නං ව්‍යූහානං සංගති චතුබ්‍යූහො සොචහාරො චතුබ්‍යූහ හාරො ආවට්ටියන්ති ධම්මා එතෙනාති ආවට්ටො—සොච හාරො ආවට්ට හාරො—විභජ්ජියතෙ අත්ථ එත්ථාති, විභත්ති. සොචහාරො විභ ත්තිහාරො පරිවත්තියතෙඅත්ථො අනෙනාති පරිවත්තනො සොච හාරො පරිවත්තනහාරො—විවිධංවදති එතෙනාති වෙවචනො සොච ගවච්චනෙං—වෙවචනො, ච හාරො වෙවචන හාරො— පඤ්ඤපියතෙධම්මා එතායාති. පඤ්ඤත්ති සොච හාරො පඤ්ඤ ත්තිහාරො අවතරීයන්ති අත්ථා එත්ථාති ඔතරණො සොච හාරො ඔතරණහාරො සොධියන්ති අත්ථා එත්ථ තිසොධනො සොචහා රො සොධනහාරො අධිසියති ධම්මා එත්ථාති අධිට්ඨානො සොච හාරො අධිට්ඨානහාරො සංකරොති පච්චයං එතෙනාති පරික්ඛා රො සොච හාරො පරික්ඛාරහාරො සමාරොපියන්ති අත්ථා එත්ථං ති සමාරොපනො සොච හාරො සමාරොපනහාරො දෙසනාය හාරො දෙසනාහාරො කියාහෝ පදට්ඨානංහාරො පදට්ඨාන හාරො කියාහෝ යුක්තාය.

## මෙ ගි ප රි පා ටි ය.

සොළසහාරා පඨමං දිසාලොචනෙන දිසාවිලොකෙත්වා
සංඛිපිය අංකුසෙනහි, නයෙහිතිහි නිද්දිසෙ සුත්තංයි''

මෙදලහෙයින්—සොළසහාරය ආදියෙහි කියයුතුහෙයද එයිනුදු දෙසනාහාරය ප්‍රථම කියයුතු.

## දෙසනා හාරය.

අස්සාදාදීනවතා නිස්සරණම්පිච ඵලං උපායො
ආණත්තිච භගවතො, යොගිනං දෙසනා හාරො

ආස්වාදය—ආදීනවය නිස්සරණය ඵලය උපාය-ය නියොගය යන ෂඩ්ලක්ෂණවශයෙන් සූත්‍රාර්ථාවබොධය දෙශනාහාර—නෙත්තිය.

## විචය හාරය.

යං පුච්ඡිතංච විස්සජ්ජිතංච සුත්තස්සයාච අනුගීති.
සුත්තස්ස යො පවිචයො හාරො විචයොති නිද්දිට්ඨො,

පදපෘච්ඡා විසර්ජන පූර්වාපර අනුගීති ආස්වාද ආදීනව නිස්සරණඵල උපාය ආණත්ති, යන නවලක්ෂණවශයෙන් සූත්‍රාර්ථාවබොධය විචයහාර—නෙත්තිය.

## යුක්ති හාරය.

සබ්බෙසං හාරානං යා භූමියොච ගොචරො තෙසං
යුත්තායුත්ති පරික්ඛාහාරො යුත්තීති නිද්දිට්ඨො.

සූත්‍රාගත ශබ්ද අර්ථදෙදෙනාගේ යුක්තායුක්තභාවය වෙන් කොට සූත්‍රාර්ථාවබොධය යුක්තිහාර—නෙත්තිය.

## පදට්ඨානහාරය.

ධම්මංදෙසෙති ජිනො තස්සච ධම්මස්සයං පදට්ඨානං
ඉතියාව සබ්බ ධම්මා එසොහාරො පදට්ඨානො

සූත්‍රාගත ධර්මයන්හි මේ ධර්මය මේ ධර්මයට ආසන්නයයි අන්‍යොන්‍ය ප්‍රදස්ථාන ධර්මයන් නිර්ධාරණයකොට අර්ථාවබොධ ලක්ෂණය යුක්තිහාර—නෙත්තිය.

## ලක්ඛණ හාරය.

වුත්තම්හි එක ධම්මෙ යෙ ධම්මා එකලක්ඛණා කෙචි
වුත්තා භවන්ති සබ්බෙ සොහාරො ලක්ඛණො නාම,

සූත්‍රයෙහි නොආවාවූ ධර්මයන් ආවාවූ ධර්මයන්සේ ප්‍රාප්තපදය කිත් ලක්ෂණ සාම්‍ය හෙතුඵල විශයෙන් සම්කොට ධර්මාර්ථාව බොධය ලක්ෂණහාරනම්—නෙත්තිය.

### ච තු බ්‍යූ හ හා ර ය.

**නෙරුත්තමධිප්පායො බ්‍යඤ්ජන මථ දෙසනා නිදානඤ්ච**
**පුබ්බාපරානුසන්ධි එසො හාරො චතුබ්‍යූහො.**

සූත්‍රාගත ධර්මයන්, නිරුක්ති අධිප්‍රාය නිදාන පූර්වාපරසන්ධි යන සතරාකාරයෙන්, දැන අර්ථාවබොධ ලක්ෂණොපාය චතුබ්‍යූහහාර, නෙත්තිය.

### ආ ව ත්ත හා ර ය.

**එකම්හි පදට්ඨානෙ පරියෙසති සෙසකං පදට්ඨානං**
**ආවට්ටති පටිපක්ඛෙ ආවට්ටො නාම සො හාරො.**

දෙශනාගෘහිත ධර්මයන් සභාග විසභාග පදස්ථානයෙන් පරිවර්තනයකොට අර්ථාවබොධය "ආවර්තහාර" නෙත්තිය.

### වි භ ත්ති හා ර ය .

**ධම්මඤ්ච පදට්ඨානං භූමිඤ්ච විභජ්ජතෙ අයංහාරො**
**සාධාරණෙ අසාධාරණෙච නෙය්‍යොහාරො විභත්තිති.**

සංක්ලෙශව්‍යවදාන ධර්මයන් සාධාරණ අසාධාරණවශයෙන්ද භූමි වශයෙන්ද පදස්ථානවශයෙන්ද විභාගකරනයකොට අර්ථාවබොධනොපාය හෝ අර්ථාවබොධය "විභක්තිහාර" නෙත්තිය.

### ප රි ව ත්ත න හා ර ය .

**කුසලාකුසලෙ ධම්මෙ නිද්දිට්ඨෙ භාවිතෙ පහීනෙච**
**පරිවත්තති පටිපක්ඛෙ හාරො පරිවත්තනො නාම.**

සූත්‍රාගත ධර්මයන් ප්‍රතිපක්ෂයන්ගේ වශයෙන් හෙවත් කුසලාකුසලයන්ගේ අන්‍යොන්‍ය විරුද්ධත්වය අවබොධන වශයෙන් පරිවර්තනයකොට අර්ථාවබොධනොපාය හෝ අර්ථාවබොධය "පරිවර්තන හාර" නෙත්තිය.

### වෙ ව ච න හා ර ය .

**වෙවචනානි බහූනිතු සුත්තෙ වුත්තානි එකධම්මස්ස**
**යො ජානාති සුත්තවිදූ වෙවචනො නාම සො හාරො.**

සූත්‍රාගත එකී එකී පදයෙක් බොහෝ පර්‍ය්‍යාය වචන වශයෙන් විස්තරකොට සූත්‍රාර්ථාවබෝධය "වේවචනහාර" නෙත්තිය.

**පඤ්ඤත්ති හාරය.**

**ඒකං භගවා ධම්මං පණ්ණත්තීහි විවිධෙහි දෙසෙති**
**සො ආකාරො නෙය්‍යො පණ්ණත්ති නාම සො හාරො.**

සූත්‍රාගත එකිඑකී ධර්මයක් බොහෝ ප්‍රඥප්ති විසින් ප්‍රඥප්තිභාවය හැඟවීමෙන් ධර්මාර්ථය අවබෝධ නොපායහෝ අවබෝධය "**පඤ්ඤත්තිහාර**" නෙත්තිය.

**ඔතරණ හාරය.**

**යොච පටිච්චුප්පාදො ඉන්ද්‍රිය ඛන්ධාච ආයතනා**
**එතෙහි ඔතරතියො ඔතරණො නාම සො හාරො.**

සූත්‍රාගතාර්ථයන් පටිච්චසමුප්පාදදීන්ගේ වශයෙන් බහා අර්ථාවබෝධ නොපාය හෝ අවබෝධය "ඔතරණහාර" නෙත්තිය.

**සොධන හාරය.**

**විස්සජ්ජිතම්හි පඤ්හෙ ගාථායං පුච්ඡිතායමාරබ්භ**
**සුද්ධාසුද්ධපරික්ඛා හාරො සො සොධනො නාම.**

සූත්‍රාගත පද පදාර්ථ ප්‍රශ්ණ විසර්ජනය ආරම්භය යන **ලක්ෂණා**වබෝධ නො පාය හෝ අර්ථාවබෝධය "සොධනහාර" නෙත්තිය.

**අධිට්ඨාන හාරය.**

**ඒකත්තතාය ධම්මා යෙපිච වෙමත්තතාය නිද්දිට්ඨා**
**තෙන විකප්පයි තබ්බා එසො හාරො අධිට්ඨානො.**

සූත්‍රයෙහි සාමාන්‍යයයි වදාළ ධර්මයන් අවිකල්පනයකොට සාමාන්‍ය විශෙෂයන්ගේ ලක්ෂණ හෙයින් නිර්ධාරණයකොට අවබෝධ නොපාය හෝ අවබෝධය "අධිට්ඨානහාර" නෙත්තිය.

**පරික්ඛාර හාරය.**

**යෙ ධම්මා යං ධම්මං ජනයන්ති පච්චයා පරම්පරතො**
**හෙතුමවකඩ්ඪියිත්වා එසො හාරො පරික්ඛාරො.**

සූත්‍රාගත ධම්මයන් පරික්ඛාර සඞ්ඛ්‍යාත හෙතු ප්‍රත්‍යයන් විසින් නිර්ධාරණකොට අර්ථාවබොධ නොපායහෝ බොධය "පරික්ඛාරහාර" නෙතහානිය.

### ස මා රො ප න හා ර ය.

**යෙ ධම්මා යං මූලා යෙ චෙව කථිතා පකාසිතා මුනිනා**
**තෙ සමාරොපයි තබ්බා එස සමාරොපනො හාරො.**

සූත්‍රාගත ධර්මයන් පදට්ඨාන වෙවචන භාවනා පහාණ යන විසින් අර්ථ විචාරණ ලක්ෂණ අවබොධ නොපාය හෝ බොධය "සමාරොපන" නම් නෙතහානිය.

## සො ළ ස හා ර යි.

### න ය ප ඤ්ච ක ය.

**පඨමො නන්දියාවත්තො දුතියො ච තිපුක්ඛලො**
**සීහවික්කීළිතො නාම තතියො නය ලඤ්ඡකො.**

**දිසාලොචන මාහංසු චතුත්ථං නය මුත්තමං**
**පඤ්චමො අංකුසො නාම සබ්බෙ පඤ්ච නයාගතා.**

නන්දියාවත්තය තිපුක්ඛලය සීහ වික්කීළිතය දිසාවිලොචනය අංකුසය යන නමින් නය පඤ්චකයක් වේ.

### න න්දි යා ව ත්ත න ය.

**තණ්හඤ්ච අවිජ්ජඤ්ච සමථෙන විපස්සනාය යො නෙති**
**සච්චෙහි යොජයිත්වා අයං නයො නන්දියාවත්තො.**

නන්දියා අවිද්‍යාය වා පීතියා ආවත්තෙතා නන්දියාවත්තො නන්දියං (ජලජට්ටාය ආවට්ටාපිය නයො වා නන්දියාවත්තො) යි වුක්ත හෙයින් අවස්ථාවිවශයෙන් තෘෂ්ණා අවිද්‍යා දෙකින් සංක්ලෙශපක්ෂික සූත්‍රාර්ථයද, සමථ විදර්ශනාවයෙන් ව්‍යොදාන පාක්ෂික සූත්‍රාර්ථයද චතුරාර්‍ය්‍යසත්‍යයන් හා යුක්තකොට පරිඥණක්‍රමය නන්දියාවත්ත යි.

### ති පු ක් ඛ ල න ය.

**යො අකුසලෙ සමූලෙහි නෙති කුසලෙ ච කුසලමූලෙහි**
**භූතං තථං අවිතථං තිපුක්ඛලං තං නයං ආහු.**

තිපුච්ඡිය බලතීතිවා— තීහි ආකාරෙහි උපපුච්ඡතො බලන්ති, සුද්ධා සුද්ධභාවං උපනෙන්තීති තද්ධම්මතා තිපුක්ඛලො"යි" යුක්තාර්ථයෙන් ත්‍රිවිධ අකුසල මූලයන්ගෙන් සංක්ලෙශ පාක්ෂිකවූ සූත්‍රාර්ථයද— ත්‍රිවිධ කුසලමූලයන්ගෙන් වොදාන පාක්ෂිකවූ සූත්‍රාර්ථයද, චතුරාර්‍ය්‍යසත්‍යයන් හා යුක්තකොට අභිවිජානන න්‍යාය— තිපුක්ඛල නම්.

### සි හ වි ක්‍රී ඩි ත න්‍යා ය

**යො නෙති විපල්ලාසෙහි සංකිලෙ සින්ද්‍රියෙහි සද්ධම්මෙ**
**එතං නයං නයවිදූ සීහවික්කීළිතං ආහු**

සීහස්ස වික්කීළිතං සීහස්සවිය වික්කීළිතං අස්ස අත්ථීතිවා. සීහවික්කීළිතො=යි නිර්දිෂ්ටහෙයින්— සමාධිප්‍රඥ දෙකින්ද චතුර්විධ විපර්‍ය්‍යාසයන්ගෙන්ද සංක්ලෙශ පාක්ෂිකවූ සූත්‍රාර්ථයද ශ්‍රද්ධාදි ඉන්ද්‍රියන්ගෙන් වොදානපාක්ෂිකවූ සූත්‍රාර්ථයද පරිඥාතාර්ථයෙන් චතුරාර්‍ය්‍යසත්‍යය යුක්තකොට අභිවබොධ ලක්ෂණය— සීහවික්‍රීඩිතන්‍යාය.

### දිශාවිලොචන න්‍යාය.

**වෙය්‍යාකරණෙ සුත්තෙ කුසලා කුසලා භාගිං භාගිං වුත්තා**
**මනසා වොලොකයතෙ තං ඛු දිසාලොචනං ආහු.**

දිසාභාවෙන දිසති දිසනං අස්ස අත්ථීතිවා, දිසාලොචනො යී වුක්ත හෙයින්— කුශලාදි ධර්මයන් යථොක්ත න්‍යාය පරිදි මනසානුපශ්‍යිතව්‍යය— දිසා විලොචන— න්‍යාය.

### අ ං කු ශ න්‍යා ය.

**ඔලොකයිත්ව දිසා ලොචනෙන උක්ඛිපිය යං සමානෙති**
**සබ්බෙ කුසලා කුසලෙ අයං නයො අංකුසො නාම.**

අංකෙති අනෙනාති අංකුසො— අංකුසොවිය. අංකුසො=යි යුක්තාර්ථයෙන්— සමාධි ආදීන් උප නිශ්‍රයකොට— යථොක්ත— න්‍යාය ලක්ෂණයෙන් වුක්තාවිධි අභිවබොධනොපාය— අංකුසන්‍යාය නම්.

යථොක්ත දිශාලොචන අංකුශයන න්‍යායද්වය යථොක්ත— ත්‍රිවිධ න්‍යාය පරිඥාණෙ පසම්භ සාර්ථයෙන්, වුක්තයි— මෙව කීය.

ඉමෙසං පන තිණ්ණං නයානං සිද්ධාය වොහාර නය එය මෙව හොතී; ති,

## සා ස න ප ඨා න.

සාසන පට්ඨානයෙහි අටලොස් මූලපදකෙනෙකි. ඒ කිසේදයි, තණ්හා=අවිජ්ජා=ලොභො=දොසො=මොහො-සුභසඤ්ඤා,සුඛසඤ්ඤා නිච්චසඤ්ඤා. අත්තසඤ්ඤා'ති' කියනලද අකුසලපද නවයෙකි.

සමථො—විපස්සනා—අලොභො—අදොසො—අමොහො—අසුභසඤ්ඤා, දුක්ඛසඤ්ඤා, අනිච්චසඤ්ඤා-අනත්තසඤ්ඤා—යි, කියනලද-කුසලපදනවයෙකි. තදුභය පදවශයෙන් අටලොස් මූලපද දතයුතු.

යථොක්තයන් වශයෙන් — පට්ඨානයවේ. පභවතො— පකාරෙහිවා, සියතෙ තිට්ඨන්තිතිවා—පට්ඨානං, සාසියතෙ—සාසතිවා අනෙනාති—සාසනං, සාසනස්ස පට්ඨානං—සාසනපට්ඨානං—සාසනමෙව පට්ඨානං—සාසනපට්ඨානං කියාත්—ආචාර්‍ය්‍යී චුකහිති.

## සා ස න න ම

සංකිලෙස භාගියං සුත්තං, වාසනාභාගියං සුත්තං, නිබ්බෙධභාගියං සුත්තං, අසෙක්ඛභාගියං සුත්තං,සංකිලෙස වාසනා භාගියං සුත්තං, සංකිලෙස නිබ්බෙධ භාගියං සුත්තං, සංකිලෙස අසෙක්ඛභාගියං සුත්තං, සංකිලෙස නිබ්බෙධ අසෙක්ඛභාගියං සුත්තං, සංකිලෙස වාසනා නිබ්බෙධ භාගියං සුත්තං වාසනා නිබ්බෙධ භාගියං සුත්තං,, තණ්හා කිලෙස භාගියං සුත්තං දිට්ඨිසංකිලෙස භාගියං සුත්තං, දුච්චරිත සංකිලෙස භාගියං සුත්තං තණ්හා වොදාන භාගියං සුත්තං, දිට්ඨි වොදාන භාගියං සුත්තං,දුච්චරිත වොදාන භාගියං සුත්තං යනසොළස සුත්‍රයෝ—**සාසනයි**— කියනලද, සාසනපට්ඨානය, සංක්ෂිප්තනයින් සංග්‍රහිතය—

## ත දු දා හ ර ණ

**කාමන්ධා ජාලපච්ඡන්නා තණ්හාඡාදන ඡාදිතා**
**පමත්තා බන්ධුනා බද්ධා මච්ඡාව කුමිනාමුඛෙ=පෙ=**

යනාදි—සූත්‍ර-සංකිලෙශ භාගියනම්

**නාජීවිතො පසනනම්හි අප්පකානාම දක්ඛිණා**
**තථාගතෙවා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ**

යනාදි සූත්‍රාන්ත—වාසනා භාගිය නම්.

**කොධං ඡෙත්වා සුඛං සෙති කොධං ඡෙත්වා න සුජ්ඣති**
**කොධස්ස විස මූලස්ස මධුරග්ගස්ස බ්‍රාහ්මණ**

**අරියානපප සංසන්ති තංහිත්වාන නසොචති**
**කොධස්ස එක ධම්මස්ස වධං රොචෙමි බ්‍රාහ්මණ**

යනාදී සූත්‍රාන්ත—නිබ්බෙධභාගියනම්.

**යස්ස සෙලූපමං චිත්තං ඨිතං චිත්තංනානුකම්පති**
**විරත්තං රජනීයෙසු කොපනෙය්‍යෙ න කුප්පති**
**යස්සෙවං භාවිතං චිත්තං කුතො නං දුක්ඛමෙස්සති**

යනාදීහු-අසෙක්ඛ භාගියනම්

මෙසේ සෙසු උද්දෙසයන්ටද මිශ්‍රකවශයෙන් සූත්‍රොදාහරණ කර්තව්‍යයි— පූර්වෝක්ත අඨාරස පදයන් අර්ථකොට වෛනෙජනාධ්‍යාශයෙන් වදාළ ශාසනයන්ගේ පැවැත්ම සාසනපට්ඨානයි.

සංක්ෂෙප වශයෙන් දිනාහි නෙත්ති සමූහය 'සොළසහාරා-පංචනයා, වාදසපදා; නෙත්ති'සී'—පූර්වෝක්ත හෙයින්ත්‍රයත්‍රිංසද්විධයි එහිවාදසපදනම්—අක්ෂර—පද-ව්‍යංජන—නිරුක්ති-නිර්දෙශ—යන ව්‍යංජන පද ෂට්කය—සංකාසන—පකාසන—විවරණ—විභජන—උත්තානීකම්ම පඤ්ඤත්ති—යන අර්ථ පදෂට්කයදයි-මෙසේ වාදසපදයි සැදූහයම ව්‍යඤ්ජන අර්ථයයි වුක්තයි. මෙසේ සර්වඥ භාෂිතයාගේ ව්‍යඤ්ජනපදවිභාගහා අර්ථවිභාගලක්ෂණවශයෙන් අනෙකවිධකොට ධර්මාවබොධනයෙහි උපායදක්ෂවූවෝ නීරුප්පතොප දෙශ ඇති ත්‍රයත්‍රිංසත් නෙත්තිනය සඳලෝයි—**නෙත්ති නයයි.**

**ජිතමාරාදිකං—යනාදි** ගාථා නෙත්තිනය විසින් ගදනන්තරවැ විඥෙයයි. හේ මෙසේයි—

“වන්දිත්වා” යනුයෙහි-ශ්‍රද්ධාචෙතනාවද විඥප්තිවයද, “වක්ඛාමි” යනුයෙහි, විඥප්තිවය හා වාක්භෙද ශබ්දයද, සමාති වීථිඥාණයෝද, “සොතු ජනාන මජ්ඣාය” යනුයෙහි, සොතද්වාරික චිත්තොත්පාදයද සොතානුගත මනොවාරික චිත්තොත්පාදයද ශුද්ධමනොවාරික චිත්තොත්පාදයද යනමොනු සමාහි ප්‍රස්ථානයි —

යථොක්ත ශ්‍රද්ධාදි සහජාතයෝද තන්නිශ්‍රයෝද තදනුවර්තීයන්ට පැමිණියෝද යන සර්වරූප විපාක ක්‍රියා ව්‍යාකෘත සංඛ්‍යාත පඤ්චස්කන්ධයෝද රූප කුශලසඞ්ඛ්‍යාත පංචුපාදානස්කන්ධයෝද යන සියල්ල දුක්ඛසත්‍යය නොහොත්

චඤ්ඤිතා පටික්ඛාමිසි වුක්ත තෙමේද සොතු ජනානංයී—වුක්ත යතුදු මෙකී සියල්ල උපාදය ප්‍රඥප්තිය ඔහු පංචුපාදානස්කන්ධයගේ—දුක්ඛසත්‍යයි—"යො යොච සංහරිස්ස ගච්ඡන්ති වුත්තො සො සො උපාදය පඤ්ඤායන්තා තෙ පංචුපාදානක්ඛන්ධා දුක්ඛාසච්චංති" යී නිර්දිෂ්ට හෙයින් දුක්ඛ සත්‍යය ඵලයවේ- ඵලයද කාරණාක්ඛ්‍ය සමුදයෙන් විනා අභාව හෙයින් භවයට පූර්වකාරණාවූ තෘෂ්ණා අවිද්‍යාව නුදු ගෘහිතය. "තණ්හා සමුදයො භවෙ" යී වුක්ත හෙයින් ඒ තෘෂ්ණාතොමෝ සමුදය සත්‍යයි.

"අත්ථාය" යනුයෙන් අර්ථ විශෙෂයක්වූ සතරමාර්ගද ගෘහිතයි. "මග්ගා ලොකුත්තරො මග්ගො" සි වුක්තානුයි. හේ මාර්ග සත්‍යයි.

"**නිරොධං නාම නිබ්බානං**" යී හෙයින් "අත්ථාය" යනුයෙන්ම අර්ථ විශෙෂයක්වූ නිර්වාණය වක්තව්‍යයෙන් හේ නිරොධ සත්‍යයි.

මෙසේ පූර්වගාථායෙන් චතුරාර්ය සත්‍යය නිර්දිෂ්ටයි.

එහි දුක්ඛ සත්‍යය ආදීනවයි. මාර්ග නිරොධ මය නිස්සරණයි. අර්ථ විශෙෂවූ ඵල ධර්මශාන්තකෘත හෙයින් ඵලයි. ප්‍රණාමයෙන් විඝ්නාන්තරායීව ග්‍රන්ථ පරිසමාපනය හා තත් ශ්‍රවණාභියොගයද උපායයි. අර්ථයට මූලොප නිශ්‍රයවූ ප්‍රකරණයක් මයා විකීෂිතය තදුත්සාහ පරිශීලනය කර්තව්‍යයි යන ආචාර්යයන්ගේ අනුඥතය ආනත්තියි. යමක් අනිත්‍යද හේ දුකයි. හේ අනාත්මයි කියන්නෙන්. දුඃඛසත්‍යවූ ධර්මජාතය ක්ෂයාර්ථයෙන් අනිත්‍යය. භයාර්ථයෙන් දුකය. අසාරකාර්ථයෙන් අනාත්මය. මෙසේ පරිඥතව්‍යයි.

මෙම කීහ **නෙත්තාර්ථ සංග්‍රහයි**.

"භගවන්තො සාසනං පරිසුද්ධක්ඛමෙන ලක්ඛණාවබොධ පටිපත්තියා. සුසඞ්ඛත මුඛාදීහි ගිරාහෙ තබ්බානි,

අයමෙත්ථ දෙසනාහාරො පදෙසො—

**වි ච ය හා ර යෙ හි**

"පද පුච්ඡා, විස්සජ්ජනා, පුබ්බාපර, අනුගීති, අස්සාද, ආදීනව නි

සරණ, ඵල උපාය ආණත්ති" යි එකා දශාර්ථ නිද්ධාරණ කටයුතු යෙන් " ජෙතබ්බ මාරාදීකං භඤ්ජිතත්තා " " ජිතමාරාදිකං "

**සබ්බ** ධම්මෙ පටිවිද්ධත්තා "බුද්ධං" ති වුත්තං යනාදීන් **අනුපද** විචය කටයුතු—

මෙපරිදි කීහ—**අභිධර්මපිටක සංවර්ණනායෙහි**

ආරොග්‍යට්ඨෙන අනවජ්ජට්ඨෙන කුසල[illegible]න කුසලං,

**එසේම**

ජිතමාරාජිකං, යනු ස්‍යාද්‍යන්ත ත්‍යාද්‍යන්තයන් කෙරෙන්— ස්‍යාද්‍යන්තයි. නාමාඛ්‍යාතොපසර්ග නිපාතයන් කෙරෙන්- නාමයි. නාමනාම සර්වනාම සමාසනාම තද්ධිතනාම කිතකනාමයන් කෙරෙන් සමාසනාමයි.

අව්‍යයීභාව, ද්විගු, ද්වන්ද්ව, කර්මධාරය, තත්පුරුෂ, බහුව්‍රීහීන් කෙරෙන් බහුව්‍රීහියි—තත්ගුණ අතත්ගුණ සංවිඥාණයන් කෙරෙන් තත්ගුණ සංවිඥාණ බහුව්‍රීහියි- ඖපචාරිකය ලෛංගිකය නෛමිත්තිකය අධිත්‍ය සමුප්පන්නාය යන සතරින් නෛමිත්තිකයි. සාමාන්‍ය ගුණ කිත්තිම උප ප්‍රාපතිකයන් කෙරෙන් ගුණනාමයි. ක්‍රියා ගුණ ජාති ය දිජ්ඡිතයන් කෙරෙන් ගුණනාමයි. ජාති ගුණ ද්‍රව්‍ය නාම ක්‍රියා යි ශබ්ද පංචකයෙන් ගුණශබ්දයි. පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග නපුංසකලිඞ්ග ද්විලිඞ්ග ත්‍රිලිඞ්ග අලිඞ්ගයන් කෙරෙන් ත්‍රිලිඞ්ග පදයි. ස්වභාව ත්‍රිලිඞ්ගික වෛශෙෂ්‍යානුගත ත්‍රිලිඞ්ගිකයන් කෙරෙන් වෛශෙෂ්‍යානුගත ත්‍රිලිඞ්ගිකයි. ප්‍රථමා ද්විතීයා තෘතීයා චතුර්ථී පඤ්චමී ෂෂ්ඨී සප්තමීන් කෙරෙන් ද්විතීයාන්තයි. වචන විසින් ඒකවචනයි. සමාසාදී දශ වාචකයන් කෙරෙන් ද්විතීයා වාචකයි. කර්තෘකර්මාදි අෂ්ට වාච්‍යයන් කෙරෙන් කර්මවාච්‍යයි, යනාදීන් හෝ **අනුපද විචය** දතයුතු—

**පදාර්ථ විචය** වනාහි—ජිතමාරාදිකං 'යන මෙහි' ශීලසමාධ්‍යාදීන්ද දර්ශිතයි. එයින් ශීලයනම් විරති චෙතනා හා තත් සම්ප්‍රයුක්ත ධර්මය. එයිනුදු විරතිය පර්යාය ශීලයි. සෙසෙසා අපර්යාය ශීලයි සමාධිනම් ප්‍රථමධ්‍යානාදීනයි. ප්‍රඥානම්, මාර්ග ඵල විමුක්ති ආදීහුය. යනාදීන් පද පදාර්ථ වශයෙන් නිගමණනය දක්වා විචය කටයුතුය—

මෙපරිදි කීහ. **නෙත්ති අර්ථ කථායෙහි**

**"කිං විචිණති" පදං විචිණාති පදත්ථං** සංවණ්ණනා නයංච **තත් පදං විචිණන්තොති ආදිතො** පට්ඨාය යාව නිගමනා **සුත්තස්ස සබ්බපදං විචිණාතී"ති.**

## පුච්ඡාවිශෙෂයි.

පෘච්ඡාවද තදර්ථයෙන් එකවිධවූවද, පෘච්ඡිත ව්‍යාජියන්ගේ අනෙකත්වයෙන්-අදිට්ඨජෝතනා පුච්ඡා-දිට්ඨ සංසන්දනා පුච්ඡා-අනුමතිපුච්ඡා-විමතිච්ඡේදනා පුච්ඡා කථෙතු කාම්‍යතාපුච්ඡා යන භෙදපංචකයකින්. දෙශනාගතය—

## විසජ්ජනා

විසජ්ජනාව තදර්ථයෙන්, එකවිධය. විස්සජ්ජිතව්‍යයන්ගේ බහුත්වයෙන් එකංසබ්‍යාකරණීය විභජ්ජබ්‍යාකරණීය-පටිපුච්ඡාබ්‍යාකරණීය-ඨපනීය යන වශයෙන් චතුර්විධභාවය-දෙශනාගතයි.

තවද නිරූපනයෙන් පුච්ඡාවිචය මෙසේයි; ජිනමාරාදිකං බුද්ධං, යනාදිගය, විස්සජ්ජනයක්ද නොහොත්-ප්‍රශ්ණයෙක්දැයි-අනුයෝගීනට-විස්සජ්ජනයයි කියයුතු—තල්ලක්ෂණ කීහ

**යස්මිං සන්දෙසිතෙ ච අත්ථෙ විසජ්ජනෙ සති-**
**පඤ්හානුබන්ධා සබ්බා පුච්ඡා නාම විභාවිතා,යි"** එහෙයින්

විස්සජ්ජනය-ඵලයවෙයි පෘච්ඡා,හෙතුයි-ඵලදැයි භූතවිස්සජ්ජනාව, හේතුභූත පෘච්ඡායෙන්-අවෙනස් හෙයින්, හේතුභූත පෘච්ඡාව උද්ධරණය කටයුතුය-කෙසේයත්—

භවත් යසාචාර්‍ය්‍යයෙනි දුෂ්චත්තු—කාත්‍යායන භෙදප්‍රකරණයකර නානුය. තදදිගෙනි රත්නත්‍රය ගුණදීපික, කෙබඳු ගාථාවක් කිය විද-නනු පෘච්ඡායි—මෙම ගාථාවිශෙෂය නොදන්න පුලුවුත්හෙත් අදෘ අටද්‍යොතනා-පෘච්ඡායි—

**ජිනමාරාදිකං** බුද්ධං, යනාදිවූ ගාථායි, යනු විස්සජ්ජනායි. යථො කත විස්සජ්ජනයෙහිලා—බුද්ධගු හුදෙක් පචමාරයන්ම දිනුවෝ නොවෙති-ආලවක සච්චක අංගුලිමාලාදීනුත් දිනුවෝමයයි—ආදි ක්‍රමයෙන්, රත්නත්‍රය ගුණබෙද සාභිශය ගුණදීපකවූ මෙවැනි ගාථාවක් දක්වමුයි. විස්සජ්ජනය කළයුතු ගාථාහෙයින්-විභජ්ජබ්‍යාකරණීය-නම්වේ-සෙසු පෘච්ඡාවිස්සජ්ජනාවෝද මෙමනයින් අවගන්තව්‍යයි-

## පුබ්බාපරවිචය.

වණ්ණිතා, යන ශුද්ධාඛ්‍යාතනා ක්‍රියාපටිපාණ වාචක කිතකපදවූ පූර්වවචනය-පච්ඡාබාම්, යන, සංඥානි-ඛියාඛ්‍යාණ—ක්‍රියාපටිපාණ වාචකවූ

ආඛ්‍යාත අපරවචනයහා සමවෙයි-යනාදීන්, පූර්‍වාපර, පදසම්බන්‍ධාපෙක්‍ෂණය-සම්පදයත්හිනිඃක්‍ෂෙපකොට දක්කයුතු මේ පුබ්බාපරවච යොපදෙශයි—

### අ නු ගී ති වි ව ය.

අනුගීතිවිවය නම්, සංග්‍රහගාථාය—හෝ උද්දානාර්ථගාථාය—අනුක්‍රානාර්ථගාථාය-තදුභයාර්ථගාථායි, ත්‍රිවිධය, "ජිතමාරාදිකං, යනාදි ගාථායෙහි-කච්චායනස්සභෙදං, යනපදය සංස්කරණයාගේ විභාග වශයෙන් වුක්තනුයි-තදපදෙශ ලෙසයෙන්- මේ ගාථාතොමෝ අවුක්තාර්ථගාථානම්-මෙමනයින් අනුගීතියි,

### අ ස්සා ද ය.

සුඛවෙදනා-සෞමනස්‍ය වෙදනා—ඉෂ්ටාලම්බන යන වශයෙන් අනෙකවිධය, සුඛවෙදනාද, ගෙහසිත නෙක්ඛම්ම සිතවශයෙන්ද, ඉෂ්ටාලම්බනය. රූපාදි වශයෙන්ද අනෙකවිධය—තෘෂ්ණාව, අට ලොස් තෘෂ්ණා චරිත ස්ථානවශයෙන් බහුවිධය විපල්ලාසය—චාශ ෂට්දෘෂ්ටි වශයෙන් අනෙකවිධය. තත් භෙදහෙසින් අස්වාදභෙද දක්කයුතු—

### ආ දී න ව ය.

ත්‍රිවිධවූම, වෙදනා, දුඃඛය, හෝ, ත්‍රිගුම්මක වෘතය-හෝ-ජාත්‍යාදින් පරිවෘත්තනෘ යනාදීන්-ත්‍රෛභූමික සංස්කාරයන් දෙෂමුත් සැපෙක් නැතැයි සෙවිම දක්කයුතු—

### නි ස්ස ර ණ ය.

කායානු සතිපට්ඨානය වඩාලත් මාර්ග්‍ය-යනාදී චතුර්විධ භෙදයද සවුපාදිශෙෂ නිර්වාණය-අනුපාදිශෙෂ නිර්වාණයද-යන භෙදයෙන් අනෙකවිධය—

### ඵ ල ය.

සුතමයඥාණ චින්තාමය ඥාණය යනාදීවශයෙන් අනෙකවිධය—

### උ පා ය.

සතිපට්ඨාන සම්මප්පධාන දඬාභිඥාදී වශයෙන් අනෙකාවිධය—

### ආ ණ ත්ති ය.

දන්දෙව සිල්රකුව යනාදීන් විධානය ආනත්තියි මෙමැ ගාථායෙහි ආස්වාදදීත්ට--උදාහරණ—සුදුසුපරිදි දතයුතු—

අ ය මෙ ත්ථ වි ච ය හා රෝ ප දෙ සො

### යු ත්ති හා ර ය.

සර්ව ග්‍රන්ථකාරකයෝ ග්‍රන්ථාරම්භයෙහි ප්‍රණාමාභිවාද පූර්වකව, කරණ ශිල්පුය-එයි ප්‍රණාමය ආත්මහිත පරහිත සාධකය "ජිතමාරාදිකා බුද්ධං" ආදි සතුභිප්‍රණාම කරණය යෝග්‍යයි, සම්‍යග්දෘෂ්ටිකයන් රත්නත්‍රයම නමස්කාරකරණ ශීලීත්වයෙන් 'බුද්ධං ධම්මං සඞ්ඝං' යනුද, යෝග්‍යයි, ශීල සමාධ්‍යාදි ගුණාභිරික්ත බැවින් බුදුනට 'ජිතමාරාදිකං' යි, විශෙෂනය යොග්‍යයි-මෙසේ සුදුසුපරිද්දෙන් යුක්ති හාරයද, තත්ප්‍රතිපක්ෂයෙන් අයුක්තිහාරයද, නිර්ධාරිතව්‍යයි—

### අ ය මෙ ත් ථ යු ත්ති හා ර නි ද්ධා රො ප දෙ සො
### ප ද ට්ඨා න හා ර ය.

බුද්ධ ධම්ම සඞ්ඝ යන ප්‍රණාමණීය වස්තූන් වන්දනය අර්ථවේද, ධර්මවෙදදිව්‍යගුණ පරිසමාපනයට ආසන්න කාරණයි-පර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සංඛ්‍යාත ධර්මයන් ජානනාභියොගයතෙම, යථාක්‍රමයෙන්, පාලෲාර්ථාව බොධයටද, පදස්ථානයි. "ජිතමාරාදිකං" යන මෙයින් භාග්‍යවත්හුගේ, ශීලසමාධි මහාකරුණා සර්වඥතාඥානාදිගුණ දර්ශිතය. තද්ගුණයෝ වන්දන සංඛ්‍යාත ශ්‍රද්ධාචෙතනාවට පදස්ථානය, හේඅන්තරාය විධ්වංසනයට, ආසන්නකාරණයි. එහි, කච්චායනහෙද ග්‍රන්ථ සාධනයට ආසන්නකාරණයි, මේක්‍රමයෙන් සෙසුපදයන්හිදු, පදට්ඨානයන් නිර්ධාරණය කටයුතු—

### අයමෙත්ථ පදට්ඨානහාර නිද්ධාරොපදෙසො
### ල ක්ඛ ණ හා ර ය.

කිච්ච-හෙතුඵල ආරම්මනාදීන් වශයෙන් සාමාන්‍ය ධර්මයි, ජිතමාරාදිකං, යනමෙහි ශීලසමාධි කරුණාදිධර්මයෝ ධර්මායතනයයි ධර්මායතන ග්‍රහණයෙන්-අවශෙෂ බාහිරායතනයන්ද ගෘහීතයි. බාහිරායතන භාවයෙන් එක ලක්ෂණහෙයිනි—

ශීලසමාධි සම්ප්‍රයුක්ත විඥනය මනායතනයයි-තද්ග්‍රහණය ඇති කල තදවශෙෂ ආධ්‍යාත්මික ෂඩායතනද ගැණෙත්-ආධ්‍යාත්මිකායතනත්වයෙන් සමානහෙයිනි—

ශීල සමාධ්‍යාදීහු සංස්කාරස්කන්ධය තද්ග්‍රහණයෙන් තත්සම්ප්‍රයුක්ත අරූපස්කන්ධත්‍රයද-තත්සමුට්ඨාපිතවූද නිශ්‍රයවූද රූපස්කන්ධයදූයි, මේ ස්කන්ධ පචකය ගන්නාලද්දේවෙයි—

මෙසේ ඉන්ද්‍රිය ධාතුවශයෙන්ද සමාන ලාක්ෂණික ධර්මයෝ යථායෝග්‍යයන් නිර්ධාරකළයුතුයැ-සෙසු පදයන්හිදු-මෙමැනයයි—

## අ ය මෙ ව ල ක්ඛ ණ හා රෝ ප දේ සෝ
## ච තු බ්‍යූ හ හා ර ය.

නිරුක්තිය-අභිප්‍රාය-දේශනානිදානය-පූර්වාපරසන්ධිය. යන චතුරා ර්ථයන් විභාවන ලක්ෂණයි, එහි-නිරුක්තිනම් පදයන්හි නිර්වචන දක්වීමයි. අභිප්‍රායනම්, දේශකයන්ගේ අභිප්‍රාය දක්වීමයි. දේශනා නිදානනම්—දේශනා ප්‍රාදුර්භාවයට හෙතුවූවස්තු නිර්දේශයයි—පූර්වාපරා නුසන්ධිය වනාහි-අර්ථසන්ධි ව්‍යඤ්ජනසන්ධි දේශනාසන්ධි නිර්දේශස න්ධි යනාසන්ධි චතුෂ්කයකින් යුක්තය. එහි අර්ථසන්ධිනම්, ශබ්දාර්ථ පදයි-ව්‍යඤ්ජන සන්ධිනම්, සව්‍යඤ්ජනපදයි—දේශනා සන්ධිනම්, අන්‍යදේශනාවක් සම්පාදනය කිරීමයි-නිර්දේශ සන්ධිනම්, පූර්වනිර්දේ ශයකින් අපරනිර්දේශයක් සංසන්දනය කිරීමයි-

ජිතමාරාදිකං යනාදියෙහි මෙසේ දතයුතු—

### නි රු ක්ති.

ජිතාමාරාදයො යෙනසො-ජිතමාරාදිකො-තං-බුජ්ඣතීති-බුද්ධො තංබුද්ධං මෙආදීනයින්-සෙසුපදයන්හිදු නිර්වචන කටයුතු—

### අ භි ප්‍රා ය.

අනන්තර විශේෂනවූ ආත්මාර්ථයද, වනතෘජන ප්‍රසාදජනනවූ පරාර්ථයද, යන උභයාර්ථයන්ගේ නිර්වෘතිය ඊප්සිතයෝ ග්‍රන්ථාදි යෙහි ප්‍රණාමයද කරන්නාහුය-සංසාරදුඃඛයෙන් මිදෙනු කැමැත් තෝ තද්ගුණ පොෂණයද, කරන්නාහුයයන ඡන්දයම මෙහිඅභිප්‍රායි

### නි දා න.

පෘච්ඡාවිචයෙහි උද්ධරණයකළ ප්‍රශ්ණයම මෙහි නිදානයි. නිදා නය, සාධාරණය, අසාධාරණයයි, ද්විවිධය, සාධාරණ නිදානනම්, අනන්තරාගෙහිලා, කාත්‍යායන භෙද ප්‍රකරණයෙන් සාමාන්‍ය ශික්ෂා දියයි, අසාධාරණ නිදානනම්-දුඃඛෞඝනිමග්න ශ්‍රොතෘජනතා නිම් තොත්පතන කරුණාවහා-තන්නිමිත්තවූ ශ්‍රොතෘජනතාවදවේ—

### අ නු ස න්ධි ය.

ජිතමාරාදිකං, බුද්ධං, යනු, සකලගුණවූ, විශෙෂනය-සකලගුණ වත් වූවිශෙෂ්‍යයකියා, අර්ථයොජනායි, බුද්ධං, වන්දිත්වා, යනු ආරම්මණ අනුක්ත කර්මකාරකය, හා ආරම්මණික අනුක්තකර්ම ක්‍රියායි, අර්ථයොජනායි, මෙසේ අන්වයදක්වා, ක්‍රියාකාරක පදවශයෙන්— නිර්ධාරණය, අර්ථසන්ධියි—

## පදත්ථ.

පදාර්ථයන්-පදන්තරාර්ථයනිලා, සංක්ෂෙප කිරීම පදසන්ධි නාමය,

## දෙශනා සන්ධි.

ජිතමාරාදිකං බුද්ධං වන්දිත්වා, මොහච්ඡිදං සකංධම්මමච, උත්තමං සඞ්ඝව වන්දිත්වා, යි යනුයෙන්, පූර්වාපරසන්ධිය කටයුතු—

අයමෙත්ථ චතුබ්‍යූහ හාරොපදෙසො

## ආවත්ත හාරය.

වන්දිත්වා, යන මෙයින්-ශ්‍රද්ධාපූර්වඞ්ගත චිත්තොත්පාදයක් දර්ශිතයි ඒ ප්‍රකරණ නිෂ්පාදනීය පිණිසද විදග්ධයන්ට ප්‍රසාදජනනයටද පදස්ථානයි, ඒ චිත්තොත්පාදයෙන් යොනි සොමනස්කාරාදි සම්පත්ද, තම්මූලක සකල කුශලභාගීය ධර්මයෝ—ආවර්තනවෙත්-අනාදරවන්දනයෙන් අයොනි සොමනස්කාරය හා ත්‍රිවිධවිපත්තීහුද, පහලවෙත්. ඒ ප්‍රකරණාහනාරාදියට ආසන්නයි—යනාදීන්—සර්වඅකුශලභාගීයෝ ආවර්තනවෙත්—මෙසේ සකල කුශලාකුශලයන් හා ලොකොත්තර ධර්මයන්ද, ආවර්ජිතකොට දතයුතුයි.

අයමෙත්ථ ආවත්තන හාරොපදෙසො

## විභත්ති හාරය.

සංක්ලෙශ වොදන ධර්මයන් සාධාරණ, අසාධාරණ, වශයෙන්ද, භූමිවශයෙන්ද, පදස්ථාන වශයෙන්ද, බෙදීම් ලක්ෂණයි, ජිතමාරාදිකං, යනමෙයින්, ශාස්තෲනුගේ අතිශය ගුණදර්ශිතයි. ශේ ශීලාදි වශයෙන් අනෙකවිධය "වන්දිත්වා" යනමෙහි භයලාභ කුලාචාරා ශ්‍රද්ධා පූර්වාඞ්ගමාදී අනෙකවිධ වන්දනා කෙරෙත්. ශ්‍රද්ධාපූර්වාඞ්ගම වන්දනායි 'බුද්ධං' යනමෙහි, බුද්ධබුද්ධ. පච්චෙකබුද්ධ. සාවකබුද්ධ. සුතබුද්ධ; යන චතුර්විධ කෙරෙන්, බුද්ධබුද්ධවූ, තථාගතයෝයි. 'ධම්මං' යනමෙහි, මාර්ගඵල නිර්වාණ පර්‍යාප්තිධර්මයි—සඞ්ඝං, යනමෙහි, අෂ්ටාර්‍ය්‍යසඞ්ඝසමූහයි යනාදීන් විභජනය කටයුතු—

අයමෙත්ථ විභත්ති හාරොපදෙසො

## පරිවත්තන හාරය.

වන්දිත්වා, යි රත්නත්‍රය ප්‍රණාමයෙන්, යථාප්‍රතිඥාතාර්ථයන් අභිනිෂ්පාදනයෙහි සාමර්ථ්‍යජනක වෙයි—මේ ප්‍රකරණයෙන්ද, පාලිප්‍රත්‍යර්ථාව බොධාදි බොහෝ ප්‍රයොජන වෙයි-ප්‍රවචනානුරූපකොට ප්‍රකරණකරණයෙන් තදුද්ග්‍රහ ධාරණාදි පරිශීලනයෙන්—ප්‍රතිසම්භිදාදි

අභිප්‍රාප්තිවශයෙන්—මානාතිමාන ගර්භාඩම්බරෝ පාරම්භාදීන් දුරීකරණයවෙයි, ශ්‍රීබුද්ධපාප්‍ර විරෝධයෙන් කෘතනාම් ශ්‍රොතෘජනතාවටද තමෙඩතුමයෙන් උපාරම්භාදීන් ජනකවෙයි යනාදීන් සුදුසුසේ—ආවත්තනයකොට දක්කයුතු—

අ ය මෙ ත් ප රි ව ත්ත න හා රො ප දෙ සො

**වෙවචන හාරය.**

“ජිතමාරාදිකං” ජයිතබ්බ අභාතකාදිකං, බුද්ධං දසබලං, සත්ථාරං, ධම්මං නවලොකුත්තරං-සුගතවචනං නිය්‍යාන පටිපදං, ‘සඞ්ඝං සුපටිපන්නං-පුඤ්ඤක්ඛෙත්තභූතං සමූහං යනාදි පරියාය වචනවශයෙන් සුදුසුසේ-දක්කයුතු—

අයමෙත්ථ වෙවචන හාරොපදෙසො

**පඤ්ඤත්ති හා ර ය.**

“ජිතමාරාදිකං” යන ශබ්දය, ශීලසමාධි සර්වඥගුණයන්ට උපනිබන්ධ ප්‍රඥප්තියක-ශීලසමාධ්‍යාදී වශයෙන්ද—චෛතසික චේතනා ශීල වශයෙන්ද, ධ්‍යාන කාමාවචරාදී වශයෙන්ද අනෙකවිධය— බුද්ධ—යන ශබ්දය, සර්වඥයන්හට ප්‍රතිලාභ ප්‍රඥප්තියක යනාදීන්— අනෙකවිධ ප්‍රඥප්තිභාවය යථාලක්ෂණයෙන් දක්කයුතු—

අ ය මෙ ත් ප ඤ්ඤ ත්ති හා රො ප දෙ සො

**ඔතරණ හාරය.**

“ජිතමරාදිකං” යනමෙහි, ශීලය-ශීලස්කන්ධයි—සමාධිය—සමාධිස්කන්ධයි යනාදී චාර වශයෙන් ඔතරණයද—

ශීලයන් කෙරෙහිනුදු—විරති චේතනාදීහු සංස්කාර ස්කන්ධය— තත්සම්ප්‍රයුක්ත වේදනා—වේදනාස්කන්ධය- සංඥා සංඥාස්කන්ධය— විඥාණ, විඥානස්කන්ධය—යනාදී ස්කන්ධ ඔතරණයද—

“චක්ඛුංචා” යන ශ්‍රද්ධාචේතනා ප්‍රසන්නවූ චිත්තොත්පාදයට-නිශ්‍රයවූ, චක්ෂුරූපය. තත්නිශ්‍රයවූ සතරමහා භූතයෝය—යනමොහු රූපස්කන්ධ ඔතරණය, යනාදීන් පටිච්චසමුප්පාදනය ඔතරණය වනපරිදි දක්කයුතු—

අයමෙත්ථ ඔතරණ හාරොපදෙසො

**සොධන හාරය.**

පදශුද්ධි, ආරම්භශුද්ධි විචාරණ ලක්ෂණවිසින්—මෙම ගාථායෙහි, යට කියනලද ලෙසින් චොදනා ඇතිකලැපරිහාරය පිණිසැ මෙය

වුත්තාශ යනු ආරම්භකුම්භී ජිතමාරාදිකං, යනාදීහු - පදශුද්ධිය පිණි සැවුත්තායි-ඊප්ෂිතාඃ සිඹියම පදශුද්ධියවෙයි-

අයමෙත්ථ සොධන හාරොපදෙසො ·

## අ ධි ට්ඨා න හා ර ය.

එකත්ත වෙමත්ත විචාරණ ලක්ෂණහෙයින් 'බුද්ධං' යනු සාධාරණහෙයින් එකත්තතායි, ජිතමාරාදිකං, යනු ශීලසමාධ්‍යාදිගු විශෙෂකහෙයින් වෙමත්තතායි, 'ධම්මං' යනු—ලෞකිකාදී අන්‍යධර්ම ප්‍රශඩගවන හෙයින්—එකත්තතාය "මොහවිද්ධංසකං" යනු විශෙෂකහෙයින්, වෙමත්තතායි, සඞ්ඝං යනු සමූහයට සාමාන්‍යත්වයෙන් එකත්තතාය-උත්තමං යනු, නානාගුණ විශිෂ්ට භාවයෙන්—වෙමත්තතාය, යනාදීන් දත්යුතු—එකත්ත නම් විශෙෂ්‍යයි. වෙමත්ත නම්, විශෙෂණයි, නොහොත්, එකත්ත නම්—සියල්ලට සම්බවය, වෙමත්ත නම්, අධිකබවය—

අ ය මෙ ත්ථ අ ධි ට්ඨා න හා රො ප දෙ සො

## ප රි ක්ඛා ර හා ර ය.

පරික්ඛාරයයි, කියනලද, හෙතුප්‍රත්‍ය දෙදෙනා නිර්ණය කටයුතුයෙන්-බීජය-අංකුරොත් පත්තියට අනන්‍ය සාධාරණත්වයෙන් හේතුවෙයි—පෘථුවිආදී, ආධාරොපකාර වස්තූන්-අංකුරාදීන්ටද, සාමාන්‍ය සාධාරණ—හේතුවෙයි, බීජය-වැනිවූහේතුව ප්‍රත්‍යනම, පෘථුව්‍යාදීන් සාදෘශ්‍යවූ-ඵලයහා ප්‍රධානනිතවූ හේතුව. කාරණප්‍රත්‍ය නාම ඵලයහා සමානවූව කාරණ හේතුයි-

"ජිතමාරාදිකං" යනමෙහි, ශීලාදීගුණ දර්ශිතයි, ඔවුන්කෙරෙන්, ශීලයට සාධාරණත්වයෙන්-හිරිඔතප් ආදීහු හේතුයි-අසාධාරණත්වයෙන්-ශ්‍රද්ධාවීර්‍ය්‍ය ප්‍රඥාදීහු හේතුයි. සතර සම්පත්ති, චන්‍ද්‍ර, සොනිසොමනස් කාරයෝ, කාරණයි මෙසේ සෙස්සන්ටද දත්යුතු—

අ ය මෙ ත්ථ ප රි ක්ඛා ර හා රො ප දෙ සො

## සමාරොපන හාරය.

පදට්ඨාන, වෙවචන, භාවනා, පහාණ, යනමොවුන්ට, ආරොපනය කොට, ප්‍රකාශකිරිම ලක්ෂණයි. වන්දිත්වා සි, වන්දනාවන්ගේ අවීයෙන්, කායවාග්මනඃ සුචරිත වශයෙන් ත්‍රිවිධ සුචරිතයෝ සම්භවෙත්; ඔව්හු පුණ්‍යාදි ශබ්දයන්ට පදස්ථානයි එයින් කායවාක් ශීල

ස්කන්ධයි, මනෝ සුචරිතයෙහි, අනභිධ්‍යා අව්‍යාපාදයන් සමාධිස්කන්ධයි, සම්‍යග්දෘෂ්ටිය, ප්‍රඥාස්කන්ධයි, ශීලසමාධිස්කන්ධයෝ සමථයි, ප්‍රඥාස්කන්ධය, විදර්ශනායි, සමථය රාගවිරාගයෙන්, චෙතොවිමුක්තියට පදස්ථානයි; විදර්ශනාව, අවිද්‍යා විරාගයෙහෝ, ප්‍රඥාවිමුක්තියට පදස්ථානයි. යොනිසොමනස්කාරාදීන් හේතුවෙන්, සම්‍යක්ප්‍රධානාදීන්හා සතිපට්ඨාන මාර්ගාදීහුද වඩන්; භාවනාශක්තියෙන් සර්වාකුසල ප්‍රහාණයවෙයි; තවද, සකස්ව ග්‍රන්ථනිර්මාණයෙන් තදුද්ග්‍රහණයෙන් පාලනයාවබෝධයට, පදස්ථානයි; එය සම්‍යක් ප්‍රතිපත්තියටද, පදස්ථානයි; ප්‍රතිපත්ත්‍යෙකදෙශ සමථය, වික්ඛම්භන ප්‍රහාණයි; විදර්ශනාව තදඞ්ගප්‍රහාණයි. තෙධතුවෙන් මාර්ගාධිගමයයි, එය සමුච්ඡේද ප්‍රහාණයි; එයින් සතරඵලයවේ, එය, ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණයි, නිර්වාණය නිස්සරණ ප්‍රහාණයි. සෙස්සැම මෙනයින් දක්කයුතු—

අ ය මෙ ඪ ස මා රො ප ත හා රො ප දෙ සො

මෙසේ සැකෙවින් සොලස හාරොපදෙසයි.

## නන්ද්‍යාවර්තනයය.

ජීතමාරාදිකං, යනමෙයින් ශීලස්කන්ධාදීන් දර්ශිතයි. ප්‍රහාය කවූ සමථවිදර්ශනා ග්‍රහණයෙන්, ප්‍රහාතව්‍යවූ තෘෂ්ණා අවිද්‍යාවෝ සමුදය සත්‍යයි.—

සමථවිදර්ශනාවෝ මාර්ගසත්‍යයි කාරණාහෙතුවූ සමුදයසත්‍ය ග්‍රහණයෙන්, ඵලයවූ දුඃඛසත්‍යද ගෘහිතයි.—

ආරම්මණික මාර්ගසත්‍යයාගේ ග්‍රහණයෙන්, ආලම්බනවූ නිරොධ සත්‍යයද ගෘහිතමැ, මෙසේ ප්‍රථමදිසා දක්විමෙන්, චෙතොවිමුක්තියද විනීය දිසායෙන් ප්‍රඥා විමුක්තියදවේ; නන්ද්‍යාවර්තනය භූමියි.—

## ත්‍රිපුක්ඛලනයය.

ජීතමාරාදිකං, යන මෙයින් වක්‍තාව්‍යවූ ශීල ප්‍රඥ සම්ප්‍රයුක්ත විජ්ඥානොත්පාදයෙහි විගත වශයෙන් අලොභාදි ත්‍රිවිධ කුසලමූල යන් ගැණීමෙන්, ප්‍රහාතව්‍යවූ ලොභාදි ත්‍රිවිධ අකුශලමූලය නුදු ගෘහිතයි තත්ග්‍රහණයෙහිලා ලොභ ද්වෙෂ මොහයන්හා එක්වසිටි අකුසලයි නුදුගෘහිතය, මෙහි ප්‍රථමවියිය තෘතීය දිශාහෙයින්, අප්‍රණිහිත විමොක්ෂ අනිමිත්ත විමොක්ෂ ශුන්‍යත විමොක්ෂයිනුදු දර්ශිතය ත්‍රිපුක්ඛලනයායයි.

## සිංහ වික්‍රීඩිත න්‍යාය.

ජිතමාරාදිකං—යනමෙයින්, යථොක්ත චිතෙතාත්පාදය ගැණීමෙන්, තත්කාරණවූ ප්‍රඥව ගෘහිතය: ප්‍රඥතොමෝ පඤ්ඤින්ද්‍රියයි. තත්ග්‍රහණයෙන් තදුපනිශ්‍රයවූ සද්ධින්ද්‍රියද; උස්සහණ ලක්ඛණවූ විරියින්ද්‍රියද අපිලාපන ලක්ඛණවූ සතින්ද්‍රියද; අවික්ෂෙප ලක්ෂණවූ, සමාධින්ද්‍රියද, ගනුලැබෙත්. තත්ග්‍රහණයෙහි සුභසුඛනිත්‍යාදි විපල්ලාසයිනුදු ගෘහිතයි. දිසාවිලොනයද යථොක්තනයින් දතයුතු—දිසාවිලොකන අංකුසයනවය. පූර්වොක්තනයන්ගේ සාධ්‍යාපකාරයෙන් වූක්තයි—එහෙයින් විසුංප්‍රයොග අව්වක්ෂිතයි

ප ච න යො ප දෙ ශ යි

## සාසනපට්ඨානය.

වන්දිත්වා, යනමෙහි-වාසනා භාගියත්වය ලැබේ. "මොහවිද්ධංසකං ධම්මං" යනමෙහි නිබ්බෙධභාගියත්ව අසෙක්ඛභාගියත්වයෝ ලැබෙත්, මීතිය ගාථායෙහි පචක්ඛාමි යනමෙහි වාසනාභාගියද "සොතුජනානාමඤ්ජාය' යනමෙහි නිබ්බෙධභාගිය අසෙක්ඛභාගියෝද ලැබෙත් මෙසේ ගාථාවය, ප්‍රත්‍යෙකක්තෙතභාගිය නම්වේ. ශාසන ප්‍රස්ථානොපදෙශයි——

## නෙ ත්ති න ය ස මා ප් ත ය.

## ස ං ව ණ්ණ නා න ය,

උල්ලිඞ්ගවුත්ති සම්බන්ධ, වසෙන තිවිධොනයො
උඩ්ඩංලිඞ්ග තථුල්ලිඞ්ගං, ඉතිනා සහිතං මතං—
උද්දෙසං ලිඞ්ගතථුලිඞ්ග, මිතිආචාරියා පරෙ
ලක්ඛණසති වුත්තිච, වුත්තිනයොච ගම්‍යතෙ—
අජ්ඣාහරිත්වා සම්බන්ධො, සම්බන්ධො ද්විවිධියතෙ
උදහරණ මෙතෙසං, පාකටංසබ්බ සොසියාඤ්ති

කියනලද වශයෙන්—උල්ලිඞ්ගනය, වුත්තිනය, සම්බන්ධනය, උල්ලිඞ්ගසම්බන්ධනය, වුත්තිසම්බන්ධනයයි පචභෙද ගෙයින්-' සෙට්ඨං ඉති පසත්ථතරං තිලොකමහිතං ඉති තිලොකෙන අභිපූජිතං" යනාදීවශයෙන් වණ්නියපදය උඩ්රණකොට වණ්ණනා කිරීම උල්ලිඞ්ගනයයිද—

"දයා මෙත්තා සිනෙහස්සභාවො සී" යනාදිවශයෙන් කාත්‍යායන ව්‍යක්තිමෙන් වණ්ණනීය පදය උද්ධරණය නොකොට්ම යථා

ස්ථානසපිතපද වණ්ණනාව ව්‍යාප්තිනයයිද—උත්තමඞ්ගඤ්ඤෙති සම්බන්ධොසිද—සොයං තිලොකමහිතං අග්ගං බුද්ධං අභිවන්දියඅමලං ධම්මච උත්තමංගනච අභිවන්දියාති, යොජනායී, කියාද, වණ්ණනීයපදයෙහි ඇත්තාවූද පදයන් සම්බන්ධකිරීම් වශයෙන් වණ්ණනාවද; ඉහිශබ්දයාගේලැබීමට හේතුපදයන්ගේ වශයෙන් වණ්ණනාවද සම්බන්ධනයයිකියාද; උත්තමංඉති, උඩවතමත්තා බුද්ධංඉති බුජ්ඣතීති බුද්ධො යනාදි වශයෙන් වණ්ණනීයපදයන් උධරණයකොට ඉහිශබ්ද ලාභහෙතුපද වශයෙන් වණ්ණනාව උල්ලිඞ්ග සම්බන්ධනයයිද.

වුච්චති අනෙනානිච්චනං, අරියනෙ ඤායතෙති අනෙපො යනාදීන් වණ්ණනීය පදයන් නිර්වචන වශයෙන්, ඉතිසම්බන්ධවද වණ්ණනාව වුත්තිසම්බන්ධනයයිද; යනහෙද විසින් පසෙයි.

පදවණ්ණනාය, අත්ථවණ්ණනාය, පදත්ථවණ්ණනාය, යනාදිවශයෙන්; අභිවන්දිත්වාති අභිවන්දිය, පුරිසොති පඨමෙකවචනං යනාදීන් පදුඩාරවණ්ණනාව, පදවණ්ණනායීද, ගණනානිසමුහො, පවත්තනයීති කථෙසි යනුවෙන් අත්ථාධාර වණ්ණනාව අත්ථවණ්ණනායයිද උත්තමංගඤ්ඤාති සම්බන්ධො, සොයං තිලොකමහිතං අග්ගං බුද්ධං අභිවන්දිය යනාදීන් අත්ථයන්ගේ, අනෙකානෙකපද සමාසයකොට ලිඞ්ගපදයන්ගේ වණ්ණනාව පදත්ථවණ්ණනායීද කියාහෝ ත්‍රිවිධවෙයි.

පදසංවණ්ණනාව වනාහි ලිඞ්ගපද විභත්තිපද පච්චයපද ධාතුපද යන වණ්ණනා වශයෙන්ද, ලිඞ්ගපදත්ථ විභත්තිපදත්ථ ප්‍රත්‍යයපදත්ථ ධාතුපදත්ථයන වණ්ණනාවශයෙන්ද අෂ්ටප්‍රකාරවෙයි.

සෙට්ඨන්ති පසත්ථතරං අස්ස ඉති තස්ස යනාදීන් උපසර්ගනිපාත නාමලිඞ්ගපද වශයෙන් වණ්ණනාව ලිඞ්ගපදවණ්ණනායයිද. පුරිසොති පඨමෙකවචනං පුරිසො තිට්ඨති, පුරිසෙ අභිවාදෙති යනාදීන් විභත්තිපද වශයෙන් වණ්ණනාව විභත්තිවණ්ණනායයිද, සෙය්‍යන්ති පසත්ථතරං යනාදී ප්‍රත්‍යයාධාර වශයෙන් වණ්ණනාව ප්‍රත්‍යයවණ්ණනායයිද.

වක්ඛාමීති, භාසිස්සාමි, ලභන්ති නිපච්චිද්ධන්ති, යනාදීන් ආඛ්‍යාත වශයෙන්; ධාත්වාධාර වණ්ණනාව ධාතුවණ්ණනායයිද, තිලොකමහිතන්ති තිලොකෙන පූජිතං, සෙය්‍යො සෙට්ඨොති පසත්ථතරො යනාදීන් සමාසතද්ධිත ලිඞ්ගපදත්ථ වශයෙන් වණ්ණනාව ලිඞ්ගපදත්ථ වණ්ණනායයිද.

කරිස්සන්ති කරිස්සාමි භාසිස්සන්ති භාසිස්සාමි යනාදීන් ආඛ්‍යාත විභත්තිවශයෙන් පදවණ්ණනාව විභත්තිපදත්ථ වණ්ණනායයිද,

ගච්ඡන්තානි ගච්ඡමානො මරන්තානි මරමානො යනාදීන් කිතකප්‍රත්‍යය වශයෙන් පදවර්ණනාව ප්‍රත්‍යයපදාර්ථ වර්ණනායයිද;

පුබොධුං ති සුට්ඨු ඤාතුං ජානන්තානි බුජ්ඣන්තා යනාදීන් කිතකධාතු ප්‍රත්‍යයවශයෙන් පදවර්ණනාව ධාතුපදාර්ථ වර්ණනායයිද කියනු ලැබේ.

අර්ථවර්ණනාවට නාගී, ලිඞ්ගාර්ථවර්ණනාය, විභක්ත්‍යාර්ථවර්ණනාවය, ප්‍රත්‍යයාර්ථ වර්ණනාය, ධාත්වර්ථවර්ණනාය, පදාර්ථවර්ණනාය, විභක්ති පදාර්ථවර්ණනාය, ප්‍රත්‍යයපදාර්ථවර්ණනාය, ධාතුපදාර්ථවර්ණනාය අභිධෙය පදාර්ථවර්ණනායයි නවභෙදයකි-අග්ගන්ති, උත්තමං, අමලන්ති, නිම්මලං, තෙනාති, කවචාතෙන යනාදී වශයෙන් උපසර්ගනිපාත. නාමලිඞ්ගපද වශයෙන්; අර්ථවර්ණනාව ලිඞ්ගාර්ථවර්ණනායයිද·

චක්ඛුඑතස්ස අත්ථීති චක්ඛුමා කරුණාය නියුත්තොති කාරුණිකො දක්ඛිණාය අරහන්ති දක්ඛිණෙය්‍යා යනාදීන් තද්ධිතප්‍රත්‍යයාර්ථ වශයෙන් වර්ණනාව ප්‍රත්‍යයාර්ථ වර්ණණායයිද.

පවත්තිස්සන්ති, උපපජ්ජිංසු, සම්පවත්තතීති, කථෙසි; යනාදීන් ආඛ්‍යාත ධාත්වර්ථවශයෙන්; වර්ණනාව ධාත්වර්ථවර්ණනායයිද.

ජිනෙරිත නයෙනාති, භගවතා දෙසිතනයෙන, උග්ගත තමත්තා උත්තමං, යනාදිවශයෙන්; සමාසතද්ධිත ලිඞ්ගපදාර්ථවර්ණනාව ලිඞ්ගපදාර්ථ වර්ණනායයිද.

සන්ධාවිස්සන්ති සංසරිං (සංසරංගිහො) ලභෙහි ලභිස්සාමියනාදීන් ආඛ්‍යාත විභක්ත්‍යර්ථ වර්ණනාව විභක්තිපදාර්ථවර්ණනායයිද

ධාරයමානො, ධාරෙන්තීති වා ධම්මො දස්සියමානො දස්සෙන්තා යනාදීන් කිතකප්‍රත්‍යයාර්ථවර්ණනාව, ප්‍රත්‍යය පදාර්ථවර්ණනායයිද.

කිරතීති, කරුණා පරදුක්ඛං නික්ඛිපති, අපනෙතීතිඅත්ථො, යනාදීන් කිතකධාතු ප්‍රත්‍යයාර්ථවශයෙන් වර්ණනා ධාතු පදාර්ථවර්ණනායයිද.

යථානුසිට්ඨං පටිපජ්ජමානෙ සත්තෙ චතුසු අපායෙසුච සංසාර වට්ටදුක්ඛෙච අපතමානෙ කත්වා ධාරෙතීති ධම්මො-පරියත්ති විසෙසො ධම්මො වණ්ණීයති අනෙනා එතායාති වණ්ණනා අට්ඨකථා යනාදීන් සකල පදාර්ථයාගේ වාචකවර්ණනාව අභිධෙයාර්ථ වර්ණනායයිද, කියනු ලැබේ. නාවද,

**සම්බන්ධො ච පදඤ්චෙව පදත්ථො පද විග්ගහො**
**චොදනා පරිහාරො ච ඡබ්බිධා පද වණ්ණනා,** යි පුව්සිත්

සම්බන්ධ පදවණ්ණනා පදවිභාග පදවණ්ණනා පදාර්ථසංවර්ණනා පද විග්‍රහ සංවර්ණනා චොදනා සංවර්ණනා පරිහාර සංවර්ණනායි ෂට් විධවෙයි.

## ව ණ්ණ නා න ය නි ම.

---

මෙසේ ප්‍රණාමගාථායෙහි-ග්‍රන්ථ ගරුදෙෂාපහරණයද, ප්‍රණාම ප්‍රයොජනද, ශබ්දනය නෛතිනය—සාවර්ණ්ණනානයොප දෙශද, දක්වා අනුපදවර්ණනාව පූර්වාපර ව්‍යාඛ්‍යානයානු සාරයෙන් මෙසේයි.

**ජිනමාරාදිකං,** යනාදී ගයින් වාක්ප්‍රණාමය—ආචාර්ය්‍යය සස්ථ විරයන් විසින් කියනලදී—තමෙඩතුවෙන් රත්නත්‍රය කෙරෙහි, තමා ගේ ප්‍රශාද ජනනයද-එය නුවනැති යන් ආරාධනාවටද, එය සව ග්‍රන්ථොද්ග්‍රහණයටද-එය වචනාර්ථාවබොධයටද-එයද දෘෂ්ටධර්ම සාම් පරායිකාර්ථ නිශ්පාදනයටදැයි මේ පරම්පර යොජනා සම්බන්ධනම්.

තමාවිසින් වූ කළ ප්‍රණාමයෙන්වැද. උද්ග්‍රහණාරබ්ධ ශොභාජන තාවගේද අන්තරාය විශොෂණය ‘ ප්‍රකරණ ප්‍රයොජන සම්බන්ධනම්’

අභිධෙය කරණප්‍රකාර ප්‍රකරණාභිධාන ප්‍රයොජන යනමොහු කුමටයයත් විදිතාභිධෙය ඇතිකුල පුත්‍රයන්ගේ උද්ග්‍රහණාර්ථය පිණිස අභිධෙය කථනයද උද්ග්‍රහණයෙහි උත්සාහවත්වනු පිණිස කරණ ප්‍රකරණයහා ප්‍රයොජන කථනයද ව්‍යවහාර පහසුපිණිස අභිධාන කථනයද වක්තව්‍යයි මේ හේතුඵල සම්බන්ධ පදවර්ණනා යි.

ජිනමාරාදිකං ඉති එකංපදං බුද්ධං ඉති එකංපදං ධම්මං ඉති මොහ විධංසකං ඉති-වන්දිත්වා-පෙ-සප්පයොගං, උත්තමං, සඞ්ඝං, කච්චාය නං, ච, වණ්ණිතන්ති එකං පදං—මෙසේ මේ ගාථාතොමෝ, එකා දස විභක්ත්‍යන්ත පදනම් වෙයි.

**කච්චායනාගතාන්**-එකංපදං, හෙදනානි-පෙ-අභනානි, සප්පයොගං යථාරහං, සොතු ජනානං, අත්ථාය, පවක්ඛාමි, සමාසතො, මෙසේ මේ ගාථාතොමො විභක්ත්‍යන්ත පදවිභාග විසින් නවපදනම්ය—

මෙසේ ඇඹිවිඥාපි තන්ත්‍රයෙන් එක ලක්ෂණිකවූද විභක්ත්‍යන්ත පදවිසින් විභාගවන්නි පදවිභාග සංවර්ණනායි.

ජිතමාරාදිකං බුද්ධඤ්ච මොහවිධංසකං ධම්මඤ්ච උත්තමං සඞ්ඝඤ්ච වණ්ණිතං කච්චායනඤ්ච වන්දිත්වා සොතුජ්ජනානං, අත්ථාය කච්චායනස්ස සප්පයොගං යථාරහං භෙදං සමාසතො අහං පවක්ඛාමීති, මේ පදාර්ථ ස මු දා ය වේ.

ජිතමාරාදිකං බුද්ධං වන්දිත්වා මොහ විධංසකං ධම්මං වන්දිත්වා, උත්තමං සඞ්ඝඤ්ච වන්දිත්වා වණ්ණිතං කච්චායනඤ්ච වන්දිත්වා සොතුජ්ජනානං අත්ථාය කච්චායනස්ස සප්පයොගං යථාරහං භෙදං සමාසතො අහං පවක්ඛාමීති හෝ මේසමුදායාර්ථය දතයුතු—මෙකී අර්ථව යමැ පාඨානුසාරී සම්බන්ධයයි කියනුලැබේ.

ජිතමාරාදිකං, අනවසෙසං අත්තනො නාවෙරං ජයන්ත චක්කවත්තිරාජාවිය, ජිතබ්බපඤ්චමාර-ආලවක-විසුච්මානවිකා සච්චකාදයො-විජයන්තං බුද්ධං-වන්දිත්වා, භයලොභකුල ආචාරවිරහෙන සක්කච්චං කායවචී මනොචාරෙහි, නමස්සිත්වා-මොහවිධංසකං, අසනිවක්කාදීහි භංගොවිය මොහ සාධාරණ සබ්බඅකුසල භංජකං-ධම්මඤ්ච, සපරියත්ති, නවලොකුත්තර ධම්මඤ්ච—උත්තමං, සබ්බජනෙසු විසිට්ඨපනෙනා රාජාවිය-සබ්බකල්‍යාණ පුථුජ්ජනෙසු සෙට්ඨං-සංඝංච—අට්ඨාරියපුග්ගල සමූහංච—වණ්ණිතං—චක්කවත්තිරාජෙන ථොමිත මහාසෙට්ඨිරතනංවිය—සම්මාසම්බුද්ධෙන ථොමිතං කච්චායනඤ්ච, මහාකච්චායනථෙරඤ්ච, වන්දිත්වා, භයාදිවිරහෙන කායාදිවාරෙහි නමස්සිත්වා, සොතුජ්ජනානං, සොතුජන සමූහානං, අත්ථාය, සග්ගමොක්ඛ පයොජනාය, කච්චායනස්ස කච්චායනපකරණස්ස, සප්පයොගං, සඋදාහරණං යථාරහං භෙදානුරූපං භෙද සද්දූපකාරං, සමාසතො, නාතිවිත්ථාර නාතිසංඛෙපවිසෙසත, අහං පවක්ඛාමි, භාසිස්සාමි සි මෙසේහෝ සබදි, මේ උපමා සම්බන්ධයයි කියනු ලැබේ—යථොක්ත උපමා සම්බන්ධයෙහිලා, කියනලද 'ජිතමාරාදිකං' යනාදී විශෙෂ්‍ය පදයන්ගේ විශෙෂණවූ උපමා වර්ණනා පදයන් ආදියෙහිලා තදනන්තරවැ එය එසේම තෙඩතුවිසින් ලක්ෂිතව්‍ය ජිතමාරාදිකං යනාදිහු හේතුසම්බන්ධ නම, අනවසෙසං වෙරං ජයනෙතා චක්කවත්තිරාජාවිය, ජිතබ්බ පඤ්චමාර ආලවක විචමානවිකා සච්චකාදයො ජයන්තන්තා; ජිතමාරාදිකං යනාදි පදයන්ට වර්ණනීයවූ-උපමාහා හේතුන්ද ආදියෙහි දක්වා තදනන්තරවැ පදාර්ථසම්බන්ධ ය එනය උපමාහේතු සම්බන්ධනම

**එ සි න් කි හ.**

**පාඨානුසාරී සම්බන්ධො—සම්බන්ධො උපමාසම**
**හෙතුනාපිච සම්බන්ධො—උපමාහෙතු නාපිච**
**සම්බන්ධභෙද විඤ්ඤෙය්‍යා-චතුර්ධාති විභාවිනා-ති.**

අථ්‍ය වනාහි-එකාභිධාන එකාර්ථය, එකාභිධාන නානාර්ථය, නානාභිධාන නානාර්ථය, නානාභිධාන එකාර්ථය යනභෙද චතුෂ්කයෙකින් –ඉත්ථි, පුරිස, යනාදීහු ඒකනාමයකින් එකනාම යක්ම ගම්‍යමාන හෙයින් එකාභිධාන එකාර්ථයයිද෴

බුද්ධ, ධම්ම, සඞ්ඝ, යනාදීහු එකනාමවුවද නානාර්ථයන් වාචක හෙයින්, එකාභිධාන නානාර්ථයයිද, කුසලාරූපං චක්ඛුං යනාදීහු නොයෙක් නොයෙක් නාමද, නානානාමහා නානාර්ථද වාචකහෙයින්-නානාභිධාන නානාර්ථයයිද සක්ක පුරින්දද යනාදීහු නානා නාමවුවද එකමඅර්ථයක් වාචකහෙයින් නානාභිධාන එකාර්ථයයිද, කියනලදී-එයින් කීහ෴.

**එකාභිධානො එකත්ථො එකාභිධානො නානත්ථො**
**නානාභිධානො නානත්ථො නානාභිධානො එකත්ථො**
**ඉමෙසං පන භෙදානං වසෙනවත්ථු ධාමතානි෴**

**ජිනමාරාදිකං**-යනු බුද්ධංයන මෙයට, තුල්‍යාධිකරණ විශෙෂණයි බුද්ධං, යනු වන්දිත්වායි, පූර්වක්‍රියාවට, කර්මනිර්දේශයි, ධම්මං, යනු කර්මනිර්දේශයි, මොහවිධංසකං යනු තත්තුල්‍යාධිකරණ විශෙෂණයි **සඞ්ඝං** යනු කර්මනිර්දේශයි—වණ්ණිතං යනු, **කච්චායනං** යන්නෙහි තුල්‍යාධිකරණ විශෙෂණයි කච්චායනං යනු කර්මනිර්දේශය, ච යනු සමුච්චයාර්ථ නිර්දේශය, කච්චායනස්ස, යනු භෙදයන්නෙහි සම්බන්ධ ෂෂ්ඨිනිර්දේශයි—භෙදං යනු. අපර ක්‍රියායෙහි කර්මාර්ථ නිර්දේශයි, අහංයනු කර්තෘ නිර්දේශයි—සප්පයොගං යනුද—යථාරහංයනුද—භෙදං යන්නෙහි තුල්‍යාධිකරණ විශෙෂණයි (යථාරහං යනු, භාවනපුංසක නිර්දේශයයිද යෙත්) සොතුජනානං යනු, අත්ථාය, යන්නෙහි සම්බන්ධ ෂෂ්ඨිනිර්දේශයි, අත්ථායයනු, සම්ප්‍රදාන නිර්දේශයි, පවක්ඛාමියනු-අපරක්‍රියානම් ආඛ්‍යාතක්‍රියා නිර්දේශයි- සමාසතොයනු ක්‍රියාවිශෙෂණ නිර්දේශයි-යනු අනෙකවෘත්ති ගාථාහෙයින් සන්දිශ පදයි "**යුජෝශ්චතුර්ථතොජෙන පථ්‍යාවක්ත්‍රම් ප්‍රකීර්තිතම්**"

යුබැවින් පථ්‍යාවක්ත්‍රනම්-ප්‍රස්තාරාදීන් විසින් විස්තරකරන් ග්‍රන්ථගිරුකානු ග්‍රහයෙන්-උපෙක්ෂිතයි.

මෙහි-බුද්ධං, ධම්මං, සඞ්ඝං, කච්චායනං, යනපද චතුෂ්කය-වන්දිත්වා යන ක්‍රියාවට කර්මනුයි-' එකාසත්ති එකාකිරියා නානාසත්ති නානාකිරියා යි, සූත්‍රහෙයින් එකක්‍රියාවට නානාකර්ම කෙසේ යෙදේද යත්-ක්‍රියාමධ්‍යදීපක න්‍යාය හෙයිනැයි කියයුතුයි෴

දීපකනම්,

**ආදි මජ්ඣන්තවසා—දීපකං තිවිධං මතං**
**අකාසි අත්තනො අත්ථං—පරත්ථංපිච සොත්ථිතො—යථා**

මෙහි අකාසි, යන ක්‍රියාව-ගාථාදියෙහි සිට-අත්තනො අත්ථං පරත්ථං යන උභයාර්ථ දක්වනහෙයින්-මේ ආදි-**දීපකයයිද.-**

**සාධූනං දස්සනං හොති අමතං සෙව කෙවලං**
**අසාධූනන්තු දස්සනං විසංසෙව ධුවං මුනි,** යනමෙහි-

හොති-යන ක්‍රියාව-ගාථා මධ්‍යයෙහි සිට, දස්සනං අමතං දස්සනං විසං යන උභයාර්ථයම දක්වන බැවින්—**මධ්‍යදීපකයයිද.-**

**අභිරූපයිං අතිසොභං ජුතිවදනංච පුණ්ණමං**
**පස්සන්තානන්තු සත්තානං මුඛංසබ්බත්ථ භාසතං.-**

යනමෙහි-භාසති, යන ක්‍රියාව අන්තයෙහිසිට-මුඛං-මුණිවදනං-පුණ්ණිමං—යන සර්වාර්ථයන්-ප්‍රකාශකරණ හෙයින් **අන්තදීපකය** යයිද-යනමෙහෙදත්‍රයකින් ප්‍රදීපනය කීහු-ජාතිගුණ ද්‍රව්‍යයෙනුදු-ආදිමධ්‍යාන්ත-දීපකනය-මෙමැ ක්‍රියාදීපක ප්‍රයොගමෙනි.-

**- එසිප්කිහ -**

**දීපකනම්වෙද ක්‍රිය ගුණවත් දක්වා**
**ශිව්කවමුලුතෙපලනව වහල් වදනෙක් ගිමෙජ්**

කච්චායනයෙහි—යනතත්හි-(ච) ශබ්දය—උපන්‍යාශය සමුච්චය යන විවිධාර්ථයන් කෙරෙන්-සමුච්චය වාචකය-එසිප්කිහ.-

**උපඤ්ඤාසො සමුච්චයො විකප්පෙත්ථ විධාමතා**
**උපඤ්ඤාසො නාමවාක්‍යා රම්භොවුච්චති විඤ්ඤුනා-යිද**

වාක්‍යාරම්භ, කාරණ, ඵල, විශෙෂන, ප්‍රකටීකරණ දල්හිකරණ පක්ෂාන්තර, අන්වය, ව්‍යතිරෙකයන අර්ථාන්තරයන්හිදු, චන්නෙන් දෙවයි; නිදීදිනටමැයි.

**වාක්‍යාරම්භෙ ඵලෙචෙව කාරණෙච විසෙසනෙ**
**පාකට් කාරණෙචෙව දල්හියම්පි පක්ඛන්තරෙ**
**අන්වයෙබ්‍යති රෙකෙච චසද්දොපි පවත්තති-යිද**

නිසෙසා ඵුසෙසා 'ච' ගච්ඡති යනාදියෙහි, පද සමුච්චයද, ධම්මං සඞ්ඝංච, යනාදියෙහි, වාක්‍ය සමුච්චයද; **ථෙරො ච, දහරො ච,** පි

ණ්ඩාය චරති යනාදියෙහි, වුත්තසමුච්චයද; නො 'ච' චාදිතො න මිහි, යනාදියෙහි, අවුත්ත සමුච්චයද ආදිතොඹ ච, යනාදියෙහි වුත්තාවුත්ත සමුච්චයද යන පචවිධභෙද හෙයින්-වාක්‍යාරම්භ-වුත්ත සමුච්චයාර්ථයන වයෙයෙදයි.

### එ සි න් කි හ

**පදවාක්‍ය වසෙනාපි සමුච්චයො ද්විධාමතො**
**වුත්තාවුත්ත මුභිතනාන වසෙනාපි තිධාමත**

———

“**සමාසතො**” යනු ක්‍රියාවිශෙෂන පදය එහි ඔදනො මුදුභවති යනාදියෙහි-ප්‍රථමාන්තයෙන්ද සුඛදුඹදනං මුදුං පචති යනාදියෙහි විතියානතයෙන්ද එකාහෙන එවපායාසි යනාදියෙහි-තෘතියානත යෙන්ද සීසස්ස උක්ඛිපනං යනාදියෙහි-ෂෂ්ඨ්‍යානතයෙන්ද දක්වන් මෙහි එනාහි විශෙෂනාර්ථයෙහි ෂෂ්ඨ්‍යානතායි.

### එසින් කිහ

**අබ්හිධා ද්විධාහොති පඨමා දුතියාවසා**
**සකම්මකාය දුතියා අකම්මකාපඨ මාමතා**
**අසම්හරස භාවතනා කස්සුතො නච කාරණා**
**භවෙතෙනෙව විසද්දෑගි නාතිසංනම්පිඥවජිතං**
**ජට්ඨනන මපරොධාතු විසෙසන මහාවයො**
**එකාහෙනෙව පායාසි සිසසුඛබි සනංතිම**
**ක්‍රියා විශෙෂනංයාව නංසබ්බංහි නපුංසකො**
**හියාව එකවචනං යථාගිඛබු සුඛං සිතා**
**ක්‍රියා විසෙසනං සභෙඪ වුත්තං ධාතු විසෙසනං**
**භාවනපුංසකංඑව සාසනෙ සමුදීරිතං යි.**

**කියනලද ලක්ෂණහෙයින්**- සමාසතොයනු, ෂෂ්ටිවිභක්ත්‍යක චවනානන භාවනපුංසක නිර්දේශයි-**පදාර්ථ සංවර්ණනායි.**

### පදවිග්‍රහ සංවර්ණනා වනාහි

ජෙතබ්බො, ජිතො, මරතිවජතීති, මාරො, ජිතොවසො. මාරො චාති, ජිතමාරො, නොහොත්-ජෙතබ්බාති ජිතා දනතලද්දනුයි ජිත නම්. මරනතීති මාරා, මරත්නුයි මාරනම්. ජිතාවතෙ මාරාවෙනි **ජිතමාරා, නම්. දෙවපුත්‍ර, කෙලෂ අභිසංස්කාර මෘත්‍යු, ස්කන්ධසඞ්ඛ්‍යාත පචමාරයෝයි.**

ආදියති, සමුද්‍රයො එතෙහිති, ආදයො, ආලවක සච්චකාදීහුයි. ජිනමාරා ආදයො යෙසංතෙ, ජිතමාරාදයො. තෙයස්ස අත්‍ථීති-ජිතමාරාදිකො, නොහොත්, අජිසිතඑජෙතබ්බාහිවා, ජිතා පචමාර ආලවකාදීහුය. මාරා ආදියෙසංතෙ මාරාදයො, ජිතාමාරාදයො යෙහතෙසා, ජිතමාරාදිකො, සමාසනානයෙහි කප්‍රත්‍යය වගයෙන්; නිද්දිෂටයි. භගවත්හු, පචවිධමාරාදීන් දිනූහෙයින්, ජිතමාරාදික නම්හූයෙත්.

## පස්මරගු නම්

**දෙවපුතෙතා කිලෙසොච අභිසංඛාර නාමකො**
**ඛන්ධමාරො මච්චුමාරො මාරාපච පකා සිතා, යි.**

සබ්බ ධම්මෙ, බුජ්ඣතීති, බුද්ධො-යනුයෙන්; සර්‍වඥතාඥණ සමං ගීහුද සයම්භූ සංඛාතෙන මග්‍ගඥණෙන බුජ්ඣතී 'ති, බුද්ධො යනුයෙන්; අභීන්මාගී සමගීහුද-සයම්භූඥාණ සඞ්ඛාතෙන අරහත්ත මග්‍ගෙන සබ්බධම්මෙ අබුජ්ඣිති—බුද්ධො යනුයෙන් අභීත් ඵලසථයොද. චත්තාරි සච්චානි බුජ්ඣතීති, බුද්ධො යනුයෙන්; අභීන් මාගීසථයොද. චත්තාරි සච්චානි අබුජ්ඣිති, බුද්ධො, යනුයෙන්; අභීත් ඵලසථයොද, චත්තාරි සච්චානි, බුජ්ඣිස්සතීති බුද්ධො, යනු යෙන් සොවාන් සැදෑගැමි අනාගාමි-මාගී ඵලසථයොද. කියනු ලබ නාහෙයින්; මෙහි අභීත් ඵලසථ වාචකය යෙදේ. විග්‍රහය

ධාතු විග්‍රහය- ධාත්වර්ථ විග්‍රහය, සපද විග්‍රහය, අසපද විග්‍රහයයි- චාතුර්විධවේ. චත්තාරි සච්චානි බුජ්ඣතීති බුද්ධො, යනුයෙන්; වාක්‍යයෙහි ආඛ්‍යාත ප්‍රත්‍යයෙනුද්, සචධාතුවෙනුද්, අර්ථවාචකයන් යෙදූහෙයින් ධාතුවිග්‍රහයද සපද විග්‍රහයදවේ.

සබ්බධම්මෙ ජානාතීති බුද්ධො-යනුයෙන් වාක්‍යයෙහි ආඛ්‍යාත ක්‍රියාභා අන්‍යධාතුපදයන්ද, යෙදූයෙන් අසපද ධාත්වර්ථ විග්‍රහනම්. ව්‍යුත්පන්නය කෘදන්තවද, වාක්‍යය අඛ්‍යාත ක්‍රියායෙන්ද, පචතීති පාචකො යි විග්‍රහවනුයේ අසපද යයිද, ව්‍යුත්පන්න වාක්‍ය යනම යම පචනං පාකො යනුයෙන්-කෘදන්තමවූයේ සපද යයිද, බුද්ධං ඤණං අස්ස අත්‍ථීති බුද්ධො යි ප්‍රථමාන්තවූ ව්‍යුත්පන්නය සචපදාර්ථ ද්‍යොතකකොට නිර්වචන ශෙෂය, පදවත්‍තීකාන්ත යයිද; බුජ්ඣතීති බුද්ධො තං බුද්ධං යි විශෙෂ්‍ය පදාන්තරාපෙක්‍ෂායෙන් සපිහිය වාක්‍යා වත්‍තීකාන්තයයිද දතයුතු.

පදවාක්‍යාවත්ති කසාන වසෙන විග්ගහොද්විධා
පඨමෙනෙත්ථ විග්ගහො පදවත්තික මීරිතං
අත්ථංඅත්තානු රූපෙන නිප්ඵාදෙති යථායථා
වාක්‍යාවත්තික මාඛ්‍යාතං නාමසද්දෙහි භාසිතං

—— ⁜ ——

'බුද්ධ' ශබ්දය යථාලාභවශයෙන් නාම, ජාති, ද්‍රව්‍ය, ක්‍රියා ගුණ, වාචකබැවින්; මෙහි බුජ්ඣතීති බුද්ධො යි වනබැවින්, ක්‍රියාශබ්ද බොධන ක්‍රියාවස්ථායෙහිද, බුද්ධගුණ අවස්ථායෙහිද, බුද්ධජාති අවස්ථායෙහිද, තදාධාරවූ ලක්ෂණසඞ්ඛ්‍යාත ද්‍රව්‍යක් ලබන්නාවානහෙයින් ද්‍රව්‍යශබ්ද හෝ වෙයි-විභාවිනී ටීකාවායෙහි වනාහි "යථාවුත්තාව චනත්ථයොගෙපි සම්මාසම්බුද්ධ සද්දස්ස භගවති සමඤ්ඤාවසෙන පවත්තනතො යි-දක්වනුවෝ නාම ශබ්දයයිද කියත්.

සකත්ථද්‍රබ්බ ලිඞ්ගානි සංඛ්‍යාකම්මාදි කාරකං
ඉතිසද්දත්ථ විසෙසෙස්‍යා පඤ්චකාපනා යථාරහං යි

කියනලද පචවිධ ශබ්දාර්ථයන් කෙරෙන් බුද්ධ ශබ්දාර්ථය නාමා, ස්වාර්ථය, ද්‍රව්‍යාර්ථය, ලිඞ්ගාර්ථය, සඞ්ඛ්‍යාර්ථය. කර්මාදි කාරකාර්ථය යන වශයෙන් පචවිධවෙයි.

වාචකාදසධා ඤෙය්‍යා වච්චාඅට්ඨවිධා තථා
සද්දසත්ථානු සාරෙන ඤාතබ්බා සමයඤ්ඤුනා යි

කියනලද වාචක වාච්‍යමය හෙයින් "බුද්ධ" ශබ්දයතෙමේ-කිතකවාචකද. කර්තෘවාචකද වෙයි; කර්මවාච්‍යද වෙයි, එහි වාචක වාච්‍ය යෝනම්

දුතියා තතියාචාපි චතුත්ථි පඤ්චමීතථා
ඡට්ඨීච සත්තමී චෙති ඡසීමාපිච වාචකා,
සමාස තද්ධිතාඛ්‍යාත කිතකාපිච වාචකා
වාචකා දසධාචෙව ඤාතබ්බා සමයඤ්ඤුනා
කත්තාදයොඡළෙව සම්බන්ධො භාවොචෙකොච විඤ්ඤූනං
වච්චාඅට්ඨ විධාචෙවං ඤාතබ්බා සමයඤ්ඤුනා ති

බාහ්‍යාර්ත්ථ වාචකය අබාහ්‍යාර්ත්ථ වාචකය යන භෙදහෙයින් බුද්ධ යනමෙහි බුද්ධ ධාතුහුගේ අර්ථය අබාහ්‍යාර්ථ නම්. ත ප්‍රත්‍ය වාච්‍ය වූ අර්ථය බාහ්‍යාර්ථනම්.

**චතුසුවාචකෙස්වෙව එකෙකෙස්වෙව වාචකෙ**
**අඤ්ඤෙ බාහිරත්ථානං වශෙනෙත්ථ විධාමතො යි**

කියනලද හෙයින් සමාස තද්ධිත ආඛ්‍යාත කිතක යනමොනු තද්ධිත විවිධාර්ථවාචකයෝයි දතයුතු මෙතෙකින්-

"ජිතමාරාදිකං බුද්ධං" යනු ව්‍යුත්පත්තනයැ

—0—

"ධම්මං මොහවිද්ධංසකං" යනුයෙහි

ක්ලෙශ සමුච්ඡෙද පටිප්පස්සම්භන නිස්සරණ වශෙන ධුනාතිවිද්ධං සෙතීතිවා ධම්මො ලක්ඛණාදිනා ඵුසනාදිනා සකසකභාවෙන ධාරීයතී ලක්ඛියතීතිවා ධම්මො අථවා පාපකෙ අකුසලෙ ක්ලෙශ සමුච්ඡෙදවශෙන ධුනාතීති ධම්මො පාපක්ලෙශයන් සමුච්ඡෙද වශයෙන් විනාසකෙරේ යි නිර්වචනාර්ථයෙන් මාර්ගධර්මයද පාපකෙ අකුසලෙ ධම්මෙ සමුච්ඡෙද පටිප්පස්සම්භන වශෙන ධුනාතීති ධම්මො යන නිර්වචන හෙයින් ඵලධර්මයද-පාපකෙ අකුසලෙ කිලෙසෙ නිස්සරණ වශෙන ධුනාතීති ධම්මො යනුවෙන් සංස්කෘත ධර්මයද, පාපකෙ අකුසලෙ ධම්මෙ කතූපනිස්සය වශෙන ධුනාතීති ධම්මො යනුවෙන් ධම්මොච ධම්මොච; එක ශෙෂනයින් පර්‍ය්‍යාප්තිධර්මයද, ගෘහිතයි මෙහි එකශෙෂයනම්-පුරිසොච පුරිසොච පුරිසා යනාදියෙහි සරූපෙක ශෙෂයයිද, මාතාච පිතාච මාතරො සාරිපුත්තොච මොග්ගල්ලානොච සාරිපුත්තා යනාදියෙහි අසමානරූපෙක ශෙෂයයිද කියනුලැබේ.

ශේ මෙ සේ යි

**එකසෙස විකප්පෙක පුරෙහාති කිතෙනවා**
**පුරිසාති පුරිසානෙ සෙනාත්‍යාදිස්ස දෙනවා,**
**මාතරො පිතරො සාරි පුත්තා පුත්තාති අදිසු**
**එකසෙසම් රූපානං වුණිතාශෝග විභාගතො**

ධර්මය වනාහි පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ යි ත්‍රිවිධවේ. එහි අර්ථකථාසහිත ත්‍රිපිටක බුද්ධවචනය පර්‍ය්‍යාප්ති නම්. අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යන ත්‍රිශික්ෂාව ප්‍රතිපත්ති නම්. සෝවාන් සකෘදාගාමි අනාගාමි රහත් යන මාර්ගඵල අටහා මාර්ගඵලාලම්බණික නිර්වාණයද යන ලෝකෝත්තර නවය ප්‍රතිවෙධ නම්.

මේ ගාථායෙහි ප්‍රථම තෘතිය ධර්මයමැ අභිප්‍රේතයි-නොහොත් පර්‍ය්‍යාප්තියෙන් ප්‍රතිපත්තියටද, ප්‍රතිපත්තියෙන් ප්‍රතිවෙධයටද-උප නිශ්‍රය හෙතුවනුයෙන් යථොක්ත ත්‍රිවිධ ධර්මයමහෝ අභිප්‍රේතයි ධම්මොයනු නවලොවිතුරා දහම්යයි වර්ණිතා කරණුවෝ-

සොතාපත්තාදයො මග්ගා චත්තාරො තප්ඵලානිච
චත්තාරි අථ නිබ්බානං ධම්මා ලොකුත්තරා නව සිද

බුද්ධො සබ්බඤ්ඤුතං ඤාණං ධම්මො ලොකුත්තරොනව
සංඝො මග්ග ඵලට්ඨොච ඉච්චෙවං රතනත්තයං සී

යනුද විවක්ෂිතයෙන් ලෞකිකධර්මය සංස්කාරය අසධර්මතා ලක්ෂණයයි බැහැරකෙරෙත් එහෙයින්-

පාපකෙ අකුසලෙ ධම්මෙ සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ වසෙන ධුනාති විධංසෙතීති ධම්මොයනු විග්‍රහයමැ යෙදෙ. මෙහි කර්මාර්ථයෙහි උපයොග වචනයුබැවින් 'තං ධම්මං' යි ශෙෂයි.-

" මො හ වි ධං ස කං "

මුය්හන්ති සම්පයුත්තධම්මා එතෙනාති-මොහො යි නිර්වචනයෙන් හෙතුසජාතකවූ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යසංඛ්‍යාත මොහයද මුය්හතීති මොහො යනුයෙන් "අවිද්‍යාසඞ්ඛ්‍යාත මොහාන්ධකාරයද මුය්හනං මොහො යනුයෙන් මොහනණ සතානියද ගිණියයුතු.-

විසෙසෙන ධංසතීති විධංසකො මොහස්ස විධංසකො මොහ විධංසකො ෂෂ්ටිතත් පුරුෂයි.-

ණ්වුතුපච්ච සානස්මිං ජටසිහවති කම්මනි
භාවසාධන සංයුත්තො ජටසීවාචීති වායනො සී

වුක්තබැවින් ණ්වුප්‍රත්‍යාන්තවැ සිද්ධනුයි "මොහං විධංසකො" යි විග්‍රහතොකොට මොහස්ස විධංසකො මොහවිධංසකො යි වුක්තායි තං "මොහවිධංසකං"

ජිතමාරාදිකං යනු බුද්ධං යනුයෙහි විශෙෂණයි මොහ විධංසකං යනු ධම්මං යනුයෙහි විශෙෂණයි එහෙයින් ජිතමාරාදිකං බුද්ධං ධම්මං මොහවිධංසකං යි සම්බන්ධයි මෙහි වනාහි-

පුරතො පච්ඡතොවාපි දාසකො ගච්ඡතෙ යථා
තථාපධාන සද්දොපි පුබ්බවුත්තො පරොපිවා සි

කියනලද පරිදි සවාමියාට පෙරහෝ පසුහෝ දාසයාගේ ගමන් සෙයින් විශෙෂණයාගේ තාත්පර්යයෙන් පරවැයෙදූහයි දතයුතු.-

ව න්දි ත්වා

වන්දිත්වා යන්නෙහි ත්වා ප්‍රත්‍යාන්තමා භාවාර්ථ කර්මාර්ථ කර්ත්‍රාර්ථ වාචකහෙයින් අඛ්‍යාතාඛ්‍යාතයෙහි වන්දනං නමනං වන්දියතෙ නමීයතෙ වඳුම් නමාමියි වචනාර්ථ කටයුතුය එහෙයින් කීහ.-

නමෙවාහංතු නත්වාන භාවෙකම්මනි කත්තරි
භාවෙයෙවතු අසදිසාදා හොන්තීති පදීපයෙ

මේ ගාථායෙහි පවක්ඛාමි යන අපරක්‍රියාහට විශෙෂණ හෙයින් සමානාධි කරණවූ කර්තෘසාධනය යෙදේ.

ත්වාප්‍රත්‍යයෝ වනාහි පූර්වාපර සමානකාල හෙත්වර්ථයන්හිද පව ත්නාබැවින් මෙහි සමානකාලාර්ථවූ ප්‍රත්‍යුත්පන්නාර්ථය මැකියයුතු නොඑසේ වේනම් අහං පවක්ඛාමි යන ක්‍රියාකාරක පදන්තර හා අසම්බන්ධය එහෙයින් ග්‍රන්ථාන්තරයෙහිද ත්වාප්‍රත්‍යාන්තයෝ ප්‍රත්‍යු ත්පන්නවූ කියත්-එයින් සීහ-මණිසාර මංජුසාවෙහි—

“ තස්මා ඉධාපි අහංබුද්ධං (නත්වා) නමාමි, ධම්මං (නත්වා) නමාමි. සඞ්ඝං (නත්වා) නමාමි-එවං බුද්ධංනත්වා ධම්මංනත්වා සඞ්ඝං නත්වා අභි ධම්මත්ථ සඞ්ගහං වණ්ණයිස්සන්ති අත්ථො-පෙ-සිද්ධියාති ” ඈතම් ආ චාර්‍ය්‍යවනාහි මෙහිද අන්‍යතැන්හිද තත් ප්‍රත්‍යාන්තයෝ පූර්වකාල ක්‍රියා නිර්දේශයයි කියා අපරකාල ක්‍රියා හා සම්බන්ධකොට අතීතාර්ථ යමැ ගණිත් ග්‍රන්ථකාරයෝද එම අභිප්‍රායෙන් තත්තත් ස්ථානය න්හි ත්වා ප්‍රත්‍යාන්තයට අතීතාර්ථයමැ කියත් තදපාවාදකයෝ

පුබ්බාපර සමානෙව කාලෙ හෙතුම්හි ත්වාදයො
පච්චා භුඤ්ජිසො සො පිදහිත්වාන නික්ඛමි
ගන්තාච්චගතිනො දණ්ඩා පිත්වා සප්පිං බලංතිම යී කියත්

“ උ ත්ත මං ” ඉති

සෙට්ඨා, උත්තමත්තා, උඩ්ඪතමත්තා, උත්තමං කියා උග්ගතා නං ලොකිය සාධූනං විසෙසංති; උත්තමං යී පූර්වවිකල්පයෙහි අනි සපන්න ප්‍රාතිපදිකාර්ථයෙනුදු අයමෙතෙසං අතිසයෙන උග්ගතොති උත්තමො යී ද්විතීයවිකල්පයෙන් තද්ධිතතම ප්‍රත්‍යාර්ථයෙනුදු—උඩ්ඪ තමෙබ්බා උඩ්ඪතො සමපසුතොනා එතෙන තමෙනාතීති තමො උඩ්ඪතො තමො යෙනසො උත්තමො යී තෘතීයවිකල්පයෙන් බහුව්‍රීහි සමාස න්න යෙනුදු උත්තමශබ්ද සිද්ධයි-තං උත්තමං,

“ සං ඝං ” ඉති

සං සුට්ඨුකිලෙසෙ හන්තීති සඞ්ඝා යි විග්‍රහයෙන් අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝයාද සමග්ගං කම්මං සමුපගච්ඡන්තීති සඞ්ඝා යි යනුයෙන්—ස සම්මුති සඞ්ඝයාද ගෘහීතවෙයි චතුවර්ගාදි විනය ප්‍රඥප්තියෙහි ‘; සු ණාතු මෙභන්තෙ සඞ්ඝා යි වදළහෙයින් තදර්ථයෙහි “ සම්මු තිසඞ්ඝ ” නමි.

මෙහි වනාහි-පූර්වකල්පයෙන් නිද්දිෂ්ට-පරමාර්ථ සඞ්ඛ්‍යාත දක්ෂිණාර්හ සඞ්ඝයාට සඞ්ඝං සරණං ගච්ඡාමි යි වදාළහෙයින්ද බුද්ධං ධම්මං යනු සම්බන්ධස්ථාන බැවින්ද; අභිප්‍රේතයි.

කඞ්ඛාවිතරණී ටීකාචාර්‍යයෙහි "තත්‍ථපොථුජ්ජනික සඞ්ඝස්සාපි පුබ්බභාග පටිපදා අත්‍ථි තස්මා පුරිමචෙතනාය විසුද්ධතෙ එසෙව සඞ්ගහො දට්ඨබ්බො" යි කියනුවෝ සම්මුති සඞ්ඝයාද දක්ෂිණාර්හ කොට දක්වූ මණිසාර මංජුසාචාර්‍යයෙහි-"කල්‍යාණ පුථුජ්ජනස්සාපි සෙඛ සඞ්ගහිතො" යි—පෘථජ්ජනික සඞ්ඝයා ශෛක්ෂ සඞ්ඛ්‍යාවට සඞ්ග්‍රහ කළෝය෴

" ඝාං ඝං ඝං "

---

" ක ච්චා ය නං " ඉති

කසිවනිප්ජාදිහි කසති දිප්පතීති කච්චෝ—කසයින් පිතෘයි තස්ස කච්චස්ස අපච්චං පුත්තො " කච්චායනො " යි—තද්ධිතාන්තවූ පද ව්‍යුත්පත්තියි " තං කච්චායනං " මහාකාත්‍යායන ස්වාමි යි

ච ස ද්දො

ච ශබ්දය නිපාතවන්නෙන් විග්‍රහ නොකටයුතු ඒ කීහ

රූළ්හිකඛ්‍යාතං නිපාතංචු පසග්ගාලප නාමිපිච
සබ්බනාමඤ්ච එතෙසු විග්ගහො නකතො ඡසු යි

ප්‍රතිෂෙධයි—තදන්‍යයෝය෴

**රූළ්හිඛ්‍යාතං නිපාතංචු පසග්ගාලපනං තථා**
**ඉමෙසුපච සද්දෙසු විග්ගහොන කතො සදා**—යි

රූඪි ආඛ්‍යාත නිපාත උපසර්ග ආලපන සර්වනාම යන ෂට්කය විග්‍රහහෙයින් අනභිප්‍රේතයි කීහ෴

" වණ්ණිතං "

වණ්ණිතබ්බො—පසංසිතබ්බොති වණ්ණිතා යනු නිර්වචන හෙයින් වණ්ණිතා යනු ප්‍රශංසි වණ්ණිතා පසත්‍ථා අයසත්‍ථීති වණ්ණිතො මහාකාත්‍යා යන ස්වාමිහුයි " එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං සංඛිත්තෙන භාසිතස්ස විත්‍ථාරෙන අත්‍ථං විභජන්තානං යදිදං මහාකච්චායනො, යි භගවත්හු විසින් වර්ණිත යි ' තං වණ්ණිතං '

**ජිනමාරාදිකං බුද්ධං ධම්මං මොහ විද්ධංසකං**
**වන්දිත්වා උත්තමංසඞ්ඝං කච්චායනඤ්ච වණ්ණිතං**

මෙසේ සම්බන්ධයි

මේ ගාථායෙහි "පාපවිධංසකං ධම්මං" යි වක්තව්‍යමුත් 'මෝහ විධංසකං' යි-යොද නුවෝ

විනාසෙන්ත සංහතෙහාති ඤාංනානන්තරිකංමනං
සන්තිකා සවංහර ඉදමෙත්ථ නිදස්සනං යි

කියනලද නානන්තරිකන්‍යාය හෙයින් මොහ විප්‍රයුක්ත කෙලෙශ යන්හුගේ අභාවයෙන් එයම විශෙෂණ කළේය. මොහොව සම්ප්‍රයුක්තාව මොහො යී විරූප එකශෙෂයිද කියත්.

කච්චායනස්ස භෙදහං සප්පයොගං යථාරහං
සොතුජනාන මත්ථාය පවක්ඛාමි සමාසතො යනමෙහි

"කච්චායනස්ස" ඉති

කච්චායනස්ස ඉදං පකරණං යි තද්ධිත ඉදමර්ථයෙහි ණප්‍රත්‍යාන්තයෙන් "කච්චායනං" යීද සාමාන්‍යාර්ථයෙහි ෂෂ්ඨිනිර්දෙශයෙන් තස්ස කච්චායනස්ස යීද ශෙෂයි.

"භෙදං" ඉති

භිජ්ජනං භෙදො යී භෙද සක්‍නියද භිජ්ජති එතෙනාති භෙදො යී උදාහරණද භිජ්ජති පකාරං කරොතීති භෙදොයි ප්‍රකාරයද කියයුතු.

'ඤාං භෙදං'

---

"අහං" ඉති

අම්හ ශබ්දාදෙශ සර්වනාම ලිංගාර්ථ ප්‍රථමෙක වචනයැ අහං, යයි කියයුතු පරමාර්ථයක් නොඇති ස්කන්ධ පචකයවේ; එසිනුදු නාම ස්කන්ධත්‍රයැ එසිනුදු විඥණස්කන්ධයැ එසිනුදු කාමාවචරසිත එසිනුදු සෞමනස්‍ය සහගත ඥාණසම්ප්‍රයුක්ත සසංස්කාරික කුසලසිතම මම, යයි කියයුතු ඇතම්නු අසංස්කාරිකයයි කියත්-මේ වනාහි සොතුජනානමත්ථායයි කියනුලබන හෙයින් අනුචෙතනාදී සම්ප්‍රයුක්ත චෛතසිකය නුදු කියයුතු හෙයින් අයුක්තයැ.

—+(0)+—

අහං යනු, වන්දිත්වා පවක්ඛාමී යන ක්‍රියාහා සම්බන්ධයි—භෙදං යනු පවක්ඛාමි යනු හා සම්බන්ධයි—පයොගෙන සහ යො වත්තතීති සප්පයොගො තං සප්පයොගං භෙදං යනමෙහි තුල්‍යාධිකරණ විශෙෂනයි. මෙහි සහ ශබ්දය සමවායෙහි වැටේ එහෙයින් කිහ.

"සහසද්දෙනව යොගො ක්‍රියාගුණ දබ්බසමාවායෙ සම්භවති" යි මෙහිවනාහි ක්‍රියාසමාවායෙහි කියයුතු.

“ ය ථා ර හං ” ඉති

යථාපයොගො අරහොති යථාරහං අව්‍යයීභාව හෙයින් නපුංසකෛක වචනයි.—

“ සො තු ජ නා නං ” ඉති

සුණන්ති අභිසවන්තීති සොතාරො ස්වාදිගණ සුධාතුයි සවන්ති සන්දන්ති පිටකත්තය වසෙනාති සොතාරො භූවාදිගණ සුධාතුයි සුයන්ති පසවන්ති පිටකත්තයන්ති සොතාරො දිවාදිගණ සුධාතුයි යන වශයෙන් “ සොතු ශබ්ද නිෂ්පන්නයැ.—

——*+*——

“ ජන ” ඉති

සමුච්ඡින්න නොවූ තෘෂ්ණා අනුශය සන්තාන හෙයින් අවිද්‍යා තෘෂ්ණාහි සංඛ්‍යාත කර්මයෙන් භවයොනි ගතිස්ථිති සත්තාවාසයන් හි ස්කන්ධපංචකයයි කියනලද ආත්මභාවය උපදවත්නුයි යනාර්ථයෙනුදු කිලෙසෙ අජනිංසු ජනෙන්ති ජනිස්සන්තීති යනාර්ථයෙනුදු ජනා යි ශෙෂයි සොතාරොච තෙ ජනාචෙති සොතුජනා තෙසං සොතු ජනානං යි අර්ථශබ්දයහා සම්බන්ධ ෂෂ්ඨියි.—

——0——

‘ අත්ථාය ’ ඉති

අරති ගච්ඡතීතිවා පවත්තතීති අත්ථො තාය අත්ථාය යි. ප්‍රයොජන වාචකනම්.—තදර්ථයෙහි සම්ප්‍රදානයි; එයින් කීහ. අර්ථ ශබ්දාර්ථ ප්‍රවෘත්තින්.—

අත්ථො පයොජනෙ සද්දාභිධෙය්‍ය වුද්ධිසු ධනෙ
වත්ථුම්හි කාරණෙ නාසෙ හිතෙ පච්ඡිම පබ්බතෙ ති

මෙහි සොතෘජන ප්‍රයොජන නම් නවලොකොත්තරයයි.—

---

“ ප ව ක්ඛා මි ” ඉති

පුවිඨුකථෙස්සාමි යනාර්ථයෙහි ප උපසර්ග පූර්වවචධාතු කෙරෙහිවූ අනාගතාර්ථස්සාමි ප්‍රත්‍යයහට ධාත්වන්තය සමග. සප්‍රත්‍යය ග්‍රහණයෙන් ධාමියනෘදෙශවැ නිෂ්පන්න ආඛ්‍යාත පදයි උපසර්ගයනුදු

පපරානිනී උදුසං, වි අව අනු පරිසු
අධි අභි පති අති, ආ අපි අප උප එතෙ

මෙකී උපසර්ගයෝ අනේකාර්ථය එයින් කීහ.—

උපසග්ගා නිපාතාච පච්චයාච ඉමෙතයො
නෙකෙනෙකත්ථවිසයා ඉතිනෙරුත්තිකාබ්‍රවුං

එසේ හෙයින් මෙහි ප යනු " සමාසතො " යි වක්ෂ්‍යමාන පෙක්ෂා හෙයින් සාපෙක්ෂා ර්ථවාචකයැ.—

" සමාසතො "

සමසනං සමාසීයතෙ තිවා සමාසො තතො සමාසතො නාතිසංක්ෂෙප නාතිවිස්තාරයෙනැයි සේයි—ප්‍රත්‍යයක්‍රුදු අනෙකාර්ථයි යුබැවින් මෙහි අනාතප්‍රත්‍යය ප්‍රත්‍යුත්පන්නකාල භාවාර්ථවාචකය ඇත මිහු අනාතප්‍රත්‍යය තමා ප්‍රත්‍යුත්පන්න අනාගතකාල කර්ම අර්ථයමැ වාචකයයි

මානන්තා වත්තමානෙව නාගතෙසු පවත්තරෙ
අනන්තා කත්තරි මානෙන්තු භාවෙ කම්මනි කත්තරි යි කියත්

භාවකර්මාර්ථ වාචක නොවේයයි යන තන්මතය මණිසාරමංජුසාචාර්යයන් විසින් " මහියතෙ—පූජීයතෙති මහනෙයා " යි කියන ලද වචනයහා නොසම වෙයි.—

මානන්තා වත්තමානෙව ලක්ඛණෙ හෙතුකෙපිච
කිරියාධාරත්ථෙ සම්බන්ධෙ හොන්ති කාලන්තරෙ ක්වචි, යි

කියනලද හෙයින් මෙහි අනාතප්‍රත්‍යය පචකාරාමි ආී ක්‍රියාපදයෙහි එවධාතු හා සම්බන්ධවියෙන් අනාගතාර්ථයද වාචකයයි ගත් සමසනං සමාසො තතො සමාසතො යි විශෙෂණාර්ථයෙහි තො ප්‍රත්‍යයා න්තාසිද තාතීයා විශෙෂණයිද දතයුතු හෙද ක්‍රියා විශෙෂණයි සබෙ නාධාවති යනාදියෙහිමෙන් භින්නාධිකරණ විශෙෂණයි අර්ථයෙන් සමානි තුල්‍ය ධිකරණද වේ. ශාසනයෙහි භාවනපුංසක නිර්දේශයයිද ශාස්ත්‍රයෙහි ක්‍රියා විශෙෂණයයිද ව්‍යවහාර්යයි—මෙම කීහ

කිරියාවිසෙසනංනාම, දුවිධං සමුදීරිතං
බහිඩාලපනං සබ්බං, අබහිඩා මුදදීකං.
කිරියාවිසෙසනංයාව, තං සබ්බංහි නපුංසකං
සියාම එකවචනං, යථාගිනානු සුඛංසිනා.

පද ව්‍යාඛ්‍යා වශයෙන් වර්ණිතායි

---

චොදනා සංවණ්ණනා චනාභිඃ චොදකතෙමේ එක දෙශයකින් සව මාත්‍රයක් ගෙණ සම්යම් පරම්පරා විශෙෂයකින් සර්වාභිප්‍රාශ

නොදනීද-සම්ප්‍රකාරයෙන් පරිහාරය නොදනීද-හේ චොදකතෙමේ ශාස්ත්‍රය ශොධනය කරන්නේවේ-එයින්කීහ.

ලෙසමත්තා උපාදාය, ගංථාගංථා පරම්පරා
චොදකො පන චොදෙති, සොපිසම්බංධ පස්සති
සමෙපස්සති නංසබ්බං, පරිහාරෙන සම්භවෙ
අසමත්ථො චොදකො ශාස්ත්‍ර, පරිසොධෙති සබ්බථා, සි

එසේ හෙයින්-ග්‍රන්ථවිශොධනය චොදකයාගේ විශෙෂවිත්‍ර ගුණයක්මය.

දෙෂගිණිස්ස ශාස්ත්‍රස්ස චොදනාතු නවිද්‍යතෙ
දෙෂශුද්ධාන මහාගන්ථස්ස තස්මාදෙවා දනම්පාඨකම්
ඵලංසදපි වෘක්ෂාත් ශතශාඛාශාම්කාම්පිනාත්
චොදනාශාස්ත්‍රශාස්ත්‍රාණාං ප්‍රාජ්ඥො න්‍යායඵලංමහත්සී

වුක්තාහෙයින් චොදනා පරිහාර වක්තව්‍යමයැ

එහි චොදනාසෙයිලා අඛ්‍යාපිත පෞනරුක්ත්‍ය පූර්වාපරවිරොධොක්ත්‍ය එකත්වයයි දෙෂවිධි පංචකයෙන් නිර්දිෂ්ටයි, ඔවුනතුරෙන් යම් පදයකින් අනීප්සිතාර්ථයක් ගම්‍යමානද-ඒ අව්‍යාපිතදෙෂනම්-අනිප්සිත දෙෂයෙන් අභිප්‍රාය ගම්‍යමානද-ඒ අභිඛ්‍යාපිත දෙෂයි· පූර්වෝක්තාර්ථ පදයන් පශ්චාද්වුක්තිය පෞනරුක්තදෙෂයි-ඊප්සිතාර්ථය දක්වා තදපවාදය අන්‍යාර්ථත්වයකින් කීයාතම්—ඒ විරොධොක්තිදෙෂයි. අර්ථයෙන් තුල්‍යවූ ශබ්දවයක් එක වාක්‍යයෙහි උක්ත නම්-ඒ එකාර්ථදෙෂයි.

එයින් කීහ

අඛ්‍යාපිතානි ඛ්‍යාපිතං දෙසංපුනරුත්ති නාථා
පුබ්බාපර විරොධුත්තං එකත්තං පිණ්ඩිතා-මේ පංචදෙෂයි.
සම්පිතං අධිප්පායං නපූරයති සබ්බයි,
අඛ්‍යාපිතනයි විසෙසදස්සා දෙසසද්දෙහි සහාවයො-අඛ්‍යාපිත දෙෂය.
අනිම්පිතං අධිප්පායං යස්සාදිස්සති තංපදං
අභිඛ්‍යාපිත දෙසනානි දෙසසද්දෙහි විඤ්ඤාණියං-අභිඛ්‍යාපිත දෙෂය.
පුනබ්බවුත්තං අධිප්පායං පුනවුච්චති යස්මිහි
පුනරුත්තිහි විසෙසදස්සං දෙසසද්දෙහි සහායවකො-පෞනරුක්ත්‍යදෙෂය.
සම්පිතත්ථං වත්වාන තමෙව වදන්‍යසද්ධා
තංවිරොධිනි විසෙසදස්සා දෙසසද්දෙහි සහායවකො-විරොධොක්ති දෙෂය.

අත්‍ථතුලාසාදුවෙ සද්දා සත්‍ථුච්චනාති නාමතො
එකන්තනාති සභාවෙන ඉමෙ දොසා විවජ්ජියා එසේ සුබොධාලඞ්කාරයෙහි තෙවිසි දෙෂයෙක්ද නිර්දිශ්‍යයි.

ග්‍රන්ථාන්තරයෙහි

අපාර්ථං ව්‍යර්ථ මෙකාර්ථං සසංශය මපක්‍රමම්
ශබ්ද හීනම් යතිභ්‍රෂ්ටං භින්නවෘත්තං විසන්ධිකම්
දෙශකාල කලාලොක න්‍යායාගම විරොධිච
ඉතිදොෂාද ශෛවෙතෙ වර්ජ්‍යාඃ කාව්‍යෙෂු සූරිභිඃ යි දශයෙක්ද කියත්

යථොද්දිෂ්ට දොෂාවිකරණ ලක්‍ෂණය චොදනායි

පරිහාර

පරිහාර නම්-එක් ග්‍රන්ථයෙක්හි හෝ වාක්‍යයෙක්හි පූර්වාපර පරිඥානයෙන් සුවිනිශ්චිතවූ ශබ්දාර්ථ අභිප්‍රායාර්ථයන් විචාරනයින් ශකවාද නිශ්‍රිතය,යි-ඒ කීහ.

පුබ්බාපරං විචාරෙත්වා නිස්සාසසුවිනිච්ඡිතං
අත්‍ථංවණ්ණෙති සිද්ධත්‍ථං වාදිනුගුණ නිස්සිතං.

මෙහි නිස්සිතං යනු ලිංගවිපර්යාස වශයෙනි-ඒ කීහ

ලිඞ්ගභෙද වචීභෙද දුවිධං භෙද මෙවච
අඤ්ජනං කදලීසාරං සොසානාභිබහු ඤානසො

එහෙයින් ගුතනිස්සිතොයි වුසානයි. නිශ්‍රිතයද,

සකවාදිපභ සමෙඵ ගුනාලෙඵ නිස්සිතං භවෙ
පරවාදි අනුලොම එකදෙසෙන නිස්සිතා, යි ලක්‍ෂණකීහ.

පරිහාර ලක්‍ෂණයි

—0—

චොදනා

මෙමැ ගාථායෙහි අභිප්‍රේතාර්ථය බුද්ධංයහ චෙපචණෙන් සිද්ධනුයි ජිතමාරාදිකං යි වචනය කුමට යෙදුවෝද; යනු චොදනා සිද්ධය එසේ නමුදු බුද්ධ යනුයෙහි,

සුතබුද්ධානු බුද්ධොච පච්චෙකො ලොකනායකො
ඉති චතුසු අත්‍ථෙසු බුද්ධසද්දා පවත්තති යි

කියනලද බහුශ්‍රුත භික්‍ෂු සංඛ්‍යාත ශ්‍රුතබුද්ධය ශ්‍රාවකසංඛ්‍යාත අනුබුද්ධය ප්‍රත්‍යෙකබුද්ධය සම්‍යක්සම්බුද්ධය යනචතුරංගය වාච්‍යවතුදු

සර්වඥබුද්ධයන්ම දක්වනුවෝ ජිනමාරාදිකං,යි යෙදූහ යනු පරිහාරයි නොහොත්—

**ඤාණවිකාසනෙන චෙව ජාගරෙ ගමනෙපිච**
**චතුසච්චෙසු අච්චෙසු බුද්ධධාතු පවත්තතී යි**

කියනලද චතුර්විධාර්ථයන් කෙරෙන් කවරාර්ථයදැයි යනු චෝදනායි, තදර්ථචතුෂ්ටයයන් මෙහි බුද්ධශබ්දයෙහි ඤානවිකසන ජාගරණ අර්ථද්වයම කියත් යනු පරිහාරයි.

— එහිඥනනම් —

**ඨානාඨානංච විපාකඤාණං පටිපදායච**
**නානාධාතුච ලොකස්මිං සත්තානං අධිමුත්තිතා**
**ඣානාදිකෙසං කිලෙස වොදානෙච පරාපරෙ**
**පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛාස වස්‍රාඛයෙ යී**

උක්ත දශවිධ බුද්ධඥනයි විකශණ නාම්

දිනකර කිරණ සමාගමෙන පරමසිරි සොභාග්‍ය ප්‍රාප්තියා විකසිත වීව පදුමං අනාවරණඥාණ සමාගමෙන අපරිමිත ගුණ ගණාලංකෘත සබ්බඤ්ඤුත ඤාණප්‍රාප්තියා සම්මා සයමෙව විකසිතොහි. "බුද්ධො" යනුයි—ජාගරණ නාම්—

සම්මා සාමඤ්ඤච පටිබුද්ධො අනඤ්ඤෙ පටිබොධිතො හුත්වා සයමෙව සවාසනා සම්මොහනිද්දාය අච්චන්තං විගතො, ති "බුද්ධො" යනුයි මේ පරිහාරයි—නොහොත්—

**භාවපදවශං කිංචි සබ්බඤ්ඤු මුපලබ්භති**
**විසෙසන විසෙස්සත්තං ගමකොනපි කාමතො, යී**

විසෙසන විසෙසි තබ්බභාවො යථාකාමං හොති, සිද උක්තයෙ සින්—ජිතමාරාදිකං යනුම විශෙෂන කළේද; යනු චෝදනායි—

**විසෙසංතිච විඤ්ඤෙය්‍යං විඤ්ඤාණහෙතු විසෙසනං**
**විසෙසන විසෙස්සත්තු ගුණප්පධාන කාරණිච**
**පධානත්තාය දබ්බස්ස තංදච විසෙස්සං සියා**
**ගුණස්ස අප්පධානත්තා සොච විසෙසනං සියා, යි**

කියනලද බැවින් විඥනා විඥානාර්ථ වශයෙන්ද, ගුණ ද්‍රව්‍ය වශයෙන්ද—යොගයෙහි-කාමාචාරාර්ථයෙන් වියයුතු හෙයි-ජිතමාරාදිකං යනු විශෙෂණද බුද්ධං යනු විශෙෂ්‍යද-කළේ යනු පරිහාරයි-නොහොත් ජිතමාරාදිකං යනු සවාර්ථ වාචකවේද; නොඑසේනම් බාහ්‍යාර්ථවාචකද; නැතහොත් උභයාර්ථ වාචකදැයි යනු චෝදනායි.

ශ්‍රීදින් සවාච්‍යවාචක විනම්-සවාච්‍ය විශෙෂණයෙහි "විසෙසනෙන ච" යී සුත්‍රයෙන්-තාතියා වියුක්තය ආත්මාර්ථය, බාහ්‍යාර්ථ විශෙෂණයෙහි අසදෘශාර්ථ ප්‍රසංගයයි-අත්මාර්ථය සවාච්‍ය බාහ්‍යාර්ථ විශෙෂණයෙහි මිශ්‍රකදොස ප්‍රසංගයි-අත්මාර්ථය ආත්මාර්ථ විශෙෂණයෙහි "ජයසීච" යි ශබ්දාන්තරයෙහි හිනතාධිකරණ වියුක්තය බාහ්‍යාර්ථ විශෙෂණ කාරණයෙහි තත්තුල්‍යාධි කරණ වියුක්තය. ආත්මාර්ථ බාහ්‍යාර්ථ විශෙෂණ කරණයෙහි යතොක්ත මිශ්‍රකදොෂ ප්‍රසංගයි එහෙසින් පාරිශෙෂ පරිශුද්ධ වශයෙන් තත්ගුණ සංවිඥාණ බහුව්‍රීහිබැවින් ආත්මාර්ථ බාහ්‍යාර්ථ වාචකය-ද්‍රව්‍යප්‍රධාන ගුණ අප්‍රධානීපක්ෂ භාවයෙන් සදෘශාර්ථදොෂ ප්‍රශංගද නැත්තේයි යනු පරිහාරයි-තොහොත්

ජිතමාරාදිකං, යන පදයෙන් දෙවපුත්‍රමාර ආලවකාදීන් හෙදක කාමාවචර කුසලක්‍රියා ප්‍රඥාවෝද සෙසු සතරමරුන් හෙදක අහීත්මාගී ප්‍රඥාවෝද ලැබෙත්-"බුධං" යන පදයෙන් අහීත්මාගී සර්වඥතාඥාණ ච්ඡන්නාවරණයෝද-ද්වාත්‍රිංසත් වරමහා පුරුෂ ලක්ෂණහා අසීත්‍යානු ව්‍යඤ්ජනාදී ගුණද-බුද්ධ ද්‍රව්‍යාංකිත සමූහසන්තාන් ප්‍රඥප්තීහුද-ලැබෙත්. යලි කෙසේ තුල්‍යාධිකරණ කීනුදයී-යනු චොදනායි. විශෙෂණ සවභාව අප්‍රධාන වශයෙන් වාචකත්වයෙන් තුල්‍යාධිකරණදවෙයි "ජයනෙතා" හි සවාහනං මාරදෙවං පංචමාරෙවා ජයනෙතා, මාරදෙවං කාමකුසලඥාණෙන ජිනාති-සොතාපන මග්ගඥාණෙනාති,ති-පෙ-ර්‍ණාවාහෙසීනාති හෙසින් මුක්ඛ්‍ය වශයෙන් කාමාවචර කුසලක්‍රියා ප්‍රඥාද-අහීත්මාගී ඥාණද-වාචකත්වයෙන් තුල්‍යාධිකරණවෙයි යනු පරිහාරයි.

### අහීත්මාගීඥාණ නම්

සයම්භූඥාණ, තොව චතුස්සානයින් උපෙක්ඛා එකග්ගතායත චංගික චතුර්ථධ්‍යානයයි කියනලද පඤ්චමධ්‍යානයයි-තදංග සාමාන්‍යයෙන් 'අමගගඵල භූත චතුත්ථජ්ඣාණං තථාගතස්ස සෙය්‍යා' යී වුක්තහෙයින් ඵලයද චතුර්ථධ්‍යාන නම්වේ.

### සර්වඥතාඥාණය නම්

අහීත්මාගී විධියෙන් පඤ්චඥෙය්‍ය ධර්මයන් ආලම්බණකොට "සෞමනස්‍ය සහගත ඥාණසම්ප්‍රයුක්ත මහාක්‍රියා චිත්තය, ජවන ක්‍ෂණයෙන් සත්වරක් දිවෙයි තත්සම්ප්‍රයුක්ත ඥාණය "සර්වඥතාඥාණ" නම්.

එය අග්‍ර මාර්ගානන්තරව ඵලචිත්තයෙන් උපැන් බැවින් "විමොක්ඛාන්තික" නම් ප්‍රතිසම්භිදා පාළියෙහි "විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධිමූලෙ සබ්බඤ්ඤුතඤාණස්ස පටිලාභා සච්ඡිකතාය යදිදං බුද්ධො"ති උදුළුබැවින් තදර්ථව බොධ්‍යයයි. අර්ථකථායෙහි "විමොක්ඛො අරහත්තමග්ගො විමොක්ඛස්ස අන්තො අරහත්තඵලං තස්මිං විමොක්ඛන්තෙ භවං විමොක්ඛන්තිකං නාම සබ්බඤ්ඤුතඤාණං භවති" යි කියනලදී ආචාර්‍ය්‍යයෙකු වනාහි මග්ගාවසානෙ පච්චවෙක්ඛණවීථි හොති තතො සබ්බඤ්ඤුතඤාණ වීථි හොතියි කියත්. අර්ථකථාචාර්‍ය්‍යවාදයෙන්ම ක්ෂණානන්තරමුත් ඥානානන්තර අනුසානසි.~

---

විද්‍යා නම්

ඉද්ධිවිධං දිබ්බසොතං පරචිත්ත විජානනං
පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛු ආසවක්ඛයො, යි උක්ත ෂට්කයයි.~ විදර්ශනා ඥාණය මනොමය සිද්ධීන් අටබඅ සූත්‍රාගතයි.~

~ චරණ නම් ~

සීලවරං ඉන්ද්‍රියසංවරොච මත්තඤ්ඤුතා ජාගරියානුයුත්තො
සද්ධා හිරොත්තප්ප බහුස්සුතත්තං පරක්කමොචෙව සතිමතීච
චත්තාරි ඣානානි මනාභිරාමා තිපච ධම්මා චරණාති ජඤ්ඤා

මෙහි අසංගෘහිත සෙසු බුද්ධගුණයෝ දසබල චතුර්වෛශාරද්‍යඥාණ අෂ්ටාදශ බුද්ධධර්ම ව්‍යාමප්‍රභාවන්ද චරණ ගෙයින්ම ගතයුතු දශබල ඥාණ පූර්වෝක්තයි—

චතුර්වෛශාරද්‍යඥාණ නම්

අනන්තරායෙ නිය්‍යානෙච බුද්ධත්තෙ ආසවක්ඛයෙ
ඉමෙසු චතුඨානෙසු බුද්ධා හොන්ති විසාරද

අෂ්ටාදශ බුද්ධ ධර්ම නම්

කායාදීසු චාරෙසු දුච්චරිතස්ස භාවතා
කාලත්තයානුවත්ති ධම්මෙ අප්පටිහත ඤාණතා
කායවචී මනොකම්මෙ ඤාණපුබ්බංගමත්තතා
ඡන්දවිරිය සතීනං නත්ථි හානත්තනාදචා
ඛලිතච සහසාච අබ්‍යාවට මනප්පිච
නත්ථාකුසල චිත්තංච සම්බුද්ධස්ස තාදිනො

—0—

ඛ්‍යාමප්‍රභා නම්

මනා ශොභා විලාසයෙන් සමුපේත න්‍යග්‍රොධ ඡායාවක් මධ්‍යාහ්න යෙහි යම්සේද; එසේම භගවත්හු ශ්‍රීකාය පරික්ෂේපයා (බඹ) ව්‍යාමයෙන් ව්‍යාමමාත්‍ර විස්තීර්ණවූ ප්‍රභාසම්පත්තියයි-

යථොක්තගුණ ප්‍රාසිද්ධත්වයෙන් බුද්ධශබ්දප්‍රාච්‍යසී—ප්‍රාරංභයෙන් ජිතමාරාදිකං යනු යෙ නුදු ප්‍රාච්‍යසී තාන් පර්‍යායෙන් තුල්‍යාධිකරණ විශෙෂනවී යි පරිහාරයි. තවද;

මේ ප්‍රණාම ගාථායෙහි ප්‍රණාමක්‍රියානිශ්‍රිතවූ ආනෘශංසය කෙසේ දෘෂ්ට ධාර්මිකවේද; යනු චොදනායි—

දන චෙතනා වනාහි ප්‍රත්‍යයධාර්මිකත්වය චෙතනා මහත්තත්වය- වස්තුසම්පත්තික ගුණාතිරෙකත්වය යන චතුර්විධ සම්පදාවශයෙන්— ශුභාත්මයෙහි වෙදනීය වෙයි-

ප්‍රණාම චෙතනා තොමෝ ක්ෂෙත්‍රාධ්‍යාශ යන සම්පත්තිවය යුක්ත යෙන් එංගිකවූ දෘෂ්ටධාර්මිකවේ යනු පරිහාරයි, මෙහි දෘෂ්ටධාර් මික නම්—

ශෛලාන කුලාචාර විරහයෙන් සකස්කොට අභිවන්දනා කරන්න හුව ප්‍රවෘත්ත චෙතනායෙන් අහෙතුක සතර නාමස්කන්ධයන්ද කෘත ඝචිරූපද ඓතාහාර ධනලාභාදීන්ගේ අනන්තරා විපාකයද දෘෂ්ටධා ර්මික විපාකනම්.

— එයින් කීහ —

**භගසමොග ද්‍රද්දිවසී පණ්ණාමෙතස්ස දස්සිතො**
**පසන්නාපුබ්බබුද්ධගමො එසො පණ්ණාමමත්තෙ දස්සිතො**
**ගසාපරොප වාදදි රහිතස්ස නිදස්සිතං**
**කානාසන ක්‍රියාසෙවා ගිහෙයාපෙසුං කිරගන්තකා**

ජිනමාරාදි ගාථායෙහි අභිශබ්දලාපයයි දතයුතු—

චොදනා පරිහාරනයයි

කච්චායනභෙද අර්ථව්‍යාඛ්‍යානයෙහි ප්‍රථම ගාථාවය සම්බන්ධ අවයවාර්ථ දශීනයි.

තදනන්තරවූ, කච්චායනස්ස භෙදං යනු විස්තර කරණුලැබේ, එහි කාත්‍යා යන ප්‍රකරණයෙහි භෙදය වනාහි, කාරණූපචාරයෙන් හෝ සාමාන්‍ය වශයෙන් හෝ, එකාර්ථය, ග්‍රන්ථභෙද, සූත්‍රභෙද, සමුහභෙදයන් වශයෙන් පඤ්චවිධය විභාග වශයෙන්,

සන්ධි, නාම, කාරක, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක උණාදි යන ග්‍රන්ථභෙදයන් අටආකාරයි, සන්ධි නාම ආඛ්‍යාත කිතකයන විශයෙන්, චතුර්විධකොටද කියති—

පරිච්ඡෙද ප්‍රමාණ වශයෙන්, සන්ධි පරිච්ඡෙද පසකි, නාමපරිච්ඡෙද පසකි, කාරක පරිච්ඡෙද එකකි, සමාස පරිච්ඡෙද එකකි, තද්ධිත පරිච්ඡෙද එකකී, ආඛ්‍යාත පරිච්ඡෙද සතරකි, කිබ්බිධාන පරිච්ඡෙද පසකි, උණාදි පරිච්ඡෙද එකකැයි, මෙසේ පරිච්ඡෙද ප්‍රමාණයෙන් තෙවිස්සකි —

## සූ ත්‍ර ප්‍ර මා ණ.

දෙසැත්තෑවක් අධික-සසියක් නොහොත් සත්සිය දහයක්වෙති මෙමැකීහ-කාත්‍යායන දීපනයෙහි—

**සන්ධිම්හි එකපඤ්ඤාස නාමම්හි ද්විසතංභවෙ**
**අට්ඨාරසාධිකංචෙව කාරකෙපඤ්චතාලිසං,**
**සමාසෙ අට්ඨවීසංච ද්වාසට්ඨි තද්ධිතෙ මතා**
**අට්ඨාරසා සතාඛ්‍යාතෙ කිබ්බිධානෙ සතංභවෙ**
**උණාදිම්හිච පඤ්ඤාසං නෙකසංඛ්‍යාත පභෙදතො**
**සබ්බංසම්පිණ්ඩමාණන්තු ඡසතංසත්තති චෙව, ති**

යථොක්ත සංඛ්‍යාව, න්‍යාසයෙහි, සත්සිය දසයකැයි, මූලන්‍යාස සංඛ්‍යාවෙන් හීනයි, වණ්ණමාතිකයෝ—සසිය සැත්තෑවකැයිද යෙත්-

යථොක්ත සූත්‍රකාරකයෝ කාත්‍යායන මහා ස්වාමීහුය; ඔව්හු භාග්‍යවත්හු සම්මුඛ මහා ශ්‍රාවකයෝයි, බහුතරාචාර්‍ය්‍යයෝ මතයැ. වෘත්තිකාරකයෝ සඞ්ඝනන්දිනම්, ආචාර්‍ය්‍ය ස්වාමීහුය, උදාහරණ කාරකයෝ බ්‍රහ්මදත්තාචාර්‍ය්‍ය ස්වාමීහුය. න්‍යාස කාරකයෝ විමල බුද්ධ්‍යාචාර්‍ය්‍ය ස්වාමීහුය,— මෙහි වෘත්තිකාරකාචාර්‍ය්‍ය ස්වාමිහු සඞ්ඝනන්දිනම් අන්‍යතරාචාර්‍ය්‍ය කෙනෙකැයි බාහුල්‍යවෘත්ති නමුදු සූත්‍රකාරකවූ කාත්‍යායන මහා ස්වාමිදු, තන් නාමයෙන් ව්‍යවහෘතැයිද කියත්. නෙත්ති අට්ඨකථාදියෙහි තදන්‍ය ග්‍රන්ථයන්හිදු තදාඛ්‍යා. ලබනිහු දක්නාද ලැබෙත්.

**කච්චායනෙන කතොයොගො-වුත්තිච සඞ්ඝනන්දිනො**
**පයොගොබ්‍රහ්ම දත්තෙන-න්‍යාසොවිමල බුද්ධිනා යි**

පරිපාටියකීහ-

මෙහි "සඞ්ඝ නන්දිනො" යනු දෙවදත්තස්ස රජ්ජං-යනාදියෙහි මෙන් කර්ත්‍රර්ථයෙහි ෂෂ්ඨිය-සඞ්ඝනන්දිනාසිද යෙත් සූත්‍රවෘත්ති උදාහරණ සහිත සමූහප්‍රමාණය අෂ්ටාක්ෂරපද ගාථාරොපන සංඛ්‍යාප්‍රමාණයෙන් "සප්තශතාධික සහශ්‍රප්‍රමාණ ග්‍රන්ථයකි. අක්ෂර සංඛ්‍යාවෙන් සූපනස්දහස් සිව්සියකි, පදවිසින් අෂ්ටශත පදයකි; බණවරවිසින්, පඤ්ඤාසත් ග්‍රන්ථොනසැට භාණවාරයෙකි, ප්‍රත්‍යෙක සූත්‍රසංඛ්‍යා සහිතයි-මෙම කීහ,

අට්ඨක්ඛරා එකපදං ගාථා එකා චතුප්පදං
ගාථාචෙකා මතො ගන්ථො බත්තිංසක්ඛරසඞ්ඛතො
බත්තිංසක්ඛර ගන්ථානං පඤ්ඤාසංච සතං පන
භාණවාරොති සොවුත්තො අට්ඨක්ඛරස හස්සකො

~ ප්‍රයෝග භේදය ~

සන්ධි භේදය, නාම භේදය, කාරක භේදය, සමාස භේදය, තද්ධිත භේදය, ආඛ්‍යාත භේදය, කිතක භේදය, යනවශයෙන් සප්තවිධය

~ ස න්ධි භේ ද ය ~

ආගම සංධි ත්‍රයක ලෝපසංධි ත්‍රයක, ආදේශසංධි ත්‍රයක, විකාරසී සංධිවයක, ප්‍රකෘති සංධි චයක, දීර්ඝසංධි චයක, හ්‍රස්වසංධි චයක යන භේදයෙන් සප්තදශ සංධිභේදයකි.~ ඒ කිහ.

ආගමො ලොපො දෙසොච විකාරොප කතීපිච,
දීඝරස්ස වසෙනාපි සන්ධිනානා විධාමතා—

අක්ෂරභේද.

ස්වර, බ්‍යඤ්ජන, නිග්‍රහීත, වර්ග, ඝෝෂාඝෝෂ භේදවිසින්, ස්වර අටෙක් බ්‍යඤ්ජන තෙතිසකි, තෙතිස්වැන්න නිග්‍රහීතය, වර්ගපසෙකි තදසත් බ්‍යඤ්ජන පස්විස්සකි. ඝෝෂ එක්විස්සෙකි, අඝෝෂ එකලොසකි, එයින් කිහ~

තෙවඅට්ඨ සරාහොන්ති සෙසාතිංස බ්‍යඤ්ජනාමතා
බ්‍යඤ්ජනානං පරානත්ථු බින්දුසාධාරණං මතං
බ්‍යඤ්ජනෙසු පඤ්චවග්ගා බ්‍යංජනාපඤ්චවීසති
ඝොසවග්ගෙනාන විසාච අඝොසෙකාදසාමතා.

අක්ෂරොත්පත්තිභේද.

න්‍යාසයෙහි කණ්ඨ, තාල්ව, මූර්ධ, දන්ත, ඔෂ්ඨ, යනවශයෙන් පංච ස්ථානයක්ද රූපසිද්ධියෙහි කණ්ඨ, තාල්ව, මූර්ධ, දන්ත, ඔෂ්ඨ, නාසිකාස්ථාන වශයෙන් ෂඩ්ස්ථානයක්ද චූලනිරුක්තියෙහි කණ්ඨ, සිර. උර, ජිව්හාමූල, දන්ත, නාස, ඔෂ්ඨ, තාල්ව, වශයෙන් අෂ්ටස්ථානයක්ද වූකතයි—

සංග්‍රහ ගාථාවෝද වේත්

කණ්ඨතාලුමුද්ධ දන්තොට්ඨ ඨානෙසු පංචසු
අවණ්ණාචෙව කවග්ගොහ කාරොත්‍යට්ඨ කණ්ඨජා
ඉවණ්ණාචෙව චවග්ගො යකාරොත්‍යට්ඨ තාලුජා
ටවග්ගරලකාරාති දෙසිතා සත්තා මුද්ධජා

තවගගල සකාරා, ති දෙසිතාසන්ත දන්තජා
උපවග්ගොඨ ජාසන්ත සන්තානිං සෙස ජාසියුං
කණ්ඨතාලුබ්හ එවකාරො ඔකාරො කණ්ඨොට්ඨජො
දන්තොට්ඨජාව කාරොති හොන්තිසුඛ විජානයො
හකාරොති විජ්ජොසුබ්ධො පඤ්චමන්තෙහි සංයුතො
ඔරසොතෙහ සංයුතො කණ්ඨජොති පකාසිතො
අ. ආ. එ. ඔ. කවග්ගොච හකාරොකණ්ඨ ජොසඨා
චවග්ගොරල කාරාච සන්තාසිරසි ජායරෙ
ඉර්යළු චවග්ගොච තාළුම්හිතාච ජායරෙ
උඌඔවාපවග්ගොච නවඔඨම්හි ජායරෙ
තවග්ගොලසවා අට්ඨ වණ්ණාදන්තෙසු ජායරෙ
නාසිකාඩඤණනමා ආවණ්ණාවාපි අනසිමා
උරසම්ංචාපි ඔකාරො එකාරොචාපි දීපිතො
සබ්බවණ්ණාච ජිවහඨා ජිව්හාමූලෙසු ජායරෙ

——0——

## උච්චාරණ භෙදය.

උච්චාරණ නම්. චිත්තකිරිය වායොධාතුකොපයෙන් ශබ්දවීමය සිථිල (අල්පප්‍රාණ) ධනිත (මහප්‍රාණ) දීඝීහ්‍රස්ව-උච්චාරණයද. ගුරු ලඝු, උච්චාරණය. කරණනිග්‍රහ උච්චාරණය. පූර්වාපරපද සම්බන්ධවූ උච්චාරණය. පදච්ඡෙද සහිතවූ උච්චාරණය කරණය විමුක්තවූ උච්චාරණයයි—දශප්‍රකාරයෑ—මෙමෑ හීග—

**සිථිලධනිතංච දීඝරස්සං ගරුකලහුකංච නිග්ගහීතං**
**සම්බන්ධංවවත්ථිතං විමුත්තං දසධාබ්‍යංජන බුද්ධියාපභෙදො.**

## කරණ භෙදය.

කරණ නම්. අක්ෂරොච්චාරණයට, අතිශය හෙතුස්ථානයි. තාලුජාක්ෂරයන්ට—ජිව්හාමධ්‍යය කරණය. මූර්ධජාක්ෂරයන්ට-ජිහ්වොපා ග්‍රස්ථානය—කරණය. දන්තජාක්ෂර යන්ට ජිහ්වාග්‍රය-කරණය. කණ්ඨ්‍යඔෂ්ඨාක්ෂරයන්ට-ස්වකීයස්ථානය කරණයෑ. මෙම් කීහ මූඛමත්තතාර යෙහි—

**ජිව්හාමජ්ඣං තාලුජානං උපග්ගං මුද්ධජානංච**
**ජිව්හග්ගං දන්තජානංච සෙසාසකට්ඨානජා,ති**

---

## ප්‍රයත්න භෙදය

ප්‍රයත්න නම්. අක්ෂර උච්චාරණයෙහි—කරණස්පර්ශ ශක්තිසි, සංවෘතය. විවෘතය. ස්පෘෂ්ටය-ඊෂත් ස්පෘෂ්ටය-සිව්භෙදයකි—

මෙම කීහ

**සමුට්ඨානාදිකරණ විසෙසං පයත්නිරිතං**
**සංවුතත්තමකාරස්ස විවටත්තඤ්ඤසරානච**
**සංඵුට්ඨත්තඤ්ච වග්ගානං ඊසංසරලවානච**
**එවංඨාන කරණප්ප යත්නතොපාකටක්ඛරාසියුං. ති**

---

## නිග්ගහිතය

අවිවෘත මුඛයෙන්—නාසිකාස්ථානයෙපෙළා—උච්චාරණය. නිග්ගහිතයවයැ. අවිවෘත මුඛයෙන් නාසිකාග්‍රයෙපෙළා උච්චාරණය. මකාරයවයැ.

මෙම කීහ—

**කරණං නිග්ගහෙත්වාන මුඛෙනාවිවටෙනයං**
**වුච්චතෙ නිග්ගහීතන්ති වුත්තංබින්දු සරානුගං.**
**නිග්ගහීතං පනෙකාඛ් නිස්සරාවග්ගභාවතො**
**ඝොසාඝොස විනිංමුත්තා සබ්බසංපවජ්ජිමංකතං**

සන්ධි. නාම. කාරක. සමාස. තද්ධිත. ආඛ්‍යාත. කෘතක. යන භෙදයන්හි—විශෙෂ විභාගයෝ—ග්‍රන්ථ ව්‍යාඛ්‍යානයථාස්ථානයෙහි—දර්ශිතව්‍යයි—

**මෙතෙකින් " කච්චායනභෙදං " යනුයෙහි—**

විශෙෂවිභාග සැකවින් දැක්කයුතු-

—:(०):—

3 කසිකම්මාදිනාබ්‍යා පාරෙන දිප්පතියොපිතා
ඉතිකච්චාසපුත්තොතු තස්සකච්චායනො මතො
4 තෙනෙවකතසත්ථම්පි කච්චායනභාසිතංයති
කච්චායනස්සිදංසත්ථං නිම්මාවචනත්ථතො

---

ආදි ගාථායෙහි පවත් අනුපදව්‍යාඛ්‍යාණ

1 අහං, අසමච්ඡන්දවාච්‍යවූ, " යස " යයි සමුදාචරිතනාමඇති. මම. ජිතමාරාදිකං. දහනලද දිව්‍යපුත්‍රාදී. පංචමාරයන් ඇත්තාවූ. බුද්ධං. සකල ධර්මයන් ස්වයම්භූඥානයෙන් අධිගතවූ තථාගත බුද්ධීන්ද; මොහවිධංසකං, අවිද්‍යාන්ධකාර නිරාකරණ ප්‍රවීණවූ. ධම්මංච. ශ්‍රීසද්ධර්මයද. උත්තමං. මූලොත්පාටනයකළ මොහාන්ධකාරඇති සංඝං. අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝයාද. වණ්ණිතං. බුද්ධවර්ණිත ප්‍රඥාඇති. කච්චායනඤ්ච. මහාකාත්‍යායන ස්වාමීන්ද ( අභි ) වන්දිත්වා භයාදී' විරහ ශ්‍රද්ධාසිතින් ප්‍රණාමකොට–

2 කච්චායනස්ස. කාත්‍යායන ප්‍රකරණය සම්බන්ධිවූ. භෙදං. සංධිනාමාදීවූ. භෙදය. සප්පයොගං. උදාහරණ සහිතකොට. යථාරහං. අනුරූප හෙයින්. සමාසතො. සැකවින් සොතුජනානං. ශ්‍රොතෘජන සංඛ්‍යාත. ශිෂ්‍යජනයාගේ. අත්ථාය. මුඛ්‍යානුෂංගික ප්‍රයොජන සංඛ්‍යාත. අර්ථයපිණිස. වක්ඛාමි. කියන්නෙමි.–

මෙහි වක්ඛාමියි ප්‍රතිඥානුරූපවූ "අවණ්ණවිධං" යනාදී, කියනුවූවද කච්චායන ශබ්දයාගේ වචනාර්ථ ව්‍යුත්පත්ති ශ්‍රවනාර්ථීන්ට; ආදියෙහි දක්වූව මනායයි. ආභොගීවූ. ආචාර්‍ය්‍යයෝ, කසිකම්මාදිනා සි හදළෝ. පදාර්ථ

3 යොපිතා. යම් පිතෘකෙනෙක්. කසිකම්මාදිනා. කෘෂිකර්මාදීවූ බ්‍යාපාරෙන. ව්‍යාපාරයෙන්. දිප්පති. දක්නාලැබේද. හෙවත් ප්‍රකටවේද ඉති. තදර්ථයෙන්. සො. ඒ (පිතෘ) තෙම. කච්චො. කච්චනම්. තස්ස. ඔහුගේ. පුත්තොතු. පුත්‍රවූයේ. කච්චායනො (ඉති) මතො. කච්චායනනාමැති. දනී.

5 සබ්බං අට්ඨවිධං හොති සන්ධිනාමඤ්ච කාරකං
සමාසං තද්ධිතාඛ්‍යාතං කිතකං උණකං ඉති

5 සමාධීයන්ති යං තත්ථ අද්දෙසසද්ධාන මන්තරං
වඩ්ඪකීනාව ධියනායී සංධිතෙන පවුච්චති

---

4 තෙනෙව. ඒකච්චායනයන් විසින්. කතසත්ථම්පි. කරණලද. නිරුක්ති. ශාස්ත්‍රයද කච්චායනං ඉති. කච්චායනයයි. ඤායතෙ. හඟි නුලැබේ. කුම්හෙතුයත් කච්චායනස්සිදං සත්ථං. ඉති. කච්චායනස්ස. ඉදං 'සත්ථං'යන ඉම්නාවචනත්ථතො. මෙතද්ධිත වචනාඃර්ථවසයෙනි–

## විස්තර

කසිකම්මාදිනා. කචති දිප්පතීති.. කච්චො. කච්චස්ස අපච්චං පුත්තො. කච්චායනො, කච්චායනස්සඉදං. කච්චායනං. කච්චායනත්ථෙරෙන. රචිතං. පකරණං. යි සම්බන්ධයි.

කසිකම්මාදිනාබ්‍යාපාරෙන–කචතිදිප්පතීයි. ගාථා, විශයුතුවූවද. කචශබ්ද ලොපයෙනුදු—ධාත්වර්ථ නිර්වචනයෙනුදු—ගම්‍යමාන හෙයින් ඒ " කච " ශබ්ද අයොජිතයි—ඉති ශබ්දය. නාම ලාභහෙතු වාචකය. " තෙනෙව " යි එව යනු-යෙන් පිතායනු. නිවෘතිකෙරේ. තෙනයනු සංනිඝාතාර්ථය–වෘත්තොපාදානකරණකයො. අනුඥාතාර්ථයයි කියත් පිශබ්දය කාත්‍යායන සප්විර,යනු–සමපිණ්ඩනය කෙරේ–ඉදං. ශබ්දය–සත්ථං යනු වාචකය, කතංචතංසත්ථංචාති–කතසත්ථං, වචීයතෙ, අනෙනාති වචනං, අර්ථයතෙ ඤායතෙති. අත්ථො, වචනස්ස අත්ථොවචනත්ථො, තතො වචනත්ථතො—ඉත්ථිති ප්‍රකරණ පරිචෙඡද වශයෙන්

ග්‍රන්ථනාම " අට්ඨවිධං " යනාදිය කියති

5. ප–සත්ථං, කච්චායන නිරුක්ති, ශාස්ත්‍රය. සංධි. සංධියද. නාමේච, නාමයද කාරකං කාරකයද සමාසංසමාසයද තද්ධිතං තද්ධිතයද.

ආඛ්‍යාතං, ආඛ්‍යාතයද. කිතකං, කිතකයද. උණාකංඉති. උණාදිසද්දයි මෙකී භේදයෙන්, අට්ඨවිධං, අෂ්ටප්‍රකාරය.

වි-අත්ථං සූචෙතීති-සුත්තං, සුචීසුරියයි. අථවා. එතෙන, පකාසීයන්තිවා-සුත්තං අත්ථානාභිධානං. සමාහාරො. අට්ඨවිධං, සමාධීයන්ති එත්ථ එතෙනවාති සංධි,-සුත්තං, අත්ථං නමති එත්ථාති-නාමං, සුත්තං, ක්‍රියං කරොති එත්ථාති කාරකං, සමාසීයන්ති එත්ථාති-සමාසං, තෙසං හිතං, තද්ධිතං, විභත්තීහි ආඛ්‍යායතීති එත්ථාති-ආඛ්‍යාතං, හිතා කරොති එත්ථාති කිතකං, සියසානමත්ථං කරොතීති කිතං-කිතමෙව කිතකවා, උණො ආදියෙසන්ති, තෙ-උණාදයො-උණාදයො අස්ස අත්ථීති-උණකං-(ආදිසද්දලොපො) උණප්පධානා අස්ස අත්ථිතිවා—උණකං-"ඉති" යනු වුත්තපරිපාටි නිදශීනයි, සමාධියන්ති යනාදින් සංධි කියති.—

6. ප. තත්ථ, ඒ දුව කම්මාන්තයෙහි-වඩ්ඪකිනා-තච්ඡකයා විසින් යං-යම්අසුරකින්. අනන්තරං අදස්සෙත්වා පුවරුදෙඅතර විවරනොපියා සමාධීයන්ති, අප්පනු ලැබෙත්ද. ඉව, අසුරෙන්-මේෂාසත්‍රයෙහි දෙපදතුර අතරනොපියා. ධීයන්ති. සම්බන්ධකරණු ලැබෙත්ද, තෙන එයින්. සංධි. (ඉති) සන්ධිංයයි-පවුච්චති-කියනුලැබේ.—

වි, "යං. යනු. විශෙෂනාර්ථයෙහි-උපයොගයි " ඉව " යනු උපමා ජොතකනිපාතයි, " සංධි ඉති පවුච්චති "යි වියයුතු. ඡන්දානුරක්ෂණයෙන්-" ඉති " ලොපයි-වඩ්ඪකිනාව ධීයන්ති, යනු-වාක්‍යාර්ථ උපමායි, උපමානම් ත්‍රිවිධයි

" කරුණාවිය සතෙතසු යස්ස පඤ්ඤාමහෙසිනො, යනාදියෙහි " ශබ්දක්‍රමොපමා " නම්, අලීනිමාහි චක්ඛූනි, යනාදියෙහි-" අර්ථක්‍රමොපමා " නම්, ගිම්හසංතාපහිම කාල මුවදෙ ඉව, යනාදියෙහි-- " වාක්‍යාර්ථක්‍රමොපමා " නම්.—

7 සරබ්‍යඤ්ජන වුත්තානං සන්ධීනඤ්ච වසා තිධා
සරෙසු ච බ්‍යඤ්ජනෙසු විහිතා සර බ්‍යඤ්ජනා

8 ගාථාසු වුත්තභාගානත්ථං වාචාසිලිට්ඨතාය ච
ලොපාගමං කරිත්වාන විහිතා වුත්තසන්ධිකා

9 සබ්බවිතානං කිංසුධ තඤ්හි තස්ස මුසා භවෙ
සෙය්‍යථිකො පදමතො ඉදං එතෙසං නිදස්සනං

---

**ප**—7. 8. සරබ්‍යඤ්ජන වුත්තානං, ස්වරසන්ධි බ්‍යඤ්ජනසන්ධි වෘත්තසන්ධි යන; සන්ධීනඤ්චවසා සන්ධීන්ගේ වශයෙන්; තිධා, ත්‍රිප්‍රකාරයි; සරෙසු, ස්වරනිමිත්තෙන් හෝ ස්වරවිෂයෙහි හෝ; බ්‍යඤ්ජනෙසු, බ්‍යඤ්ජනනිමිත්තෙන් බ්‍යඤ්ජන විෂයෙහි හෝ; විහිතා, කරණලද සංහිතාවෝ; සරබ්‍යඤ්ජන, ස්වරසන්ධිය බ්‍යඤ්ජනසන්ධිද; ගාථාසු, ගාථාබන්ධනයෙහි; වුත්තභාගානත්ථං, වෘත්තීහුගේ නොපිරිහීම පිණිස හෝ; වාචාසිලිට්ඨතාය ච, වාක්‍යශ්ලිෂ්ටතාය පිණිසැ හෝ; ලොපාගමං, වර්ණානුච්චාර වර්ණාගමය; කරිත්වාන, කොට; විහිතා, කෘතසන්ධිය; වුත්තසන්ධිකා, වෘත්තසන්ධීද දතයුතු.

**වි**—සරන්ති ගච්ඡන්ති-සරා, බ්‍යඤ්ජීයන්ති අත්ථා එතෙහීති-බ්‍යඤ්ජනා, සරා අස්ස අත්ථීති-බ්‍යඤ්ජනා, අස්ස අත්ථීහි- සර බ්‍යඤ්ජනා, වුච්චන්ති එතායාති- වුත්ති, වුත්ති අස්සාත්ථීති- වුත්ති, සරාච බ්‍යංජනාච වුත්තාච- සරබ්‍යංජනවුත්තා, තාසං= සරබ්‍යංජන වුත්තානං, වසා, යනු විශෙෂනාර්ථයෙහි තෘතීයායි— තීහි පකාරෙහි තිධා, ච, යනු සමුච්චයාර්ථයි, ඊහිතබ්බත්තා විහිතා- වුත්තානං අභාගං, වුත්තාභාගානං- තස්ස වුත්තාභාගානත්ථං, වාචාය සිලිට්ඨෝ- වාචාසිලිට්ඨො-තස්ස භාවො වාචාසිලිට්ඨතා තාය ලොපියතෙහි-ලොපො-ආගච්ඡතීති- ආගමො තං සන්ධීච- සන්ධිකා, සකත්ථේ-කො—

### තදුදාහරණ කියත්.

**ප**—9 සබ්බවිතානං, සබ්බවිතානං යනමේද; කිංසුධ, කිංසුධ යනමේද; තඤ්හි තස්ස මුසාභවෙ යනමේද; සෙය්‍යථිකො පදමතො ඉදං යනමේද; එතෙසං, පූර්වෝක්ත ස්වර බ්‍යංජන වෘත්ත සන්ධීන්ට; නිදස්සනං, උදාහරණයි.

**වි**—සබ්බාඉධ- සබ්බ, කිංසුඉධ- කිංසුධ, යී **සරසන්ධියි** "දීඝං, පුබ්බොච" යන සූත්‍රවිෂය, තංහි-තඤ්හි, බ්‍යංජන පරනිමිති **බ්‍යංජන**

10 ලොපාදෙසංච ආගමො විකාරො පකතී තථා
දීඝරස්ස වසෙනාපි සන්ධි සත්තවිධා මතා

11 තයො තයො තයො චෙ චෙ චෙ චෙ චෙව යථාක්කමං
ති ඌණවීසති සන්ධි පණ්ඩිතෙහි විජානියා

---

**සන්ධිස**-“එහෙසඤ්ඤං සුත්තකායසීසි.සෙය්‍යථිදං-අක්ඛර පදමතො” යි කියයුතු— **වුත්තා වසානා තිලකාභිගජාජගාගො ඕ වුක්ත ව්‍යාභෙද්‍ය** පිණිසැ අක්ඛර ශබ්ද ලොපයෙන් “ සෙය්‍යථිදං අක්ඛර පද මතො”යි අපදෙස සංඛ්‍යාත විභාවෘත්ති සූත්‍ර චතුෂ්කයෙන් කායසීති. “තෙසං” යනු සාමාන්‍යාර්ථයෙහි ෂෂ්ඨියි— ලිංගත්පලලාස වශයෙනැයි යෙන්—නිද්දිසියති එතෙනවා නිද්දිසිතබ්බං වා- නිද්දෙසනං, ‘ති’ යනු ‘**ධාතවර්ථං බාධතෙ කශ්චිත් කශ්චිත් තදනු වර්තතෙ**’ වුක්ත නයින් මෙහි ධාත්වර්ථානුවර්තීයැ—

**ත්‍රිවිධසන්ධි** නිදශිතානන්තරව- **සත්තවිධ සන්ධි** කියත්

ලොපාංච, ලොපසන්ධියද; ආදෙසොච, ආදෙශ සන්ධියද; විකාරො ච, විකාරශී සන්ධියද; පකතීච, ප්‍රකෘති සන්ධිද; තථා, ඉන්මතු; **දීඝ රස්ස** වසෙන අපි, දිඝීසන්ධි හ්‍රස්වසන්ධි වශයෙන්දූයි; සන්ධි, සන්ධිහු; සත්තවිධාමතා, සප්තප්‍රකාරයයි දතයුතු—

**නිර්දෙශ කියත්.**

තයො, ලොපසන්ධි ත්‍රයක; තයො; ආදෙශ සන්ධිත්‍රයක; **තයො**, ආගමසන්ධි ත්‍රයක= චෙ, විකාරශී සන්ධිවයක; චෙ, ප්‍රකෘතිසන්ධි චයෙක; චෙ, දිඝීසන්ධි චයක; චෙ, හ්‍රස්වසන්ධි චයකැයි; **යථාක්කමං**, කියවූ පිළිවෙළින්හෝ ( ) තිඌණවීසතීසන්ධී, සප්තරසවිධ (උනුතුන්විසි) සන්ධිහු; පණ්ඩිතෙහි, ශබ්දශාස්ත්‍රාචාර්යකයන් විසින් (පාණ්ඩිත්‍ය පතන්නවුන් විසින්) විජානියා, දතයුත්තාහ—

‘**ච**’ ජාතිසමුච්චයාර්ථයි, ‘**එව**’ අවධාරණාර්ථයි, ‘**චෙව**’ යි නිපාත සමුදායක්හෝ,සන්නිට්ඨානාර්ථ,අනුඥාතාර්ථ,අවධාරණාර්ථ යනුදු,යෙත් එහි,ති ඌණවිසති සන්ධිව,යී-සන්නිට්ඨාන කෙරේ,සත්තසන්ධි නිශෙෂසන්ධි යී; පූර්වොක්තය අනුඥාතාර්ථ කෙරේ, අනුඥාතාර්ථයෙන් ඌණාධිකයන් අවධාරණයද කෙරේ.

ති ඌණවිසති යනු මිශ්‍රසංඛ්‍යාවී= සඞ්ඛ්‍යාවෝ **මිශ්‍රසඞ්ඛ්‍යාය, ගුණිත** සඞ්ඛ්‍යාය, **සම්බන්ධ** සඞ්ඛ්‍යාය, **සංඛෙත** සඞ්ඛ්‍යාය, **අනෙක**

12 සරබ්‍යඤ්ජන බින්දූනං වසෙනාහි තයො මතා
යස්සින්ද්‍රියානි චත්තාරො මෙ ඉති සරලොපතො

13 එවං සතෙ අගාරාගාරං ඉති බ්‍යජන ලොපතො
තාසාහනාහි මතං නිගහිත ලොපතාහි විඤ්ඤුනා

---

සඞ්ඛ්‍යාය, යි **පඤ්චවිධශ,** අසඞ්ඛ්‍යය දක්වා ගණන් සඞ්ඛ්‍යානම්. **අඩ්ඪතෙලසෙහි භික්ඛුසතෙහි** යනාදියෙහි ගුණිතසඞ්ඛ්‍යා නම්, **පඤ්චදසක සතානි** යනාදියෙහි සම්බන්ධ සඞ්ඛ්‍යානම්, **තිංසපුරිසනාවුතො** යනාදියෙහි සඞ්කෙත සඞ්ඛ්‍යානම්. **සහස්සරංසි සහස්සනෙත්තො** යනාදියෙහි අනෙක සඞ්ඛ්‍යානම්, මෙම කීහ—

**මිස්ස ගුණිත සම්බන්ධ සඞ්කෙතා නෙකභෙදතො**
**සංඛ්‍යා පඤ්චවිධා ඤෙය්‍යා පාළියා ආගතක්කමා**

තීහි ඌණා-තිඌණා, තිඌණාවසා වීසතිවාහි තිඌණ වීසතී, මෙහි

සංහිතෙතකපදෙ නිත්‍යා නිත්‍යා ධාතූපසග්ගයොඃ
නිත්‍යාසමාසෙ වාක්‍යෙතු සාවිවක්ෂාමපෙක්ෂතෙ,යි වුකානුසි-

තූණවීසති හි වියයුතුදු **'විවක්ඛිතස්සෙව සන්ධි භවති'** යි නියමයෙන් සන්ධි අවිවක්ඛිතයි— **කමස්ස අනුරූපං යථාක්කමං, විජානිතබ්බා** විජානියා

**සරබ්‍යංජන** යනාදීන් නිදර්ශනරූප කියත්.

12. 13 සරබ්‍යඤ්ජන බින්දූනං, ස්වරලොප බ්‍යඤ්ජනලොප නිග්ගහීතලොප සන්ධීන්ගේ; වසෙන, වශයෙන්; තයො, ලොපසන්ධි තුණක්; මතා, දතයුතු; යස්සින්ද්‍රියානි, යස්සින්ද්‍රියානි යනුද; චත්තාරොමෙ, චත්තාරොමෙ යනුද; ඉති, මේ උදාහරණ; සරලොපතො, ස්වරලොප යෙහිහෝ (ස්වරලොප වශයෙන් සන්ධියි) මතාවයි; එවංසතෙ අගාරාගාරං ඉති, එවංසතෙ අගාරාගාරං යනමේ උදාහරණ; බ්‍යඤ්ජනලොපතො, බ්‍යඤ්ජනලොප සන්ධියෙහි මතාව්‍යයි; තාසාහං ඉති, තාසාහං යනමේ උදාහරණය; නිග්ගහීතලොපං ඉති, නිග්ගහීතලොප සන්ධියයි; විඤ්ඤුනා, නුවනැත්තහු; මතං, දතයුතු—

විඤ්ඤතෙති, බින්දු- සරාච බ්‍යඤ්ජනාච බින්දුච, සරබ්‍යඤ්ජන බින්දූ. තෙසං=වසනං-වසං- පකාරසත්ති. තෙන. වසෙන. විශෙෂනාර්ථයෙහි තෘතීයායි, 'ඉති' යනු නිදර්ශනාර්ථ නිපාතයි, ලොපියතෙති

14 ම්‍යායං ත්‍යාහං සරාදෙසං ඔනාඩො බ්‍යංජනො මතො
තමහනතු මතං නිගගහි තාදෙසනාති විඤ්ඤුනා

15 අතිප්පගො පරොචාති සරාගමොති ඤූයති
බ්‍යඤ්ජනො නයිමස්සාති පුබ්බංගමං පරම්මතං

---

ලොපො, ලොපො එව ලොපනෙතා, තතො ලොපතො, නොහොත් ලොපවසෙන ලොපතො 'තොප්‍රත්‍යය' බ්‍යඤ්ජනො ලොපනෙන අස්සාති, බ්‍යජනලොපනතා= සන්ධි=තස්ස=පෙ=නතා=නිගගහීනං ලොපං යස්සාසා- නිගගහිත ලොපං, තං-නිගගහිත ලොපං- සාම්‍යාර්ථයෙහි උපයොග වචනයි, විසෙසෙන ජානාතීති විඤ්ඤු, තෙන විඤ්ඤුනා, 'හි' යනු විස්තාර ද්‍යොතක නිපාතයි. හිශබ්දය වූකලී විස්තාර වාක්‍යාරම්භ කාරණ ඵල විසෙස තත්පාකටීකරණ දල්හි අන්වය බ්‍යතිරෙකය යන අර්ථනවයෙහි පවතී—මෙම කීහ.

**වාක්‍යාරම්භෙව විත්ථාරෙ දල්හි සං ඵල හෙතුකෙ**
**තප්පාකටීකරෙචෙව විසෙසෙ අන්වයෙ පිච**
**බ්‍යතිරෙකෙ චහි සද්දො නවයෙත්ථ පකාසිතො**

යස්සඉන්‍ද්‍රියානි, යස්සින්‍ද්‍රියානි (සරාසරෙ ලොපං යනාදින් සිඩයි) චත්තාරො ඉමෙ (වාපරො අසරූපා යනාදින් සිඩයි) එවං අස්ස, එවංස (බ්‍යජනොච විසංයොගො යනාදින් සිඩයි) අග්ගි අගාරං, අග්‍යාගාරං (ඉවණ්ණො යංනවා යනාදියෙන්ද බ්‍යජනොච විසඤ්ඤොගො යනාදියෙන්ද එහි වග්ගහණයෙන්ද සිඩයි) තාසං අහං, තාසාහං (ඛවි ලොපං යනුයෙන් සිඩයි)—

**ලොප ඉක්බිති ආදෙශ කියත්.**

14 ම්‍යායං ත්‍යාහං, ම්‍යායං ත්‍යාහං යනු; සරාදෙසං, ස්වරාදෙශ යයි දතයුතු; ඔනාඩො, ඔනාඩො යනු; බ්‍යංජනො මතො, බ්‍යංජනාදෙශයයි දතයුතු; තමහනති, තමහං යනු; නිගගහිතාදෙසං ඉති, නිගගහිතාදෙශයයි; විඤ්ඤුනා, නුවනැත්තහු විසින්; මතං, ආදෙශ සන්ධියට උදාහරණ දතයුතුයි.

**වි**—ආභුසො දිසති එඑාහිවා, ආනන්බා දිසතීති- ආදෙසො, සරො ආදෙසො යස්සාති- සරාදෙසො, බ්‍යංජනො ආදෙසො යස්සාති-බ්‍යංජනො උත්තරපදලොප'බහුබ්‍රීහිසමාසයි=තඞිතයයිදයෙනි,නිගගහිතං ආදෙසං යස්සාති- නිගගහිතාදෙසං=මෙ-අයං=ම්‍යායං (යමෙදන්තස්සාදෙසො යන්නෙන් සිඩයි) තෙඅහං-ත්‍යාහං (යමෙ) දීසං) ඔ

16 සරබ්‍යංජනතො චෙව වෙ වෙ පුබ්බා විජානියා
නොපෙති එකම්ඳහං විකාරොති විජානියා

17 කොඉමනතු මනොපුබ්බං ගමොති පකතී මතා
විකාරො පකතීචෙව ඤාතුකාමෙන ජානියා

---

නඩො (ඔ අවස්ස යනුයෙන් සිඩයි) තං අහං- තමහං=(මදසරෙ යනු යෙන් සිඩයි).

15 අභිප්පගො පරොච ඉති, අභිප්පගොබො- පරොසහස්සං ය නාදිය; සරාගමො ඉති ඤසයති, සවර ආගමයෙන් සිඩ සන්ධියයි හ ගිනුලැබේ; නයිමස්ස ඉති, නයිමස්ස යන උදහරණය; බ්‍යංජනො, බ්‍යංජනාගම සන්ධිය; (ඉති ඤුයති) පුබ්බංගමං ඉති, පුබ්බංගමං යන උදහරණය; පරං, අන්‍ය (නිග්ගහිත) ආගමසන්ධියයි; මතං, දතයුතු.

වි—ඨානීනංආමද්දිඩ්ඪාආගමච්ඡතීති- ආගමො,මෙහි සරානං ආග මො- සරාගමො, පරොචාති යනතන්හි ඉති යනු මියඃසිාදඃෂ්චාචියි, සහස්සං යී සංග්‍රහයි. බ්‍යංජනානං ආගමො බ්‍යාජනො, විරූපෙකසෙ සයි, අභිප්පබො- අභිප්පගොබො, පරසහස්සං- පරොසහස්සං, (ඣච් ඔබ්‍යංජනෙ යන්නෙන් සිඩයි) නඉමිස්ස, නයිමිස්ස (යවමදනතරලා චාගමා යන්නෙන් සිඩයි) පුබ්බගමො පුබ්බංගමො (නිග්ගහිතංච ය න්නෙන් සිඩයි).

**ප්‍රත්‍යභෙද සන්ධි කියස්.**

16- 17. සරබ්‍යංජනතො චෙව, ස්වර බ්‍යංජන වශයෙන්ද; වෙ විකාර සන්ධි දෙකෙක; වෙ, ප්‍රකෘතිසන්ධි දෙකකැයි; පුබ්බා, පූර්වො ක්ත ගාථායෙහි තයො තයො, යී පූර්වයෝ; විජානියා, තතනාමයෙ න් දතයුතුතාහ; නොපෙති එකම්ඳහං, නොපෙති එකම්ඳහං යන උ දහරණ; පකති ඉති මතා, ප්‍රකෘති සන්ධියයි දන්නාලද්ද; විකාරො ප කතීච එවං, විකෘති ප්‍රකෘති වයද මෙසේ වුක්තප්‍රකාරොදහරණ වි සින්ම; ඤාතුකාමෙන; සොතෘජනයා විසින්, ජානියා, දතයුතු;

කො ඉමං මනොපුබ්බගමාතු, කො ඉමං මනො පුබ්බංගමා යන උදහරණ; පකති ඉති මතො, ප්‍රකෘතිසන්ධියයි දන්නාලද්ද; විකාරෝ පකතීච එවං, විකෘති ප්‍රකෘති වයද මෙසේ උක්තප්‍රකාරොදහරණ වි සින්ම; ඤාතුකාමෙන, සොතෘජනයා විසින්; ජානියා, දතයුතු.

සරොච සරොච සරා, බ්‍යජනොච බ්‍යජනොච බ්‍යජනා, සරූපෙ

18 සනිද්දෙසා නිද්දෙසෙන වෙ වෙ පරා විජානියා
සබ්බාති සනිද්දෙසො මුනීවරෙ පරො මතො

19 යථරිව සනිද්දෙසො හොවාදි අනිද්දෙසකො
දීඝ රස්සප්පභෙදෙවං ඤාතුකාමෙන ජානියා

---

කසෙසති. සරාච බ්‍යඤ්ජනාච සරබ්‍යඤ්ජනා තතො, ච යනු සම්පිණ්ඩනාර්ථයි. එව යනු අවධාරණාර්ථයි, ඉන් නිග්ගහිත අප්‍රසඟයි. විසෙසෙන ජානිතබ්බා විජානියා, විසෙසෙන විපරිණතන කරියන්තීති විකාරො, පකාරෙන කරියන්තීති පකති, එවං යනු නිදර්ශනාර්ථයි. ඤාණානං ඤාතුංකාමො ඤාතුකාමො; විජානියා යනු ලිඞ්ගවිපල්ලාසයි. විජානියොයි ද; න උපෙති නොපෙති ස්වර විකාර සන්ධියි; (ඛවාස) එකං ඉදං අහං එකමිදහං; බ්‍යඤ්ජන විකාර සන්ධියි; (දෙධ 1. 2. 9) කොඉමිං කොඉමං ස්වර ප්‍රකෘති සන්ධියි; (සංර 1. 3. 2.) මනොපුබ්බංගමා මනො පුබ්බංගමා බ්‍යඤ්ජන ප්‍රකෘති සන්ධියි (සරාප 1. 3. 1)

අන්‍යයෝ අපර විකාර පූර්විකාර වසයෙන් ද්විවිධයි කියත් මෙමකීහ=.

**“පුබ්බ විකාරො පරවිකාරො අපරො දුවිධො මතො”** තදපරොදාහරණ කියත්.

18 පරා, (පූර්වොක්ත විකෘති ප්‍රකෘති සන්ධි වශයෙන්) අන්‍යයෝ වෙ, දීර්ඝසන්ධි දෙදෙනෙක්; සනිද්දෙසානිද්දෙසෙන, සනිර්දේශ සන්ධිය අනිර්දේශ සන්ධිය යන වශයෙන්ද; වෙච, හ්‍රස්වසන්ධි දෙදෙනෙක් සනිර්දේශානිර්දේශ වශයෙන්ද; විජානියා, දතයුතු; සබ්බ ඉති, සබ්බ යනු; සනිද්දෙසො, සනිර්දේශ දීර්ඝයිද; මුනීවරෙ, මුනීවරෙ යනු; පරො, තදන්‍ය අනිර්දේශ දීර්ඝයිද; මතො, දන්නාලදී.

යථරිව, යථරිව යනු; සනිද්දෙසො, සනිර්දේශ හ්‍රස්වයිද; හොවාදි, හොවාදි යනු; අනිද්දෙසකො, අනිර්දේශ හ්‍රස්වයිද දන්නාලදි; දීඝරස්සප්පභෙද, දීර්ඝ හ්‍රස්ව ප්‍රභෙද; එවං, මෙසේයින්; ඤාතුකාමෙන, දැනුකැමැත්තහු; ජානියා, දතයුතු; පාදීඝ රස්සප්පභෙද සනිද්දෙසා නිද්දෙසෙන වෙ වෙ විජානියා යිදු සම්බන්ධයි.

ලොපවිකාරවසෙන නිද්දිසති එතෙනාති=නිද්දෙසො, සහ නිද්දෙසෙන යො වත්තතෙති=සනිද්දෙසො, නත්ථි නිද්දෙසො අස්සාති=අනිද්දෙසො, ‘නිර්දේශ’ නම් කාර්‍ය්‍යකෙරෙන් පෙර දීර්ඝ හ්‍රස්ව ප්‍රකෘතියි ‘අනිර්දේශ’ නම් කාර්‍ය්‍යයෙන් පසුදීර්ඝ හ්‍රස්ව ප්‍රවෘත්තියි මෙව වෙච වෙව වෙ

ලෙ අලුත්ත ඉතරීතරයොග චන්‍දයි දවහිලව්වාරණ කාලමෙතස්සාති= දීඝො, රස්සති අප්පකංකාලංති= රස්සො, දීඝො ච රස්සො ච= දීඝරස්සා තෙසං පභෙදො=දීඝරස්සප්පභෙදො තෙ-භෙද එවං යනු තෘතීයා විග්‍රහ තත්පුරුෂ නිපාතයි.

සඩා ඉධ සබ්ධ (දීඝං ) සතිදේ‍දසෙන දීඝසන්ධියි. මුනීවරෙ මුනීවරෙ (දීඝං ) අනිර්දි්‍දශ දීඝසන්ධියි. යථා ඉව යථරිව (එව ) සනිර්දේශ හ්‍රස්වසන්ධියි. හොවාදී (ගුණිත) හොවාදි (ගුණිත) (ර ස්සං ) අනිර්දේශ හ්‍රස්වසන්ධියි. පරදීඝ හ්‍රස්ව අනපෙක්ෂායෙන් අ නිර්දේශැයි කිහු;

**මෙතෙකින් සන්ධි සනලොසක් කිහු එහි "ලක්ෂලක්ෂණ ම සක්‍රෙදව ප්‍රවර්තනෙ"** යි පරිභාෂා හෙයින් සැතරස සූත්‍රයිනුදු ර කතාමැයි ඒ මෙසේයි.

සරාසරෙ ලොපං, වාපරො අසරූපා යනු සවරලොප සූත්‍රය. බ්‍ය ජනොච විසඤ්ඤොගො යනු බ්‍යජනලොප සූත්‍රය, මෙහි චග්‍රහණය හා වාපරො යනාදියෙහි එකවචනග්‍රහණයද බ්‍යජනලොප කාර්‍යක යෝග්‍ය; කවචි ලොපං බ්‍යජනෙච යනු නිගගහිතලොප සූත්‍රය; යමෙද න්තස්සාදෙසො වමොදුදන්තානං ඉවණ්ණායනනවා යනු සවරාදෙශ සූත්‍රය; සබ්බොචනති දෙධස්සච යනු බ්‍යජනාදෙශ සූත්‍රය; අංබ්‍යජ නෙ නිගගහිතං වගගන්තංවා වගෙග එහෙඤ්ඤං සයෙච මදසරෙ ය නු නිගගහිතාදෙශ සූත්‍රය; ලොපංච තත්‍රාකාරො යනු සවරාදෙශ සූත්‍ර ය, මෙහි චග්‍රහණයෙන් සැතරස වර්ණයෙක් ආගමවෙතියි රූපසිද්ධි චූලනිරුක්ති වෙයහි වුක්තය; යවමදනතරලා වාගමා යනු බ්‍යජනාග ම සූත්‍රය; මෙහි චග්‍රහණයෙන් චතුර්විංසත් බ්‍යජනයිනුදු ආගමවෙ රෙහියි කියත්; නිගගහිතංච යනු නිගගහිතාගම සූත්‍රය; කවචාසව ණ්ණං ලුත්ත (ෂට්ප්‍රසිද්ධිඃ යි වුක්තහෙයින් ලුත්තග්‍රහණයෙන් පූර්ව වි කාරය කෙරේ) යනු සවරවිකාර සූත්‍රය; දෙධස්සච යනු බ්‍යජනවිකා ර සූත්‍රය; සරෙකවචි යනු සවරප්‍රකෘති සූත්‍රය; සරාපකති බ්‍යජනෙ ය නු බ්‍යජනප්‍රකෘති සූත්‍රය; පුබ්බොච යනු සනිර්දේශ දීඝසූත්‍රය; දීඝං ය නු අනිර්දේශ දීඝසූත්‍රය; එවාදිස්සරි පුබ්බොච රස්සො යනුහා පාසස වාහොතා රස්සො යනුද සනිර්දේශ හ්‍රස්වසූත්‍රයි; රස්සං යනු අනිර්දේශ හ්‍රස්වසූත්‍රය;

**යථොක්ත සන්ධින්ගේ යථාලාභ නය කියත්**

**20** සරෙහෙව සරා පුබ්බා ලුප්‍යනාවාවී පරා රමා
බ්‍යඤ්ජනාවාගමා වාවී දීඝ රස්සාදි සම්භවා

20 සරෙහි එව, ස්වර හේතුංයන්ම නොහොත්; සරෙහි එව, අෂ්ටස්වර නිමිත්තෙහිම; ලුප්‍යනා, ලුප්තවූ; පුබ්බාසරා, පූර්වස්වරයෝ සන්ධිවාචී ප්‍රත්‍යෙක නිමිත්තෙහි අෂ්ට අෂ්ට ස්වරලොපයෙන් සූසැටෙකි; පරා, පූර්වස්වර නිමිත්තෙහි ලුප්තවූ පරස්වරයෝ සන්ධි; රමා, දෙපණසෙකි; ආගමා බ්‍යඤ්ජනාව, ආගම බ්‍යඤ්ජනද; වාවි, සූසැටෙකි; දීඝ රස්සාදි, දීර්ඝ හ්‍රස්ව ආදෙශ විකාර ප්‍රකෘතීහු; සම්භවා, යථාලාභ සංඛ්‍යා වෙති;

එව යනු නිවත්තාපනාවධාරණය; පුබ්බෙජාතා පුබ්බා; ලුප්‍යන්තං ලුප්‍යන්ති තස්මිං, වාවි යනු සඞ්කෙත සඞ්ඛ්‍යාය; කටපයාදි සඞ්ඛ්‍යා ව්‍යවහාර නයෙනි, මෙම කීහ; බ්‍යඤ්ජයන්ති අත්‍ථො එතෙහීති බ්‍යඤ්ජනා, දීඝ රස්සා ආදියෙසංතෙ=දීඝ රස්සාදයො, ආදිශබ්දයෙන් ආදෙශ විකාර ප්‍රකෘති සන්ධි සඞ්ග්‍රහවෙත්. යථාලාභ වසෙන සම්භවන්තීති=සම්භවො;

මෙහි **සරාසරෙ ලොපං** යනුයෙන් පූර්වස්වරලෝප සන්ධි සූසැටකී; **වාපරො අසරූපා** යනුයෙන් පරස්වර ලෝපසන්ධි දෙපනසෙකි, ඒ සමානහු කෙරෙන් පරස්වරලොප නැතියෙන් **අ ආ-ඉ ඊ-උ ඌ ආ අ-ඊ ඉ-ඌ උ** මෙසේ තන්හි අසම්භවවූ දොළසෙක් ඌනය. **සවමදනතරලාචාගමා** යනුයෙන් එකී එකී ස්වරනිමිත්තෙහි යවාදිහු ආගමවෙත්නුයි ආගමසන්ධි සූසැටකි; තදන්‍යයෝ මෙම සූත්‍රයෙන් සාධ්‍යාගමසන්ධීහු එක්සියදසානුවකැයි කියති. ‘දීඝරස්සාදි සම්භවන්තා’ යනමෙහි දීඝනම්; ‘සරාසරෙ ලොපං’ යන සූත්‍රයෙන් පූර්වස්වර අට යථාලාභස්ථානයෙහි ලුප්තකළකලැ පරවූ ත්‍රිවිධ හ්‍රස්වයන්ට දීර්ඝවනුයෙන් හ්‍රස්වත්‍රිකයට දීර්ඝප්‍රාප්ති තිර්ති සූවිස්සක් සම්භවේ; ‘වාපරොඅසරූපා’ සී සූත්‍රයෙන් අසමානස්වර ලොපයක් වනුයෙන් තන්නිමිත්තෙහි පූර්වස්ථ ස්වරත්‍රයටත් දීර්ඝ සම්භවයෙන් පරස්වරලොප නිමිත්තෙහි පූර්වහ්‍රස්වස්වර ත්‍රිකයට දීර්ඝප්‍රාප්ති අෂ්ටාරසයකි. මෙසේ පූර්වාපර ස්වරලොප නිමිතින් දීර්ඝසන්ධි දෙසාලිසෙකි; බ්‍යංජන පරනිමිත්තෙහි හ්‍රස්වත්‍රිකයට දීර්ඝ සම්භවනුයි ප්‍රත්‍යෙක හ්‍රස්වස්වරයෙක් දෙතිස් දීර්ඝවන හෙයින් ත්‍රිගුණිතවූ සයානුවක්වේ. තද්භය සම්පිණ්ඩනයෙන් ඒසිය අටතිසෙක්. හ්‍රස්වයනුදු සයානුවෙකි. ආදි ශබ්දයෙන් ගෘහිත ආදෙශ විකාරයීහුදු යථාලාභ යොජනාය ප්‍රකෘතීහු සූසැටකි; ස්වරප්‍රකෘතීහා දෙසිය පනසක් බ්‍යංජන ප්‍රකෘතිද්‍යයි මෙසේ තුන්සිය විස්සක් ප්‍රකෘති සන්ධීහුයි,

**සන්ධිලක්ෂණානන්තරව අසන්ධි ලක්ෂණ කියයි.**

21 කාලවණ්ණ ව්‍යවධානෙ සන්ධිනාම නසම්භවෙ
යථාසු දුතියන්තෙන තතියාදිවකා ලිකං.

22 සබ්බසඞ්ඛාරා අනිච්චාති යදාපඤ්ඤාය පස්සති
අථනිබ්බින්දතී දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා.

23 සකිං එව මහාරාජ සබ්භිකුබ්බෙථ සන්ථවං.
ඉච්චාදිසුච වණ්ණෙන ව්‍යවධානං විජානියා.

24 පුනසද්දහානෙන ගච්ඡෙය්‍යං සුඛුම්මවජ්ජිතො අහං
වාචාසිලිට්ඨතායවා පෙසුඤ්ඤ විගතොපිච—

**සප්පයොගං සන්ධිභෙදං සමත්තං**

---

කාලවණ්ණ ව්‍යවධානෙ, කාලයෙන්හා වර්ණයෙන්; ව්‍යවධාන, බාධාඇතිකල; සන්ධිනාම නසම්භවෙ, සන්ධිකාය්‍යීය නොලැබේ; ගාථාසු, ගාථාවන්හි; දුතියන්තෙන, ද්විතීය පාදාන්තවර්ණයෙහා; තතියාදිච, තෘතීය පාදයාගේ ආදිවර්ණයද; කාලිකං, කාලව්‍යවධාන සථානජය, සබ්බ—පෙ—පස්සති- අථනි—පෙ—විසුද්ධියා- යනු උදාහරණයි- පස්සතියි ද්විතීය පාදාන්තයෙහා "අථ" තෘතිය පාදදියද යනමේ දුතුර උච්චාරණ කාලක්ෂෙප ඇතිසෙන්, කාලව්‍යවධානනුයි සන්ධිබාධකය— සකිං එව මහාරාජ—පෙ—සන්ථවං=ඉති ආදිසු මෙආදින්හි; වණ්ණෙන, වර්ණවශයෙන්; ව්‍යවධානං, බාධාව; විජානියා, දතයුතු; "සකිං එව," යනුයෙහි ' ඉ එ ' යන ස්වරමධ්‍යයෙහි 'ං' නිග්ගහීත පතිතයෙන් වර්ණවිසින් සන්ධිකාය්‍යී බාධකය—

කරොති එත්ථාති කාලං- රකාරස්ස ලකාරො වණ්ණීයති එතෙහිති වණ්ණා- ඉධ නිග්ගහීතං=කාලංච වණ්ණංච කාලවණ්ණං- මරියාදා වසෙන අවතිට්ඨති එත්ථාති ව්‍යවධානං= කාලවණ්ණෙහි ව්‍යවධානං යස්සතං-කාලවණ්ණ ව්‍යවධානං=තස්මිං කාලන්තරිතෙසු සුත්තං කාලිකං. අථවා වණ්ණීයති කපීයති එතෙනාති වණ්ණං. නිග්ගහීතං, වි. අව. තිට්ඨති අන්තිකං කරොතීති- ව්‍යවධානං-වි-අව-ධානංවා ව්‍යවධානං,තස්මිං ව්‍යවධානෙ-වෙහි වි. අව පූර්වධාතුතොමො ස්වාර්ථ විජහනය කෙළේනුයි උපසර්ගාංකුස නම්වී, උපසර්ගයෝ උපසර්ගාංකුසය. උපසර්ගානු කූලයයි ත්‍රිවිධය, උපසර්ගයුක්ත ධාතු ධාත්වර්ථය නොකියානම් උපසර්ගාංකුසය ධාත්වර්ථය නොපියානම් අනුකූලය-

**නාමං**

25 අත්ථං නමන්ති නාමෙන්ති ඉති නාමානි යානිවා
එවං නමන භාවෙන නාමං එකවිධං මතං.

---

**ආශිංසනය කියති**

අහං, මම; අනන්තප්‍රඥාඥන; සප්‍රයොග සන්ධිභෙදවූකන පූර්ණ්‍යයෙන්; සුබුද්ධිච්ඡෙකො, සියුම් ජිව් ඇත්තේ; භවෙය්‍යං, වෙම්වා; වාචාසිලිට්ඨතාවාපි, වාක්ශ්ලිෂ්ටතායෙන්ද යුක්තාවෙම්වා; පෙසුඤ්ඤ විනතොපිච, පෛශුන්‍ය වචන නැත්තේද වෙම්වා; තීක්ෂණපඤ්ඤ, නිදර්ශිතත්වයෙන් තියුනුනුවනැත්තේදසන්ධිවශයෙන් උච්චාරණශුබත්වය විනුයෙන් වාක්ශ්ලිෂ්ටතාය ඇත්තේද සන්ධිමෙන් අන්‍යොන්‍ය සන්ධිය පෛශුන්‍යවිරහයෙන් වනුයෙන් පෛශුන්‍ය නැත්තේද වෙම්වා, 'යි ආචාර්යයන්ගේ ප්‍රතිඥා තාත්පර්යයෙනි.

සප්පයොගං, උදාහරණසහිතවූ; සන්ධිභෙදං, සන්ධිභෙද පරිච්ඡේදය; සමත්තං, සම්පූර්ණයි;

**සන්ධිභෙද අනතුරු නාමභෙද කියත්**

25. යානි, යම් පදකෙනෙක්; අත්ථං, අර්ථයට; නමන්ති, තමා වාචකත්වයෙන් නැමෙත්ද; නාමෙන්තිවා, තමා වාච්‍යත්වයෙන් අර්ථයහෝ නම්වත්ද; ඉති, එසින්; නාමානි, නාමනම්; එවං නමනභාවෙන, මෙසේ නැමීම් භාවලක්ෂණයෙන්; නාමං, ගො-පුරිසාදිනාමපදය; එකවිධං, එක්ප්‍රකාරයි; මතං, දන්නාලදි.

අර්ථතෙ ඤායතෙති- අත්ථො, තං නමන්ති යනු ශුද්ධ කතෘකත්‍රියායි. නාමෙන්ති, යනු හෙතුකතෘක ක්‍රියායි. නමිතබ්බං නමනං=භවනති බුද්ධි එතෙනාති= භාවො=නමනස්ස භාවො නමනභාවො=තෙන. ඉති යනු නාමලාභ හෙතුවාචකය. එවං යනු නිදර්ශනාර්ථය. එකොවිධො යස්ස තං= එකවිධං.

**නමන භාවය.**

නමනනම්, විඥානොත්පත්තිය. භාවනම්, නාමාද්‍යර්ථ පංචකය. යම්විටක ගවාදි ද්‍රව්‍යදර්ශනයෙහි හෝ ගොශබ්දාදිශබ්ද ශ්‍රවණයෙහි හෝ අභිධාන අභිධෙයයන් අනුව මේ කිමෙක්දැයි සිතනුහට ප්‍රථම

26 එත්ථාන්වත්ථරූළ්හීනං වසෙන දුවිධං මතං,
පංසුකූලික හිස්සාදි භාසිතං තං යථාක්කමං.

27 නාමනාමං සබ්බනාමං සමාසං තද්ධිතං තථා
කිතනාමංහි විඤ්ඤූහි නාමං පඤ්චවිධං මතං.

---

ච විග්‍රහය නමන භාවයෙන් ගොවාද්‍යර්ථයකැයි බුද්ධිය උපදිද; ඒ අර්ථයකරාහෝ අර්ථයහෝ නමනභාවයවේ. නාමනම්ද්‍රව්‍යයි.

**සාමාන්‍යලක්ෂණ අනතුරුව විශෙෂ ලක්ෂණ කියත්**

26. එත්ථ, මේසාමාන්‍යයෙන් එකවිධවූ නාමයෙහි; අන්වත්ථරූළ්හීනං, අන්වර්ථ රූඪිය යනමුන්ගේ; වසෙන, වශයෙන්, දුවිධංමතං, ද්විප්‍රකාරයෙන් දත්තාලදී; තං, ඒ ද්විවිධය; (උදාහරණ) යථාක්කමං, ක්‍රමසංඛ්‍යායෙන්; පංසුකූලික හිස්සාදී, පංසුකූලිකය හිස්සය යනාදියෙහි; භාසිතං, කියනලදී;

අත්ථං අනුගතං අන්වත්ථං රූළ්හාති සමාරොපෙතීති=රූළ්හී= අන්වත්ථංච රූළ්හිච= අන්වත්ථ රූළ්හී=තෙසං= අන්වත්ථ රූළ්හීනං= පංසුකූලං ධාරෙතීති අත්ථිහිච=පංසුකූලිකො- අන්වර්ථයට උදාහරණය. හිස්සය නු ධාතුප්‍රත්‍යයව්‍යාවර්ථරහිතව උපචාරාර්ථවනුයෝ රූඪියට උදාහරණය. පංසුකූලිකොච හිස්සොච= පංසුකූලික හිස්සා-තෙ ආදිසද්දසංතෙ, පංසුකූලිකහිස්සාදී-තම්හි-ප—පෙ—දිම්හි-විභත්තිනැතදගාථා ඡන්දානුරක්ෂණයෙහි ලොපයි. තං යනු වුත්තාපෙක්ෂාහෝ පක්ඛාත්තවිෂයහෝ වෙයි. මෙච්ඡීහ—

**පක්ඛාතත්ත විසයොචෙව පසිද්ධ විසයො තථා,**
**අනුභූතවිසයොචෙව තං සද්දොනුපෙක්ඛතො.**

**අන්වර්ථ රූළ්හි වශට අනතුරුව නාමපද පඤ්චකය කියත්**

27. නාමනාමං, ගුඩනාමය; සබ්බනාමං, සාමාන්‍යනාමය; සමාසං, සමාසාන්තනාමය; තද්ධිතං, තද්ධිතාන්තනාමය; තථා, එසේම; කිතනාමං, කෘදන්තනාමය; ඉහි, මේභේදයෙන්; නාමං, නාමව්‍යවහාරය; පඤ්චවිධං, පඤ්චප්‍රකාරයයි; විඤ්ඤූහි, විශේෂඥන්නා නුවණැත්තන් විසින්; මතං, ගැනයයි. නාමංච තං නාමං චෙති- නාමනාමං- සබ්බනාමාදියද මෙසේය. සමාසං යනාදියෙහි උත්තරපදලොපයිද ගෙත්. විසෙසෙන ජානාතීති=විඤ්ඤූ=තෙහි.

**එසින් නාමනාමයෙහි භේදකියත්**

28 සාමූහිකඤ්ච පච්චේකං විකප්පඤ්ච සංයෝගිකං.
සම්බන්ධිකං පටිපක්ඛං නාමනාමං ඡධාමතං

29 සාමූහිකං ඝටපටො පච්චේකං කට්ඨ වේළුයො
විකප්පාච දිසාකාලො කණ්හසප්පා සංයෝගිකො.

30 සම්බන්ධිකො ගොතමාදී පටිපක්ඛා කිසාදයො
සප්පයොගානි නාමානි පණ්ඩිතෙහි විජානියා.

---

28. සාමූහිකංච, සාමූහික නාමයද; පච්චේකං, පච්චේක නාමයද; විකප්පංච, විකප්ප නාමයද; සංයෝගිකං, සංයෝගික නාමයද; සම්බන්ධිකං, සම්බන්ධික නාමයද; පටිපක්ඛං, පටිපක්ඛ නාමයදැයි යන භේදයෙන්; නාමනාමං, සුද්ධ නාමය; ඡධාමතං, සඩ්ප්‍රකාරයයි දතයුතු.

සමූහො එතස්ස අත්ථීති- සාමූහිකං- පටිවිසුං එකො සයමෙව වදතීති- පච්චේකං- පරමත්ථතො අවිජ්ජමානං විකප්පෙතීති- විකප්පං= සංයෝගං අස්සත්ථීති- සංයෝගිකං- සම්බන්ධො අස්ස අත්ථීති- සම්බන්ධිකං- පටිවිරුද්ධභාවෙන පක්ඛති පවත්තතීති= පටිපක්ඛං. වෙන්වෙන්ව ප්‍රවෘත්තිතාර්ථයන් එකස්ථාභිධානය- සමූහිකය- අන්‍යමිශ්‍රවෙකාර්ථාභිධානය- පච්චේකය- පරමාර්ථාභිධානය= විකප්පය- අන්‍ය වස්තූසම්බන්ධාර්ථාභිධානය- සංයෝගිකය- ජනක සමූහහෙත්වාද්‍යර්ථ සම්බන්ධත්වයෙන් ජන්‍යවූ අන්‍යවස්තුක සංයෝගාර්ථාභිධානය- සම්බන්ධිකය= අන්‍යවිරුද්ධ ප්‍රතිනීතාර්ථාභිධානය පටිපක්ඛය, මොහු අර්ථාභිධානයිනුදු අර්ථවත් ශබ්දයෝද නාමාරනාම ව්‍යවහාර ලබත්නුයි. සාමූහිකාදීන් වුත්තාන.

### ඔවුන් ප්‍රභින්නෝද්දේශවශයෙන් උදාහරණ කියත්

29. 30. ඝටපටො, ඝට පට යනාදිය; සාමූහිකං, සාමූහිකනාමය; කට්ඨවේළුයො, කඩ වෙළු යනාදිය; පච්චේකං, පච්චේක නාමය; දිසාකාලො, දිසා කාල යනාදිය; විකප්පා, විකප්පනාමය; කණ්හසප්පා, කණ්හ-සප්ප යනාදිය; සංයෝගිකො, සංයෝගිකනාමය; ගොතමාදි, ගෞතම යනාදිය; සම්බන්ධිකො, සම්බන්ධිකනාමය, කිසාදයො, කිසය යනාදිය; පටිපක්ඛා, පටිපක්ඛනාමය යනමේ භෙදයෙන්; සප්පයොගානි, සඋදාහරණවූ; නාමානි, නාමයෝ; පණ්ඩිතෙහි, නුවණැත්තන් විසින්; විජානියා, දතයුතු.

ඝටොච පටොච- ඝට පටො- සෙස්ස සුබොධය. පණ්ඩසංඛාතෙ

31 පයොගවචනානං වචනං ගුණපුච්ඡා පමාණිකං
සබ්බසබ්බං දිසාවත්ථා සඞ්ඛ්‍යා කාලාති දසධා.

32 පයොගවචනං යං තංහි තුම්හාම්හ වචනං තථා
නීලපීතං ගුණො නාම පුච්ඡා කතර කතමං.

33 අප්පං ථොකං පමාණන්තු සබ්බසබ්බෙ තරඉතරං
දිසාපුබ්බා අපරාච දීඝරස්සාදි අවත්ථා.

34 එකද්විතිචතුසඞ්ඛ්‍යා කාලන්තු අතීතාදයො,
දසධා සබ්බනාමානි සප්පයොගා විජානියා.

---

නා ලක්ෂණන යුතානා පවත්තනානි- පණ්ඩිතා- තෙහි- ඝට පටාදි උදාහර ණ සාමූහිකාදි අර්ථයන් පරිදි ප්‍රභේදකත විභාගයෙහින් බෝධියයි

**එයිනික්බිති දසවිධ සර්වනාමකියත්**

31. පයොගවචනානං—පෙ—"ප්‍රයොගවචනා" සර්වනාමය- වචන ය- ගුණය- පුච්ඡාය- පමාණිකය- සබ්බසබ්බය- දිසාය- අවත්ථාය- සඞ්ඛ්‍යාය- කාලය- යි; ඉති, මේ ප්‍රකාරයෙන් සර්වනාමය; දසධා, දසවිධය.

පයොජීයතෙහි= පයොගො=ඝටපටපුරිසාදි ශබ්දය- පයොගො අස්ස අත්ථීති= පයොගවචනානං- යං තං කං ආදිය-උච්චතෙ අනෙනාති= වචනං. තුම්හාදිය. ගුණීයතෙත අනෙනාති= ගුණං- නීලාදිය. පුච්ඡී යතෙත අනෙනාති=පුච්ඡා=කතරාදිය පකාරෙන මානෙතී එත්ථාති- පමාණිකං- අප්පං යනාදිය. අවයවෙහි සහ වත්තතීති=සබ්බං-සබ්බං චතං සබ්බං චෙහි- සබ්බසබ්බං=ඉතරාදිය. ඉන්දාදයො දිස්සාය පස්ස න්තීති- දිසා- පුබ්බාදිය-වත්ථං ධුවං එතායාති- අවත්ථං- දීඝාදිය. සංඛ්‍ය යතෙහි-සංඛ්‍යා-එකාදිය. කරොති කරණංවා-කාලං- අතීතාදිය, යං තං යනාදීහු ඝටපුරිසාදිප්‍රයොගයකින්විනා අර්ථාවබොධනොකෙරෙ ත්නුයි ප්‍රයොගිකනම්. තුම්හ අම්හ ශබ්දයෝද අන්‍ය ප්‍රයෝගයකින් ඇර අර්ථාවබොධ නොකෙරෙත්නුයි වචන නම්. සෙසස සුබොධයි.

32- 33. 34. යං තං, යං තං යනාදිය; පයොගවචනානං, එනම්ය; තුම්හ අම්හ, තුම්හාම්හලිඞ්ගයන්නු;තථා,එසේම;වචනං, එනම්ය;නීලං පීතං යනු; ගුණොනාම, ගුණනම; කතරකතමං, කතරකතමං යනාදිය; පුච්ඡා, එනම්ය; අප්පංථොකං, අප්පං ථොකං යනාදිය; පමාණං (තු) එනම්ය; "තු" නිපාතය; ඉතරං, ඉතරං යනාදිය; සබ්බ සබ්බං; එන ම්ය; අපරාච, පුබ්බ අපරයනාදිය; දිසා, එනම්ය; "ච" යනු නිපාතය;

35 ලීනං අපාකටං අඞ්ගං ලීනංගමයතීතිවා ·
ලිඞ්ගං නාමන්ති විඤ්ඤෙය්‍යං නාමං ලිඞ්ගංහි සා දිසං.

36 යාසාච ඉත්ථියාලිඞ්ගං යොසො පුල්ලිඞ්ග මෙවච
යං තං නපුංසකඤ්චෙති තිවිධං ලිඞ්ගලක්ඛණං,

---

දීඝරස්සාදි, දීඝරස්ස යනාදිය; අවත්ථා, එනම්ය; එකබිතිචතු,එක-බි- ති- චතු- යනාදිය; සංඛ්‍යා, එනම්ය; අතීතාදයො, අතීත යනාදිය; කාලං, එනම්යයි; සප්පයොගා, සහෝදාහරණවූ; සබ්බනාමානි, සර්වනාමයෝ; දසධා, දශප්‍රකාරයයි; මතා, දත් නාලදහ. මෙහි සබ්බනාමානීදි- සප්පයොගාසීද- යොදනුවෝ සර්වනාම අකාරාන්තයෙන් යොනීත් ආකාරාදෙශ විකල්පබව කීහ—

**නිච්චමෙවච පුල්ලිඞ්ග අනිච්චංච නපුංසකෙ**
**අසනානං ඤෙකනතෙතතු විධිං දීපෙති වාසුනි.**

සමාස තද්ධිත කිතක නාමයන් තදස්ථානයන්හි විස්තරමානයෙන් මෙහි අවිවක්ෂිතය.

**දැන් නාමලිඞ්ග වශයෙහි සමානාර්ථය කියති**

35. ලීනං, සේයි; අපාකටං, අව්‍යක්තවූ; අඞ්ගං, අඞ්ග (අවයව) නුයි හෝ; ලීනං, ලීනාර්ථය; ගමයතීතිවා, බොධ්‍යකෙරෙනුයි හෝ; නාමං, නාමය; ලිඞ්ගං ඉති, ලිඞ්ගනාමැති; විඤ්ඤෙය්‍යං, විඥානය කළයුතු; හි, ඒ සැබව; ලිඞ්ගං, ලිඞ්ගයනුද; නාමං, නාමයනුද; සාදිසං, සාදෘශ්‍යය; ලිඞ්ගං නාමන්ති විඤ්ඤෙය්‍යං යිද මිතානතරයි.

ලීනඤ්ච තං අඞ්ගංචෙති ලිඞ්ගං ලීනඞ්ගං,යී රූපප්‍රාප්තියෙහි න කාරාදි ලොපයෙන් සිද්ධය. "ති" යනු දළහිකරණාර්ථය, මෙහි ලිඞ්ග නාම්. ප්‍රඥප්තියයි. **"ලිඞ්ගං හෙතුඃ"** යී නිරුක්තිකාරයන්ගේ ලිඞ්ගනාම් **හෙතුයයි** කීහ.

**සාමාන්‍ය ලිඞ්ගලක්ෂණ අනතුරුව ත්‍රිවිධ විශෙෂ ලක්ෂණ කියති**

36. යාසා, යා සා යනු; ඉත්ථියා ලිඞ්ගං, ස්ත්‍රීලිඞ්ග වාචකය; යොසො,යො සො යනු; පුල්ලිඞ්ගංඑවච,පුම්ලිඞ්ගවාචකයමය; යං තං, යං තං යනු; නපුංසකංච, නපුංසක ලිඞ්ගවාචකයයි; ඉති, මේ භෙදයෙන්; ලිඞ්ගලක්ඛණං, ලිඞ්ගලක්ෂණය; තිවිධං, ත්‍රිප්‍රභෙදවේ.

**සුතබ්‍රම්භතාකමපි ඉච්ඡතීති—ඉත්ථි, තාය පුමස්ස ලිඞ්ගං—පුල්**

37 ආවත්ථි ලිඞ්ගිකං නෙමිත්ති කාධිච්ච සමුප්පන්නං
වච්ඡෝදණ්ඩීච තෙවිජ්ජෝ සිරිවඩ්ඪනකො මතො.

38 ක්‍රියාජාතිගුණං යාදි වජ්ජනාභිවා චතුබ්බිධං
පාවකොච අසෙසා රාජා තෙවිජ්ජොච නිස්සාදයො.

39 සාමඤ්ඤගුණ කිත්තීව ඔපපාතිකතොථවා
මහාසම්මත තෙවිජ්ජෝ තෙමියො වඤ්ජිමාදිකො.

---

ලිඞ්ගං නපුංසෙතීති—නපුංසො—සොච, නපුංසකං "ච" පදපූරණෙහි. "එච" යනු අවධාරණය ලක්ඛිතබ්බං ලක්ඛණං, ලිඞ්ගස්සලක්ඛණං ලිඞ්ගලක්ඛණං.

**දැන් තත්ත්‍රිකයෙහි ප්‍රභෙද්‍යකභෙද ලබ්භ්‍යමානයෙන් කියත්**

37. 38. 39. ආවත්ථි, ආවත්ථික ලිඞ්ගය; ලිඞ්ගිකං, ලිඞ්ගික ලිඞ්ගය; නෙමිත්තිකං, නෙමිත්තික ලිඞ්ගය; අධිච්ච සමුප්පන්නං, අධිච්චසමුප්පන්න ලිඞ්ගය දූයි චතුර්විධය; වච්ඡෝ, වච්ඡ යනුද; දණ්ඩී, දණ්ඩීයනුද; තෙවිජ්ජෝ, තෙවිජ්ජ යනුද; සිරිවඩ්ඪනකො, සිරිවඩ්ඪනකයනුද; මතො, යථාක්‍රමයෙන් උදාහරණ දතයුතුය.

ක්‍රියාහි ගුණං, ක්‍රියානිමිත්ත ලිඞ්ගය, ජාතිනිමිත්තලිඞ්ගය ගුණනිමිත්තලිඞ්ගය; යාදිවජ්ජකං, යාදිවජ්ජක ලිඞ්ගය; ඉති, යනභෙදයෙන්; චතුබ්බිධං, චතුර්විධලිංගලක්ෂණ ඇක්දවේ. පාවකොච, පාවකයනුද; අසෙසා, අසෙසයනුද; රාජා රාජායනුද, තෙවිජ්ජෝ, තෙවිජ්ජෝයනුද; නිස්සාදයොච, නිස්සන්තාදියද; යථාක්‍රමයෙන් උදාහරණ දතයුතු.

අථවා, තවද; සාමඤ්ඤගුණකිත්තිම ඔපපාතිකතො, සාමඤ්ඤලිඞ්ගය. ගුණලිංගය. කිත්තිමලිඞ්ගය ඔපපාතික ලිඞ්ගය යනවශයෙන් චතුර්විධය; මහාසම්මත තෙවිජ්ජෝ, මහාසම්මතය. තෙවිජ්ජය; තෙමියො වඤ්ජිමාදිකො, තෙමියය, වඤ්ජිමය, යනාදිය, යථාක්‍රමයෙන් දතයුතු. අවත්ථාය නියුත්තං ආවත්ථිකං, ලිඞ්ගමුප්පාදය පවත්තං, ලිඞ්ගිකං, ලඞනිමිත්තං කාරණං උපාදය පවත්තං, නෙමිත්තිකං, අධිකං කත්වා සමුප්පන්නං අධිච්චසමුප්පන්නං, කාතබ්බා, ක්‍රියා, ජනනං, ජාති, ගුණීයතෙහි ගුණං. යායා ඉච්ඡා අස්සිති, යාදිවජ්ජං, සමානස්ස භාවො, සාමඤ්ඤං, සාමඤ්ඤං අස්සිති, සාමඤ්ඤං වා, කිත්තිං අස්සිති, කිත්තිමං උපපතති අවිජ්ජමාන විසෙස පවත්තතීති, ඔපපාතිකං, තතො

**වුක්තනාමයන්ස්ත්‍රීපුං නපුංසක ලිඞ්ගවශයෙන් මාදශභෙදකියත්**

40 තිලිඞ්ගෙසෙවෙක මෙකස්ස චතුභෙද භාවතො
ද්වාදසප්පභෙදං ලිඞ්ගං පණ්ඩිතෙහි විජානියා.

41 තත්ථා ඉ ඊ උ ඌ ඔ ති ඡබ්බිධා ඉත්ථියන්තතො,
අ ආ ඉ ඊ උ ඌ ඔ ති පුල්ලිඞ්ගා සත්තධාමතො.

42 නපුංසකොපි තථෙව බින්දුවණ්ණොපි තිලිඞ්ගිකො
ආවජ්ජිකාදිභෙදෙන අනන්තභෙදො විජානියා.

---

40. තිලිඞ්ගෙසු, ස්ත්‍රීපුංනපුංසක යන ලිඞ්ගත්‍රයෙහි; එක එකස්ස, එකිඑකී ලිඞ්ගපදයක්; චතුප්පභෙදභාවතො, ආවජ්ජික, ලෛඞ්ගික, නෛමිත්තික, අධිත්‍යසමුත්පන්න යන චතුර්විධ භෙදඇතිහෙයෙන්; ද්වාදසප්පභෙදං, දෙලොස් ප්‍රභෙදඇති; ලිඞ්ගං, ලිඞ්ගපද; පණ්ඩිතෙහි, පණ්ඩිතයන් විසින්; විජානියා, විජානනය කටයුතු.

තිලිඞ්ගානි සමාහටානි තිලිඞ්ගං, තෙසු, නිර්ධාරණ සප්තමිය. එකංව එකංව, එකමෙකං, තස්ස, නිර්ධාරණීය ෂෂ්ඨිය. චතුන්නං සමාහාරො, චතුප්පභෙදා චතුප්පභෙදස්ස භාවො, චතුප්පභෙදභාවො, තතො නිර්ධාරණ භාගියපදයි, ද්වාදසන්නං පභෙදානි, ද්වාදසප්පභෙදං, පූර්වොක්ත ආවජ්ජිකාදී චතුෂ්කයෙන් ස්ත්‍ර්‍යාදී ලිඞ්ගත්‍රය ගුණිතව ද්වාදශභෙදවිය. ක්‍රියාදිචතුෂ්ක, සාමඤ්ඤාදි චතුෂ්කයන්වශයෙන්ද ගෘහිතකල්හි සුවිසෙසකි. සම්පිණ්ඩිතාවයෙන් සඞ්ත්‍රිංසකයෙක් වේ.

**ශබ්දයන් අන්තවර්ණවශයෙන් රූපසිද්ධිනය කියත්**

41. 42. තත්ථ, ඒ ත්‍රිවිධලිඞ්ගයන් කෙරෙන්; ඉත්ථි, ස්ත්‍රීලිඞ්ගවාචකශබ්ද; අන්තතො, අන්තවර්ණවශයෙන්; ආ ඉ ඊ උ ඌ ඔ ඉති, ආකාරාන්ත ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත, ඔකාරාන්ත යන මේ භෙදයෙන්; ඡබ්බිධා, ෂඩ්ප්‍රකාරය. පුල්ලිඞ්ගො, පුල්ලිඞ්ගවාචක ශබ්දයද; අ ආ ඉ ඊ උ ඌ ඔ ඉති, අකාරාන්ත—පෙ—ඔකාරාන්ත යන භෙදයෙන්, සත්තධාමතො, සප්තප්‍රකාරයකින් දන්නාලදී. නපුංසකොපි, නපුංසකලිඞ්ගවාචක ශබ්දයද; තථා එව, පුල්ලිඞ්ග සමානමය; බින්දුවණ්ණොපි, නිග්ගහීතාන්ත ශබ්දයද; තිලිඞ්ගිකො, ලිඞ්ගත්‍රයම ඇත්තේය. ආවජ්ජිකාදිභෙදෙන, ආවජ්ජිකාදී චතුෂ්කභෙදයෙන්; අනන්තභෙදො, මේ අනන්තභෙදය; විජානියා, ජානනය කළයුතු. තත්ථ යනු නිර්ධාරණ සප්තමී අර්ථයෙහි නිෂ්පන්න නිපාතය. ඉත්ථි යනු නිර්ධාරණීයයි. ඡධා යනු නිර්ධාරණ හෙතුයි. පුල්ලිඞ්ගායනාදිය මෙසේදතයුතු-නිර්ධාරණනම් කිමයත්. මෙමකීන-

43 ආකාරො ඊ උ ඌති පඤ්චධා ඉත්ථියන්තතො,
අ ආ ඉ ඊ උ ඌ වෙති ඡබ්බිධා පුල්ලිඞ්ගා මතො.

44 අ ඉ උ ඉති තීණෙව නපුංසකෙ විජානියා,
ආවච්ඡිකාදිභෙදෙන ඡප්පඤ්ඤාසානි වුච්චරෙ.

---

**සංඛිත්ති ගුණකිත්ති නාමෙහි සමුද්දයතො**
**සුත්තකාරණමෙතස්ස තං නිබ්බාරණමබ්‍රවුං·**

## දැන් සබඳ නිති මතකියන්

43. 44. ඉත්ථියන්තතො, ස්ත්‍රීලිඞ්ගාන්තවශයෙන්; ආකාරො-පෙ-ඌ ඉති, ආකාරාන්ත=පෙ=ඌකාරාන්තයයි; පඤ්චධා, පංචප්‍රකාරය; පුල්ලිඞ්ගා, පුල්ලිඞ්ගාන්තය; අ ආ-පෙ-වෙති, අකාරාන්ත-පෙ-ඌකාරාන්තද්‍ය යි; ඡබ්බිධා, ෂඩ්ප්‍රකාරයයි; මතො, දත් නාල දී. නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි; අ ඉ උ ඉති, අකාරාන්ත- ඉකාරාන්ත- උකාරාන්ත- වශයෙන්; තීනි එව, තුන්අන්තයෝම; විජානියා, විඥනව්‍යය; ආවච්ඡිකාදිභෙදෙන, ආවච්ඡිකාදිභෙදයෙන්; ඡප්පඤ්ඤාසානි, ෂඩාධිකපඤ්ඤාසත්භෙදයයි; පවුච්චරෙ, කියනුලැබෙත්.

අ එව= අකාරො- ඉත්ථියා අන්තො- ඉත්ථියන්තො- යන්තාරය සඞ්ජය. තතො= ඉත්ථියන්තතො- විශෙෂණාර්ථයෙහි තො ප්‍රත්‍යය. ඡබ්බිධා යස්සසො- ඡබ්බිධො= අවච්ඡිකං ආදීයස්සසො- ආවච්ඡිකාදී-තස්සභෙදෙ= සොවසො භෙදොවෙති වා=ආවච්ඡිකාදීභෙදො= තෙන ඡහිඅධිකා පඤ්ඤාසා=ඡප්පඤ්ඤාසා=

මෙහිසපනසවුයේ තුදුස්අන්තයො ආවච්ඡිකාදි ඒක්වතුක්කය කින් ගුණිතවය. ත්‍රිගුණිතවීනම් ඒක්සිය අටසැටඅන්තයකි. පූර්වොක්ත ඡප්පඤ්ඤාසනය ආචාර්‍ය්‍ය වාදවශයෙන් ශබ්දනීතිභ්‍යාස මුඛමත්තසාර යන ප්‍රකරණත්‍රයෙන් සංගෘහිතය. ශබ්දනීතියෙහි= "ඔ ආ කිඤ්චි ඉ ඊ උ ඌ—පෙ—දසපඤ්චපි ඡබ්බිධානි" න්‍යාසයෙහි "තඤ්ච එකෙකං අවණ්ණිවණ්ණු වණ්ණන්තවසෙන—පෙ—එවං ඡප්පඤ්ඤාසවිධං හොන්තීති" මුඛමත්තසාරයෙහි "ආවච්ඡික චතුක්කස්ස—පෙ—ඡප්පඤ්ඤාසවිධෙ ලිංඞගභෙදෙ එවමුදීරිතං" සී, කීශු—

**ඉක්බිති කෙවිග්වාද කියන්.**

J

45 නපුංසකම්පි පුමංව කත්වා අට්ඨසට්ඨීතිච,
එකෙවදන්ති අන්තානං ගහෙතබ්බං විජානතා.

46 ඡප්පඤ්ඤාසට්ඨ සට්ඨීච වාධිකා නවුතීරිතා,
න්‍යාසෙතප්පදීපකෙ රූප සිද්ධියඤ්ච යථාරහං.

47 වුත්තියන්තු "කිමඤ්ඤාන්ති" පුච්ඡිතබ්බෙසු මිස්සපි,
පරං සන්ධිපිකත්වාන පුබ්බන්තු සම්බන්ධං කරෙ.

---

45. එකෙ, න්‍යාසටීකාචාර්‍ය්‍යාදී ඇතැම්ආචාර්‍ය්‍යයෝ; නපුංසකම්පි, නපුංසකලිඞ්ගාන්තයද; පුමංව, පුල්ලිඞ්ගිකාන්තයමෙන්; කත්වා, ශ ඞ්විධකොට; අට්ඨසට්ඨීච; අෂ්ටාධික ෂෂ්ටිසංඛ්‍යාවත්යසිද; වදන්ති, කියත්; ඉති, මෙවිවිධනයින්; අන්තානං, අන්තයන්ගේ; භෙදං, භෙදය; විජානතා, නුවනැතිවිසින්; ගහෙතබ්බං, ගතයුතු; "අපි" යනු සම්පිණ්ඩණාර්ථය, "ඉව" යනු උපමාජෝතකාර්ථනිපාතය. "ච" යනු ආකර්ෂණාර්ථවාචිය අට්ඨච සට්ඨීච= අට්ඨසට්ඨි- "එක" යනු සර්වනාමය. සර්වනාම ශබ්ද "සබ්බ= කතර- කතම- උභය- ඉතර- අඤ්ඤ- අඤ්ඤතර- අඤ්ඤතම= පුබ්බ- පර- අපර= දක්ඛිණ= උත්තර= අධර= ය= ත- එත- ඉම- අමු= කිං එක-ඞි- ති- චතු- පඤ්ච- අම්හ- තුම්හ-" යන ෂත්විස්සකැයි. ශබ්දනීති වුත්තියි.

**යථොක්ත ග්‍රන්ථකවශයෙන් නිගමන කියත්**

46. න්‍යාසෙ, න්‍යාසයෙහිද; තප්පදීපකෙ, න්‍යාසටීකායෙහිද; යථාරහං, පිළිවෙළින්; ඡප්පඤ්ඤාසට්ඨසට්ඨී, සපනසක් හා අටසැටක්ද; රූපසිද්ධියං, රූපසිද්ධිප්‍රකරණයෙහි; වාධිකානවුතීච, දෙයානූවක්ද; ඊරිතා, කියනලදී, න්‍යාසයෙහි සපනසකි තට්ටීකායෙහි අටසැටකි රූපසිද්ධියෙහි දෙයානූවකි. යනුයි. ඊරයිතබ්බං- ඊරිතං- දීපීයන්තෙ අනෙනාති- දීපකං තස්සදීපකං= තප්පදීපකං= තස්මිං. න්‍යාසටීකාව ඝනාමයි. ටීකාවනාහි ලොකව්‍යවහාරයෙහි- දිපනී- ප්‍රදීප= වණ්ණනා- දීපිකා- දීපක- යන නාමයෙන්ද කියති- ශාසනව්‍යවහාරයෙහි "ටීකා" යන නාමයම කියති. මෙම කීහ

**ටීකා ටීකා පදීපො තිලොකෙ ටීකාව සාසනෙ**
**වුත්තො විසෙසරවතො ගන්ථාපකරණං මතො.**

**ඉක්බිති කාත්‍යායන වෘත්තියෙහි "කිමඤ්ඤං" යනු සුබොධකරත්**

47. 48 වුත්තියන්තු, කාත්‍යායන සූත්‍රවෘත්තියෙහි වනාහි; කිම

48 පුබ්බං සහිපිකාඛ්‍යාන පරම්පි සම්බන්ධං කරෙ,
තීසුපි චීසු සන්තෙසු එකංච සම්බන්ධං කරෙ.

49 නාමිච්චචන පුඤ්ඤෙන නාමිතං නමනං භවෙ,
සදාචාරානඤ්ච විඤ්ඤූනං සංසරන්තො භවා භවෙ.

50 ලීනච්චචන පුඤ්ඤෙන ලීනත්ථො පාකටො භවෙ,
ලීනපඤ්ඤොහොතුථෙනොච සතිමා සීලතෙජසා.

**සද්දයොගං නාමභෙදං**

**සමත්තං.**

---

ත්ථං, ඉති, "කිමත්ථං" යනපදය වනාහි; පුච්ඡිතබ්බෙසු; තවශයෙන් පිළිවිසියයුතුවූ; චීසු, අඞ්ගවයක් සම්බන්ධසූත්‍රයන්හි; පරං, පරහෙතුව; කාඛ්‍යාන, සූත්‍රයෙහි සම්බන්ධකොට; සහිඅපි, ඉදින් ඇත්තේනම්; පුබ්බහෙතු, අසම්බන්ධවූ පූර්වාඞ්ගය; සම්බන්ධංකරෙ, සම්බන්ධකරන්නේය; පුබ්බං, පූර්වහෙතුව; කාඛ්‍යාන, සූත්‍රයෙහි සම්බන්ධකොට; සහිඅපි, ඉදින් ඇත්තේනම්; පරම්පි, අසම්බන්ධපරාඞ්ගයද; සම්බන්ධං කරෙ, සම්බන්ධකරන්නේය; තීසු, හෙතුත්‍රයක් සම්බන්ධසූත්‍රයන්හි; චීසු සන්තෙසු, අඞ්ගවයක් සම්බන්ධකල්හි; එකංච, අසම්බන්ධ එකහෙතුව ම; සම්බන්ධංකරෙ, සම්බන්ධකරන්නේය.

සඤ්ඤ- සඤ්ඤී= ආදෙශ- ආදෙශි- නිමිත්ත- කාරි- කාර්‍ය්‍යී= ආදිත= යනාදීහෙතු සම්බන්ධව කියයුතු සූත්‍රයෙක්හි අසම්බන්ධවූ අඞ්ගය "කිමත්ථං,, යනුයෙන් දෙශාතැකරෙසී යනු අභිප්‍රායි.

**ප්‍රාර්ථනා කියති**

49. 50. භවාභවෙ, භවයක්පාසා; සංසරන්තො, සැරිසරන්නාවූ (මම); නාමිච්චචනපුඤ්ඤෙන, නාමභෙදය රචණාකළපින්නෙන්; සදාචාරානං විඤ්ඤූනං, සදාචාරඇති පණ්ඩිතයන්; නාමිතං, (වෙත) නැම්මවීමද; නමනං, නැමීමද; භවෙ, ඇත්තෙක්වේවා; ලීනච්චනපුඤ්ඤෙන, ලීනාර්ථයෝ ලිඞ්ගභෙද ප්‍රකාශිතදිනින්; ලීනත්ථො, ගුඪාර්ථයන්නේ; පාකටො, ප්‍රකටවූයේ; ලීනපඤ්ඤො, මෙරමා විසඳපියනුහුනුප්‍රඥාඇත්තේ; ථෙනො, මෛරමා පුළුවුන්පැන විසඳීමේ සමර්ථවූයේ; සතිමා, සද්ධානොචිත ආම්ඃහි ඇත්තේ; සීලතෙජසා, සිල්තෙදින්යුතුවූයේ; භවෙ, වන්නේවා;

## කාරක භෙද

51 නිප්ඵාදෙති පදත්ථො යො ගමණපචනාදිකං,
ඉතියො කාරකොනාම කාරකඤ්ඤූහි ජානියො.

---

නාමස්සවචනං- නාමවචනං; පුනාහිඵලං= පසවතීති- පුඤ්ඤං- නාමවචනංචතං පුඤ්ඤංචෙතිවා- නාමවචනෙන සම්භූතං පුඤ්ඤං වා- නාමවචනපුඤ්ඤං- තෙන- සුන්දරං සම්මාවා ආචාරං යෙසං තෙ සදාචාරා-තෙසං, සම්‍යාර්ථයෙහි ශ්‍රේෂ්ඨයි. සංසරතීති- සංසරණොනා= භවයි එත්ථාති- භවො- නභවො- අභවො= භවොච අභවොච= භවා භවා- තස්මිං.

මෙහි අභව යනුයෙහි අකාරයතෙම

**පටිසෙධ වුඩ්ඪිහාභාවෙ අඤ්ඤත්ථෙ සදිසෙසුච**
**විරුද්ධගරහෙ සුඤ්ඤෙ අකාරො විරහප්පකෙ,සි.**

කියනලද දශාර්ථයන්කෙරෙන් අල්පාර්ථයෙහිවූයේවි.

මෙ ත කි ත්

සප්පයොගං, සහොදාහරණවූ; නාමභෙදං, නාමභෙදය; සමත්තං, කියා සමාප්තයි-භෙවත්-සම්පූර්ණයි.

——— :0: ———

## නාමභෙද ඉක්බිති කාරකභෙද කියත්

51. යොපදත්ථො,යම්ධාතු ප්‍රත්‍යාව්‍යාපාරාශ්‍රයවූ පදාර්ථයක්තෙම්; ගමණපචනාදිකං, ගමණපචන ආදී ක්‍රියාවක්; නිප්ඵාදෙති, නිෂ්පාදනය කෙරේද; ඉති, උක්තප්‍රවනාර්ථයෙන්; සො, එපදාර්ථයතෙම; කාරකොනාම, කාරකනමැයි; කාරකඤ්ඤූහි, කාරකාර්ථවෙදිකයන් විසින්; ජානියො, දතයුතු;

පදස්ස අත්ථො, පදත්ථො. ගමණංච පචනංච. ගමණපචනං. තං ආදියස්ස සො. ගමනපචනාදිකො තං= කරොතී'ති කාරො. කාරො එව කාරකො. කාරක සද්දස්සඅත්ථො. කාරකො. උත්තරපද ලොපයි. තං ජානාතී'ති. කාරකඤ්ඤූ. තෙහි- ආදිශබ්දයෙන් නිසීදනාදිය ගැණේ.

ගමන පචනාදි සම්ක්‍රියා ව්‍යාපිතවයෙන් කතෘම කාරකනම්. ඒම ක්‍රියා නිෂ්පත්තියෙහි මුඛ්‍යවෙයි. කර්මාදිහු අමුඛ්‍යවෙති,

52 කාරකත්තා ක්‍රියායෙව සත්තිභූතොප්‍යතො කාරකං,
දබ්බංඨාන්‍යූපචාරෙන තදාධාරණ භාවතො.

53 සද්දොපි අත්ථචාරෙන කාරකොති පවුච්චති,
එවං නිප්ඵාදකත්තෙන කාරකෙකවිධං භවෙ.

---

## කාරකශබ්ද විචාරණ විධි

52 ක්‍රියාය; ගමනපචනාදි ක්‍රියාව තමා; කාරකත්තා, නිෂ්පාදකභාවයෙන්; සත්තිඑව, නිස්පාදන විතතනොත්පාද සාමර්ථ්‍යයමැ මු බොව්‍යතො, භූතාපිවශයෙන්; කාරකං, කාරක නම්; දබ්බං, පුරුෂාදි ද්‍රව්‍යය වනාහී; තදාධාරභාවතො, ස්ථානීවූ ශක්තියට ආධාරභාවයෙන්; ඨාන්‍යූපචාරෙන, ස්ථානීහුගේ නාමාරොපන ලක්ෂණයෙන් කාරකනම්;

කාරකස්සභාවො කාරකත්තං, සමත්ථේතී'ති සත්ති-සමත්ථෙති එතායවාති, සත්ති, භූතති සත්තිති ඨානභාවං ගච්ඡතී'ති. භූතං, ඉත්ථිනා= විසෙසං දවතී'ති දබ්බං, නාමාද්‍යර්ථ ප්‍රතිශ්ඨාසි, තිට්ඨති එත්ථාති ඨානං, ඨානං අස්ස අත්ථීති, ඨානී, උපසමීපෙ චරතී'ති උපචාරො, ඨානිනො උපචාරං ඨාන්‍යූපචාරං- තෙන- ආහුසො ධාරෙති එතෙනාති, ආධාරණං, තස්ස ආධාරණං, තදාධාරණං, තස්සභාවො තදාධාරණභාවො, තතො—

## ශබ්දයද කාරකබව

53. සද්දෝපි, ප්‍රඥප්තිශබ්දයද; අත්ථචාරෙණ, අර්ථයටකාරණ භාවයෙන්; කාරකොති, කාරක නමැයි; පවුච්චති, කියනුලැබේ; එවං,යථොක්තවූ; නිප්ඵාදකත්තෙන, සාධ්‍යභාවලක්ෂණහෙයින්; කාරකං, කාරකය; එකවිධංභවෙ, එක්ප්‍රකාරවින්නේය;

කෙවලවූ අර්ථයමැ කාරක නම් වින්නේ නොවෙයි, අර්ථ සම්පාදනයෙන් එලද්දවූ අර්ථචාරයට හේතුවූ ශබ්දයද එලූපචාරයෙන් කාරකනාමලබන්නේවෙයි. යථොක්ත වචනාර්ථයොගයෙන් කාරකය එකවිධවේයි යනු අභිප්‍රායි- සද්දති සොතවිඤ්ඤාණාරම්මණං ගච්ඡතී'ති. යෙද්දා, පරමාර්ථ සංඛ්‍යාත සෘජු ශබ්දයයි; සද්දීයතීති සද්දො; පරමාර්ථ සංඛ්‍යාත විකෘජශබ්දයයි; සද්දෙති අත්ථං පකාසෙතීති. සද්දො ප්‍රඥප්ති ශබ්දයි. මෙහි කාරකනාමප්‍රාප්තියෙහි ප්‍රඥප්තිය අභිමතය-ශබ්දයවනාහි යථොක්ත ත්‍රෛවිධ්‍යයෙන්ද සවිඥාතක අවිඥාතක වශයෙන්ද නිශ්පන්න ප්‍රාතිපදිකය අනිශ්පන්න ප්‍රාතිපදී

54 කත්තා සබ්බක්‍රියා බ්‍යාපී සෙසං කම්මාදි පඤ්චකං,
විසෙසක්‍රියා බ්‍යාපීහි කාරකං දුවිධං මතං.

55 කත්තු කම්මඤ්ච කරණං සම්පදාන මථාපරං;
අපාදානාව ඔකාසං කාරකං ඡබ්බිධං මතං.

---

කය නිශ්පන්න ශබ්ද ප්‍රතිරූපකය අනිශ්පන්න ශබ්ද ප්‍රතිරූපකය යනාදීන් අනෙක භෙදවිධි කියත්-

අත්ථස්සචාරං කාරණං යස්සසො අත්ථචාරො- තෙන- ඉතියනු ආකාරාත්ථයි. එවං යනු නිදශීනාත්ථයි. නිපථාදෙතීති, නිපථාදකො තස්ස භාවො නිපථාදකත්තං, තෙන.

## බ්‍යාපනාදී භෙද

54. කත්තා, කර්තෘතෙම; සබ්බක්‍රියා, ෂට්කාරකක්‍රියාවන් කරා; බ්‍යාපි; යෙයි; නොහොත් ව්‍යාප්තවන්නේය. සෙසං, සෙසු; කම්මාදිපඤ්චකං, කර්මකරණාදි පඤ්චකය; විසෙසක්‍රියා, විශෙෂවූ ස්වක්‍රියාවන් වෙතම්; බ්‍යාපි, යෙයි; හෝ ව්‍යාප්තවන්නෝය; ඉති, මෙබ්‍යාපිත හෝ අබ්‍යාපිත භෙදයෙන්; කාරකං, කාරකය; දුවිධං, විප්‍රකාරයයි; මතං; දතයුතු.

මෙහි කර්තෘ සර්වක්‍රියායෙහි බ්‍යාපීය; සෙසු පස ස්වකීය ස්වකීය ක්‍රියාහි බ්‍යාපීයයි යන ව්‍යාපිත භෙදයෙන් කාරකය විප්‍රකාරයයිකීහ

## සංඥායෙන් ෂඩ්විධ කාරක භෙද

55 කත්තු, කර්තෘකාරකයද; කම්මඤ්ච, කර්මකාරකයද; කරණං කරණකාරකයද; සම්පදානං, සම්ප්‍රදානයද; අථඅපරං, පලිඅන්‍යවූ; අපාදානංච, අපදානකාරකයද; ඔකාසං, ආධාර කාරකයද; යන ඡබ්බිධං, ෂට්ආකාරවූ, කාරකං, කාරකය; මතං, දතයුතුය-

කත්තු කම්මට්ඨං ක්‍රියං කරොතීති කත්තා කරීයතෙති කම්මං කරීයතෙ කරොතිවා අනෙනාති කරණං සම්පජ්ජ අස්ස ආදදාතීති සම්පදානං අපනෙත්වා ඉතො ආදදාතීති අපාදානං අවකාසති එත්ථාති ඔකාසං.

කාරක යනු නානා සත්‍යිහෙයින් විප්‍රකාරයෙන් ඉක්බිති කර්තෘ කර්මකරණ සම්ප්‍රදානඅපාදාන ආධාර යන ෂට්ප්‍රකාරනාමයෙන් කාරක ව්‍යවහාරත්වය කීහ.

## කර්තෘ කාරක භෙද

56 කත්තාච ද්විධො හොති වුත්තා වුත්ත වසෙනච
පඨමෙන යුත්තො වුත්තො අවුත්තො තතියෙනච
පුරිසො ගච්ඡති මග්ගං ගරුළෙන හතො නාගො.

---

56. කත්තාච, කර්තෘකාරකයද; වුත්තාවුත්තවසෙන, උක්තය අනුක්තය යනවශයෙන්; ද්විධොහොති, දෙයාකාර වෙයි; පඨමෙන යුත්තො ප්‍රථමාන්තයෙන් යුක්තවූයේ; වුත්තො. උක්තකර්තෘය; තතියෙන, තෘතීයාන්තයෙන් යුක්තවූයේ; අවුත්තො, අනුක්තකර්තෘය පුරිසො මග්ගං ගච්ඡති' පුරුෂතෙම මගයයි යනු උක්ත කර්තෘ පක්ෂයට උදාහරණයි. ගරුළෙන හතො නාගො, ගුරුළු විසින් නාගයා නසනලදි යනුඅනුක්ත කර්තෘ පක්ෂයට උදාහරණයි.

සමාසාදිහි වුත්තිතෙහි වුත්තො න වුත්තො අවුත්තො වුත්තොච අවුත්තොච වුත්තා වුත්තො වුත්තාවුත්තොච සො චසොචාති වුත්තා වුත්තවසො තෙන ආදිම්හි පඨතීති මජ්ඣෙ පඨමෙ ජාතො පඨමො තෙන. ක්‍රියංකරොතීති කත්තාසී ක්‍රියා නිෂ්පාදකාර්ථ සාමර්ථ්‍යයෙන් කර්තෘභාවය කර්මාදීන්ටද සාධාරණ වෙයි* එසේ වූවද "ධාතුනො ක්තක්‍රියෙ නිත්‍යං කාරකෙ කර්තෘ තෙ ෂ්‍යතෙ" යී ශාබ්දිකාභිමතත්ව යෙන් ක්‍රියාභිනිෂ්පත්තියෙහි ආත්ම ප්‍රධානත්වයෙන් මුඛ්‍යසාහටමැ කර්තෘ කාරකත්වය ප්‍රසංගවෙයි- මෙම කිහ.

**යඃ ක්‍රියාං ව්‍යාපාරඃ කර්තෘසථං කුරුතෙ මුඛ්‍යභාවතඃ**
**අප්‍රයුක්තඃ ප්‍රයුක්තොච සකර්තානාම කාරකම්.**

කියනලද වචනාර්ථයොගීවූ කර්තෘ තෙමද උක්තය අනුක්තය යන භෙදයෙන් ද්විප්‍රකාරය එහි සමාස තද්ධිත ආඛ්‍යාත කිතකයන් කර්තෘාර්ථයෙහි කරණලද නම් තත්ස්ථානයෙහි උක්තකර්තෘයි. එසේ නුවූයේ අනුක්තනම්. කර්මාද්‍යර්ථයෝ සමාසාදීන්විසින්ද විභක්‍ත්‍යාදී විභක්තීන් විසින්ද ප්‍රකාශකරණු ලබත්. සමාස පණ්ඩිතාදීන්විසින් කර්මාදි අර්ථයක් කියනලද නම් තද වස්ථායෙහි නාමවාචක විභක්ති තොමො තදුක්තාර්ථවන් ශබ්දයා කෙරෙන් නොවෙයි. ඉදින් වේනම් විභක්ති විසින් කියයුතු අන්‍යාර්ථයක් නොලබනුයෙන් පෙනී නැරුකණි වියයුතු. තවසයෙන් පුරිසොමග්ගං ගච්ඡති "යනමෙයි ප්‍රත්‍යය සංඛ්‍යාත ආඛ්‍යාතයා විසින් පුරිස නම් කර්තෘ හුගේ ක්‍රියා

---

* නිෂ්පත්ති මාත්‍රෙ කර්තෘත්වං සර්වත්‍රවාස්ති කාරකෙ.
ව්‍යාපාරභෙද පෙක්ෂායාං කරණත්වාදි සම්භවා—ඉතිසරලා.

57 සයංහෙතු කම්මකත්තු වසෙන තිවිධං භවෙ
දත්තො කරොති කාරෙති කුසුලො භිජ්ජතෙ සයං.

---

ප්‍රධානත්වය උක්තයි එහෙයින් පුරුෂ නම් කර්තෘ පදයා කෙරෙහි "කත්තරිච" සි තෘතීයාවූව තිප්‍රත්‍යයා විසින් වාච්‍යත්වය අප්‍රසංග වෙයි. එසේ නොවන්නෙත් පුරිස යන මෙහි විභක්ති ආශ්‍රිතයක් නොවෙයි "විභත්තිං විනාවාච්ඡං නිද්දිසිතු මසක්කුණෙය්‍යත්තා" යනාදීන් ආචාර්යයෝක්ති පරිදි විභක්ත්‍යන්ත නොවන්නේ අර්ථකථනයෙහි අසමර්ථනුයි තදපවාදත්වය පිණිසැ "උත්තත්තකම්මාදිසා මිසම්ං ලිංගත්ථෙ පඨමා සියා" යි යුක්තිබැවින් දශාර්ථයෙක්හි පවත්නා ප්‍රථමා නාමෝ ලිඞ්ගාර්ථ මාත්‍රා පෙක්ෂායෙන් ඔහු කෙරෙන් සිදුවැ "පුරිසො,, සි වෙයි.

"ගරුළෙන හතො නාගො,, යන මෙහි තප්‍රත්‍යයා විසින් කර්මාර්ථයවූ නාගයා යනු උක්තයි ගරුළෙන යන කර්ත්‍රාර්ථය අනුක්තයි ඔහුගේ කර්තෘත්වය කිතකයෙන් අනුක්තනුයි. තදර්ථවාචක තෘතීයා යොගකොට "ගරුළෙන" යී සිඩයි. මෙසේ සෙසු අර්ථයන්හිදු න්‍යායාරොපනය කටයුතු.

**කර්තෘ භෙදනය**

57. සයං හෙතු කම්ම කත්තු වසෙන, ස්වයං කර්තෘ හෙතු කර්තෘ කර්මකර්තෘ වශයෙන් (කර්තෘතෙම) ත්‍රිවිධ භවෙ, ත්‍රිප්‍රකාරවන්නේය; දත්තො, දත්තතෙම; කරොති, කෙරෙයි, කාරෙති, කරවයි; කුසුලො, කුසුල්තෙම; භිජ්ජතෙ, බිඳෙනු ලැබේ;

සයං කත්තාච හෙතුකත්තාච සයං කම්මකත්තාචයී නිරුක්ති ලක්ෂණයෙන් ආදිමධ්‍ය කත්තුශබ්දලොපයි. සයං=පෙ=තූනං වසො සයං-පෙ-වසො-තෙන—

යමෙක් ප්‍රයොජක ව්‍යාපාර රහිතවූයේ ආත්ම ප්‍රධානත්වයෙන් ක්‍රියාව කෙරේද, හේ ස්වයං කර්තෘ නම්, ස්වතන්ත්‍ර කර්තෘ ශුද්ධකර්තෘ යනුදු ඊට පර්යාය නාමයෝයි- දත්තො කම්මං කරොති යනු උදාහරණයි.

යමෙක් ක්‍රියාභි නිෂ්පාදක ස්වයං කර්තෘ ව්‍යාපාරාන්තරයෙහි මෙහෙයාද හේ ප්‍රයොජක කර්තෘ නම්, හෙතුකර්තෘ නමුදු හේමය. "රාජා දත්තං දත්තෙනචා කම්මං කාරෙති" සි උදාහරණයි—

යමෙක් කර්තෘ ව්‍යාපාරත්වයමැ පිළිබඳවැ කර්තෘවූයේ කර්මවූයේ

58 කම්මංහි දුවිධං හොති වුත්තා’වුත්තවසෙන ච
ඔදනො පච්චතෙ දත්තො කටං කරොති ත්‍යාදිකං.

59 නිබ්බත්ති විකතිප්පත්ති භෙදා කම්මං තිධා මතං
කටං කරොති ඣාපෙති කට්ඨා දිච්චං නමස්සති

---

සුවසේ තොමෝමැ නිෂ්පන්නවූයේ මෙන් සදෘශෝපචාරයෙන් වේද, හේ කර්මකර්තෘ නම්, කුසුලො භිජ්ජතෙයනු උදාහරණයි, ස්වයංකර්තෘ ස්වයං කර්මයනුද මෙය මැයි—

**කරීයමානං යං කම්මං සයමෙවප්පසිජ්ඣති**
**සුකරං සෙහි ගුණෙහි කම්මකත්තාති තංවිදූ.**

යනුවෙන් කර්මකර්තෘ ලක්ෂණ කීහ. රූපසිද්ධි කාරකාචාර්යයෝ "දෙවදත්තෙන පචීයමානො ඔදනො සයමෙව පච්චතෙ" යි උදාහරණකළෝ. ඒ වුකලි "පරප්පයොගං විනා" යනාදි බාලාවතාර ලක්ෂණානුසාරයෙහි නොසමවේයයිද කියත්. ස්වයංකර්තෘ හෙතුකර්තෘ කර්මකර්තෘ අභිහිතකර්තෘ අනභිහිතකර්තෘ යන වශයෙන් කර්තෘහුගේ පංචභෙදයෙක්ද කියත්. හේ වනාහි

**සයං හෙතු කම්මකත්තා භිහිතා නභිහිතො තථා**
**පුඤ්ඤං කරොති පුරිසො කාරෙති අප්පරෙජ්ජතො-**

යනාදීන් දක්වනලදි

කර්මකාරක භෙද

58. කම්මංහි, කර්මකාරකයවනාහි; වුත්තාවුත්තවසෙන ච, උක්ත කර්මය අනුක්තකර්මය යන වශයෙන්ද; දුවිධං හොති, ද්විප්‍රකාරවෙයි; ඔදනො පච්චතෙ=පෙ=දත්තෙන ඔදනො පච්චතෙයනුද, දත්තො කටං කරොති යනුද, ඉතිආදිකං, යනාමේආදිය උදාහරණයි; කරීයතෙ’ති කම්මං යනුවෙන් යම් පදාර්ථභූතවූ ඔදනාද්‍යර්ථයක් කර්තෘහුගේ පචනාදීක්‍රියාඵලයෙන් පැමිණෙනු කැමතිවූයේ කර්ම කාරකනම්, තදර්ථය. "යං ක්‍රියාභිගන්තබ්බං තං කම්මං යං කරීයතෙ" යනාදීන් සත්ති- කරණ- ක්‍රියා- යන ලක්ෂණත්‍රයකින් කීහ. එහි සමාසාදීන් විසින් අභිහිත කර්මාර්ථය උක්තනම්. උක්තත්වයෙන්මැ "ඔදනො" යි ප්‍රථමාන්තවී අනුක්තවිෂයෙහි කර්මාර්ථද්‍යොතක විභක්ති වනුයෙන් කටං යනාදියවේ. මෙසේ කර්මකාරකයාගේ උක්තය අනුක්තය යන භෙද ද්වයෙකි.

ඔවුන්ගේ විශෙෂ භෙද

59. නිබ්බත්ති, නිර්වර්ත්‍යකර්මය; විකති, විකාර්‍යකර්මය; පත්ති,

ප්‍රාප්තිකර්මය යනු; භෙද, භෙදවශයෙන්, කම්මං, කර්මකාරකය; ති
ධා, ත්‍රිප්‍රකාරයයි; මතං, දන්නාලදී; කටං කරොති-පෙ-කටං කරෙ
ති, කට්ඨං ඛාපෙති ආදිච්චං නමස්සති, යනු එයට යථාක්‍රමයෙන්
උදහරණයි.

නිබ්බත්තීයතෙ 'ති, නිර්වර්ත්‍ය, කර්තෘව්‍යාපාරයෙන් පෙර අවිද්‍ය
මානයාගේ විද්‍යමානත්වයද විද්‍යමානයාගේ අප්‍රකාශත්වයහෝ ප්‍ර
කාශකෙරේද, ඒ කර්තෘක්‍රියා ජන්‍යස්වරූප ඵලවත්වූයේ නිර්වර්ත්‍යක
ර්මනම් මෙම කීහ සංස්කෘත ශාබ්දිකයෝ

**සතිවා විද්‍යමානා වා ප්‍රකෘතිඃ පරිණාමිනී**
**යස්‍ය නාශ්‍රීයතෙ තස්‍ය නිර්වර්ත්‍යත්වම් ප්‍රචක්ෂතෙ යි**

කටංකරොති, යන්නෙහි කර්තෘහුගේ කරණක්‍රියාවෙන් පූර්වයෙහි
කටයක්හුගේ අවිද්‍යමානයවේ. කරණ ක්‍රියාවෙන්ජනිත ඵලත්වයෙන්
ප්‍රකාශවූ අවස්ථාවෙහි කටස්වරූපයක් නිෂ්පන්නවීය එහින් නිර්වර්ත්‍ය
කර්මවී—

විකරීයතෙ'ති, විකෘති, කර්තෘහුගේ ක්‍රියා ව්‍යාපාරයෙන් පූර්වයෙහි
මාද්‍යන විවූප්‍රකෘතිය ක්‍රියායෙන්පසු ප්‍රකෘති උච්ඡෙද වශයෙන් හෝ
ගුණාන්තර ප්‍රාප්තවශයෙන් හෝ වෙනස්බවට පැමිණේනුයි විකාර්‍ය
නම්- කියත්

**ප්‍රකෘතිඃච්ඡෙද සම්භූතං කිංචිත් කාෂ්ඨාදි භස්මවත්**
**කිංචිත් ගුණාන්තරෝත් පත්‍යා සුවර්ණාදි විකාරවත්-යි**

කට්ඨං ඛාපෙති යනුයෙහි කාෂ්ඨාවස්ථාව ප්‍රකෘතියි. ඛාපන
ක්‍රියායෙන් පසු ප්‍රකෘති භින්නවූ භස්ම වස්ථාවූයේ විකාර්‍යයි

පාපුනීයතෙ'ති ප්‍රාප්‍ය. යම් කර්මයක් නිර්වර්ත්‍ය විකාර්‍යවයට අස
ම්ප්‍රාප්තවැ කර්තෘහුගේ ක්‍රියා සිද්ධියෙහි කෙවලප්‍රාප්තිවේද හේ ප්‍රාප්
තිකර්මයි- මෙම කීහ.

**ක්‍රියාකෘත විශෙෂාණාං සිද්ධිර්‍යත්‍ර න ගම්‍යතෙ**
**දර්ශනාදනුමානාද්වා තත් ප්‍රාප්‍යමිති කථ්‍යතෙ- යි**

ආදිච්චං නමස්සති යනුයෙහි අදිච්චසංඛ්‍යාත කර්මය නමස්සන
ක්‍රියාවෙන් පූර්වයෙහි අවිද්‍යමානද නොවෙයි. තත්ක්‍රියාවෙන් විකෘ
ති වන්නේත් නොවයි. නමස්සනක්‍රියාවට කර්මවූයේමුත් විශෙෂ
සිද්ධනුවූයේනුයි ප්‍රාප්තිකර්මනම්.

**නිර්වර්ත්‍ය කර්මභෙද**

60 සන්තා සන්ත ජනනානං වසේන නිබ්බත්ති ද්විධා
මාතා පුත්තං විජායති පුඤ්ඤං සුඛං ජනෙතිදං

61 පරිවත්තනා පරිවත්තන කාරණා විකතී ද්විධා
කරොති කට්ඨං අඞ්ගාරං සුවණ්ණං කටකං කරෙ

---

60. නිබ්බත්ති, නිර්වර්ත්‍යකර්මය; සන්තාසන්තජනනානං, සන්තජනන අසන්තජනන යන මොවුන්ගේ; වසේන, වශයෙන්; ද්විධා, ද්විධවෙයි; මාතාපුත්තං විජායති, මාතාපුත්තං විජායති යනුද; පුඤ්ඤං සුඛං ජනෙති, පුඤ්ඤං සුඛං ජනෙති යනුද; ඉදං, එයට නිදර්ශණයි-

සන්තිපරමත්ථාදිභාවෙන විජ්ජතීති සන්තං, ජනීයතෙති ජනනං සන්තං ජනනං යස්ස තං සන්තජනනං, න සන්තජනනං අසන්තජනනං සන්ත—පෙ—ජනනංච- සන්තාසන්තජනනං- තෙසං

මාතා පුත්තං විජායී යනුයෙහි පුත්‍රසංඛ්‍යාත කර්මය මාතෘසංඛ්‍යාත කර්තෘහුගේ විජායන ක්‍රියායෙන් ප්‍රකාශවීම නාලලක්ෂණයෙන් ඒ සන්තජනන නම් නිර්වර්ත්‍යකර්මයි.

පුඤ්ඤං සුඛං ජනෙති යනුයෙහි සුඛසංඛ්‍යාත කර්මය පුණ්‍යසංඛ්‍යාත කර්තෘහුගේ ජනන ක්‍රියාවෙන් පූර්වයෙහි අසන්තයි. ක්‍රියාසිද්ධියෙන් තදසන්තයාගේ ප්‍රාප්තිහෙයින් ඒ අසන්ත ජනනනම් නිර්වර්ත්‍යකර්මයි— "යදසජ්ජාය තෙසඃජම්මනායත් ප්‍රකාශතෙ" යනාදීන් තදර්ථයමැ තදන්‍යයෝද කිහ.

**විකාර්‍ය කර්මභෙද**

61 විකති, විකාර්‍ය කර්මයද; පරිවත්තනා පරිවත්තන කාරණා, පරිවත්තනකාරණය, අපරිවත්තනකාරණය යන විශෙයෙන්; ද්විධා, ද්වි ප්‍රකාරයි; කට්ඨං—පෙ—කට්ඨං අඞ්ගාරං කරෙති, යනුද, සුවණ්ණං කටකං කරෙ යනුද ඊට පිළිවෙළින් නිදර්ශණයි—

පරිවජ්ජියතෙ'ති, පරිවත්තනා- කරීයතෙ එතෙනාති= කාරණං පරිවත්තනං කාරණං යෙන යස්ස වා පරිවත්තනකාරණං, න පරිවත්තන-පෙ-වත්තනකාරණං- පරිවත්තනා=පෙ=ණංච, අපරිවත්තන—පෙ—ණංච- පරිවත්තනා පරිවත්තනකාරණං, මධ්‍යකාරණශබ්ද ලොපසිද්ධෙත්— තස්මා—

පරිවත්තන කාරණනම් කට්ඨං අඞ්ගාරං කරොති, යනුයෙහි කරණක්‍රියා නිෂ්පාදනයෙන් පූර්ව අවස්ථාවත් නාශවූ වර්ණසංස්ථාන සං

62 පත්තිකම්මං විධා කාය චිත්ත සම්පත්ති භෙදතො
බුද්ධං වන්දති පූජෙති ආදිච්චං ච නමස්සති.

---

ඛ්‍යාත කාරකය කරණක්‍රියා සිද්ධියෙන් පරාවස්ථාවෙහි ඒකාන්තයෙන් හරිනුයි පරිච්චත්තකාරණ විකතිනම්වේ.

සුවණ්ණං කටකං කරෙ යනුවෙහි කරණක්‍රියාවෙන් පූර්වයෙහි සුවර්ණ ස්වරූප සංස්ථානය සිද්ධ විෂයෙහි කටකනම් කරණ විශෙෂවූයේමුත් ඒකාන්ත පරිත්‍යාග නොවීනුයි අපරිච්චත්තකාරණ විකති නම් වි—අන්‍යයෝ ප්‍රකෘතුච්ඡෙද අසංභූත විකාර්‍ය්‍ය වශයෙන් "විකාර්‍ය්‍යන්තු කර්මවෙධා ව්‍යවස්ථිතම්" යී මෙයම් කීහ.

### ප්‍රාප්ති කර්මභෙද

62. පත්තිකම්මං, ප්‍රාප්‍යකර්මයද; කායචිත්තසම්පත්තිභෙදතො, කායසම්පත්ති චිත්තසම්පත්ති යන භෙදවශයෙන්; විධා, විප්‍රකාරයි; බුද්ධං වන්දති—පෙ—බුද්ධං, වන්දති, පූජෙති, යනුද, ආදිච්චං නමස්සති, යනුද, ඊට යථාක්‍රමයෙන් නිදර්ශනයි.

කුච්ඡිතානං, ආයොති කායො. සම්පාපුණිතබ්බං, සම්පත්ති, කායෙනසම්පත්ති, කායසම්පත්ති. චිතෙතාති, චි. චිත්තං චිතෙතාන-පෙ- කායසම්පත්තිච, චිත්තසම්පත්තිච, කාය—පෙ—තෙසං භෙදො— කාය—පෙ— භෙදෙ, තතො,

" බුද්ධං වන්දති පූජෙති " යනු යෙහි 'බුද්ධං' යනු වන්දනක්‍රියා නිෂ්පාදකයාගේ කායසංඛ්‍යාත ස්කන්ධපංචකයට අත්‍යන්තාසන්නාවයෙන් උපගමනයකොට ක්‍රියාසංඛ්‍යාත විඥානසන්තතියෙන් පැමිණේද එයින් "කායසම්පත්ති" නම් ප්‍රාප්‍යකර්මයි— 'ආදිච්චං නමස්සති' යනුවෙහි නමස්සනක්‍රියා නිෂ්පාදකයාහට ආදිත්‍ය කර්මයාගේ ආලම්බන කරණත්වයමුත් කායසම්ප්‍රාප්තියක් නොවේද, එයින් ක්‍රියාසංඛ්‍යාත විඥාණ සන්තතියෙන් ආලම්බන කරණයෙන් යායුතුනුයි "චිත්ත සම්පත්ති" නම් ප්‍රාප්‍යකර්මයි.

මෙහි 'බුද්ධං, වන්දති ආදිච්චං, යන ප්‍රාප්‍යකර්මයන් නමස්සන, ක්‍රියාසිද්ධියෙහි කර්තෘහුගේ වන්දනාදිය සහණය කෙරෙනුයිද, චක්ෂුරාදීන්ට ආලම්බනවේනුයිද, කාරක භාවය කියති. තදර්ථද්‍යෝතක න්‍යාචාර්‍ය්‍ය වරයො—

" ආභා සොප ගමො ව්‍යක්තිඃ සොඪච්චමිති කර්මණඃ
විශෙෂාඃ ප්‍රාප්‍යමාණස්‍ය ක්‍රියා සිද්ධ්‍යෛ විවක්ෂිතාඃ-සිද්ධක්වූන

ඔවුන් ගේ ඊ ප් සි තා දි හො ද

63 ඉච්ඡිතාදිවසා කම්මං තිධා හත්ථිඤ්ච භුඤ්ජති
විසං ගිලති ගාමඤ්ච ගච්ඡං සාලමුපාගමි.

64 කරණං දුවිධං හොති බාහිරජ්ඣත්ත භෙදතො
වීහිං ලුනාති දත්තෙන චක්ඛුනා වත්ථ මික්ඛතෙ.

---

63. කම්මං, කර්මය; ඉච්ඡිතාදිවසා, ඉච්ඡිත අනිච්ඡිත නානිච්ඡිත යන වශයෙන්; තිධා, ත්‍රිප්‍රකාර වෙති, හත්ථිංච, භුඤ්ජති —පෙ— 'හත්ථිං භුඤ්ජති, යනුද විසං ගිලති, යනුද "ගාමං ගච්ඡං සාලං උපාගමි" යනුද එයට උදාහරණයි...... කත්තෘ කාරකෙන ඉච්ඡියතෙති, ඉච්ඡිතං ආදි යෙසං තෙ, ඉච්ඡිතාදි. තෙසං වසො, ඉච්ඡිතාදිවසො- තතො-ච යනු නිපාතයි.

කර්තෘහුව්සින් ක්‍රියා සම්බන්ධයෙහි අභිමතවූයේ ඊප්සිත කර්මයි, එවශයෙන් අභිමතනූවූයේ අනීප්සිත කර්මයි. අභිමතද අනභිමතද වූයේ නානීප්සිත කර්මයි, හත්ථිංභුඤ්ජති යනාදිය යථා ක්‍රමයෙන් දතයුතු— රූපසිද්ධි බාලාවතාරාදියෙහි, ඉච්ඡිත, අනිච්ඡිත, ඉච්ඡිතානිච්ඡිත, අකථිත, යනවශයෙන් චාතුර්භේදයෙකි. පරවෛයාකරණයෝ, ඊප්සිත, අනීප්සිත, භෙදවයම්, සප්තාකාර කොට කියත්. එහි ඊප්සිත කර්මය, නිර්වෘත්‍යාදින් ත්‍රිප්‍රකාරයි අනීප්සිත කර්මය ඖදාසීන්‍යාදින් චාතුර්විධ්‍යය, නිර්වෘත්‍යාදීහු පූර්වෝක්තයි. ඖදාසීන්‍යාදීහු—

**ඖදාසීන්‍යෙන යත්ප්‍රාප්‍යං යච්ච කර්තුරනීප්සිතම්**
**සංඥාන්තරෛරනාඛ්‍යාතං තද් යච්චාන්‍ය පූර්වකම්**

කර්තෘහුගේ අනුද්දේශවයක් ඇතිකල්හි ක්‍රියාජනිත ඵලවත්වූයේ "**උදාසීන**" කර්මයි, අනිෂ්ට සාධනත්වයක් ඇති කල්හි ක්‍රියාජන්‍ය ඵලවත් භාවවූයේ "**ද්වෙෂ්‍ය**" කර්මයි, අපාදනාදි කාරක සංඥායොග යකින් විවක්‍ෂා නොකරණලද්දේ " **සංඥාන්තරනාඛ්‍යාත** " කර්මයි සම්ධාතූපසර්ග නිපාතයොගයෙක්හි කර්මනොවන්නාවූ අන්‍යකාරක යෙක් කර්මසංඥාලද්දේ "**අන්‍ය පූර්වක**" කර්මයි

මෙහි උදාසීනය, ඉච්ඡිතානිච්ඡිතයටද, ද්වෙෂ්‍යය, අනිච්ඡිතයටද, සමානයි, සංඥාන්තරනාඛ්‍යාත,නම් අකථිත කර්මයි. ද්විකර්මක ධාතුයොගයෙහි 'නිමිත්ත කර්මයි' ගෞණකර්මයයිද යෙත්

කරණ භෙද

64. කරණං, කරණකාරකය; බාහිරජ්ඣත්තභෙදතො, බාහිර කරණය; අජ්ඣත්ත කරණය යන භෙදයෙන්;දුවිධං හොති, දෙ

වැදැරුම්වෙයි; වීහිං ලුනාති දාත්තෙන — පෙ — දාත්තෙන වීහිං ලුනාති, යනුද, චක්ඛුනා වණ්ණං ඉක්ඛති, යනුද ඊට නිදර්ශනයි.

කරීයතෙ අනෙනාති කරණං, බාහිරං කරණං, බාහිරකරණං අජ්ඣත්තං කරණං, අජ්ඣත්තකරණං, බාහිර-පෙ- අජ්ඣත්ත -පෙ- බාහිරජ්ඣත්තකරණං, තෙසං භෙදෙ, බා—පෙ—ත්තො අථවා බහි භවං බාහිරං අජ්ඣත්තෙ භවං අජ්ඣත්තං, බාහිරංච අජ්ඣත්තංච, බාහිරජ්ඣත්තං, තෙසං භෙදෙ, බාහිරජ්ඣත්තභෙදෙ, තතො.

බාහිර සංඛ්‍යාත පරසන්තානයෙහි ජාතවූයේ බාහිර කරණ නම් දාත්තෙන යනාදියයි. ක්‍රියානිෂ්පාදක ආධ්‍යාත්මයෙහි ජාතවූයේ අජ්ඣත්තකරණ නම්, චක්ඛුනා යනාදියයි, කරීයතෙ අනෙනාති කරණං, යි කර්තෘහුගේ ක්‍රියා සිද්ධියෙහි අතිශයොපකාරී සන්නිහිතවූයෙන් සෙසු කර්මාදින් කෙරෙන් මුඛ්‍යවූයේද කරණ නම්. ක්‍රියාපරිනිෂ්පත්තියෙහි කර්තෘ ව්‍යාපාරානන්තරව කරණ භාවයම උපකාරවෙයි. එහෙයින් වෛයාකරණයෝ කර්තෘ විහතනිරූප ලක්ෂණයෙහිම සංග්‍රහ කළෝයි. **කරණ ලක්ෂණ**

**ක්‍රියායා පරි නිෂ්පත්ති ර්‍යද්ව්‍යාපාරා දනන්තරම්**
**විවක්ෂ්‍යතෙ යද යත්‍ර තත්තත්‍ර කරණම්ස්මෘතම්**

**කරණා ව්‍යවධානෙ තු ක්‍රියා නිෂ්පත්ති කාරණං**
**යමෙව විවක්ෂිතං තෙෂු කරණං තස් ප්‍රකීර්තිතම් යි**

උදාහෘතයි. තත් කරණය බාහ්‍යාභ්‍යන්තර භෙදයෙන් විප්‍රකාරයක් යව කීහ බාලාවතාරයෙහිද මෙම වගට සමානාර්ථවත් ගාථාම උදාහරණ කළෝ. **කරණ හෙතු කරණ ව්‍යාපාර,** යයි ලක්ෂණම යති. එහි "කරණෙ තතියා" යි සූත්‍රයෙන් ව්‍යාපාරාශ්‍රිතවත් කාරක කරණාර්ථයෙහි තෘතීයා වෙයි "හෙත්වත්ථෙච" යි සූත්‍රයෙන් කාරක හෙතුවත් ද්‍රව්‍යාදි විෂය කරණාර්ථයෙහි තෘතීයාවෙයි මෙහිමැ කාරණව යි පංචම්ද වේ. එහි කරණ කරණාර්ථයන්ගේ වෙනස ව්‍යාපාර හෙතු භෙදයෙන් දතයුතු- මෙමැ කීහ.

**අනා ශ්‍රිතෙතු ව්‍යාපාරෙ කරණං හෙතු රිෂ්‍යතෙ**
**ද්‍රව්‍යාදි විෂයො හෙතුඃ කරණං වපිත ක්‍රියා යි**

**ආධ්‍යාත්මික කරණ භෙද**

65 චක්ඛාදීනාව ඡබ්බිධං රූපං පස්සති චක්ඛුනා
සද්දං සොතෙන සුණාති ගන්ධං ඝානෙන ඝායති.

66 රසං සායති ජිව්හාය කායෙන ඵොට්ඨබ්බං ඵුසෙ
ධම්මං මනෙන ජානාති ඉදං තෙසං නිදස්සනං

67 සම්පදානං ද්විධා කාය චිත්ත පුබ්බක භෙදතො
භික්ඛුස්ස චීවරං දෙති බලිං නාරායනස්සච.

---

65. 66. චක්ඛාදිනා, චක්ෂුරාදී වශයෙන්; ඡබ්බිධංව, ආධ්‍යාත්මිකකරණය ෂට්කාරදවෙයි; චක්ඛුනා, චක්ෂුර්ද්වාරයෙන්; රූපං, වර්ණායතනය; පස්සති, දකියි; සොතෙන, ශ්‍රොත්‍රද්වාරයෙන්; සද්දං සුණාති, ශබ්දය අසයි; ඝාණෙන, ඝ්‍රාණද්වාරයෙන්; ගන්ධං, ගන්ධය; ඝායති, ආඝ්‍රාණය කරයි; ජිව්හාය, දිවින්; රසං, රසය; සායති, ලෙවයි; කායෙන, කායද්වාරයෙන්; ඵොට්ඨබ්බං, පහස; ඵුසෙ, වැදගණියි; මනෙන, මනසංඛ්‍යාතවූ ජවනයෙන්; ධම්මං, ධර්මාරම්මණය; ජානාති, දනියි; ඉදං, මෙය; තෙසං, ඒ අජ්ඣත්තික කරණයන්ට; නිදස්සනං, නිදර්ශනයි.

මෙහි චක්ෂුර්ද්වාරාදියෙහි රූපාදී ආරම්මණ සඞ්ඝට්ටණයමැ කරණ ව්‍යාපාරයයි අභිප්‍රෙතයි. විඥාණයාගේ කර්තෘත්ව ප්‍රාප්තිවත හෙයින් නොහොත් ඨානොපචාරයෙන් විඥාණයද කියයුතු. මනොද්වාරය වනාහි "භවඞ්ගං මනොද්වාරං" යි යුබැවින් භවාඞ්ග චලන සංඛ්‍යාත මනොද්වාරය විජානන කෘත්‍යයෙහි අසමර්ථනුයි ජවනමනොවිඥාණයමැ "මනෙන" යන්නෙන් අභිප්‍රාකටයුතු.

චක්ඛු ආදියස්ස සො චක්ඛාදී තෙන,ච යනු සමුච්චයාර්ථයි. මේ වූ කලී පුර්වොක්ත ගාථාවෙහි "චක්ඛුනා චන්දමික්ඛතෙ" යි අජ්ඣත්තකරණයට නිදර්ශන කොළෙත් කෙවල චක්ෂුවමැ කරණවන්නේ නොවෙති, ශ්‍රොත්‍රාදීන්ගේද කරණත්වය වේයයි ආශංකා පරිහාර වශයෙන් කීහ.

## සම්ප්‍රදාන කාරකභෙද.

67. සම්පදානං; සම්ප්‍රදාන කාරකය; කාය චිත්ත පුබ්බක භෙදතො, කාය පූර්වකය චිත්ත පූර්වකය යන භෙදයෙන්; ද්විධා, ද්විප්‍රකාර වෙයි; භික්ඛුස්ස -පෙ- භික්ඛුස්ස චීවරං දෙති, නාරායනස්ස බලිං දෙති, යනු ඒට ක්‍රමයෙන් නිදර්ශණයි. මෙහි නිර්වචනලක්ෂණ කාය සම්පත්ති යනාදියෙහි මෙන් සුගමයි. දීයමාන වස්තුව කයින් පිළිගන්නේ කාය පුබ්බක සම්පදාන නම්, දීයමානය සිතින් පිළිගන්ව

68 අනිරාකරණාරාධනාබ්භනුඤ්ඤ වසෙන හි
සම්පදානං තිධා වුත්තං රුක්ඛ යාචක භික්ඛවො-

න්නේ විත්ත පුබ්බක සම්පදානය නම්. තමාගමෑ කර්තෘහුගේ පූජා බුද්ධ්‍යාදීන් දීයමානය ප්‍රතිග්‍රහණයෙන් ස්වාමිත්වයට ප්‍රාප්තිවීනුයිද ක්‍රියා නිෂ්පත්තියෙහි කාරකත්විනුයිද සම්ප්‍රදාන නම්වේ. මෙමකියත්

**සම්ප්‍රදානං තදෙවස්‍යාත් පූජානුග්‍රහ කාම්‍යයා**
**දීයමානෙන සංයොගා ස්වාමිත්වං ලභතෙ යදි**

භික්ඛුස්ස චීවරං දෙති යනුයෙහි භික්ඛු නම් සම්ප්‍රදානය කායපූර්වක ප්‍රතිග්‍රහණයෙන් එනම් විය "නාරායනස්ස බලිං දෙති" යනුයෙහි නාරායනයාට බලිදානය චිත්ත පූර්වකයෙන් ප්‍රතිග්‍රහණය කොරේනුයි එනම් විය. සද්දත්ථ භෙද චින්තා ටීකායෙහි නාරායන යනු වාසුදෙවය බලී යනු පූජායයිද කිහ. නාරායන නම් රජුය බලි නම් සුංවත් යයිද ටීකාන්තයි.

**සම්ප්‍රදානයාගේ අනිරාකරණාදී භෙද.**

68. සම්පදානං, සම්ප්‍රදාන කාරකය තෙම; අනිරාකරණං, අප්‍රතික්ෂෙපය; ආරාධන, ආරාධනාවය; අබ්භනුඤ්ඤවසෙන, අනුමොදනාය හෙවත් අනුමතය යන වශයෙන්; තිධා වුත්තං, ත්‍රිප්‍රකාරයකින් කියනලදී; රුක්ඛයාචක භික්ඛවො, රුක්ඛය යාචකය භික්ඛුය යනු ඊට ක්‍රමයෙන් නිදර්ශනයි.

නනිරාකරොති දීයමානං අභිමුඛං කත්‍රොතී හි අනිරාකරණං ආරාධයතී හි ආරාධනං, අභිඅනුමඤ්ඤති අනුඤ්ඤා තබ්බභාවි වා අබ්භනුඤ්ඤං, අනිරාකරණං ච -පෙ- වසෙන.

"රුක්ඛස්ස ජලං දෙති,, යන මෙහි රුක්ඛ යනු සම්ප්‍රදානයි. ඒද මට ජල දෙවයි ඉල්වන්නේද නොවෙයි. දීයමාන ජලය වලකන්නේද නොවේනුයි අනිරාකර්තෘ සම්ප්‍රදානයි. යාචකස්ස ජලං දෙති,, යන මෙහි යාචක යනු සම්ප්‍රදානයි එද කර්තෘ ප්‍රෙරණයෙන් දීයමාන ජලය ලබානුයි "ආරාධක" නම් සම්ප්‍රදානයි "භික්ඛුස්ස ජලං දෙති" යන මෙහි භික්ඛු යනු සම්ප්‍රදානයි එද දාන ක්‍රියා ව්‍යාපාරයෙහි කර්තෘහුගේ ප්‍රෙරණයෙන් ජල ලබන්නේ නොවෙයි. එසේ ආයාචනා නැත; දීයමාන ජලය ප්‍රතිග්‍රහණයෙන් හඳුනයිඅනුමතනුයි අබ්භනුඤ්ඤ සම්ප්‍රදානයි අනිරාකර්තෘ ප්‍රෙරක අනිමන්තෘ යනුද මීටමෑ පර්‍යාය නාමයෝයි මෙම කියත් සංස්කෘත වෛයාකරණයෝ.

69 අපාදානං ද්විධා කාය චිත්තපුබ්බක භෙදතො
අපෙන්ති මුනයො ගාමා පාපා චිත්තං නිවාරයෙ.

---

**අනිරා කරණාත් කර්තුස්ත්‍යාගාඞ්ග කර්මණෙප්සිතම්**
**ප්‍රේරණානුමති භ්‍යාංච ලභතෙ සම්ප්‍රදානතාං සි**

බාලාවතාරයෙහිද **ධර්මකීර්තිපාදයෝ**

**අනිරා කතනානුමතා රාධකං සම්පදානියං**
**තිධා යථා ඵලං දෙති රුක්ඛස්ස භික්ඛු නොප්ජිනො**

සම්පදානං යනු ලක්ෂණ හෙයින් "රඤ්ඤො දණ්ඩං දදාති" රජකයස වස්ත්‍රං දෙති යනාදියෙහි සම්ප්‍රදානත්වයාගේ අප්‍රසංග භාවය කියනු ත ස්ථානයන්හි ශබ්දප්‍රයොගයවේ, තදයථා-

**දදාති දණ්ඩං පුරුෂො මහීපතෙඃ**
**නචාපි ගන්ත්‍යා න ච දාන කාම්‍යයා**
**සද්දීක්ෂණ දාන නයාසු පාත්‍රෙ**
**තත් සම්ප්‍රදානං කථිතං මුනීශ්වරෛඃ**

ගෞණත්වෙපි සම්ප්‍රදානං භවත්‍යෙව, "බද්ධො පාධ්‍යායඃ ශිෂ්‍යාය චපෙටාං දදාති,, උපාධ්‍යාය තෙම ශිෂ්‍යයාට අතුල්පහර දෙයි යනාදිය ගෞණත්වයෙහි සම්ප්‍රදානය.

**අපාදාන භෙද**

69. අපාදානං, අපාදාන කාරකය; කාය චිත්ත පුබ්බක භෙදතො, කායපූර්වකය චිත්තපූර්වකය යන භෙදයෙන්; ද්විධා, ද්විප්‍රකාරවේ; මුනයො -පෙ= නිවාරයෙ, මුනයො ගාමා අපෙන්ති පාපා චිත්තං නිවාරයෙ, යනු ඊට ක්‍රමයෙන් උදාහරණයි.

කායෙන පුබ්බො අපක්කමො යස්සතං කායපුබ්බකං, සෙස්ස සම්ප්‍රදානය සේයි. කාය පූර්වකත්වයෙන් හෝ චිත්තපූර්වකත්වයෙන් හෝ අපක්‍රමාදි ක්‍රියා නිෂ්පාදනයට අවධිවූයේ අපාදාන නම් "ගාමා මුනයො, අපෙන්ති" යන මෙහි මුනීන්ගේ අපගමන ක්‍රියාව කාය පූර්වකත්වයෙනි. "ගාමා" යනු ඊට අවධිනුයි අපාදානවිය. පාපා චිත්තං නිවාරයෙ, යන මෙහි පාපයෙන් නිවාරණක්‍රියාව චිත්ත පූර්වකත්වයෙන් විය; "පාපා" යී තදවධිනුයි අපාදාන නමි. කාය සම්පත්ති පුබ්බක චිත්ත සම්පත්ති පුබ්බක යනුද මෙම්ය "චෙච කීන.

70 චලා චල වසෙනාපි අපාදානං ද්විධා මතං
හත්ථික්ඛන්ධතො ඔරුය්හ පතනා පතනානි රුක්ඛතො.

71 උද්දිට්ඨ විසයං කිඤ්චි උපාත්ත විසයං තථා
අනුමෙය විසයඤ්චෙති අපාදානං තිධා මතං

72 අපෙතානි මුනයො ගාමා කුසූලා තණ්ඩුලං පචෙ
පාටලිපුත්තකෙහිච අභිරූප තරා ඉමෙ

---

**කාය සම්පතති පුබ්බං ච මනො සම්පතති පුබ්බකං**
**අපාදානං ද්විධාවුත්තං අපාදානෙහි විඤ්ඤුහි**

**අපාදාන සහිත විශෙෂයන්**

70, චලා චල වසෙනාපි, චලය අචලය යන වශයෙන්ද; **අපාදා** නං, අපාදානය; ද්විධාමතං, ද්විප්‍රකාරයයි දන්නාලදී; හත්ථික්ඛන්ධතො =පෙ= හත්ථික්ඛන්ධතො ඔරුය්හ යනුද පතනා රුක්ඛතො **පතනානි** යනුද ඊට ක්‍රමයෙන් නිදර්ශනයි.

චලති කම්පතීති චලං නචලං අචලං "හත්ථික්ඛන්ධතොයනු **චලා** පාදානයි; රුක්ඛතො යනු අචලාපාදානයි, අපගමන ක්‍රියාව **උභය** කාරකයන්ටමැ සාධාරණ නමුදු පූර්ව ස්වරූපයෙන් **වෙනස්** නුවූයේමැ අපාදාන වෙයි. මෙම කිහ- **බාලාවතාරයෙහි,**

**සම්මෙපාපගමෙ චිනනා පුබ්බරූපා සදච්චුතං**
**වුච්චතෙ ගදපාදානං. තං චලා චල තො ද්විධා**
**යථාස්සාධාවතා පොසො පතෙ රුක්ඛා චලනාගිච සී**

අන්‍ය ශාබ්දිකයෝද විශ්ලේෂ්‍ය සාධ්‍යයෙහි චලවූද **අචලවූද** යම් අවධියක් ප්‍රවෘත්ති ලක්ෂණවූයේ උදාසීනද හේ අපාදානයයිකීහ.

**අපායෙ යදුදාසීනං චලං වා යදි වා චලම්**
**ධ්‍රැව මෙව තදාවෙශාත් තදපාදාන මුච්‍යතෙ**

අවධි නමින් ද

යතොච ධීයතෙ කිඤ්චිත් ක්‍රියාපූර්වං කුතශ්චන
විශ්ලිෂ්‍යතෙ චලස්ථාන්‍ය මවධිං තං ප්‍රචක්ෂතෙ

**ඔවුන්ගේ ප්‍රභෙදක භෙද**

71. 72. තංහි අපාදානං, යථොක්ත චලාචල අපාදානය **වනාහී;** උද්දිට්ඨවිසයං, උද්දිෂ්ටවිෂය; උපාත්තවිසයං, උපාත්තවිෂය; **තථාඅනුම**

73 ආධාරෝ චතුධා බ්‍යාපී කොපසිලෙසිකො තථා
වෙසයිකො සාමීපිකො තිලාදිකං නිදස්සනං

වූ; අනුමේය විසයෝව, අනුමෙය විසයදුයි; ඉති, මේ භෙදයෙන්; තිධා මතා, ත්‍රිප්‍රකාරයයි දතයුතු. අපෙනාති මූතයො =පෙ= මූතයො ගාමං අපෙනාති යනුද කුසුලා තණ්ඩුලං පචෙ යනුද ඉමෙ මාධුරා අභිරූපතරා පාටලිපුත්තකෙහි යනුද ඊට පිළිවෙලින් නිදර්ශනයි.

උද්දිසිඣතො'ති, උද්දිඩං, උද්දිඩං විසයං යස්සතං උද්දිඩවිසයං උපආදිසිඣතොති උපාත්තං තං විසයං යස්සතං උපාත්තවිසයං අනුමියි ඣතො'ති, අනුමෙයො තංවිසයං යස්සතං අනුමෙය විසයංහි යනු පඤ්චනකාරාර්ථයි, ඉති යනු විශෙෂණාර්ථයි; තථා යනු අපරශබ්දාර්ථයි; මෙහි අපාදන විසයවූ ක්‍රියාව සර්වාරූත වශයෙන් ව්‍යක්තයෙහි දක්නාලැබෙද ඒ උද්දිෂ්ට විෂය නම් ගාමා අපෙනාති යනාදියයි අපාද, න සවිෂ ක්‍රියාතොමො අධ්‍යාහාරයෑ බොධ්‍යද තේ "උපාත්තවිෂය, නම් කුසුලා තණ්ඩුලං පචෙ. මෙහි කුසුලා නීහරිත්වා යි ක්‍රියා අධ්‍යාහාරයි. තෘතීයපක්‍ෂයෙහි අධ්‍යාහාරවූ හෝ අනධ්‍යාහාරවූ හෝ උපනිධා වශයෙන් සිතාගන්නාලද ක්‍රියාව විෂයකොට පවත්නේ "අනුමෙය විෂය" නමි. ඉමෙ පාටලිපුත්තකෙහි අභිරූප තරා, යනාදියයි, මෙයයි-

නිද්දිඨ විසයුපත්තෙ ානුමෙයා විසයෙ වසා
අපාදනං තිධා වුත්ත මපදන විධඤ්ඤුනා

අන්‍ය ශාබ්දිකයෝ

නිර්දිෂ්ට විෂයං කිඤ්චි දුපාත්ත විෂයං තථා
අපෙක්‍ෂිත ක්‍රියඤ්ච ත්‍රිධාපාදන මුච්‍යතෙ යිඛිත.

උපාත්ත විෂය අනුමේය විෂය දෙදෙනාගේ අන්තර භෙදයද මෙසේ කියත්.

උපාත්ත විසයානුමෙය විසයාන කිමන්තරං
නියමෙනා ති වෙ අත්ථි අභිරූප තර නගහා ති,

"උපරි පබ්බතා වස්සති" යනාදි තන්හි ශබ්දපාදනය" සඞ්කාසානි මධුරහො,, යනාදී තන්හි අර්ථාපාදනය "ගාමා අපෙනාති මූතයො,, යනාදින්හි ශබ්දාර්ථාපාදන යයිද අන්‍යභෙදත්‍රයක්දකියති

ආධාර කාරක භෙද

73. ආධාරෝ, ආධාරකාරකය; බ්‍යාපිකො, ව්‍යාපිකය; ඔපසි

74 ඛ්‍යාපිකො ච ද්විධා සකල ඛ්‍යාපිකෙකදෙසතො
තිට්ඨන්ති තෙලං තිලෙසු ඛීරං ජලෙසු තිට්ඨති

---

ලෙසිකො, ඖපශ්ලෙෂිකය; තථා; අන්‍යවූ; වෙසයිකො, වෛෂයිකය; සාමීප්‍යකො, සාමීපිකය යි; චතුධා, චතුර්විධය; තිලාදිකං, තිලෙසු යනාදිය; තිදසසතං, තිදශගණයි.

ආධෙය්‍යස්ස ඛ්‍යාපනං ඛ්‍යාපි සො අස්ස අත්ථීති ඛ්‍යාපිකො උපසිලිසීයතෙ අඤ්ඤමඤ්ඤං යුජ්ජතෙ ති උපසිලෙසො සො අස්ස අත්ථීති ඔපසිලෙසිකො විසයො එකදෙසසාහි ච්ඡයී සො අස්ස අත්ථීති වෙසයිකො, සමීපං අස්ස අත්ථීති සාමීපකො තිලං ආදි යෙසං තානි තිලාදිකං ආදි ශබ්දයෙන් උක්ඛලි පාද ගඞ්ගා යනු ගැණෙයි.

ආධාරීයන්තෙ සමිංහි ආධාරයී හි වා ආධාරොයි වචනත්වයෙන් කර්තෘ කර්ම ක්‍රියාවන්ගේ ප්‍රතිෂ්ඨාව ආධාර නම් වේ. ආධාරසතර්විධවූ කාලොපචාරවශයෙන් ඛ්‍යාපිකාදිභෙද නිර්දිෂ්ටය ආධාරයෙහි ආධෙයයාගේ සකල ව්‍යාප්තිවය "ඛ්‍යාපික" නම් තිලෙසු තෙලං යනාදියෙහිය. ආධාර ආධෙයයන්ගේ සකල ව්‍යාප්තිවය නැතද අනන්තර සම්බන්ධගතය "ඖපශ්ලෙෂික" නම්. උක්ඛලියං ආචාමො යනාදියෙහිය, ආධාරයාගේ ගොචර භාවයෙන් ආධෙයයාගේ පැවැත්ම "වෛෂික" නම්, පාදෙසු පතිට්ඨා යනාදියෙහිය ආධාරයාගේ සමීපොපචාරත්වයෙන් ආධෙය ප්‍රවෘත්තිය "සාමීපික" නම්, ගංගායං ඝොසං යනාදියෙහිය. තදන්‍යයෝද කීහ.

**කර්තෘ කර්ම ව්‍යවහිතා මසාක්ෂා ධාරයාන් ක්‍රියාම්**
**උපකුර්වන් ක්‍රියා සිද්ධෞ ශාස්ත්‍රෙධිකරණං ස්මෘතම්**

**ආධාරශක්ති ය: කර්තෘ ව්‍යාපෙත් ව්‍යාපාර සද්මනි**
**ආධාරං කාරකං ප්‍රාහු ස්තච්චතුර්විධ මෙව ච**

ශාරස්වත ඖපශ්ලෙෂිකය සාමීපිකය අභිව්‍යාපිකය වෛෂයිකය නෛමිත්තිකය ඖපචාරිකයයි ෂඩ්විධයයි කීහ;. තදුදාහරණ=

**කටෙ ශෙතෙ කුමාරො සෞ වටෙ ගාවස්සුශෙරතෙ**
**තිලෙසු විද්‍යතෙ තෛලං හෘදි බ්‍රහ්මා මෘතම්පරම්**
**යුද්ධෙ සන්නහ්‍යතෙ ධීරො ගුල්‍යග්‍රෙ කරිණාං ශතම්**

**ඛ්‍යාපිකාදීන්ගේ ප්‍රත්‍යෙක භෙද**

74. ඛ්‍යාපිකොච, ඛ්‍යාපිකාධාරයතෙමද; සකල ඛ්‍යාපිකෙකදෙසතො, සකල ව්‍යාපිකය එකදෙස ව්‍යාපිකය යන වශයෙන්, ද්විධා ද්වි

75 දුවිධොප සිලෙසොච අල්ලීනානල්ලි භෙදතො
උකඛලියං ච අචාමො පරියෙසිකාච තිඨති

76 වෙසයිකොච දුවිධො දෙසනතරකඛණඩාවසා
පාදෙසූපනිබඩාරොදි පකඛනති සකුණා නගෙ

77 සාමීපි යවිහයං තීරෙ සමීපෙ උපචාරතො
ලබ්ධං තීරෙන ගඟාහි ගඟායං සසසමාදිසු

---

පුකාරයි; තිලෙසු -පෙ- තිලෙසු තෙලං තිට්ඨති යනුද, ජලෙසු ඛිරං තිට්ඨති යනුද, සංඛ්‍යා පරිපාටියෙන් නිදර්ශණයි, සකලෙ බ්‍යාපිකං යස්සතං සකල බ්‍යාපිකං, එකදෙසෙ බ්‍යාපිකං යස්සතං එක දෙස බ්‍යාපිකා -පෙ- තතො සකල බ්‍යාපිකෙකදෙසතො.

75. ඔපසිලෙසිකොච, ඖපශ්ලෙෂිකාධාරයද අලලියානලලිහෙදතො අලලිය නොපශ්ලෙෂිකය අනලලිය නොපශ්ලෙෂිකය යන භෙදයෙන්; විවිධො, විප්‍රකාරයි; උකඛලියං, බත්සැලියෙහි; ආචාමො නාවර නොහොත් දංකුඩ; තිඨති, සිටී; පරියෙසිකා. සැපපුටුයෙහි; (රාජා, රජතෙම) තිඨති, සිටී; යනු ඊට උදාහරණයි. අලලිනොච අනලලිනොච අල්ලියනල්ලි නෙසංභෙදො අල්ලියනල්ලිභෙදද, තතො

උකඛලියං ආචාමො යනු ආධාරාධෙයයන්ගේ අල්ලිය නොප ශ්ලෙෂිකාධාරත්වය වේ- "පරියෙසිකා රාජා" යනමෙහි ආධාරාධෙයයන්ගේ අනල්ලීය නොපශ්ලෙෂිකත්වය වේ.

76. වෙසයිකො, වෛෂයිකාරාධාරයද; දෙසනතරකඛණඩාවසා, දෙසානතර ව්‍යවච්ඡෙද විෂයය අනන්‍යථාභාව විෂයය යනවශයෙන්; දුවිධො, විප්‍රකාරයි; පාදෙසු පනිබ්බාරොදි, යනුද පකඛනති සකුණා නගෙ, යනුද ඊට උදාහරණයි— දෙසනතරොච අකඛණඩාච, දෙසනතරකඛණඩා තෙසං වසො දෙසනතරකඛණඩා වසො තෙන-

"පාදෙසුපනිබ්බා, යනමෙහි ආධෙයතෙම අවිනිවිෂ්ත දෙශනිවතීනත්වයෙන් අන්‍යවූද ආධාරයෙහි පවතීනූ" දෙසනතර ව්‍යවච්ඡෙද විෂයාධාරනම්වේ. නගෙසකුණා, යනමෙහි ආධෙයතෙමේ එකම ආධාරය විෂයකොට පවතිනුයි, අකඛණඩාභාව විෂයාධාරනම්වේ.

77. ගංගායංසසසං, ආදිසු ගංගායංසසස යනාදියෙහි; තීරෙන, තීරයකරණකොටගෙණ; උපචාරතො, උපචාරවිශයෙන්; ගඞගාඉති, ගංගායනු; සමීපෙ, සමීපවූ; තීරෙ, තීරයෙහි; සාමීපියා, සමීපසාවයාහුගේ, අවිහයං, නාමය; ලබ්ධං, ලබනලද්දේවෙයි.— නොහොත්

78 මුඛ්‍යො පරම්පරා තබ්බිසයො තදුපනිස්සයො
ගඟම්හි පරියඞ්කෙව රූපෙච සාසනෙවසී

79 සාමි ආලපනඤ්චෙව නිද්ධාරනඤ්ච ලක්ඛණං
හෙතුඅච්චන්ත සංයොගං ඉමෙ අකාරකාමතා

---

සාමීපියවිභගෙං තීරෙ සමීපෙ උපචාරතො
ලද්ධං තීරෙනභාගෙහි ගංගායං ඝොසමාදිසු

සාමීපියා,සාමීපිගුණයෙද; සමීපයට විශුගුණයෙද; අවිභගෙං, නාමය; උපචාරතො, මුඛ්‍යොපචාරවශයෙන්; ලද්ධං, ලබනලද්දේ; සාමීපික ධාරනම් තීරෙනභාගයති,තීර්ථයෙහි ස්නානයකරන්නන මෙහි,තීරෙ, තීර්ථසංඛ්‍යාත මුඛ්‍යාර්ථයෙහිද; ගංගායං ඝොසංඉති ආදිසු, ගංගාවෙහි ඝොෂය යනාදියෙහි; සමීපෙ, මුඛ්‍යයාගෙ සමීපාර්ථයෙහිද වේ.

සමීපංඅස්සඅත්ථිති සාමීපිසම්පොච සාමීපිවසාමීපි නාම මුඛ්‍යසසමු ඛ්‍යංචා උපරචතීති උපචාරො මුඛ්‍යොච උපචාරොච උපචාරාත තො- මෙම්පශ්චිම පසඅර්ථනිර්ණය පිණිසයි.

## අන්‍යාකාරවූද ආධාර විශෙෂයක්

78.මුඛ්‍යො, මුඛ්‍යාධාරය;පරම්පරා, පරම්පරාධාරය; තබ්බිසයො තද්විෂයාධාරය;තදුපනිස්සයො,තදුපනිශ්‍රයාධාරයයි අන්‍යචතුර්විධාධා රයක්දවේ. ගඟම්හි =පෙ= "ගඟම්හිඔභාසො තිට්ඨති" "යනුදප රියඞ්කෙරාජා තිට්ඨති" යනුද, "රූපෙසඤ්ඤා" යනුද"සාසනෙවසීභි ක්ඛු"යනුද,ඊටනිදර්ශණයි.

මුඛ්‍යවශයෙන් ක්‍රියාවට ආධාරවූයේ මුඛ්‍යාධාරයි; ජීවයා ඛ ගඟම්හි ඔභාසො තිට්ඨති; යනාදියයි- ක්‍රියානිශ්‍රයවූ කර්තෘ කර්මයන්ට ආධාරවූයේ පරම්පරාධාරයි. "පරියඞ්කෙ තිට්ඨතිරාජා" යනාදියයි. ය මක් ඒකාන්තයෙන්මැ ආධෙයයාව ආධාරනොවන්නේ ආලම්බනික යන්ට ආරම්මනමාත්‍රය වීවේද, ඒ තද්විෂයාධාරයයි. රූපෙසඤ්ඤා ය නාදියයි; යමෙක් යථොක්තාර්ථයන් වෙන්වූ ගුණදෙන් තදායත්ත වෘ ත්තිත්වයෙන්ආධාරවේද. ඒතදුපනිශ්‍රයාධාරයි; සාසනෙවසති භික්ඛු යනාදියයි. රාජනිස්සිතො බ්‍රාහ්මණො යනාදින් මෙන් ප්‍රතිපත්‍යාදි නිශ්‍රිතත්වය මෙහි තදායත්ත භාවයයි-

## ඉක්බිති අකාරක භෙද

79 සාමි, සම්බන්ධයද; ආලපනඤ්චෙව, ආලපනයද; නිද්ධාරණාච, නිර්ධාරණයද; ලක්ඛණං, ලක්ෂණයද; හෙතු, හෙතුවද; අච්චන්තසං

80 සාමිආලපනං තථා නිද්ධාරණමකාරකං
ක්‍රියායෙව තෙසං යොගා භාවතො තථූප ලක්ඛයෙ

යොගං, අත්‍යන්ත සංයොගයද යන; ඉමෙ, මේසය; අකාරකාමතා කාරකනොවෙතියි දතයුතු.

සංධනං අස්සඅත්ථීති සාමි අභිමුඛංකත්වා ලපීයතෙති ආලපනං ජාත්‍යාදීහි එකස්ස නීහරිත්වා ධාරණං නිද්ධාරණං. ලක්ඛීයතෙ අනෙනාති ලක්ඛණං, හිනොති පවත්තතිඵලං එතෙනාති හෙතු, දණ්ඩා දීහි නිරන්තරං සංයොගං අච්චන්ත සංයොගං—

## ඔවුන්ගේ අකාරකත්වයට හෙතු

80. තථා, ඒෂට්අකාරකයන් අතුරෙන්; සාමිආලපනං, සම්බන්ධය හා ආලපනයද; නිද්ධාරණං, නිද්ධාරණයද යනත්‍රිකය; තෙසං, ඔවුන් ගේ; ක්‍රියාය, ක්‍රියාවහා; යොගාභාවතො එව, සම්බන්ධයක් නැතිබැවි න්මැ; අකාරකංඉති, අකාරකයයි; උපලක්ඛයෙ, වෙන්කරන්නේය හෙවත් කියන්නේය—

කර්ම කර්තෘ කරණ සම්ප්‍රදානාපාදානාධාර යනමොහු ක්‍රියානිෂ්ප ත්තිනිමිත්තත්වයෙන් කාරකනම්වෙති. සාමිආලපනවය ක්‍රියානිෂ්ප ත්තියෙහිලා ඉවහල්නොවේනුයි කාරකව්‍යවහාරයෙන් බාහිරයයිකීහ සිද්ධාන්තසංග්‍රහයෙහිද

කම් කතු කරණහා සපදත් අවදි අදරද
මෙවියුවිබත් සයටම කරුනම් වියුපඬුවෝ

කිරිය නිපැත්මට ගේනෙන්මේසතුරුනම්
සබඳ අලපෙපෝ බිහිවූ මෙවෙනි අයුරක් නොලදින්

නිද්ධාරණලක්ෂණ හෙතු අත්‍යන්තසංයොග යනචතුෂ්ටය උක්තවිභ ක්ත්‍යාශ්‍රිතවත් අර්ථවිශෙෂයක්මය. තදර්ථයොගයනිදු ක්‍රියානිෂ්පාද නාභාවනුයි. අකාරකත්වයෙන් සංගෘහිතයි. කාරකභෙදප්‍රකරණ යෙහි අකාරකභෙද කියයුතු තවයාශ්‍රිතවිභක්තිනුදු කියයුතු මැය. අර්ථභෙද බහුත්වයෙන් විභක්තිභෙදවන්නෙන් කාරකභෙද සාමාන්‍ය යෙන් කර්මාද්‍යර්ථයන්ද කීයේමැයි. තන්බාහ්‍යවූ අකාරකභෙදවූකත් සාමාන්‍යතනාශ්‍රිත සම්බන්ධාද්‍යර්ථ විශෙෂයන් යථාක්‍රමයෙන් කියත්

## සම්බන්ධ භෙද

81 සාමිභෙද අනෙකධා ජනකාදිප්පභෙදතො
රඤ්ඤො පුත්තො ධනං හත්ථො සමාචාර මාදි ඤායතෙ

---

81 සාමිභෙද, සම්බන්ධභෙද; අනෙකධා, අනෙකප්‍රකාරයි; ජනකාදිප්පභෙදතො, ජනකසම්බන්ධාදී භෙද වශයෙන්; රඤ්ඤො -පෙ- මාදි රඤ්ඤො පුත්තො රඤ්ඤො ධනං රඤ්ඤො හත්ථො රඤ්ඤො සමාචාරංයන ආදිඤායතෙ මේආදිය දතයුතු රඤ්ඤො පුත්තො යනු ජනකසම්බන්ධයි රඤ්ඤො ධනං යනු සාමිසම්බන්ධයි, රඤ්ඤො හත්ථො යනු අවයවිසම්බන්ධයි. රඤ්ඤො සමාචාරං යනු ගුණීසම්බන්ධයි

සම්බන්ධනම් යම් ක්‍රියාන්තරයක්හුගේ ශක්තියෙන් හිතන ප්‍රවෘත්ති වස්තුවයක් ආබාධිත්වයෙන් ගොවිහු සම්බන්ධිහුයයි පරිඥාණයෙහුද ඒසම්බන්ධි නිශ්‍රිතවූයේ සම්බන්ධයි මෙමැකියත්, ධම්මගිරිහිපාදයො

එතෙ සම්බන්ධිනො වෙහි යස්මාත්ථො බුජ්ඣායතෙ
සම්බන්ධො නාම සො අත්ථො සම්බන්ධිච්චය නිස්සිතො-යි

තවද ක්‍රියාකාරකසම්බන්ධය ද්‍රව්‍යගුණසම්බන්ධයයිද. විවිධයි ක්‍රියාකාරක සම්බන්ධය නොමේ විශෙෂ සම්බන්ධය සාමාන්‍ය සම්බන්ධයයි විවිධයි එහිවිශෙෂය කම්මාදි රූපභෙද සම්බන්ධයෙහි කරණලද්දේ විතියාදි විභක්ති නිශ්‍රිතවෙයි. සාමාන්‍ය සම්බන්ධයෙහි ෂෂ්ඨිවෙයි. මෙමැකිහ-

සම්බන්ධඃ කාරකෙභ්‍යොන්‍යඃ ක්‍රියාකාරකපූර්වකඃ
ශ්‍රුතායාමශ්‍රුතායාං ච ක්‍රියායාං සොභිධීයතෙ

යනාදි අනෙකවිධත්වය සංගෘහිතාවාචීයේ "අනෙකධා' යි ප්‍රකාරාන්තරත්වයෙන් කිහ. ආදි ශබ්දයෙන් ජඤ්ඤාදි අනෙක ද්‍රව්‍යගුණ සම්බන්ධ සඞ්ගෘහිතයි.

## සංගෘහිත අසංගෘහිත සම්බන්ධ

| | | | | | |
|---|---|---|---|---|---|
| ජඤ්ඤ | සම්බන්ධය, | සාමිස්ස මාතා | වාච්ච | සම්බන්ධය | අත්ථස්සචාරං |
| ජනක | ,, | රඤ්ඤො පුත්තො | වාචක | ,, | පදස්සඅත්ථො |
| සං | ,, | ධනානං සාමි | ඨාන | ,, | නගරස්සගෙහං |
| සාමි | ,, | රඤ්ඤො පුරිසො | ඨානි | ,, | මහාරාජානංආවාසො |
| සමීප | ,, | සමීපස්ස නාමං | විකාර | ,, | කණ්හස්සරූපං |
| සාමීපී | ,, | නගරස්ස අවිදූරෙ | විකාරි | ,, | ඛීරස්ස දධි |
| අවයවං | ,, | රතනානං නාගං | පරිමාන | ,, | මුග්ගානංචතුදොණො |
| අවයවී | ,, | පුරිසස්ස හත්ථො | පරිමෙය | ,, | තිලානං මුට්ඨි |
| ගුණ | ,, | ගුණානං ආධාරො | පූරණ | ,, | චතුන්නං ආයු |
| ගුණී | ,, | බුද්ධස්ස ගුණං | පූරිතබ්බා | ,, | වස්සානංතානියො |

82 සජීවාජීව භෙදෙන දුවිධාලපනම්මතං
හොති ඉඤ්ඡි ච භො සෙල ජානිතබ්බං යථාක්කමං

---

ජඤ්ඤ ජනක යනාදීන් යුගල වශයෙන්ද කියති. මෙසේකීහ.

**සොච නෙකවිධොජඤ්ඤ ජනක වාච්චවාචකාදිභෙදතො-සිද්ධ**

**වච්චවාචක සම්බන්ධො තථා ජඤ්ඤ ජනකො පිච**
**විකාර විකාරණීයොච පරිමාන පරිමෙය්‍යකො.**

පූරණ පූරිතබ්බාව සම්බන්ධා නෙකධා මතො-යනාදියයි.

**අන්‍ය ශාබ්දිකයෝ ද්‍රව්‍යගුණ සම්බන්ධයෙහි**

සෙව්‍ය සෙවක රූප-පිතා පුත්‍රරූප- අවයවාවයවි රූප- ගුණ ගුණිරූප- සමූහ සමූහිරූප- පාල්‍යපාලක රූප-වාහ්‍යවාහකරූප- බොධ්‍ය බොධක රූප- ව්‍යාප්‍ය ව්‍යාපකරූප- ප්‍රතියොග්‍යනුයොගි රූප- අපත්‍යාපත්‍යාත් රූප- ආධාර ආධෙය්‍ය රූප= යනාදී සම්බන්ධභෙදයන්ද= රාඥඃ පුරුෂඃ- රාඥඃ පුත්‍රඃ- තං තූනාං පටඃ පටස්‍යරූපං- මාෂානාම්රාශිඃ=කුරූනාං රාජා චෛත්‍රස්‍යවාහනං-ශබ්දස්‍යාර්ථඃ,අග්නෙර්ධූමඃ- පටස්‍ය භාවඃ-උපගොරපත්‍යම්. කුශූලස්‍යාන්නානියි. ක්‍රමපරිපාටි උදාහරණද කීහ.

සම්බන්ධාර්ථයෙහි සම්බන්ධී ශබ්ද දෙදෙනා කෙරෙන්මැ ෂෂ්ඨිවිය යුතුනමුදු භෙද්‍ය භෙදක දෙදෙනා කෙරෙන් භෙදකයා කෙරෙන්මැ ෂෂ්ඨීවෙයි. භෙද්‍යයා කෙරෙන් නොවෙයි. මෙම කීහ.

**ඡට්ඨී විභෙදාහි සම්බන්ධා භෙදකස්මාව ජායතෙ**
**ජාතා පිතා විසෙසම්හා සම්බන්ධං නචභෙදයතො.**

**අන්‍යයෝද**

**භෙද්‍ය භෙදකයොඃ ශ්ලිෂ්ටඃ සම්බන්ධොන්‍යොන්‍යමිෂ්‍යතෙ**
**විශෙෂ්‍ය යද්‍යපි සම්බන්ධඃ ෂෂ්ඨ්‍යුත්පත්තිස්තු භෙදකාත්-**

**ආලපන භෙද**

82. ආලපනං, ආලපනය; සජීවාජීවභෙදෙන, සවිඥානක අවිඥානක භෙදයෙන්; දුවිධම්මතං, ද්විප්‍රකාරයයි දතයුතු= හොති-පෙ- "භොති ඉඤ්ඡි" යනුද "භො සෙල" යනුද, යථාක්කමං,කී පිළිවෙලින්; ජානිතබ්බං, උදාහරණ දතයුතු. මෙහි ඉඤ්ඡි යනු සවිඥානක ආලපනයි. සෙල යනු අවිඥානකයි. අන්‍යාචාර්ය්‍යවරයෝ පුද්ගලාලපන ධම්මාලපන නිර්ජීවාලපන යන වශයෙන්ද කියත්-

83 ජාති ගුණ ක්‍රියා නාම වසෙන චතුධා මතං
බ්‍යාතියොව මනුස්සෙසු සාමා නාරිසු දස්සනී

84 පථිකෙසුව ධාවන්තො ආනන්දො සාවකෙස්විති
සමූහාවයවං ජාත්‍යා දිනා නිධාරණං මතං

85 ලක්ඛණහෙතු අවච්ඡනනං ක්‍රියඵලස්ස අභාවතො
තං යොගෙ තං නිමිත්තොපි කාරකානි න වුච්චති

---

**පුග්ගලා ලපනෙචෙව ධම්මස්සවාලපනෙ පිච
නිජ්ජීවාලපනෙචා'ති තිසු හො සද්දො දිස්සති—**

හො පුරිස අච්ඡරියං හො- ‍ඥෙහා පුප්ඵසිලා යනාදින් නිදශිණිසි. අලපන-ආමන්තන-සම්බොධන- යනුද මේවමැ පයායිය නාමයෝ වෙත්- ආලපනාඪ් සුබොධය පිණිස

**"සද්දෙනා ගිමුඛීකාරෙ විජ්ජමානස්ස වත්ථුනො"** යනාදියද

**ශබ්දස්‍යාභිමුඛී භාව මාත්‍රං සම්බොධනං විදුඃ**
**ප්‍රාප්තාභිමුඛ්‍යඃපුරුෂඃ ක්‍රියාසු විනියුජ්‍යතෙ**-යනාදියදදතයුතු

**නිර්ධාරණ භෙද**

83. 84. ජාති ගුණ ක්‍රියා නාමවසෙන, ජාතිය ගුණය ක්‍රියාය නාමය යන මොවුන්ගේ වශයෙන්; (නිර්ධාරණ) චතුධාමතං, සිව්පරිදි දතයුතු; ඛත්තියො—පෙ—සාවකෙසු මනුස්සෙසු ඛත්තියොව සෙට්ඨො, සීද; සාමානාරිසු දස්සනී, සීද; පථිකෙසු ධාවන්තො සීඝතමො සීද; "සාවකෙසු ආනන්දො බහුස්සුතො" සීද, ඉගි, යනමේ ක්‍රමයෙන්; සමූහා, සම් සමුදයක් කෙරෙන්; අවයවං, එක් වස්තුවක්; ජාත්‍යාදිනා, ජාත්‍යාදිය හෙතුකොටගෙණ; නිධාරණං, නිර්ධාරණ;(පෘථක්කරණ) යසි, මතං, දන්නාලදී.

සමූහිතබ්බං ගණිතබ්බනති සමූහං තස්මා ජාති ආදියස්ස සොජාත්‍යාදී තෙන- ජාති ගුණ ක්‍රියා නාම යන සමූහවතුෂ්ටයකෙරෙන් ජාත්‍යාදිවූමැ හේතුවකින් එක් වස්තුවක්හුගේ වෙන්කිරීම"නිධාරණ" නම්. මෙම කීහ-

යංහිජාති ගුණක්‍රියා නාමෙහි සමුදයතො
පුථක්කරණ මෙකස්ස තංනිධාරණ මබ්‍රවුං-සී—

**ලක්ෂණාදීන්ගේ අකාරක භාව**

85. ලක්ඛණහෙතු අවච්ඡනනං, ලක්ෂණය, හෙතුය, අවච්ඡනනය ය නමොවුන්ට; ක්‍රියඵලස්ස, ක්‍රියාසංඛ්‍යාත ප්‍රයොජනයක්හුගේ; අභාව

86 භාවො ච භාවවන්තාංච ලක්ඛ්‍යවන්තාංච ලක්ඛිතං
ක්‍රියං ලක්ඛණං පුබ්බං පරන්තු ලක්ඛියං මතං

87 තෙසං කත්තා ච කම්මඤ්ච තබ්බන්තාං නාම ජානියා
ගොසු ච දුය්හමානෙසු ගතො දුද්ධෙසු ආගතො

---

තො, අවිද්‍යමානත්වයෙන්; තංසඤ්ඤාගෙ, ක්‍රියාභිසම්බන්ධාභාවෙහිද; තං නිමිත්තත, ක්‍රියා නිමිත්තෙහිද; කාරකංඉති, කාරකයයි; නවුච්චති, නොකියනුලැබේ.

ලක්ෂණාදීන් ක්‍රියාසම්පාදනයෙහි නම් තන්නිමිත්තද වෙයි. කර්තෘ කාරකාදීන්ටමෙන් තන්නිෂ්පාදක ක්‍රියාප්‍රයොජනද සම්භව වෙයි, ලක්ෂණාදීන්ට ක්‍රියාභිසම්බන්ධයෙන්ම, අකාරක භාවය සිද්ධයි; ලක්ෂණ කාරකාදී අව්‍යවහාරත්වයයි.-සේයි—

### පර්‍යායාන්තරයකින් ලක්ෂණ භෙද

86. භාවො ච, භාවයද; භාවවන්තානඤ්ච, භාවවන්තයද; ලක්ඛ්‍යවන්තාංච, ලක්ෂ්‍යවන්තයද; ලක්ඛියං, ලක්ෂ්‍යයද; යන අකාරසතරකි. එහි පුබ්බං ක්‍රියං, පූර්වවූ භාවාදීස්ථක්‍රියාවෙක්; ලක්ඛණං, ලක්ෂණයයිද; පරන්තු පරවූ; ගමනාදීක්‍රියාවෙක්. ලක්ඛියං ලක්ෂ්‍යයයිද; මතං, දතයුතු;

භාවීයති, ලක්ඛීයති, එතෙනාති භාවො, භාවං අස්ස අත්ථීති, භාව වන්තා, ලක්ඛීයතෙති, ලක්ඛ්‍යං, තං අස්ස අත්ථීති, ලක්ඛ්‍යවන්තා, භාවය, භාවවන්තයකියාද; ලක්ෂ්‍යය, ලක්ෂ්‍යවන්තයකියාද; ක්‍රියාකාරක සංයොගයක්වෙයි. එහි පූර්වප්‍රවෘත්තක්‍රියාව, ලක්ෂණක්‍රියායි. අපරප්‍රවෘත්තක්‍රියාව ලක්ෂ්‍යවත් ක්‍රියායි.

### ඔවුන්ට නිදර්ශන

87. තෙසං, ඒභාවලක්ෂණ ක්‍රියාවන්ගේ; කත්තා ච, කර්තෘද; කම්මංච, කර්මයද යන දෙක; තබ්බන්තාං නාම, භාවවන්තය ලක්ඛ්‍යවන්ත යනමි. ගොසු=පෙ= ගොසු දුය්හමානෙසු ගතො, යනුද; දුද්ධෙසු ආගතො; යනුද, නිදර්ශනයන්, ජානියා, තදර්ථජානනය කටයුතු-ගොසු දුය්හමානෙසු, පුරිසො ගතො; යනමෙහි "ගොසු" යනු දොහන ක්‍රියාවෙහි කර්මයි. දුය්හමානෙසුයනු භාවසංඛ්‍යාත පූර්වසිද්ධක්‍රියායි. "පුරිසො" යනු ගමනක්‍රියාවෙහි කර්තෘයි. ගතො, යනු ලක්ඛ්‍ය සංඛ්‍යාත පරක්‍රියායි. ගො යනු භාව වන්තයි. "පුරිස" යනුලක්ඛ්‍යවන්තයි. ප්‍රසිද්ධ ක්‍රියා වාරයකින් අප්‍රසිද්ධක්‍රියාවක්ද තවත් නිමිත්තයකිනුදු ප්‍රකාශකිරීමයි. භෙද ලක්ෂණ විශෙෂත්වයක් බැවින් සංගෘහීතයි. කාලභාවෙසු ච, යන සූත්‍රානනයි.

88 ජනකො සම්පාපකො හෙතු ඤාපකො'ති තිධා මතො
බීජාය අඞ්කුරො ජාතො තීරං නාවාය පාපුණි

89 සභාවො බ්‍යතිරෙකො ච කාරියො ඤාපකො තිධා
උණ්හතා සීතතා අග්ගි ධූමායෙ'ති ඤායතෙ

---

### හෙතු භෙද

88 89 ජනකො, ජනක හෙතුය; සම්පාපකො, සම්ප්‍රාපක හෙතුය; ඤාපකො, ඤාපක හෙතුය යන; ඉති, මෙසේයින්; තිධා, හෙතුව ත්‍රිප්‍රකාරයයි; මතො, දතයුතුයි; බීජාය අඞ්කුරො ජාතො, බීජයෙන් අඞ්කුරය උපනී; යනු ජනක හෙතුය. තීරං නාවාය පාපුණි, නැවින් තෙරට පැමිණී; යනු සම්ප්‍රාපක හෙතුය. ඤාපකො, ඤාපක හෙතුව වනාහී; සභාවො, සභාවය, බ්‍යතිරෙකො ච, ව්‍යතිරෙකය; කාරියො, කාර්‍ය්‍යයද්දයි කියා; තිධා, ත්‍රිප්‍රකාරයයි; උණ්හතා—පෙ—උණ්හතා අග්ගි අත්ථි, **සභාව හෙතුයි.** සීතතා අග්ගි නත්ථි, **ව්‍යතිරෙක හෙතුයි.** ධූමාය අග්ගි අත්ථි, **කාර්‍ය්‍ය හෙතුයි.**

අත්තනො ඵලං ජනෙති අනෙනාති ජනකො, සම්පාපුනාති අනෙනා'ති සම්පාපකො, ඤාපෙති පකාසෙති අනෙනා'ති ඤාපකො, භවන්ති බුද්ධි සද්දා එතෙනා'ති භාවො, විඅති ඊරති අනෙනා'ති ව්‍යතිරෙකො, කරොති එතෙනා'ති කාරියො.

ඵලොත්පත්තියට අවශ්‍යොපකාරවූයේ ජනක හෙතුයි, 'බීජාය අඞ්කුරො' යි නිදර්ශනයි, බීජය අඞ්කුරොත්පත්තියට අවශ්‍යහෙතුය බීජ හෙතුවෙන් විනා අඞ්කුරොත්පාදනය නොවේනුයි. මෙයම් ජනකවෙයි- යමක් ඒකාන්ත ප්‍රාප්තියක් නැත්තෙහිදු එයින් වෙන්ව පැමිණිය නොහේද ඒ පැමිණවීම් මාත්‍ර හේතුව සම්ප්‍රාපකයි, 'නාවාය තීරං පාපුණි' යි නිදර්ශනයි, යමක් ඒකාන්තයෙන් අවිඥාතාර්ථය තත්වයෙන් ප්‍රකාශකෙරේද ඒ ඤාපක හෙතුයි. මෙයම් සභාවහෙතු ව්‍යතිරෙක හෙතු කාරිය හෙතු යන වශයෙන් ත්‍රෛවිධ්‍යවේ,

එහි යමක් අවිලොමත්වයෙන් යථාර්ථපරිඥාන වූ සපක්ෂය ප්‍රකාශකෙරේද ඒ සභාව හෙතුයි. 'උණ්හතා අග්ගි අත්ථි' යනු අවිරොධියි යමක් ප්‍රත්‍යනීකත්වයෙන් විරොධිවූ විපක්ෂය ඤාපනය කෙරේද ඒ ව්‍යතිරෙක හෙතුය. සීතතා අග්ගිනත්ථියනු විරොධියි. නෛයායිකයෝ **"ව්‍යතිරෙකො නාම අභාවඃ"** යනාදින් ව්‍යතිරෙක නම් අභාවය අභාවඥානේ ව්‍යාප්තාය ව්‍යතිරෙක හෙතු යයිද එය අන්වය ව්‍යතිරෙක හෙතුය කෙවල ව්‍යතිරෙක හෙතුයයි ද්විවිධකොට කීහ. **සාධ්‍යතු අසාධ්‍යතුත් කොරෙන් සඩෙන දාංචිකයක් මෙහිකීහ.**

90 කාලද්ධාන වසා චෙති අච්චන්ත සංයොගං මතං
මාසංච යොජනද්ධානං සජ්ඣායතීති දීපයෙ

91 විසෙසනං විධා තෙසං තුල්‍ය භින්නප්ප භෙදතො
තිලොක මහිතො නාථො ගොත්තෙන ගොතමො භවෙ

92 යසෙසකත්ථ විභත්තිකානං එකසංඛ්‍යාක්‍රියා පිච
සමාන ලිඞ්ගතා චෙව තුල්‍යාධි කරණමමතං

---

**අත්‍යන්ත සංයොග භෙදං.**

90 අච්චන්ත සංයොගං, අත්‍යන්ත සංයොගය; කාලද්ධානවසා, කාලාත්‍යන්ත සංයොගය, අධ්වාත්‍යන්ත සංයොගය, යනවශයෙන්; චෙති, දෙකොකැයි; මතං, දතයුතු; මාසංච —පෙ— මාසං සජ්ඣායති යනුද, යොජනද්ධානං සජ්ඣායති යනුද, දීපයෙ, නිදශීණයයි; දත් නාලැබේ. රතිඤ්චිවානං පරිච්ඡෙදං කරොතීති කාලො කාලොච අද්ධානොච කාලද්ධානා තෙසං වසො කාලද්ධානවසො. තෙන-

ද්‍රව්‍යගුණ ක්‍රියාවින් හා කාල අධ්වන දෙදෙනාගේ නිරන්තර සම්බන්ධත්වයක් ගම්‍යමාන කල්හි අත්‍යන්ත සංයොගයයි කියනුලැබේ. මෙහි ක්‍රියා වශයෙන් කීහ. ද්‍රව්‍යගුණ ක්‍රියාවන්හා කාලයද ද්‍රව්‍යගුණ ක්‍රියාවන් හා අධ්වනයද සම්බන්ධ දතයුතු. මෙමැ කීහ=

**දබ්බ ගුණ ක්‍රියා හි කාලද්ධානා නයො සිතා**
**ඤෙය්‍ය මච්චන්ත සංයොගං දුතියා තත්ථ ජායති යි**

අත්‍යන්ත සංයොග භේද ඉක්බිති **විශෙෂණ භෙද.**

91 විසෙසනං, විශෙෂණය; තුල්‍යභින්නප්පභෙදතො, තුල්‍යාධිකරණ විශෙෂණය, භින්නාධිකරණ විශෙෂණය යන භෙදයෙන්; විධාමතං, ද්විප්‍රකාරයයි දතයුතු තිලොක —පෙ— තිලොක මහිතො නාථො යනුද, ගොත්තෙන ගොතමො යනුද, භවෙ, ඊට නිදශීණ වන්නේය; විසෙසති පකාසෙති අනෙනාති විසෙසනං තුල්‍යංච භින්නංච තුල්‍ය භින්නා තෙසං භෙදෙ —පෙ— භෙදෙ තතො,

භින්න ප්‍රවෘත්තිභාව ලක්ෂණවත් ශබ්දයෝ ස්වවාච්‍යාර්ථයන් එක වස්තුවෙක්හි වාච්‍ය ස්වරූපයෙන් භෙද්‍ය භෙදක රූපභාවයෙන් පවත්නාහු එක අවස්ථා වෙත්ද තදවස්ථාව තුල්‍යාධිකරණ විශෙෂණයි. තුල්‍යාවස්ථා භින්න භෙද්‍ය භෙදක ස්වරූප අන්වයවූ ශබ්දප්‍රවෘත්තිය භින්නාධිකරණ විශෙෂණයි.

**ඔවුන්ගේ ලක්ෂණ භෙද.**

92 යස්ස; යම්විශෙෂණයක්හුගේ; එකත්ථවිභත්තිකානං, විශෙෂ්‍යය

93 ආසයාසයී භාවොච තබ්භාවො තබ්බිසෙසතා
ධම්මාධාර ඵලානංච එකතාති ඡධා මතා

94 රතනො පවො සුවො සෙතො කරිහත්ථි බුද්ධාජිනො
නීලාවණ්ණො අබ්භො පාතො සීහො අනිලසොතරො

---

හා එකාර්ථභාවයද; සමාන විභක්තිත්වයද; එකසංඛ්‍යා, සමානවචන ත්වයද; ක්‍රියාපිච, සමාන ක්‍රියාපෙක්ෂත්වයද; සමාන ලිඞ්ගතාච එව සමාන ලිඞ්ගසද්භාවයද ඇත්තේ; තුල්‍යාධි කරණං, තුල්‍යාධිකරණ ලක්ෂණයයි; මතං; දන්නාලදී. එකො සමානො අත්ථො එකත්ථො, එකාවිභත්ති, එක විභත්ති, එකවචනංච එක විභත්තිච, එකත්ථ විභ ත්ති, තාසං භාවො එකත්ථ විභත්තිතා, බාහුල්‍යාදී සමාසවිසින්ද විග්‍ර හයෝග්‍යයි. මෙහි ලක්ෂණ බාහුල්‍ය වෘත්තියි. මෙහි කීහ-

**විසෙසස්ස දිස්සමානා යා ලිඞ්ගසංඛ්‍යා විභත්තියො**
**තුල්‍යාධිකරණෙ භියො කාතබ්බා තා විසෙස්සනෙ_සි.**

**තුල්‍යාධිකරණයාගේ ෂට් භෙදය**

93 ආසයාසයී භාවොච, ආසයාසයි භාව තුල්‍යාධිකරණ විශෙෂ ණය, තබ්භාවො, තද්භාව තුල්‍යාධිකරණ විශෙෂණය; තබ්බිසෙස තා, තද් තුල්‍යාධිකරණ විශෙෂණය; ධම්මාධාර ඵලානංච, ගුණ කතා විශෙෂණය; අධිකරණෙකතා විශෙෂණය, විපාකෙකතා විශෙ ෂණය; ඉති, යන වශයෙන්; ඡධා, ෂට්ප්‍රකාරයයි; මතං, දන්නාලදී. විසෙසනං ආසයන්ති එත්ථාති, ආසයො තං අස්සඅත්ථීති ආසයීආසයො ච ආසයීච, ආසයාසයී තෙසං භාවො ආසයාසයිභාවො, තස්ස භා වො තබ්භාවො, තෙසං දබ්බවාචීනං විසෙසො, තබ්බිසෙසො, තස්ස භාවො තබ්බිසෙසභාවතා, දබ්බංපකාසෙතීති ධම්මො(ගුණයයි)ගුණං ආධාරෙතීති ආධාරො (අධිකරණයයි) පච්චතීති ඵලං (විපාකයයි) ධ ම්මොච ආධාරොච ඵලංච ධම්මාධාර ඵලා, තෙසං ආසය ආසයි භාව තබ්භාව තබ්බිසෙසතා, ධම්ම ආධාර ඵල යන වශයෙන් තුල්‍යා ධිකරණ සයකි.

ධම්ම යනු ගුණ හෙයින් ගුණවිශෙෂණයයිද ආධාර යනු අධිකර ණහෙයින් අධිකරණ විශෙෂණයයිද. ඵල යනු විපාකහෙයින් විපාක විශෙෂණයයිද, ව්‍යවහාරයද යොග්‍යයි·

**තදුදාහරණ**

94. 95. රතනොපවො, රක්තවර්ණවූවස්ත්‍රය; සුවොසෙතො ශ්වේත වූ ක්ෂීර පයසිය; කරි හත්ථී, කරවත් ඇතුය, බුද්ධො ජිනො, බුද්ධවූ ජින

95 අම්බිලො ගරුකො හොති ලහුකො කටුකො රසො
ගදහත්තං සුසංයුත්තං ඔසධං දුයුත්තං විසං

96 තතියාචෙව ඡට්ඨීච සත්තමීචෙති භෙදතො
භින්නාධිකරණං තත්‍ථ තිවිධං හි විජානියා

97 ගොත්තෙන ගොතමො නාථො ඵකූනතිංසා වයසා
රසෙනසාව පුරිසොහොති තෙසෙට්ඨි බ්‍රාහ්මණා දිනං
ගෙහෙව නිසිනෙනාහොති තසාලාදීසු බ්‍රාහ්මණො

---

තෙජෙය; නීලො වණ්ණො, නිල්වූ වර්ණය; අම්බො පාකො, අඹපැත් ය; සීහො නරො, සිංහස්වරූපවූ මනුෂ්‍යයා; අනිලසෙසා, වාතස්වරූප වූ අන්වය; අම්බිලො, ඇඹුල්රසය; ගරුකො හොති, ගරුවෙයි; කටු කොරසො, කටුකවූ රසය; ලහුකො, ලඝුයි; සුසංයුත්තං, මනා යොග්‍යවූ; ඔසධං, ඖෂධය ගදහත්තං, රොග නසයි; දුයුත්තං, අයොග්‍ය යොගවූ ඖෂධය; විසං, විෂයි, යනු යථාක්‍රමයෙන් නිදර්ශනයි.

ආශ්‍රය නම් ද්‍රව්‍යයි, ආශ්‍රිතව්‍ය නම් ගුණයයි, තද්භාව නම් ද්‍රව්‍ය වාචීන්ගේ පදාර්ථයි, තව්ශෙෂණත්ව නම් ද්‍රව්‍යාදීන්ගේ විශෙෂණභාවයි ධර්මතා නම් සුරාදි ගුණ සාධර්ම්‍ය භාවයි, ආධාරෙකතා නම් විශෙෂණ විශෙෂ්‍යයන්ගේ ඒකස්ථායී භාවයි, ඵලෙකතා නම් විපර්‍ය්‍යතාව යෙන් සාධර්ම්‍ය භාවයි.

රත්තො පටො සුවෙ සෙතො යනු ආශ්‍රය ආශ්‍රිතව්‍යභාවලක්ෂ ණ විශෙෂණය, කරී හත්‍ථී බුද්ධො ජිනො යනු තද්භාව ලක්ෂණ විශෙ ෂණයි, නීලො ගුණො අම්බො පාකො යනු තබ්විශෙෂතා ලක්ෂණ විශෙ ෂණයි, අනිලො අසෙසා සීහො නරො යනු ධර්මතාලක්ෂණ විශෙ ෂණයි, අම්බිලො ගරුකො ලහුකො කටුකො රසො යනු ආධාරෙක තා ලක්ෂණ විශෙෂණයි, ගදහත්තං සුසංයුත්තං ඔසධං දුයුත්තං විසං යනු ඵලෙකතා ලක්ෂණ විශෙෂණයි.

### භින්නාධිකරණ භෙද.

96 තත්‍ථ, ඒ භින්නාධිකරණ විශෙෂණයෙහි; තතියාච, තෘතීයා භින්නාධිකරණයද; ඡට්ඨීච, ෂෂ්ටීභින්නාධිකරණයද; සත්තමීච, සප්තමී භින්නාධිකරණයදැයි; ඉති භෙදතො, මේ භෙදවශයෙන්; භින්නාධිකරණං, භින්නාධිකරණය; තිවිධං ඉති, ත්‍රිප්‍රකාරයයි; විජානියා, දතයුතුයි. භින්නෙනඅධිකරණං භින්නාධිකරණං ච යනු සමුච්චයාර්ථයි. ඉති යනු ප්‍රකාරාර්ථයි.

97 ගොත්තෙන, සඳුහිගොත්‍රවශයෙන්; නාථො, නාථතෙම; ගෙ

98 අට්ඨාරසහි සිප්පෙහි සම්පන්නො ඉමිනාඅහං
කාරණෙහි සම්මානෙහි වස්සුපගතො ගමෙ

තමො, ගොතම නම්; වයසා, වයසින්; එකූනතිංසො, එකූන්තිසය. (මේ තෘතීයාභිධානාධිකරණයි) රඤ්ඤදාව, රජහුගේම; පුරිසොභොහි, පුරුෂයාවෙයි; නසෙට්ඨි බ්‍රාහ්මණාදිනං, සිටු බමුණු ආදීන්ගේ නොවෙයි; මේ ෂෂ්ඨීභිධානාධිකරණයි. බ්‍රාහ්මණො, බමුණුතෙම; ගෙහෙළුව, ගෙහිම; තිසිහෙනහොහොති, උන්නෝවේ; නසාලාදීසු, සාලාදියෙහි උන්නේ නොවේයි. (මේ සප්තමි භිධානාධිකරණයි) මෙහි "ගොතමො"යි විශෙෂණයි, නාමොයි විශෙෂ්‍යයි. සෙසුද මෙසේරුයි මෙමකීහ-

**විසෙසනං විධාවුත්තං භින්න තුල්‍යප්ප භෙදතො**
**භින්නා තත්ථ තිධා හොති තුල්‍යා ජධාති රජිතො සී**

මෙහි විශෙෂණ විශෙෂ්‍ය ලක්‍ෂණ භෙදයෙන් ක්‍රියා විශෙෂණද ගම්‍යමානය. එහි-

**ක්‍රියාවිසෙසනං නාම දුවිධං සමුදීරිතං**
**බාහිරා ලපනං සබ්බ මබාහිරා මුදුදිකං**

කීතලද ලෙසින් බාහ්‍යාබාහ්‍ය වශයෙන් ද්විවිධය. සම්බොධනය බාහ්‍යවෙයි. "මුදුං පචති" යනාදියෙහි මුදුං යනාදිය අබාහ්‍යවෙයි. පූර්වාපර සමාන ක්‍රියා යොගයෙහිද විශෙෂණ විශෙෂ්‍යභාවයක් ගම්‍යමානය. එය-

**පුබ්බාපර සමානෙව කාලෙ හෙතුම්හි භාවදයො**
**පච්ඡාභුඤ්ජති පොසො පිදහිත්වාන නික්ඛමි ¶**
**සක්කච්ච පතිතො දණ්ඩො පීත්වා හොති සතං බලං**

යනුවෙන් උක්තය. පච්ඡා භුඤ්ජතියනුවෙහි "පච්ඡා" යන පූර්වක්‍රියාව "භුඤ්ජති" යන අපරක්‍රියාවට විශෙෂණය. "සක්කච්චපතිතො" යනුවෙහි "සක්කච්ච" යන පූර්වක්‍රියාව "පතිතො" යන සමාන ක්‍රියාවට විශෙෂණය. මෙසේ පූර්වාපර සමාන කාල ක්‍රියාවන්ට ක්‍රියාද විශෙෂණයයි. කීහ-

කාරක අකාරකාදි භෙද සමාජනි
**අනාකුරු ආශිංශන කියන්.**

98 අහං, මම; ඉමිනා, මේ පිණිස්; අට්ඨාරසහි සිප්පෙහි, අටළො

¶ මේ උපන්‍යාස ගාථාවක ඇතැම්හු මෙහි පෙළෙහිද යොදති. කච්චායන භෙද ප්‍රකරණයෙන් හේ අයොග්‍යයයි සිතමු.

## ස මා සො

99 සමාසීයන්ති නාමානි නාමානං සමසනං තථා
සමාසො නාම විඤ්ඤෙය්‍යො සමසනවසෙකධා.

ස් සිප් පිසින්; සම්පන්නො, සම්පන්නවෙම්වා; කාරණෙහි, සථානාන්තරාදී කාරණයන්ගෙන්හා, සමානෙහි සමසිත් දනන් විසින්ද; චක්ඛුහි, දෑඇම්ලත් වනින්ද; උපගතො හවෙ, සම්පන්නවෙම්වා.

— නො හො ත් —

අහං, කච්චායනගෙද ප්‍රකරණ කරණව්‍යාපාරික අනුබද්ධතෙම්; ඉමිනා මේ කාරකභෙදකතා පුණ්‍ය ඵලයෙන්; අට්ඨාරසහි සිප්පෙහි, අනවද්‍ය, ෂටඵලදසී අෂ්ටාදශ ශිල්පයෙන්ද; සම්පන්නො, සම්ප්‍රාප්තවන් වෙම්වා; කාරණෙහි, ආත්මාගීඵලොපනිශ්‍රවු දන ශීලාදීහෙතුවෙන්ද; සමානෙහි, දිෂ්ටාවිකරණ කාරි මෛත්‍රී චක්ෂුවන් සබ්‍රහ්මචාරිකාදීන්ගෙන්ද; චක්ඛුහි, අනවද්‍ය ඊප්සානුරූප පාත්‍රාචීවරාදී පරිෂ්කාරයෙන්ද; උපගතො, සම්පූර්ණවූයේ; හවෙ, වෙම්වා.

නි ග ම න ය.

සප්පයොගං, සහොදරණවූ; කාරකභෙදං කාරක අකාරකභෙදය; සමත්තං, පරිපූර්ණයි. මෙතැන

කාරකංච අකාරකංච කාරකානි "තෙසංභෙදො" යි සමාසකටයුතු,

## සමාස ලක්ෂණ භෙද විග්‍රහ කියත්.

99. නාමානි, ස්‍යාද්‍යන්ත නාමයෝ; සමාසීයන්ති, එකාර්ථභාවය ට පමුණුවනලැබෙත්ද; තථා, එසේම; නාමානං, ස්‍යාද්‍යන්තපදයන්ගේ; සමසනං, අන්වය භාවයෙන් සංක්ෂෙපයහෝ; සමාසො නාම, "සමාස" නමැයි; විඤ්ඤෙය්‍යො, දතයුතුය; (මෙසේ) සමසන වසා, යථොක්තාකාර සංක්ෂෙප ලක්ෂණ වශයෙන් එකධා, එක් පරිදියි.

සමානි එකභූතානි ආසන්ති අස්මිංති 'සමාසො' යි ද, සමාසීයන්ති නාමානීති 'සමාසො' යිද, සමසනං 'සමාසො' යිද, "සමාස" ය නුෂශබ් ධාතු, ධාත්වර්ථ; ලක්ෂණ, නිර්වචනයි.

ආසන්ති අස්මිං යනුයෙන් ආධාරද, සමාසීයන්ති යනුයෙන් ආධෙයද, නාමානි යනුයෙන් කර්තෘද, සමසනං යනුයෙන් භාවයද

N

100 සමාසොච විධාහොති නිච්චානිච්චසමාසතො
අරිඤමො දීපඞකරො මුනිඤදි නිදස්සනං.

101 සමාසොච විධා හොති ලුත්තා ලුත්තාවසාථවා
මුනිඤෙදා ගොධනො චෙති ගවම්පති නිදස්සනං.

102 සමාසොච විධා හොති යුත්තා යුත්තා වසාථවා
නිදස්සනං මුනිඤදී අස්සඩ භොජනා දිකං.

---

දර්ශිතයි. ස්‍යාද්‍යන්තයන්ගේ අකව ඝ සාහිත්‍යය 'සමාස' යයි කීහු.

විශෙෂ කියයි.

100. නිච්චානිච්ච සමාසතො, නිත්‍ය සමාස අනිත්‍ය සමාස වශයෙන්; සමාසොච, සමාසයද; විධා හොති, ද්විවිධවෙයි; ඒමෙසේයි අරිඤමො දීපඞකරො -ප-, අරිඤම දීපඞකර මුනිඤ යනාදිය; නිදස්සනං, උදහරණයි.

අරිඤම දීපඞකර යනු නිත්‍යසමාසයි, මුනිඤ යනු අනිත්‍යසමාසයි. යම් පදයක් වාක්‍යයෙහිදු සමාසයෙහිදු ඒකස්වරූපයෙද, හේ නිත්‍ය සමාසයි. තද්විරොධ ලක්‍ෂණයෙන් අනිත්‍ය සමාස දතයුතු. විග්‍රහ නැත්තේ නිත්‍යයි, ඇත්තේ අනිත්‍යයි.

මෙම කිහ.

නත්ථි නිච්ච සමාසම්හි විග්ගහො විග්ගහො නිචෙ
අසඤ්ඤපෙදන කාහාවෙබා කාරසෙදෙන කතනම්

ආදි ශබ්දයෙන් ගොවිඤ,, නොධන, රාජපුරිස, ජීවිතින්‍ද්‍රිය, අබ්‍රාහ්මණ, උපනගර යනාදිහු ගැණෙත්.

ලුත්තා ලුත්ත භෙද

101 අථවා; තවද; ලුත්තා ලුත්ත වසා, ලුප්තසමාස අලුප්තසමාස වශයෙන්ද; සමාසො විධාහොති, ද්විවිධ සමාස භෙදයක් වෙයි; මුනිඤෙදා -පෙ- මුනිඤයනුද නොධනයනුද ගවම්පති යනුද; ඉහි නිදස්සනං, මේ නිදශීනයි.

මුනිඤ ගොධන යනු ලුප්ත සමාසයි. ගවම්පතී යනු අලුප්තසමාසයි. තොරණානං පති ගවම්පති යන මෙහි නං හට තුල අං ආදෙශ අලුප්තනුයි. අලුප්ත සමාසයි.

යුක්තා යුක්තා.

102 අථවා, තවද; යුත්තායුත්තවසා, යුක්තාර්ථසමාස අයුක්තාර්ථසමාස වශයෙන්ද; සමාසො විධා හොති, සමාසය ද්විවිධ වෙයි; නිද

103 සමාසො ච තිධා හොති සද්දත්ථ භෙදතො පුන
අසද්ධභොජී උරසිලොමො නීලුප්පලාදිකං.

---

සසතං, උදාහරණ; මුනින්දාදි -පෙ- මුනින්ද යනාදිය හා අසද්ධ භොජන යනාදියයි.

යොජීයන්ති යුජ්ජන්තා අපෙක්ඛන්තා අප්පෙන්තා, යුත්තොනාම අත්ථතොනාච යුත්තා යුත්තා. තෙසං වසා -පෙ- තස්මා යුත්තාත්ථ නාම. අඤ්ඤා නයා පෙක්ඛා ලක්ඛණ සාමත්ථියයි

මුනීනං ඉන්දො, මුනින්දො යනමෙහි, ඉන්දශබ්දයතෙම අත්‍යරාජාදීන් ව්‍යපෙක්ෂායෙන් මුනියනුහා යුක්තාර්ථය. මුනිශබ්දයද අත්‍යශ්‍රෙෂ්ඨාදීන් අනපෙක්ෂානුයි. ඉන්ද්‍රශබ්දහා යුක්තාර්ථය. මෙසේ අන්‍යොන්‍යාන්‍යත් සංගතාර්ථනුයි. යුක්තසමාසනාමිවේ. මෙහි සම්බන්ධාර්ථයුක්තාර්ථය. සංගතාර්ථ යුක්තාර්ථය. සංරක්ෂිතාර්ථයුක්තාර්ථය. සංශ්‍රෂ්ටාර්ථ යුක්තාර්ථය. දුප්පත්‍යසමෙතාර්ථ ච යුක්තාර්ථයැයි යුක්තාර්ථ පසෙවනා යකි. සපුත්තො යනාදියෙහි පුත්‍රසම්බන්ධත්වයෙන් සම්බන්ධාර්ථ යුක්තාර්ථනම්. දුක්ඛං සිතො යනාදියෙහි දුඃඛ සාසිදනත්වයෙන් සංගතාර්ථ යුක්තාර්ථනම්. රාජපුරිසො යනාදියෙහි රජහුගේ සංරක්ෂණය ඇත්තුයි. සංරක්ෂිතාර්ථ යුක්තාර්ථනම් සප්පොදනො යනාදියෙහි සර්පි සංශ්‍රෂ්ටත්වයෙන් සංශ්‍රෂ්ටාර්ථ යුක්තාර්ථනම්. සෙතපටො යනාදියෙහි සෙත ගුණධාරත්වයෙන් පුථුකප්පමෙකාර්ථ භාවයුක්තාර්ථනම්.

සද්ධාභුජතීති අසද්ධභොජනො, යනමෙහි නකාරයාගේ සම්බන්ධය භොජන ශබ්දයහා වන බව මුත් සද්ධා ශබ්දාර්ථයහා සම්බන්ධනොවේ. ගුරුදක් ගමකත්ව මාත්‍රයෙහි සමාසනුයි, අයුක්ත සමාසනම්. මෙබඳු. “යුක්තාතෙත්‍රාපි අසද්ද මසද්ද සම්බන්ධෙපි සිද්ධ අයුක්තතෙත්‍රාපියොගව් භාගබලා සමස්‍යතෙ”යීද,

## සමාසයන්ගේ ත්‍රිවිධ භෙද කියත්.

103 සමාසො, සමාසය තෙම; පුන, නැවත; සද්දත්ථභෙදතො, සද්දසමාස අත්ථසමාස සද්දත්ථසමාස යන භෙදයෙන්; තිධා, ත්‍රිප්‍රකාරවේ; අසද්ධභොජී —පෙ— අසද්ධභොජී යනු ශබ්දසමාසයි. උරසිලොමො යනු අර්ථසමාසයි නීලුප්පලං යනු ශබ්දාර්ථසමාසයි. යම් පදයෙක්හි පද සංක්ෂෙපමුත් යුක්තාර්ථ නොවේද? ඒශබ්දසමාසයි. යම් පදයෙක්හි අර්ථයෙන් සංශ්‍රෂ්ටවූයේ විභක්ති ලොපයෙන් සංක්ෂෙපඇත්තේ නොවේද? ඒ අර්ථසමාසයි. යම් පදයෙක්හි තදුභය ලක්ෂණ පැණේද? ඒ ශබ්දාර්ථසමාසයි. ච යනු සමුච්චයාර්ථයි. සද්ධාඛ්‍ය අභෙවො

104 ආදිමජ්ඣුත්තරානං වා ලොපතො තිවිධො භවෙ
දත්තො අස්සරථො රූපං ඉදං තෙසං නිදස්සනං.

105 පුබ්බුත්තරූභයඤ්ඤානං පදනත්ථප්පධානතො
චතුධා තිලොකං රාජපුත්තො අජෙලක ගොධනො.

---

ව සද්දත්ථා. තත්‍ර නය වශයෙන් සඞ්ඛෙපෙ.යි අපර ශබ්ද ගෘහිතයි ආදිශබ්දයෙන් කණ්හ සප්පාදිය ගැණේ.

**ලෝප ත්‍රිවිධය කියත්.**

104 අථවා, තවද; ආදිමජ්ඣුත්තරානං, ලොපතො, ආදිලොප ම ධ්‍යලොප; අන්තලොප යන ලොප වශයෙන්; තිවිධො භවෙ, සමාසය ත්‍රිවිධ වන්නේය; දත්තො අස්සරථො රූපං, දත්ත අස්සරථරූප,යන ; ඉදං නිදස්සනං, මේ නිදර්‍ශනයි.

යම් සමාසයෙක්හි පූර්‍වපද ලොපද ඒ "ආදිලොප,, නම්. දෙවො, ත දත්තො දෙවදත්තො යි විග්‍රහයි. දත්තොයි කීහ. යම් සමාස යෙක්හි ගම්‍යමානාපෙක්‍ෂා ඇති මධ්‍යපදලොපද, ඒ 'මජ්ඣ ලොප නම්. අස්සෙන යුත්තොරථො අස්ස යුත්ත රථො යි විග්‍රහයි. මධ්‍ය ලොපයෙන් අස්සරථ යි ව්‍යුත්පත්තියි. යම්සමාසයෙක්හි නඤ්ඤාව න්තනත්‍යායින් මෙන් ගම්‍යමානාපෙක්‍ෂා අන්තලොපද ඒ'අන්තලොප නම්. රූපෙ සඤ්ඤා රූපසඤ්ඤා යි විග්‍රහයි.රූපං යි සිද්ධය.

ආදිපදංච මජ්ඣපදංච උත්තරපදංච ආදිමජ්ඣුත්තරානිතෙසං- ප දශබ්දලොපයි යෙත්.

**සාමාන්‍ය නාම භෙද කියත්.**

105 පුබ්බුත්තරූභයඤ්ඤානං පූර්‍ව උත්තර උභය අන්‍යයන්, පද නං, පදයන්ගේ; අත්ථප්පධානතො,අර්‍ථප්‍රධානවශයෙන්;චතුධා, සමා සනාම සිව්පරිද්දකි; තිලො—පෙ—ධනො තිලොකං රාජපුත්තො අ ජෙලකංගොධනො යනු ඒට උදහරණයි.

"තිලොකං,, යනු පූර්‍වපදාර්‍ථප්‍රධානසමාසය "රාජපුත්තො,,යනු උත්තරපදාර්‍ථ ප්‍රධාන සමාසය. "අජෙලකං" යනු උභයපදාර්‍ථප්‍රධාන සමාසය. ගොධනො, යනු අන්‍යපදාර්‍ථප්‍රධාන සමාසයි. ඔව්හුක්‍රමයෙ න් අව්‍යයීභාව කම්ධාර තත්පුරු ෂ ද්වන්ද බහුව්‍රීහි යන සමාසයෝයි.

**මෙ ම කී හ**

**පුබ්බත්තරූභය මඤ්ඤපදත්ථප්පධානාබ්‍යයී භාව සමාසො**
**කම්මධාරයක තප්පුරිසා මෙමතෙද්ධාව බහුබ්බිහිවණ්ණයා**

106 අබ්‍යයීභාවො දිගු ද්වන්දො කම්මධාරය මෙවච
තප්පුරිසො බහුබ්බීහි සමාසො හොති ඡබ්බිධො.

---

පුබ්බොච උත්තරොච උභයංච අඤ්ඤොච පුබ්බුත්තරූභයඤ්ඤා තෙසං පදීයන්ති පකාසෙන්තීති පදානි තෙසං අත්ථානං පධානා අත්ථප්පධානා නාම.

**සඞ්ඛාරයෙන් විශෙෂ භෙද කියන්.**

106 අබ්‍යයීභාවො, අබ්‍යයීභාවසමාසයද; දිගු, දිගුසමාසයද; ද්වන්දො ච, ද්වන්ද සමාසයද; කම්මධාරයමෙවච, කර්මධාරය සමාසයද; තප්පුරිසො, තත්පුරුෂසමාසයද; බහුබ්බීහි, බහුව්‍රීහිසමාසයද; යනවශයෙන් සමාසො, සමාසභෙදය; ඡබ්බිධො, ෂට් විධය.

අනබ්‍යයස්ස අබ්‍යයත්තෙන භාවනං අභිසම්භාති අබ්‍යයීභාවො අථවා නබ්‍යයන්තීති අබ්‍යයා අබ්‍යයානං අත්ථං භාවෙතීති. අබ්‍යයීභාවො අනබ්‍යයං අබ්‍යයං භවතීති අබ්‍යයීභාවො වා. දිගි ලක්ඛණෙහි ගතො සඞ්ඛ්‍යාති දිගු චෙගාවො දිගු දිගුසදිසත්තා අයම්පි දිගු දීනානං එකවිභත්තිකානං සමුච්චයො ද්වන්දො චෙවචෙව ද්වන්දො. කම්මම්ව ද්වයං ධාරෙතීති කම්මධාරයො, තස්ස පුරිසො තප්පුරිසො, තංසදිසත්තා තප්පුරිසො. බහවො වීහයො යස්සසො බහුබ්බීහිතං සදිසත්තා බහුබ්බීහි

ලිඞ්ගවිභත්‍යාදීන් අන්‍යථාත්වයට නොයෙත් නුයි. උපසර්ගනිපාත අව්‍යය නම්ය. තද්ව්‍යයන්ගෙ අර්ථය යම් සමාසයෙක්හි ද්‍යොතකයවේද ඒ අව්‍යයීභාව සමාස නම්ය. නොහොත් අනව්‍යයන් අව්‍යයභාවයට මෙහිදී ප්‍රශංගනුයි. අව්‍යයීභාවයි කියාත් අභිමතයි.

සංඛ්‍යාපූර්වභාව නපුංසකලිඞ්ගභාව යයි ලක්ෂණවයකින් යුක්ත වූයේනුයිහෝ වෙ ගාවෙ දිගුයි කියනලද පදවිශෙෂයෙහි මෙන් ව්‍යපෙක්ෂාව ලක්ෂණ වත් පදයන්ට "දිගු" යි සඥයි.

**"එකවිභත්තිකානං නාමානං යො සමුච්චයො සො ද්වන්දො නාම"** යි කියනලද්දෙන් හෙටසිම්පරිච්ඡෙදයෙන් පදසමූහයක්ගෙ එකවිභාවය "ද්වන්ද" නම්, අබ්‍යාහිත්‍යයෙන් විපද විපද නොයෙක් සංගතභාවයට යේනුයි හෝ "ද්වන්ද" නමි.

කම්මම්ව ද්වයං ධාරෙතීති කම්මධාරයො යි වචන හෙයින් කර්ම සතෙම ක්‍රියාවද ප්‍රයොජනයද යි අර්ථ දෙක් ධරමින් ක්‍රියාප්‍රයොජන සාධ්‍යයකෙරේද: එමෙන් මේ සමාසයද පරස්පර ව්‍යපෙක්ෂාවයෙන් එකාර්ථීභාවය ශබ්දමයකින්ම ද්‍යොතනයකෙරේද එයින් කර්මධාරය නම්

107 යථාරුචි තිලොකංච සමණබ්‍රාහ්මණාදයො
නීලුප්පලං රාජපුත්තො ලම්බකණ්ණො යථාක්කමං,

108 සත්තා බ්‍යයී යථාරුචා ධිමාතරා ධිරූපකං
යථාක්කමං නිබ්බානූප නගරං අධිනච්චකං.

---

තස්සපුරිසො තප්පුරිසො= තං සදිසතා,යී- තත්පුරුෂ සාදෘශ්‍ය යෙන් තච්ඡබ්ද වාච්‍යාර්ථයහා- පුරුෂශබ්දවාච්‍යාර්ථයද= එකාර්ථීගා වයෙන් තුල්‍යනොවෙත්ද; එමෙන්. ගුණාභිධායී පදයන්ගේ අභි සහාවය- තප්පුරිස- නම්.

"බහවො වීහයො යස්සසො බහුබ්බීහි" යී- බහුව්‍රීහි ශබ්ද යෙන්- ශබ්දව්‍යුත්පත්තියෙහි යුක්තපදයන් සවාර්ථය තබා බාහ්‍යවූ ගෘපතිආදි අර්ථයක් වාච්‍යකෙරේද; එමෙන් සමස්‍යමාන පදාර්ථයෙ න් බාහ්‍ය අන්‍යපදාර්ථයක් අපෙක්‍ෂායෙන් වන සමාසය "බහුබ්බීහි" නම්.

### උදාහරණ කියයි

107. යථාරුචි තිලොකංච, යථාරුචි යනුද තිලොකං යනුද; ස මණබ්‍රාහ්මණාදයො, සමණබ්‍රාහ්මණ යනාදියද; නීලුප්පලං, නීලුප්ප ලං යනුද; රාජපුත්තො, රාජපුත්තො යනුද; ලම්බකණ්ණො, ලම්බ කණ්ණො යනුද; යථාක්කමං, කියනලද පිළිවෙලින්; උදාහරණය.

යෙසෙරුචි- "යථාරුචි" අව්‍යයීභාවයි. තයොලොකා සමාහ ටා "තිලොකං" ද්විගු-යි. සමණාචබ්‍රාහ්මණාච "සමණබ්‍රාහ්මණා" ද්වන්ද යි. නීලංච තං උප්පලංචෙති "නීලුප්පලං" කර්මධාරයයි රඤ්ඤො පු ත්තො "රාජපුත්තො" තත්පුරුෂයි. ලම්බාකණ්ණා යස්සසො "ලම්බ කණ්ණො" බහුව්‍රීහියි. ආදි ශබ්දයෙන් අස්සත්ථ= කපිත්ථනාදිය ගැ ණේ. තොහොත්= ෂට්සමාසයන්ටම උදාහරණ සංග්‍රහිතය.

### අව්‍යයීභාව සමාසභෙද

108. අබ්‍යයී, අව්‍යයීභාව සමාසය; සත්ත, සත්ප්‍රකාරයකි; යථා, මෙසේයි; යථාරුචි—පෙ—යථාරුචියනුද= අධිමාතරං යනුද= අධි රූපකං යනුද- යථාක්කමං යනුද= නිබ්බානං යනුද= උපනගරං ය නුද= අධිනච්චකං යනුද= පිළිවෙළින් උදාහරණයි.

මෙහි අව්‍යයීභාවය සප්තවිධය කෙසේවේද යත්?= අව්‍යයීභා සමාසත්වයට පැමිණි උත්තරපදයන්ගේ ලුප්තවිභක්ති වශයෙන් විවක්‍ෂිතව වෙයි. තද්භෙදයෙන් යථාරුචිය නු ප්‍රථමාවිභක්ති ලොප අව්‍යයීභාවය—පෙ—අධිනච්චකං යනු සප්තමීවිභක්ති ලුප්ත අව්‍යයීභා

109 ද්විගු ද්විධා සමාහාරා සමාහාර වසෙනච
තිලොකන්තු සමාහාරං පඤ්චින්ද්‍රියානි වාසමා

110 ද්වන්ද්ව ද්විධා සමාහාර ඉතරීතර යොගතො
අජෙළකං සමාහාරො සමණබ්‍රාහ්මණෙ තරො.

---

ව සමාසය. යෙයෙරුචි- යථාරුචි- මාතරං අධි= අධිමාතරං= රූපප න අධිකො= අධිරූපකං- කම්මස්ස අනුරූපං= යථාකම්මං- වාත තො නික්ඛන්තො- නිබ්බාතං- නගරස්ස සමීපං- උපනගරං- නවෙව සු අධිකා- අධිනවවකං-

### ද්විගු භෙද කියත්

101. ද්විගු, ද්විගුසමාසය; සමාහාර අසමාහාර වසෙනච, සමාහාරද්විගුය අසමාහාර ද්විගුයයි යන වශයෙන්; ද්විධාච, ද්විප්‍රකාරයක්වේ; තිලොකංතු සමාහාරං, "තිලොකං" යනු සමාහාරය; පංචින්ද්‍රියානිච අසමා, "පංචින්ද්‍රියානි" යනු අසමාහාරය=වෙයි;

සමාහාර= අසමාහාර වශයෙන්= ද්විගු සමාසය ද්විවිධය. සමාහාරනම්, නානාක්‍රියාපෙක්ෂකයන් එකක්‍රියාවෙන් සම්බන්ධ භාවයට ප්‍රාප්තිය රාශීකරණය නොවය සමූහය ප්‍රධානත්වයෙන් අභිධානභාවයයි= සමූහ ප්‍රධානත්වයෙන්මවූ එකවචනය—

අසමාහාරනම්. එක දෙශාපෙක්ෂායෙන් වත්නේය. අවයව ප්‍රධානත්වයෙන් ව්‍යපෙක්ෂා කලෙන් අසමාහාරය. තයොලොකා සමාහටා-යි යන මෙහි. විසීර්ණ. ලොකතුනෙක් බුද්ධියෙන් එක් ක්‍රියාවකින් සම්බන්ධකලෙන් "තිලොකං" කියාවේ.

පංච ඉන්ද්‍රියානි- පඤ්චින්ද්‍රියං- යන්නෙහි පඤ්චශබ්දයෙන් සම්බන්ධ වාච්‍යාර්ථ ඇති ඉන්ද්‍රිය ශබ්දයා එකාර්ථීභාවය- අවයවව්‍යපෙක්ෂා ඇතිනුයි අසමාහාරවිය.

මෙම කිහ

" එකභාවිනෙකභාවි වසා ද්විගුද්විධා මතො "

### ද්වන්ද්වභෙද කියත්

110. ද්වන්ද්ව, ද්වන්ද්වසමාසය; සමාහාර ඉතරීතරයොගතො, සමාහාරය-ඉතරීතරයොගයයනවශයෙන්; ද්විධා, ද්විප්‍රකාරයි; අජෙළකං, අජෙළකංයනු;සමාහාරො, සමාහාරභෙදය; සමණබ්‍රාහ්මණා, සමණබ්‍රාහ්මණා යනු; ඉතරො, ඉතරභෙදය; එනම්— ඉතරීතරයොගය—

ඉතරොච ඉතරොච ඉතරීතරං තෙන යොගො ඉතරීතර යොගො තතො.

111 විසෙසන පුබ්බපරූභය පද සම්භාවනා
උපමාව ධාරණංච කුනපාදි පුබ්බං නව.

---

සමාහාර= ඉතරීතරයොග- යන ව්‍යවහාරය චකාර්ථවශයෙනි, චශබ්දය, සමුච්චය, සමාහාර අන්වාචය, ඉතරීතරයොග- යි චතුරාර්ථවාචකය. එහි සමුච්චයනම්. ප්‍රත්‍යෙකක්‍රියාසම්බන්ධය. එයි, අන්වය සමුච්චය, ද්‍රව්‍යයෙහි ද්‍රව්‍ය සමුච්චය, ගුණයෙහි ද්‍රව්‍ය සමුච්චය. ද්‍රව්‍යයෙහි ගුණසමුච්චය යනාදි භෙදවෙත්. බුද්ධං වන්දාමි ධම්මංච යනාදියෙහි අන්වයසමුච්චයයි. භික්ඛුස්සචීවරංච පත්තංච යනාදිය ද්‍රව්‍යයෙහි ද්‍රව්‍යසමුච්චයයි. රත්තො පටො කම්බලංච යනාදිය ගුණයෙහි ද්‍රව්‍යසමුච්චයයි. පටො සෙතො රත්තොච යනාදිය ද්‍රව්‍යයෙහි ගුණසමුච්චයයි.

අන්‍යොන්‍යාපෙක්ෂකයන්ගේ සමූහරූප සංඛ්‍යාත සාහිත්‍යය සමාහාර නම්. චීවරංපිච පත්තංච අදාසි යනාදියයි. ක්‍රමයෙන් ක්‍රියාවක් සම්බන්ධවූයේ අන්වාච නම්. දානංච දෙහි සීලංච රක්ඛාහි යනාදියයි. සමූහ සමූහයන්ගේ එක ක්‍රියාපෙක්ෂත්වය ඉතරීතර යොගනම්. චීවරං පිණ්ඩපාතංච අද පානකමාසනං යනාදියයි. මෙහි සමුච්චය අන්වාචය දෙක්හි සමාස නොවේ. සමාහාර ඉතරීතර යොගද්වයෙහි සමාසවේ.

සමාහාරයෙහි, සාහිත්‍යය විශෙෂ්‍යයි. ද්‍රව්‍යයවිශෙෂණයයි "දබ්බාභිධානෙ සංඛ්‍යාමෙව තබ්බා'' යි වුකහෙයින් ද්‍රව්‍යවිශෙෂණත්වයෙන්ම එක වචනදවේ. අජේළකං යනු සමාහාරයි. සමණ බ්‍රාහ්මණා යනු ඉතරීතරයි ඉතරීතරයොගයෙහිසාහිත්‍යයවිශෙෂණයයි ද්‍රව්‍යවිශෙෂ්‍යයයි තදන්‍යයෝ-

**සමුච්චයො සමාහාරො තථා අන්වාච යො පිච**
**ඉතරීතර යොගොච මෙදා නාම චතුබ්බිධා සී කීහ-**

## කර්මධාරය සමාස භෙද කියත්

111 විසෙසන පුබ්බපරූභය පදසම්භාවනා, විශෙෂණ පූර්වපදය විශෙෂණ පර පදය විශෙෂණ උභය පදය සම්භාවනා පූර්ව පදය උපමාව ධාරණංච, උපමා පූර්ව පදය අවධාරණ පදය; කුණපාදී පුබ්බං, කුපූර්වපදය න පූර්ව පදය පාදි පූර්ව පදයදැයි නව, කර්මධාරය සමාස භෙද නවයකි.

112 නීලුප්පලං යථා තංහි යථාක්කමං ගන්ධුත්තමො
සණ්හසුඛුම ධම්මාච තථාචහෙතු පච්චයො

113 සංඛසෙතං ගුණො එව ධනං ගුණධනං තථා
කුපුත්තො අභාවොච පාවචනානි ඤෙයති.

---

112. 113. තංහි, ඒ සියල්ලට; යථාක්කමං, වුක්තානුක්‍රමයෙන් උදාහරණවෙයි; යථා, ඒ මෙසේයි; නීලුප්පලං, නීලංච තං උප්පලං චෙති "නීලුප්පලං" යනු විශෙෂණ පූර්ව පදය; ගන්ධුත්තමො, උත්තමොච සොගන්ධො චෙති "ගන්ධුත්තමො" යනු විශෙෂණ උත්තර පදය; සණ්හ සුඛුම ධම්මාච, සණ්හාංච තං සුඛුමං චෙති "සණ්හ සුඛුම ධම්මා" යනු විශෙෂණ උභය පදය; තථාච, එසේම; හෙතුපච්චයො, හෙතු හුත්වා පච්චයො "හෙතු පච්චයො" යනු සම්භාවනා පූර්ව පදය; සංඛසෙතං, සංඛා වියසෙතං "සංඛසෙතං" යනු උපමා පූර්ව පදය; ගුණො එව ධනං "ගුණ ධනං" යනු අවධාරණ පූර්ව පදය; තථා, එසේම; කුපුත්තො, කුච්ඡිතො පුත්තො 'කුපුත්තො' යනු කුපූර්වපදය; අභාවොච, න භාවො "අභාවො" යනුද නපූර්ව පදය; පාවචනං පධානං වචනං 'පාවචනං" යනු පාදි පූර්ව පදය යි; ඉති, මෙයාකාරයෙන්; ඤෙයනි, බොධ්‍ය වෙයි.

විසෙස්සතෙනෙනාති විසෙසනං, යමෙක් සාධාරණත්වයෙන් බහුප්‍රකාරවත් වස්තුවක් ප්‍රකාරාන්තරයෙන්ව්‍යවච්ඡේදනයකොට එක් ප්‍රකාරයෙක්හි තබාද, ඒ විශෙෂණ නම්. විසෙසනං පුබ්බං යස්සතං විසෙසන පුබ්බං විසෙසන පුබ්බංච විසෙසන පරංච විසෙසන උභයංචෙති විසෙස—පෙ—භයානි=තානිච තානි පදානි චෙති විසෙස-පෙ-පදානි, සංභාවෙතීති සම්භාවනා; ඉති, හුත්වා, සංඛා, යනාදි පදයි. උපමීයතෙ තෙනෙතායූපමා අවධාරීයතෙ තෙනාති අවධාරණං=කුච්ඡනච පච කුනපා තෙආදිසෙසං තෙකුනපාදී තෙපුබ්බා යස්සතං කුනපාදිපුබ්බං.

නීලුප්පලං යනුයෙහි භ්‍රමරාදීන්ට සාධාරණ රූපයෙන් ප්‍රතීත නවූ නීලාර්ථය උත්පලාඛ්‍යවූ නීලොත්පලයෙහි තබනු ලැබේ. රක්ත ශ්වෙතාදීන්ට සාධාරණ රූපවූ උත්පලාර්ථය තෙමද නීලාඛ්‍යවූ නීලාර්ථයෙහි තබනුලැබේනුයි, දෙදෙනාගේ තුල්‍යාර්ථ්‍යවෙයි. "ද්‍රව්‍යගුණක්‍රියා සන්නිධානෙද්‍රව්‍ය වාචකස්‍යෙව ප්‍රධාන්‍යම්" යුබැවින් ද්‍රව්‍ය ප්‍රධාන්‍යයෙන් හා ගුණ ක්‍රියාවන්ගේ අප්‍රධාන්‍යයෙන්ද ගුණද්‍රව්‍ය ක්‍රියා ද්‍රව්‍ය විකයෙන් සමාසයෙහි ගුණක්‍රියාවන්ම පූර්වයෙහි නිපාතනය කෙරෙත්. එයින් නීලුප්පලං යි ව්‍යුත්පන්නයි. යම් පදයෙක්හි ගුණ ශබ්

ද දෙදෙනාගේද, ක්‍රියා ශබ්ද දෙදෙනාගේද, ගුණ ක්‍රියා දෙදෙනාගේ ද සමාසවේද; එහි පූර්‍වාක්තාර්ථ අනියමය. ගණ්‍ඩාත්‍යාම සණ්ඩා සුබුම ධම්මා යන උදහරණයුගමයි හෙතුපච්චය යනුයෙහි සම්භාවනානම්. ගුත්වා, යනුයි ඉති හුත්වා සංඛ්‍යාත යනාදීන්ගේසෘහියෙන් පූර්‍වාපරයන්ගේඅන්වයභාව පරිඥානයයි.

සංඛසෙතං යනාදියෙහි කෙවල යුක්තාර්ථය ද්‍රව්‍යශබ්ද සෙත ශබ්දයන්ගේ අසම්භවයෙන් මධ්‍යයෙහි ඉවාදීන්ගේ ව්‍යවච්ඡේදරූපත්වයක් අනියමලක්‍ෂණවත්වේ. ගුණ ධනං යනාදියෙහි භෙදාභෙදක අනපෙක්‍ෂායෙන් අවධාරණවෙයි- සු ප්‍රභෙතා යනාදිය තුල්‍යාර්ථ හිනනාර්ථ සාමාන්‍යයෙන් කර්ම්මධාරය වෙයි. අභාවො යනාදියෙහි න නිපාත පූර්‍ව පදයි. එ නකාරාර්ථවශයෙන් නො එක් භෙදය. ප්‍රතිෂෙධභෙදයෙන් ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධය,පර්යුදාසප්‍රතිෂෙධයයි විවිධය. සර්‍ව ප්‍රකාරයෙන් උත්තරපදාර්ථයාගේ අභාවයප්‍රකාශ කරන්නේ ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධය. උත්තර පදාර්ථයාගේ අර්ථය ප්‍රතිෂෙධකොට ක්‍රියා ගුණාදි ධර්ම්මාවකින් තත්සදෘශ අන්‍යවස්තුයෙක්හි කාර්‍ය්‍යසිද්ධිය කරන්නේ පර්යුදාස ප්‍රතිෂෙධය.

**මෙම ශ්‍රී හ.**

**පසජ්ජ පටිසෙධස්ස ලක්ඛණං වත්‍ථු නත්‍ථිතා**
**වත්‍ථුනොඤ්ඤතායාවුත්ති පරියුදාසස්ස ලක්ඛණං**

**අර්ථ භෙද යෙන්.**

තත්සදෘශ තද්විරුද්ධ තදන්‍ය තද්භාවකියාවතුර්විධය. අබ්‍රාහ්මණ මානය යනාදියෙහි බ්‍රාහමණනොවූ තද් වැනි ක්‍ෂත්‍රියාදීයෙක් කියානුයි. "තද් සදෘශ නම්, න කුසලා කුසලපටිපක්ඛාති අකුසලා යනාදීයේ උත්තරපදාර්ථයට විරුද්ධ පදාර්ථයක් කියානුයි "තද් විරුද්ධ නම්. අමනුස්සා යනාදියෙහි මනුෂ්‍යයන් කෙරෙන් අන්‍යවූ යක්‍ෂාදීන් කියානුයි "තදන්‍ය" නම්. අකත්වා යනාදියෙහි උත්තර පදාර්ථයාගේ සම්පූර්ණයෙන් අභාවය කියානුයි "තද භාව" නම්. මෙහි තදභාවය ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධයෙහිය. සෙස්ස පර්යුදාස යෙහිය. එකාර්ථීභාවයක් ඇතිකල්හි පර්යුදාස ප්‍රතිෂෙධයෙහි සමාසද ව්‍යපෙක්‍ෂාකල්හි වාක්‍යයද වෙයි. ප්‍රසජ්‍යප්‍රතිෂෙධයෙහි ක්‍රියා හා සම්බන්ධභාව ඇත්තුයි. කිසිවිටෙක සමාසවේ. තදන්‍යයෝ ෂඩ්විධ නකාරාර්ථයක්දකියත්

**මෙම ශ්‍රී හ.**

**තත්සාදෘශ්‍ය මභාවශ්ච තදන්‍යත්වං තදල්පතා**
**අප්‍රාශස්ත්‍යං විරොධශ්ච නඤර්‍ථාඃ ෂට්ප්‍රකීර්තිතාඃ**

114 තප්පුරිසො විධා හොති පඨමා මාදි භෙදතො
පඨමා බ්‍රාහ්මණොහොති අමාදි භූමිංගතො.

115 පඨමාච විධාහොති විගු තුල්‍යත්ථ භෙදතො
අපඤ්චපූලි විගූච තුල්‍යත්ථොච අබ්‍රාහ්මණො.

---

මෙහි තදල්පප,අප්‍රශස්ත,වශ අධිකාශ අනුදරිඅකෙසි යනුර්ට උදාහරණයි

## තත් පුරුෂ සමාස භෙද කියත්

114. තප්පුරිසො, තත් පුරුෂ සමාසයද; පඨමා මාදි භෙදතො, ප්‍රථමා තත්පුරුෂ අමාදි තත්පුරුෂ යන භෙදයෙන්; විධා හොති, විප්‍රකාරවෙයි; අබ්‍රාහ්මණො, අබ්‍රාහ්මණො යනු; පඨමාහොති, ප්‍රථමා තත්පුරුෂයි; භූමිංගතො, භූමිංගතොයනු; අමාදි, අමාදිතත්පුෂයි.

විගු කර්මධාරයත් සම්බන්ධ තත්පුරුෂ පද වශයෙන් පූර්වපදයෙහි ලුප්ත ප්‍රථමාඇතිසමාස ප්‍රථමා තත්පුරුෂය. අං ආදී පූර්වපද ඇත්තේ අමාදි තත්පුරුෂය."ප්‍රත්‍යග්‍රහණෙ යස්මාත්ස විහිතස්තද දෙයන ද ගතස්‍ය ග්‍රහණම්" යී පරිභාෂා හෙයින් තත්පුරුෂ සමාසය සප්ත විභක්ත්‍යන්ත පූර්වක පද හා යුක්තභාවය "අමාදයො පරපදෙහි" යී සූත්‍රයෙන් කියන ලදී. තදර්ථයම "අමාදි භෙදතො" යී පදයෙන්ද කීහ. භූමිං ගතො කියයුතුයිඅං හට යං ආදෙශව හෝ සම්ං හට යං ආදෙශව හෝ තදර්ථවචම කථනාභිප්‍රායෙන් කීහ.

## එහි ප්‍රථමා භෙද.

115 විගු තුල්‍යත්ථ භෙදතො, විගු සමාස තුල්‍යාර්ථ සමාස භෙදයෙන්; පඨමාච, ප්‍රථමා තත් පුරුෂයද; විධා හොති, විප්‍රකාර වෙයි. අපඤ්චපූලි, අපඤ්චපූලි යනු;විගු, විගු සංඥලත් ප්‍රථමාතත්පුරුෂය. අබ්‍රාහ්මණො, අබ්‍රාහ්මණො යනු; තුල්‍යත්ථොච, කර්මධාරය සංඥ ලත් ප්‍රථමාතත්පුරුෂය.

තුල්‍යො අත්ථො යස්සසො තුල්‍යත්ථො, විගුච තුල්‍යත්ථොච -පෙ- නතො -පෙ- භෙදතො, සෙසස්සුගමය. එකදෙශලක්‍ෂණයකින් තත් පුරුෂ සංඥද විගු සංඥද ඇති අපඤ්චපූලී යනාදී ගුණ සම්‍යතිරෙක භාව සමාස විගු තත්පුරුෂය. න නිපාතාදීන්ගේ සමාසයෙහි කර්මධාරය සංඥහා තත්පුරුෂ සංඥලත් භිත්තප්‍රවෘත්ති නිමිති ඇති එකාර්ථිභාව සමාස තුල්‍යාර්ථ තත්පුරුෂය. එහි පූර්වපද ප්‍රථමාන්ත ලක්‍ෂණනුයි ප්‍රථමා තත්පුරුෂ නම් විය.

116 අමාදි ඡබ්බිධො හොති දුතියා තතියා දිතො
නිදස්සනං යථා තස්ස එවං ඤෙය්‍යං විජානතා.

117 භූමිගතො දෙවදත්තො කඨිණදුස්ස මාදිකො
අත්තජො රාජපුත්තොච ගාමවාසී යථාක්කමං.

---

අමාදින්ගි භෙද කියත්.

116. 117. දුතියා තතියාදිතො, ද්විතියා තෘතියා චතුර්ථි පඤ්චමී ෂෂ්ඨී සප්තමී යන විභක්තීන්; අමාදි, අමාදි තත්පුරුෂය; ඡබ්බිධො, ෂට්විධය; තස්ස, ඒ ෂට්ප්‍රකාරයට; නිදස්සනං, උදාහරණ; විජානතා නැණවතාවිසින්; එවං, මේ වක්ෂ්‍යමානයේ; ඤෙය්‍යං, දතයුතු; යථා ඔහු කව්රුද.

භූමි ගතො, භූමිං ගතො භූමි ගතො යනුද; දෙවදත්තො, දෙවෙන දත්තො දෙවදත්තො යනුද; කඨිණදුස්සමාදිකො, කඨිණස්ස ආගතං දුස්සං කඨිණ දුස්සං යනාදියද; අත්තජො, අත්තතොජාතො අත්තජො යනුද; රාජපුත්තො, රඤ්ඤො පුත්තො රාජපුත්තොයනුද; ගාමවාසීච, ගාමෙවාසී ගාමවාසී යනුද; යථාක්කමං; කීපිළිවෙලින් අං ආදීන්ට උදාහරණයි. ආදිශබ්දයෙන් ආගන්තුකභත්තාදියගැණේ අමාදි තත්පුරුෂ උභය තත්පුරුෂ ප්‍රථමාතත්පුරුෂ අමාදි පර තත් පුරුෂ ශුද්ධ තත්පුරුෂ මිශ්‍රක තත්පුරුෂ යනාදි අනෙකවිධ නාමද ව්‍යවහාරයි. මෙම කීහ.

තප්පුරිසො දුතියා ද්‍යුභය තප්පුරිසො ඉති
සත්තධා හොති තප්පෙනෙන දිගුණාකම්මධාරයො

සති නකාරයොගෙම උභෙ තප්පුරිසව්හයො
හොන්ති අබ්‍රාහ්මණො පඤ්ච වස්සාදිම්හි යථාරහං

මෙහි ද්විතීයාන්තයෝ ගතසිතාදීන්හාද, තෘතීයාන්තයෝ පූර්ව සදෘශ සමානාදීන්හාද, චතුර්ථ්‍යන්තයෝ තදර්ථාර්ථාදීන්හාද, පඤ්චම්‍යන්තයෝ භයභීති විරත්‍යාදීන්හාද, ෂෂ්ඨ්‍යන්ත සප්තම්‍යන්තයෝ ද්‍රව්‍ය ගුණ ක්‍රියා ද්‍යර්ථවාචකයන්හාද සමාසවේත්, එසිනුදු ෂෂ්ඨ්‍යන්තයෝ නිර්ධාරණාදි එකාදශස්ථානයන්හී සමාස නොවේත්—

මෙ ම කී හ.

එකාදසසු ඨානෙසු සමාසසඤ්ඤා විවජ්ජිතා
නිද්ධාරණෙ පූරණෙච ගුණෙ වචනෙසු තිත්තත්ථෙ
සහත්ථෙ අබ්‍යයත්ථෙච තබ්බපච්චයෙ පිච

118 බහුබ්බීහි විධා හොති තග්ගුණා’ තග්ගුණ භෙදතො
ලම්බකණ්ණාදි තග්ගුණො පබ්බතාදි අතග්ගුණො

119 අඤ්ඤපද පභෙදෙන ආදිම්හි ඤාණතො තිධා
පත්තගතෙහි අනෙනාව ජිනනගතෙහි සෙ:කකාමිං.

---

**අසමානාධිකරණෙ තප්පච්චයගතකෙපිච**
**කම්මනි කත්තරිචෙව ඉමෙ ජිංගසය පණ්ඩිතො**

**[බහුව්‍රීහි සමාසභෙද කියත්**

118. බහුබ්බිහි, බහුව්‍රීහිසමාසයද; තග්ගුණා තග්ගුණ භෙදතො, තද්ගුණ සංවිඥණ බහුව්‍රීහි සමාසය අතද්ගුණ සංවිඥණ බහුව්‍රීහි සමාසය යනභෙදයෙන්; විධාහොති, දෙයාකාරවෙයි; ලම්බකණ්ණාදි, ලම්බකණ්ණයනාදිය; තග්ගුණො, තද්ගුණ සංවිඥණය; පබ්බතාදි, පබ්බතයනාදිය; අතග්ගුණො, අතද්ගුණසංවිඥණය;

තස්ස ගුණිභූතස්ස අඤ්ඤපදත්ථස්ස ගුණ භූතො තග්ගුණො න තග්ගුණො අතග්ගුණො අත්ථො, තස්ස අඤ්ඤපදත්ථස්ස ගුණෙන සහ විඤ්ඤාතබ්බන්ති තග්ගුණ සංවිඤ්ඤාණං න තග්ගුණ සංවිඤ්ඤාණං අතග්ගුණ සංවිඤ්ඤාණං—

සමස්‍යමාන පදාර්ථය තමාවිසින් වාච්‍යවූ අන්‍යාර්ථයෙහි පැණේද, ඔහුගේ විශෙෂණපද සමාසයෙහි පැණේද; ඒතද්ගුණ සංවිඥණනම්. තදභාවය අතද්ගුණ සංවිඥණනම් "ලම්බකණ්ණා" යන මෙයින් රාජකුමාරාදි පදාර්ථයෙක් වාච්‍යද තමාර්ථයට විශෙෂණ හෙයින් වාච්‍යවූ අන්‍යාර්ථයා තමාඃක්ව හැඳිනිය යුතුයෙන් තද්ගුණ සංවිඥණයට උදාහරණය, "පබ්බතාදි" යනමෙයින් වාච්‍යවූ ක්ෂෙත්‍රාදි පදාර්ථයට තමාවිශෙෂණමුත් විශෙෂ්‍යවූ අන්‍යාර්ථයහා තුල්‍යාධිකරණත්වයක් නැතියෙන් තද්ගුණයෙන් හැඳිනියනොහෙ තුයි. අතද්ගුණයට උදාහරණය. තද්ගුණය චතුප්‍රකාරයකින් දතයුතුය. ලම්බකණ්ණාදීන්හි අන්‍යාර්ථයෙන්ද, නීලවත්ථං නරං යනාදීන්හි යොගවශයෙන්ද, ආදයො යනාදීන්හි ප්‍රයොගවශයෙන්ද, බුද්ධ පමුඛස්ස දානං දෙතියනාදීන්හි ක්‍රියාවශයෙන්දැයි ප්‍රකාර සතරකි මෙම කීහ.

**භෙදයො අඤ්ඤපදත්ථෙන තස්ස යොගවසෙනවා**
**පයොගතො ක්‍රියා පිති තග්ගුණෙ සො චතුබ්බිධො**

තුල්‍යාධිකරණ බහුව්‍රීහිය භින්නාධිකරණ බහුව්‍රීහි යයිද ද්විවිධවේ.

120 සත්තවිධො බහුබ්බීහි පඨමාදිවසා පන
නිග්‍රොධමණ්ඩලොචෙව ආගතසමණො තථා.

121 ජිතින්ද්‍රියො දින්නසුංකො නිග්ගතජනකො එවං
ලම්බකණ්ණො සුසස්සොති යථාක්කමං විජානියා.

---

### අන්‍යපදවශයෙන් භෙදත්‍රයක් කියත්

119. ආදිමජ්ඣන්තතො, ආදියෙහි=මධ්‍යයෙහි=අන්තයෙහි ප්‍රයොජ්‍යමානවූ; අඤ්ඤපදපභෙදෙන, අන්‍යපදයන්ගේ භෙදයෙන්; තිධා, බහුව්‍රීහි සමාසය ත්‍රිවිධය; පන්න —පෙ— යස්ස පන්නා ගතෙ සුමෙසො පන්නගතෙො යනුද; නාසස්ස අපෙතාති අනපෙතා යනුද, ජිනොනාගතො යස්ස සො ජිනනාගතො යනුද; යථාක්කමං; ඊටපිළිවෙලින් උදාහරණයි;

මෙහි, වාක්‍යයෙහි දැක්වෙන ශබ්දරූප අන්‍යාර්ථයි, එය පූර්වමධ්‍ය අන්තයෙහිලා, නිර්වචනකිරීමෙන් ව්‍යුත්පත්ති සමාසයද, ආදිමධ්‍යන්ත අන්‍යපද සමාස යන ක්‍රමයෙන් නම්දවේ.

### විග්‍රහාන්ගත පදවශයෙන් බහුව්‍රීහි භෙද

120. 121 පඨමා දිවසාපන, ප්‍රථමාආදි ශබ්දයන් අන්තකොට ඇති පදවශයෙන්; බහුබ්බීහි, බහුව්‍රීහි සමාසය; සත්තවිධො, සත්භෙදඇත්තේය; නිග්‍රොධ—පෙ—සුසස්සො යනුද, ඉති, මෙසේ; යථාක්කමං, ප්‍රථමාදි ක්‍රමානුරූපයෙන්; විජානියා, දතයුතු;

නිග්‍රොධො ඉව පරිමණ්ඩලො යො කුමාරො සො නිග්‍රොධපරිමණ්ඩලො ප්‍රථමා දෘෂ්ටාන්තයි, ආගතා සමණා යං, ආගත සමණො, දුතීයායි; ජිතානි ඉන්ද්‍රියානි යෙන සො ජිතින්ද්‍රියො, තෘතීයායි; දින්නො සුංකො, යස්ස සො දින්නසුංකො, චතුර්ථියි; නිග්ගතා ජනා යස්මා සො නිග්ගතජනකො, පඤ්චමියි; ලම්බා කණ්ණා යස්ස සො ලම්බකණ්ණො, ෂෂ්ඨියි; සුන්දරානි සස්සානි යස්මිං සො සුසස්සො සප්තමියි; ද්විපද ත්‍රිපද චතුෂ්පද බහුව්‍රීහි සමාස වශයෙන්ද අනෙකභෙදයි. **මෙම ගිහ**

**ද්විපදෙ තිපදෙචෙව ගිනනාදි කුපමාපිච**
**සංඛ්‍යාභය දිසන්තර බ්‍යතිහාරලක්ඛණොච**
**නිපාතසහපුබ්බ බහුබ්බීහි න විරිතො**

සංඛ්‍යාභය, දිසන්තරාල; ව්‍යතිහාරලක්ෂණ, යන ත්‍රය ප්‍රථමා බහුව්‍රීහිවේ, සෙසු සත දුතීයාදීහුය. පන, යනු පක්ෂාන්තරාර්ථනිපාතය. ප

122 ද්වන්දෙන දිගුනා කම්මධාරයෙන සමුච්චයෝ
තුල්‍යත්ථවාචකා සෙසා නාමානුරූප වාචකා.

123 කම්මධාරයො ද්වන්දොච තප්පුරිසොච ලාභිනො
තයො පරපදෙලිඞ්ගං බහුබ්බීහි පදන්තරෙ.

124 දිගුච අබ්‍යයීභාවො නපුංසකෙච නියතා
වාචකාපන විසෙසනයා විහත්ති පදරූපතො.

---

ක්ඛාන්තරනම්, පූර්වපක්ෂ දක්වීමෙන් අපරපක්ෂයෙහි ස්වපක්ෂය දක්වීමෙන් අන්‍යපක්ෂයෙහි අපර කාරණීප්සාවයි—

ගෙ ම කි හ

**කිඤ්චිපක්ඛං කච්චායන අඤ්ඤම්පිවනත්ථ මිච්ඡතා**
**වුත්තත්ථානං පච්ජිමංයෙව තං පක්ඛන්තර නාමකං**

**ඉක්බිති වාචකභෙද කියත්**

**122.** ද්වන්දෙන, ද්වන්ද සමාසයද; දිගුනා, දිගුසමාසයද; කම්මධාරයෙන, කර්මධාරසමාසයද; යන සමාස—සමුච්චයෝ, සමුච්චයාර්ථයද; තුල්‍යත්ථවාචකා, තුල්‍යාර්ථයද-වාචකයෝය; සෙසා, සෙසුසමාස; නාමානුරූපවාචකා, සංඥානුරූප වාචකයෝය; ඊවුන්කෙරෙන් ද්වන්ද්වය සමුච්චයාර්ථවාචකය; දිගුකර්මධාරයය, තුල්‍යාර්ථවාචකයෝය; සෙසු අබ්‍යයීභාව තප්පුරිස බහුබ්බිහි යන සමාස අනුරූපවාචකය.

ද්වන්දෙන යනාදිවචන කර්ත්‍රාර්ථයෙහි කරණවචනහෝ ලිඞ්ගාර්ථයෙහි තෘතීයාවචනයි; අනුරූපවාචකබවනම්- කර්ම කර්තෘ කරණ සම්ප්‍රදාන පාදන ස්වාමි සත්තමී යන මොවුන්හා භාවයද යථාලාභවශයෙන් කියන බවයි.

**ෂඩ්විධ සමාස ලිඞ්ගභෙද කියත්**

**123. 124.** කම්මධාරයො, කර්මධාරය සමාසයද; ද්වන්දොච, ද්වන්ද සමාසයද; තප්පුරිසොච, තත්පුරුෂසමාසයදයන; තයො, තෙදෙන; පර පදෙ, සමස්‍යමාන උත්තරපදයෙහි; ලිඞ්ගං, සමාසවිමෙන් පෙර ලිඞ්ගභෙදය; ලාභිනො, සාධ්‍යනනයෙහිද ලබන්නෝය; බහුබ්බීහි; බහුව්‍රීහි සමාසය;පදන්තරෙ,වාච්‍යවූඅන්‍යපදයෙහි ලිඟුලබන්නේය;

දිගුච, දිගුසමාසයද; අබ්‍යයීභාවොච, අව්‍යයීභාවසමාසයද; නපුංසකෙච, නපුංසක ලිඞ්ගභෙදයෙහිම; නියතා, නියතයහ; වාචකා

125 පුඤ්ඤඤාණෙන සංසාරෙ සංඛෙප කාරකො භවෙ
අභෙජ්ජපරිසො සද්ධා සහිතො ච භවා භවෙ.

**සප්පයොගං සමාසභෙදං සමත්තං.**

---

පත, වාචකයෝ වනාහි; විභත්‍යභිපදරූපෙනතා, විභක්තිපදස්වරූපයෙන්ම; විසෙසදයෝ, දතයුතු;

කර්මධාරය වන්ද තත්පුරුෂත්‍රය අන්‍යාර්ථයක් උක්තානොකෙරේනු යි, සමාසස්ථවූ උත්තරපදයෙහි ප්‍රවෘත්තිත ලිඞ්ගභාවයම නම්වත් කිරීමෙන් පසු වත් ලබාවය බහුව්‍රීහි සමාසය තමා විසින් කියනු ලබන අන්‍යපදාර්ථයෙහි ඇති ලිඞ්ගභෙදය භජනය කෙරේ. විගු අව්‍යයීභාව වය නපුංසකලිඞ්ග එකවචනාන්තයම ලබාමය. මොවුන්ගේ වාචකභාවයද විභක්ති ආශ්‍රිතභෙදයෙන්ම ඒ ඒ යයි දතයුතුය. විභක්ති නම් ප්‍රථමාදීහුය. **මෙමකීහ**

**පච්චත්ත මුපයොගංච කරණං සම්පදානියං**
**නිස්සක්ක සාමිවචනං භුම්මමාලපනඨමං**

**ප්‍රා ර්ථ නා කි ය ත්**

125. අනෙන පුඤ්ඤෙන, මේ සමාසකෘත පුණ්‍යයෙන්; භවාභවෙ, දිව්‍යමනුෂ්‍යාදී භවාභවයන්හිදී; අභෙජ්ජපරිසො, සමගි පිරිස් ඇත්තේ; සද්ධාසහිතො, ශ්‍රද්ධාසමන්විතවූයේ වෙම්වා; සංසාරෙ, සැරිසරා යෑම; ( ශබ්දෝත්පත්තිද ) සංඛෙප කාරකොච භවෙ, සංක්ෂෙපය හෙවත් ගෙවීම කරන්නෙක්ද වෙම්වා. "සමාසො පදසංඛෙපො" යී කීයෙන් සමාසකෘතානි ශාස්ත්‍රයෙන්ද "සංසාරෙ සංඛෙපකාරකො භවෙ"යී කීහ.

**සභාදහරණ සමාසභෙදය කියා**

**ස මා ප්ත යි .**

---

## ත ඞි තං.

126 තෙසං සද්ද සමූහානං හිතානුකූලකං’ථවා,
තෙසං සිස්ස සමූහානං තද්ධිතන්ති පවුච්චති.

127 සාමඤ්ඤ බ්‍යය භාවෙන තද්ධිතං තිවිධං භවෙ,
සාමඤ්ඤං විවිධං තත්‍ථ ලිඞ්ගෙහි වචනෙහිච.

---

126. තෙසං සද්දසමූහානං, වශිට්ඨඅපත්‍යාදි ස්‍යාද්‍යන්ත පදසමූහයන්ට; හිතං, සේයි; අනුකූලකං, තදන්තසෙන් ජාතත්වයෙන් අනුකූලනුයි; අථවා, නොහොත්; තෙසං සිස්සසමූහානං, ශ්‍රවණොද්ග්‍රහණධාරණ නියුක්ත ශිෂ්‍යසමූහයන්ට; (හිතං අනුකූලකං) හිත නුයි ප්‍රයොජන නුයි හෝ; තද්ධිතං, තද්ධිතනම්;

මේ තද්ධිත නිර්වචනයි "තං හිතං" යි විග්‍රහයුතු හකාරයට ධකාරාදෙශද නිග්ගහිතයට දකාරාදෙශද වී සිඩයි. හකාරයට ධකාරාදෙශද, දකාරාගමවී සිඩසීද, කියත්- මෙම කීහ—

**තංහිතං තිහි වත්තබ්බෙ හකාරස්ස ධකාරතා**
**දකාරාගමං කත්වාන වදන්ති සුධ බුධයො.**

තදනන්තරවූ තද්ධිත භෙද කියත්-

127. 128. සාමඤ්ඤබ්‍යය භාවෙන, සාමඤ්ඤ තද්ධිතය, අව්‍යය තද්ධිතය, භාව තද්ධිතය, යන භෙදයෙන්; තද්ධිතං, තද්ධිතය; තිවිධංභවෙ, ත්‍රිප්‍රකාරවන්නේය. තත්‍ථ, ඒ ත්‍රිවිධ තද්ධිතයන් අතුරෙන්; සාමඤ්ඤං, සාමඤ්ඤ තද්ධිතය; ලිඞ්ගෙහි, ත්‍රිවිධ ලිඞ්ගවශයෙන්ද; වචනෙහි, විවිධවචන වශයෙන්ද; විවිධං, අනෙකප්‍රකාරයි; අබ්‍යය නතු, අව්‍යය තද්ධිතයවූකලී; තථානෙව, එසේවූයේ නොවේ; හෙවත් ප්‍රත්‍යප්‍රකෘතිවූයේම වේ; භාවෝ, භාවතද්ධිතය; භාවෙන, වාචකවූ භාවශබ්දයෙන්; යුත්තකො, යුක්තවූයේමවෙයි; වාසිට්ඨාදි, වාසිට්ඨ යනාදියද; තථත්තාදි, තථත්ත යනාදියද; ඔපම්මාදි, ඔපම්ම යනාදියද; නිදස්සනං, යථාක්‍රමයෙන් දෘෂ්ටාන්තයි; ඒත්‍රිවිධ තද්ධිතයන් අතුරෙන් ත්‍රිලිඞ්ගයන්ටද වචනවශටද සාධාරණත්වයෙන් වාසිට්ඨාදි යම් සාධ්‍යයක්වේද ඒ සාමඤ්ඤ තද්ධිතනම්.

128 අව්‍යයන්තු තථාතෙව භාවෙ භාවෙන යුත්තකො,
වාසිට්ඨාදි තථත්තාදි ඔපම්මාදි නිදස්සනං.

129 ගොත්තතරරාග ජාත්‍යාදි සමූහට්ඨාන නිස්සිතං,
උපමා බහුලං සෙට්ඨං අස්සත්ථිපකති පූරණං;
සඞ්ඛ්‍යා විභාගං සාමඤ්ඤං පණ්ණරස විධං භවෙ.

130 වාක්‍යෙතු විජ්ජමානස්ස පදස්සාගම්ම ලොපනං,
තානි නාමානි ඤෙය්‍යානි බුද්ධිමන්තෙහි තං යථා·

---

යමෙක් යථොක්තලිඞ්ග විභක්ති වචනවශයෙන් ව්‍යයව්‍යයකට නොයන්නේ 'තථත්තා' යනාදීන් ප්‍රත්‍යප්‍රකෘතියෙන්ම සිටීද, ඒ අව්‍ය තද්ධිත නම්; යමෙක් වාක්‍යාවස්ථායෙහිවූ ජාත්‍යාදි ශබ්ද ප්‍රවෘත්ති නිමිත්තම වාචකභාවයෙන් 'ඔපම්ම' යනාදීන් අනන්‍යාර්ථ වාචක කෙරේද ඒ භාව තද්ධිත නම්, සමානස්සභාවො සාමඤ්ඤං විසෙසාවිධා යස්ස තං, එවිධං ලිඞ්ගවිභත්ති වචනභෙදෙන අබ්‍යයං න පාපුනතීති, අබ්‍යයං භවනති බුඩ සද්ද එතසමාහි භාවො 'ච' තථා 'තු' යනාදීහු නිපාතයි-

**සාමඤ්ඤ තද්ධිත භෙද.**

129. ගොත්තතර=පෙ=නිස්සිතං, ගොත්ත තද්ධිත, තරත්‍යාදි තද්ධිත, රාගාදි තද්ධිත, ජාත්‍යාදි තද්ධිත, සමූහතද්ධිත, ඨානතද්ධිත නිස්සිත තද්ධිත යන මොහුද; උපමා, උපමා තද්ධිතය; බහුලං, බහුල තද්ධිතය; සෙට්ඨං, විශෙෂතද්ධිතය අස්සත්ථිපකති පූරණං, අස්සත්ථි තද්ධිත, ප්‍රකෘති තද්ධිත, පූරණතද්ධිත, යන මොහුද; සඞ්ඛ්‍ය, සඞ්ඛ්‍යා තද්ධිතයද; විභාගං, විභාග තද්ධිතයදැයි මෙසේ; සාමඤ්ඤං, සාමාන්‍ය තද්ධිතය; පණ්ණරසවිධං, පංචදශ ප්‍රකාරයක්; භවෙ, වන්නේය.

ගොත්ත තරත්‍යාදි රාගාදි ජාත්‍යාදි සමූහ ඨාන නිස්සිත උපමා බහුල සෙට්ඨ අස්සත්ථි පකති පූරණ සංඛ්‍යා විභාගයන තද්ධිත පඤ්ච දසව, තව්‍යවහාර නාම ලාභ හෙතු කියත්.

130. වාක්‍යෙතු, වාක්‍යාවස්ථාවෙහි; විජ්ජමානස්ස, විද්‍යමාන වූ; පදස්ස, අපච්චාදි පදයාගේ; ලොපනං, ආගම්ම, සාධ්‍යාවස්ථාවෙහි ලොපයතිසා; තානි නාමානි, ගොත්ත අපච්චාදිවූ ඒ නාමයෝ වෙති යි; බුද්ධිමන්තෙහි, බුද්ධිමතුන් විසින්; ඤෙය්‍යානි, ගොත්තාදිනාම දතයුතු; තං යථා, වුක්ත නාමයන්ට උදාහරණ මෙසේයි.

131 වාසිට්ඨ නාමිකං නීලං පුරිමා ජනතා තථා,
රජනීයං දුට්ඨුල්ලංච ධූමායිතත්තමෙවච.

132 අභිජ්ඣාලූච සෙඛෙය්‍යාච සද්ධා මණිමයං තථා,
පඤ්චමො එක විධාච ඉදං තෙසං නිදස්සනං.

---

වචිතබ්බං වාක්‍යංතු යනු පක්ෂාන්තරාර්ථ නිපාතයි. විජ්ජතීති විජ්ජමානො, තස්ස පදන්ති එතනාභිපදං ආගම්මාති ආගම්ම තං යථා, යනු පෘච්ඡාද්‍යෝතකාර්ථ නිපාතයි. තද්ධිත වාක්‍යයොජනාවෙහි විද්‍යමානපදයක් අතුරෙන්, යම්පදයක් කෙරෙන් ත්‍යජ්‍යමාන පදාන්තරාපේක්ෂායෙන් ප්‍රත්‍යකෙරේද ඒ ප්‍රත්‍යවිසින් වාච්‍යවූ සාධ්‍යාවස්ථාවෙහි ලුප්තවූ පදාර්ථයාගේ වශයෙන් තද්ධිතපද පසළොස භින්නනාමයෙන් දතයුතුය යනු අභිප්‍රායි—

## උ දා හ ර ණ.

131. 132. වාසිට්ඨ -පෙ- වාසිට්ඨ යනුද; නාමික යනුද; පුරිමා යනුද; ජනතා යනුද; එසේම රජනීය යනුද; දුට්ඨුල්ල යනුද; ධූමායිතත්ත යනුද; අභිජ්ඣාලු යනුද; සෙඛ යනුද; සද්ධා යනුද; මණිමයං යනුද;එසේම පඤ්චම යනුද; එක යනුද; විධා යනුද; යන මේ පද; තෙසං, ඒ තද්ධිතයන්ට; නිදස්සනං, යථාක්‍රමයෙන් ප්‍රත්‍යෙක් උදාහරණයි,

වසිට්ඨස්ස අපච්චං, වාසිට්ඨො වාසිට්ඨි වාසිට්ඨං යිද ලිඞ්ගත්‍රයටම යොදනු- ගොත්තාතද්ධිතයි.

නාවාය තරතීති නාවිකො නාවිකී නාවිකං වා=තරාදි තද්ධිතයි. නීලෙන රත්තො පටො නීලො නීලා නීලංයී යොදනු රාගාදි තද්ධිතයි. පුරෙජාතො, පුරිමො පුරිමා පුරිමං ජාතාදිතද්ධිතයි. ජනානං සමූහො ජනතා සමූහ තද්ධිතයි- තාප්‍රත්‍යයං, යී කිත. රජනස්ස ඨානො රජනීයො රජනීයා රජනීයං, ඨානතද්ධිතයි.

දුට්ඨුනිස්සිතො, දුට්ඨුල්ලො දුට්ඨුල්ලා දුට්ඨුල්ලං නිස්සිත තද්ධිතයි. ධූමොවියදිස්සතීති, ධූමායිතත්තං=පෙ=උපමා තද්ධිතයි. අභිජ්ඣාබහුලො පොසො, අභිජ්ඣාලු-පෙ-තබ්බහුල තද්ධිතයි. වීසසෙන පසන්නොති සෙඛො-පෙ-විසෙස තද්ධිතයි. සද්ධාඅස්ස අත්ථිති සද්ධො =පෙ= අස්සත්ථි තද්ධිතයි. මණිනා පකතො පාසාදො මණිමයො-පෙ-තප්පකති තද්ධිතයි. පංචන්නං පූරණො පංචමො -පෙ- පූරණ තද්ධිතයි. එකං

133 ණ ණායන ණානොච ණෙය්‍යො ණි ච ණිකො තථා,
ණවො ණෙරොච ණ්‍යාඉච්චෙති නවගොත්තෙ පකිත්තිතා.

134 ණිකො ණියොති වෙයෙව තරත්‍යාදිම්හි ජාතියො,
ණො ච රාගෙ ඉමිකියො ජාතිම්හි චතුරො කියො.

135 කණ්ණාතා සමූහෙති ඨාණීයො ලොච නිස්සිතෙ,
ආයිතත්තා උපමායං ආලු ච බහුලෙ තථා,

136 තර තමි ස්සි කි යි ට්ඨා පංචෙ තෙ විසිට්ඨෙනච,
වි සො සි ඉක ඊ රො ණො දි වන්තු මන්තු අස්සත්ථියං.

---

ඛ්‍යායඩ්ඩකො වික්කො-පෙ-සංඛ්‍යා තද්ධිතයි. විහි විභාගෙහි ධා විහිතා තද්ධිතයි- ධාදිපච්චයන්තකා නිපාතායී කීහ. මෙකී පංචදශ තද්ධිත භෙදය සාමඤ්ඤ තද්ධිතයෙහි සංග්‍රහවේනුයි ලිඞ්ග විභක්ති සංඛ්‍යා භෙද ඇතෙතනහිදු විශෙෂවිධි වශයෙන් වාචකයන්ට විශෙෂණයෙන් ප්‍රකෘති ත්‍යජනයක් නැතත්වූද පදසාධ්‍යයි. බාලාවතාරාදියෙහි ධා දීහු අලිංගාදියෙහි නිර්දිෂ්ටයි- මෙහි යෙනුශ්‍යප්‍රශස්තින් කීහ.

**තද්ධිත ප්‍රත්‍ය සංඛ්‍යා කියත්.**

133. ගොත්තෙ, ගොත්ත තද්ධිතයෙහි; ණො-පෙ-ණ, ප්‍රත්‍යය ණායන,ය- ණාන, ය. ණෙය්‍ය, ය. ණි, ය. ණික,ය. එසේම ණව,ය ණෙර,ය. ණ්‍ය, යන්නයි යන; නව, නවයක්වේ.

134. තරත්‍යාදිම්හි, තරත්‍යාදි තද්ධිතයෙහි; ණි=පෙ=ණික, ප්‍රත්‍ය ණිය ප්‍රත්‍යයන; වෙයෙව, දෙකක්මවෙත්;රාගෙ, රාගතද්ධිතයෙහි; ණොච, එකම ‘ණ’ප්‍රත්‍යයක්වේ; ජාතිම්හි ජාත්‍යාදිතද්ධිතයෙහි ඉමි කි=පෙ=ඉම, ඉක, ඉය, කිය, යන; චතුරො, ප්‍රත්‍ය සතරක් වෙති.

135. සමූහෙ, සමූහ තද්ධිතයෙහි; ක-පෙ-කණ්, ණ, තා, යන; තිණි, ප්‍රත්‍ය තුණෙකි; ඨාණෙ, ඨාණ තද්ධිතයෙහි;ඊයො ඊ, යප්‍රත්‍ය යක්මවේ; නිස්සිතෙ, තන්නිස්සිත තද්ධිතයෙහි; ලොච, ල ප්‍රත්‍යයක් මවේ;උපමායං, උපමාතද්ධිතයෙහි; ආයිතත්තො, ආයිතත්ත ප්‍රත්‍යය වේ; තථා, එසේම; බහුලෙ, තබ්බහුල තද්ධිතයෙහි; ආලුඑව, ආලුප්‍ර ත්‍යයක්මවේ.

136. විසිට්ඨෙ, විශෙෂ තද්ධිතයෙහි; තර=පෙ=තර, තම; ඉස්සි

137 මයො ච පකතියම්හි පූරණෙම් ථ ඨා තියො,
සඞ්ඛ්‍යානෙකොච ධා සො චෙ විභාගෙ පච්චයා ඊතා;
සාමඤ්ඤ පච්චයා එව ඡ චත්තාලීස භවන්තිමෙ.

---

ක, ඉය, ඉඨ, යන; එතෙපංච, මේ ප්‍රත්‍යපසක්; අසඃඤ්ඤියං, අසඃඤ්ඤිත
ද්ධිතයෙහි; වී=පෙ=වි, සො, සී, ඉක, ඊ, ර, ණ, වන්තු, මන්තු, යන;
නව, ප්‍රත්‍ය නවයකි.

137. පකතිම්හි,පකත්‍යාදි තද්ධිතයෙහි; මයොච, මය **ප්‍රත්‍යක්ම**
**වේ;පූරණෙ**, පූරණ තද්ධිතයෙහි;ම්-පෙ-ම්, ථ, ඨ, තිය, යන ප්‍රත්‍යස
තරක් වෙත්; සංඛ්‍යාණෙ, සංඛ්‍යා තද්ධිතයෙහි; කොච, ක, ප්‍රත්‍යය
ක්මවේ. විභාගෙ, විභාග තද්ධිතයෙහි; ධ=පෙ= සො, යන, චෙපච්ච
යාඊතා, ප්‍රත්‍යදෙකක් සිටියාහ; එවං, මෙසේ; සාමඤ්ඤ, සාමඤ්ඤ
තද්ධිතයෙහි; පච්චයා, ප්‍රත්‍යයො; ඉමෙ ඡ චත්තාලීසං, මේ සසාළිස
ක්; භවන්ති, වෙත්.

**ගොත්තතද්ධිතප්‍රත්‍ය**—වාසිඨ යනාදියෙහි "වාණපච්චයෙ" යි
විහිත ණ ප්‍රත්‍යය; වච්ඡායනො, වච්ඡානො යනාදියෙහි; ණ යන ණ
නා දීන් ණ යන ණාන ප්‍රත්‍යද; කත්තිකෙය්‍යො යනාදියෙහි ණෙ
ය්‍යො කත්තිකාදීහි ඊ, විහිත ණෙය්‍ය ප්‍රත්‍යයද; දක්ඛියනාදියෙහි අ
තොණිවා යි විහිත 'ණි' ප්‍රත්‍යයද; ජෙනදත්තිකො යනාදියෙහි මෙ
හි වාග්‍රහණයෙන් විහිත ණිකප්‍රත්‍යයද;(මෙයින් මඤ්ඤ බ, ඤ, ණිය,
යන අනිකුදු ප්‍රත්‍යතුනෙක් ඇතද මෙහි නාවොහි) මණ්ඩබ්බ, රාජ
ඤ්ඤ, ආදිච්ච, පුත්තිය, යනාදි උදහරණ සහිතවූ බාලාවතාරමුඛම
ත්ත සාරාදියෙහි පැනේ. මෙම්කීන. මුඛමත්තසාරයෙහි

**දක්ඛ්‍යාහොණිවා ත්‍යජ් වාසදෙද ණිකාදයො**
**පංචාතිගහිතා හොසං පඤ්ඤොගොච යථාතිමෙ—පෙ—**

ඔපගචො යනාදියෙහි ණචො පග්වාදිහි යි විහිත ණව ප්‍රත්‍යය
ද; වෙධවෙරො, යනාදියෙහි "ණෙරවිධවාදිතො"යි කළ ණෙර ප්‍රත්‍ය
යද "ආදිච්චො"යනාදියෙහි"අතොණිවා"යි වා සදින් කළ ණ්‍ය ප්‍රත්‍ය
යද යන ප්‍රත්‍යනවය ගොත්ත තද්ධිතයෙහි වෙත්; ශබ්දශාරාවීජාලි
නීයෙහි ක්‍රමය මෙහි ආශ්‍රිතයි. මුඛමත්තසාරයෙහි ප්‍රත්‍ය දෙළසකැයි
කීහ.ඒ අතොණිවා යි වා සදින්ගත් බ ඤ ණිය යන ප්‍රත්‍යසහිතවයි.

**තරත්‍යාතද්ධිත** ප්‍රත්‍ය=තෙලිකං යනාදියෙහි"යෙනචා" දින්කළ
**ණික**, ප්‍රත්‍යය, ජාලිකො යනාදියෙහි "තමධීතෙ" යනාදියෙන් කළ

ණ්‍ය ප්‍රත්‍යයද, යන ප්‍රත්‍යයසයක්මවේ. මෙහි ණිකප්‍රත්‍යයය සූත්‍රවශන් ජාතිවශයෙන් දක්වූහ.

**රාගාදි තද්ධිතප්‍රත්‍ය**-කාසාවං යනාදියෙහි ණරාගාතසොද ය න්‍යාදින්විහිත ණප්‍රත්‍යයක්මවේ. **ජාතාදි තද්ධිත**ප්‍රත්‍යය-පච්ඡිමො අනන්තියො යනාදියෙහි "ජාතා"දියෙන් කළ ඉම ඉය ප්‍රත්‍යයද අනන්තික ජාතික යනාදියෙහි මෙම සූත්‍රයෙහි ආදිග්‍රහණයෙන් හා චග්‍රහණයෙන් කළ ඉක් කිය ප්‍රත්‍යයද යන ප්‍රත්‍යය සතරකි. **සමූහතද්ධිතප්‍රත්‍යය**—රාජපුත්තකො මානුසො යනාදියෙහි 'සමූහෙතණ් කණණාච' යනුයෙන් කළ කණ්, ණ, යන ප්‍රත්‍යයද; මායූරතා යනාදියෙහි 'ගාමජනබන්ධු'ය නාදියෙන්කළ 'තා' ප්‍රත්‍යයදයන ප්‍රත්‍යත්‍රයක් වේ; **ඨානතද්ධිතප්‍රත්‍යය**-බන්ධනීයං යනාදියෙහි 'තදස්සඨානමීයො ච' යනුයෙන් විහිත ඊය ප්‍රත්‍යයවේ; ඉය ඉල ප්‍රත්‍යයයක් චග්‍රහණයෙන් වෙනිසිද යෙත්. තදස්සත්ථිත තද්ධිත ප්‍රත්‍යය, දුට්ඨුල්ලං යනාදියෙහි තදස්සත්ථීති ලො, යනුයෙන්විහිත ල ප්‍රත්‍යයක්වේ- **උපමාතද්ධිත**ප්‍රත්‍යය- ධූමායිතත්තං යනාදියෙහි උපමාත්ථායිතත්තං යනුයෙන් විහිත ආයිතත්තත්ත ප්‍රත්‍යයක් වේ; ඉම ඉය වයක්ද කියත්-**තබ්බහුල තද්ධිතයෙහි**-අභිජ්ඣාලු යනාදියෙහි ආලුතබ්බහුලෙ යනුයෙන්කළ ආලුප්‍රත්‍යය වේ. ආලුකප්‍රත්‍යයක්ද චූලනිරුත්තියෙහි කීහ.

### විශෙෂ තද්ධිත ප්‍රත්‍යය,

පාපතරො, පාපතමො, පාපිස්සිකො, පාපියො, පාපිට්ඨො, යනාදියෙහි 'විසෙසෙ තරතමිස්සිකියිට්ඨා' යන සූත්‍රවිහිත තරතම, ඉස්සික, ඉය, ඉට්ඨ, යන ප්‍රත්‍යය සතරකි.

### තදස්සත්ථි තද්ධිත ප්‍රත්‍යය.

මෙධාවී යනාදියෙහි 'තදස්සත්ථීති වී ච' යන සූත්‍රවිහිත 'වී' ප්‍රත්‍යයද, සුමෙධසො යනාදියෙහි මෙම සූත්‍රයෙහි 'ච' ග්‍රහණයෙන් විහිත 'සො' ප්‍රත්‍යයද, තපස්සී යනාදියෙහි 'තපාදිතො සී' යන සූත්‍රවිහිත 'සී' ප්‍රත්‍යයද, මාලිකො, මාලී යනාදියෙහි 'දණ්ඩාදිතො ඉකඊ' යන සූත්‍රවිහිත 'ඉක, ඊ' යන ප්‍රත්‍යයවයද, මධුරො යනාදියෙහි 'මධ්වාදිතොරො'යන සූත්‍රවිහිත'ර' ප්‍රත්‍යයද, ගුණවන්තු යනාදියෙහි 'ගුණාදිතොවන්තු'යන සූත්‍රවිහිත 'වන්තු' ප්‍රත්‍යයද, සතිමන්තු යනාදියෙහි 'සත්‍යාදීහිමන්තු' යනසූත්‍රවිහිත 'මන්තු' ප්‍රත්‍යයද, සද්ධො යනාදියෙහි 'සද්ධාදිතොණ' යනසූත්‍රවිහිත 'ණ' ප්‍රත්‍යයදැයි මෙසේ ප්‍රත්‍යයනවයකි.

138 සික්කාය ධාරියො භාරො යථා කාජෙන ධාරිතො,
ඒනෙනාවං වචනත්ථාය වාක්‍යමජ්ඣෙ භවන්තිතෙ.

---

චූලනිරුක්තියෙහි චක්ඛුවොපදෙසි විසො යනාදියෙහිඉව,ඉවිය ප්‍රත්‍යවයක්ද කීහ.

## ප්‍රකෘත්‍යාදි තද්ධිත ප්‍රත්‍ය.

අශොමයො යනාදියෙහි 'තප්පකතිවචනෙමයො' යන සූත්‍රවිහිත මය ප්‍රත්‍යයක්මවේ.

## පූරණ තද්ධිත ප්‍රත්‍ය.

පංචමො යනාදියෙහි'සංඛ්‍යාපූරණෙමො'යන සූත්‍රවිහිත ම ප්‍රත්‍යයද, එකාදසී යනාදියෙහි 'එකාදිතො දසස්සී' යන සූත්‍රවිහිත 'ඊ' ප්‍රත්‍යයද, චතුත්ථො ඡට්ඨො යන තන්හි 'චතුඡෙහි ථ ඨා' යන සූත්‍රවිහිත ථ ඨ ප්‍රත්‍යයෝද, දුතියො යනාදියෙහි 'ද්විතීහියො' යන සූත්‍රවිහිත තිය ප්‍රත්‍යද්‍ය මෙසේ ප්‍රත්‍ය පංචකයකි.

## සංඛ්‍යා තද්ධිත ප්‍රත්‍ය.

ඒකං යනාදියෙහි වාදිතො කො නෙකයෙච්ච යන සූත්‍ර විහිත ප්‍රත්‍යක්ම වේ.

## විභාග තද්ධිත ප්‍රත්‍ය.

එකධා යනාදියෙහි 'විභාගෙධාච' යන සූත්‍රවිහිත ධා ප්‍රත්‍යයද, සුත්තසො යනාදියෙහි මෙමැ සුතුරැ චග්‍රහණයෙන් විහිත සො ප්‍රත්‍යද්‍ය වයකි. මෙසේ පැවදශ භෙදවූ සාමඤ්ඤ තද්ධිතයෙහි ගහිත ගහණ වශයෙන් ප්‍රත්‍ය ෂට්සාලිසකි. අගහිත ගහණවශයෙන් සූත්‍රරූප භෙද සාමාණ්‍ය තද්ධිත ප්‍රත්‍ය සිව්සාළිසකි. ශබ්දසාරාර්ථ ජාලිනියෙහි දෙසැටක් යයි කීහ.

තන් ප්‍රත්‍යයන් සම්භවණ්ඨාන නියමයෙන් ව චක්ඛුවියද කීයත්;

138 සික්කාය, සැලලින් හෝ පැසකින්; ධාරියො, දැරිය යුතු. භාරො, බඩභාරයෙක්; යථාකාජෙනධාරිතො, යම්සේ කදකින් ධරණලද්දේ සුවසේ වයංගමගෙණයේද; එවං, එමෙන්; ඕනානං, අපි දෙදෙනා; වචනත්ථාය, වාච්‍යය පිණිස; තෙ, ඒ තද්ධිත ප්‍රත්‍යයෝ; වාක්‍යමජ්ඣෙ, මූල ප්‍රකෘතිපද ප්‍රත්‍යාර්ථපද සඞ්ඛ්‍යාත වාක්‍ය මධ්‍යයෙහි; භවන්ති, වෙත්.

'වානපපවෙච' යනුයෙන් ප්‍රත්‍යවත් පදය අනිර්දිෂ්ඨනුසි වසිට්ඨ අපච්ච යන වාච්‍යාර්ථ පදතුරෙන් කවර පදයක් කෙරෙන් ප්‍රත්‍ය වේදැයි ආශාඞ්කා පරිහාර පිණිසැ යම්සේ ගණ්ඩිකවයක් බණ්ඩහාර යෙන් දුකසේ ගෙණෘසුන්තේ කදකින් සුවයේ ගෙණයේද, එමෙන් වසිඨ අපච්ච යනාදි අර්ථයක් වාචකවූ ප්‍රත්‍යයෝ තත් ලක්‍ෂණ වාක්‍ය මධ්‍යයෙහිම වෙතියි කීහ.

හෙතු කිම යත්, වසිඨ යනාදීවූ ආදි පදයක් කෙරෙන්වූ ප්‍රත්‍යයෝ අන්‍යතපදර්ථය නොකියත්. අපච්ච යනාදීවූ අන්‍ය පදයක් කෙරෙන්වූවෝ අන්‍ය පදර්ථය නොකියත්; තාදෙධතුයෙන් වාක්‍යපදමධ්‍යයෙහිම වෙතියි යනු යුක්තය.

මෙම්මැ කීහ ශබ්දගණ්ඨි පදයෙහි

**වසිඨ ම පච්චයනානං මජ්ඣෙ ගණ්හාති ණාදයො,**
**අපච්චතො පරා ජාතා එකං ගණ්හාති න වසං.**

තවද ආශාඞ්කා පරිහාරයක් වෙයි. වාසිඨෝ යන මෙයින් වශිෂ්ඨයාගේ අපත්‍යසඞ්ඛ්‍යාත පුත්‍රනාම කීයයි. පුත්‍රජනක පිතෘභූත වශිෂ්ඨයා නොකියයි. එසේ ඇති කල ප්‍රත්‍යය උභයාර්ථයම කීයේය යනුද ආශාඞ්කායි.

උභය පදාර්ථයම වාච්‍යවේනම් "සමණ බ්‍රාහ්මණ" යනාදියෙහි මෙන් වශිෂ්ඨයා හෝ අපත්‍යයා හෝ කියයුතුවෙයි යනුද ආශඞ්කායි

ණාදි ප්‍රත්‍යයෝ ප්‍රධාන අප්‍රධාන වශයෙන් අර්ථයම කියත්. රාජපුරිසො යී කිකල පුරුෂ ශබ්ද විශෙෂණවූ රාජ ශබ්දයද සමාස සාමර්ථ්‍යයෙන් කියනුලැබේ. උත්තර පදාර්ථ ප්‍රධාන සමාස භාවයෙන් අන්‍ය බ්‍රාහ්මණාදීන් කෙරෙන් වෙසෙසා රජහුගේ පුරුෂයායි කියනුලබනුයෙන් පුරුෂපදර්ථය ප්‍රධාන වශයෙන්ද තත්සම්බන්ධයෙන් රාජපදාර්ථය අප්‍රධාන වශයෙන්ද ලැබෙයි. එමෙන් ණාදි ප්‍රත්‍යයෝ අපත්‍යාද්‍යර්ථයන් ප්‍රධානවශයෙන්ද අපත්‍යව විශෙෂණවූ වශිෂ්ඨාද්‍යර්ථයන් අප්‍රධානවශයෙන්ද කියත්. එයින් උභය පදර්ථයම වාචකවූ ණාදිහු ප්‍රත්‍යව විශෙෂණ පද ප්‍රත්‍යාර්ථව විශෙෂ්‍යපද යන මොවුන්ම ධ්‍යයෙහි වෙත් යනු නිරාශාඞ්කා හේතුයි.

**තද්ධිතසම විචාරණය කෙරෙත්.**

139 වාක්‍යෙතු විජ්ජමානානං ලොපො පද විභත්තිනං,
ලුත්තෙ අත්ථෙ වදන්තීති පණ්ඩිතෙහි විජානියා.

140 මණීන්ධනාතපෙ අග්ගි හොන්තිනාපෙක්ඛන නස්සති,
තථෙව පද විභත්තිම්හි පච්චයත්ථො පවුච්චරෙ.

---

139 වාක්‍යෙතු, වාක්‍යාවස්ථාවෙහි; විජ්ජමානානං, විද්‍යමානවූ; පදවිභත්තීනං, අපත්‍යාදි පද හා ෂෂ්ඨීවිභක්තීන්; ලොපො, ලොපය ඇති කල්හිද; ලුත්තෙඅත්ථෙ, ලුප්තවූ පදවිභක්තීන්ගේ අර්ථය; වදන්තීති ණාදිප්‍රත්‍යයෝ කියත්නුයි; පණ්ඩිතෙහි, පැනැතියන් විසින්; විජානියා, දතයුතුය.

වසිට්ඨස්ස අපච්චං යන වාක්‍යයෙහි 'වසිට්ඨ' ශබ්දයා කෙරෙන්වූ සවිභක්තිකනාමො සම්බන්ධාර්ථසංඛ්‍යාත වාච්‍යවිශෙෂයක් ඇසුරුකොට තද්විශෙෂ්‍යයෙන් පවතී අපච්චශබ්ද හෙමද විශෙෂවූ කරණකාරක සඞ්ඛ්‍යාත අර්ථයක් ඇසුරුකොට තද්ර්ථය කියයි. මෙසේ ෂෂ්ඨී විභක්ති අපත්‍ය ශබ්ද යන දෙදෙනා සම්බන්ධාර්ථ කරණාර්ථයන් ප්‍රකාශකොට ලුප්තවූවාහු තත්සමධ්‍යජාතවූ ණ ප්‍රත්‍යයා විසින් වාච්‍ය කරණු ලබත්. තමදාකාරයෙන් ප්‍රත්‍යයෝ ලුප්තොභයාර්ථයන්ම කියනිසිකීහ.
එහෙයින් වාසිට්ඨො යනුයෙහි සම්බන්ධාර්ථ කරණාර්ථ අනුගත වෙත්. සෙසු තත්හිදු සාමඤ්ඤතද්ධිත ප්‍රත්‍යයෝ අපාදනාර්ථ වර්ජිත අර්ථයන් වාචකවෙත්.

මෙම කීය. වාචකොපදෙශයෙහි

**සම්බන්ධ කාරණකානං වච්චභාවොව නඩ්ඩෙත**
**පදස්ස වච්චභාවොව වාමකඤ්ඤුහි ඤාතබ්බා.**

මෙයම සූර්‍ය්‍යකාන්ත පාෂාණ න්‍යායෙන් ස්ඵුට කරත්.

140 මණීන්ධනාතපෙ, මණි ඉන්ධන ආතප යන වස්තුත්‍රය සම්බන්ධයෙන් ජාතවූ; අග්ගි, වහ්නියක්වේද; එය- තම්හි, ඒ මාණික්‍යාදීන්; නාසෙ, නැති කල: නනස්සති, නොනැසෙයි; එමෙන් පදවිභත්තිම්හි, ප්‍රත්‍යාර්ථද ප්‍රත්‍යවත්හුගේ විභක්තීන්;නාසෙ, නැතිකලද; පච්චයත්ථං, ප්‍රත්‍යයොතුමු ඔවුන්ගේ අර්ථය; පවුච්චරෙ, කියත්; යම්සේ සූර්‍ය්‍යකාන්ත පාෂාණයෙන් සූර්‍ය්‍ය රශ්මි ස්පර්ශය කාරණකොටගෙණ ජාතවූ අග්නිය සූර්‍ය්‍යරශ්මිය හෝ පාෂාණය හෝ නැතත් පව

141 ථා ච ථත්තා විථං තො ත්‍ර ථො ධි චො හිං ච හං පිච,
හිංචනං චහිං විධං චහො ධ ද දානි දාචනං.

142 චචීච චචනං චාපි රහාචි චර හාචනං,
රහි ධුනා ජ්ජ ජ්ජු ජො ත්‍යට්ඨ වීස පච්චයාව්‍යයෙ.

---

ත්තේවේද එමෙන් විභත්තිපද එළතවුවින් තදඣිද්‍යොතක ප්‍රත්‍යය තබා ගියහයි කීහ. තදත්‍යයො චන්ද්‍රකාන්තාදී පාෂාණයො උදාහරණ කෙරෙත්. එහි වෙනස ජලොත්පාදය පමණෙකි. උපමෙය සම්බන්ධය සමමැයි. පවුළුවිරෙ, කියනු ලබත් යයිද යුහු-

### අව්‍ය තද්ධිත ප්‍රත්‍ය කීයත්

